# පාලි භාෂාව

## 04

## හතරවන ශ්‍රේණිය

මූලික පිරිවෙණ

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ප්‍රථම මුද්‍රණය - 2017

සියලු හිමිකම් ඇවිරිණි.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
අංක 343, කොළඹ පාර, වැහැර, කුරුණෑගල
චම්පිකා ප්‍රින්ටර්ස් ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා



## ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

පිරිවෙන් මගින් ගිහි පැවිදි දෙපක්ෂයට ම භාෂා, ආගමික හා සාරධර්ම අධ්‍යාපනය ලබා දීම චිරාත් කාලයක සිට පැවත ආ බැවින්, පිරිවෙණ යනු ශ්‍රී ලාංකික අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත් විය. එය දේශීය ගිහි පැවිදි ශිෂ්‍ය පරම්පරාව පමණක් නොව විදේශීය විද්‍යාර්ථීන් ද ඥානනය කළ විශ්වවිද්‍යාලයක් බඳු ස්ථානයක් විය. එක් එක් යුගයේ අවශ්‍යතා අනුව සකස් වූ විෂයමාලාවක් පිරිවෙන් අධ්‍යාපනය මඟින් සිසුන් වෙත ප්‍රදානය කරනු ලැබිණි. එබැවින් ම එවැනි අධ්‍යාපන මධ්‍යස්ථාන විශ්ව සම්භාවනාවට පත් විය.

විදේශීය ආක්‍රමණ හමුවේ - විශේෂයෙන් ම පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණ හමුවේ - පිරිවෙන් අධ්‍යාපනය ගුණාත්මක වශයෙන් හීන වී ගිය බව සැබෑ ය.

එහෙත් 1753 දී ශ්‍රී ලංකාවේ මහණ උපසම්පදාව යළි පිහිටුවීමට ක්‍රියාකළ අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ කැපවීම මත පිරිවෙණ නැමැති අධ්‍යාපන ආයතනය ශීඝ්‍ර දියුණුවකට පත් ව දෙස් විදෙස් කීර්තියට පත්වීම අප ලැබූ ජයග්‍රහණයකි.

අනෙකුත් අධ්‍යාපන ක්ෂේත්‍රවලට මෙන් ම පිරිවෙන් අධ්‍යාපනයට ද නිදහස් අධ්‍යාපන සංකල්පය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අර්ථවත් කිරීම අපගේ පරම අපේක්ෂාවයි. පිරිවෙන් පෙළපොත් නොමිලයේ සැපයීමෙන් රජය ඉහළ වැයක් දරුව ද එමගින් සමස්ත ජනතාවගේ විනය, සදාචාරය හා යහපැවැත්ම පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව වෙතින් ඉටු වනු ඇතැයි උදක් ම අපේක්ෂා ඇති ව මෙම පොත ඔබ අතට පත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකන අතර මෙම පොත පරිහරණය කිරීමෙන් ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නැණ ගුණ දියුණු වේවායි ද පතමි.



**අකිල විරාජ් කාරියවසම්**

අධ්‍යාපන අමාත්‍ය

# පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ නාහිමිපාණන්ගේ පණිවුඩය

මනුෂ්‍ය ජීවිතයක් ලැබූ අපි වාසනාවන්තයෝ වෙමු. අප ලැබූ වාසනාවන්ත ජීවිතය තව දුරටත් සාර්ථක කර ගත යුතු ය. ඒ සඳහා අනුගමනය කළ හැකි නිවැරැදි ක්‍රම බොහෝ ඇත. ඒ අතරින් ළමා වියේ දී නොවරදවා ම කළ යුතු වන්නේ ඉගෙන ගැනීමයි. ඔබගේ ජීවිතයේ ඉදිරි කාලය සතුටෙන් සිටිනවා ද දුකෙන් ගතකරනවා ද කියා තීරණය වන්නේ බාල වියේ ඉගෙනීමට දක්වන උනන්දුව මතයි. ඉගෙනීමට ඇති ළමා කාලය ඉතා ඉක්මනින් ගෙවී යන බව සිහියේ තබා ගන්න.

පිරිවෙන් අධ්‍යාපනය ලබන ගිහි පැවිදි දරුවන් වැඩි දෙනෙක් දුප්පත් දෙමාපියන්ගේ දරුවෝ ය. එබඳු දරුවන්ට පිරිවෙණක ඉගෙනීමට අවස්ථාව සැලසීම ම කොතරම් භාග්‍යයක් ද? අප මෙලොවට බිහිකළ දෙමාපියන්ටත් පැවිදි කළ ගුරු උතුමන් ඇතුළු ඉගෙනීමට උදවු කළ සැමටත් මේ රටටත් අප කළගුණ දැක්විය යුතු ය. එසේ කළ හැකි වන්නේ අප බණ දහම් හා ශිල්ප ශාස්ත්‍ර ඉගෙන උසස් තත්ත්වයකට පත්වුවහොත් පමණකි.

ශ්‍රී ලංකාවේත් වෙනත් රටවලත් උගතුන්, ධනවතුන් හා බලවතුන් බවට පත්ව ඇති බොහෝ ගිහි පැවිදි චරිත දෙස බලන්න. ඒ හැම කෙනෙක් ම පාහේ දුක් මහන්සි වී ඉගෙන ගත්තෝ ය. ඔවුන් ආහාරපාන පොත්පත් ආදිය සපයා ගෙන ඇත්තේ ඉතා දුක සේ ය. එහෙත් අලස නොවී, වෙහෙස නොබලා, කාලය අපතේ නොහැර ඉගෙනීම නිසා අද ඔවුන් තමන්ගේ ජීවිතත් තමන්ට උපකාර කළ අයගේ ජීවිතත් සතුටුදායක කොට ගෙන ඇත.

වර්තමාන ලෝකයේ මිලියන ගණනක් දරුවන්ට ජීවත් වීමට නිවසක් නැත; කුසට ආහාර නැත; අසනීපයකට බෙහෙත් ගන්නට මුදල් නැත; ඉගෙනීමට පොත්පත් නැත. එහෙත් ඔවුහු බොහෝ දුෂ්කරතා මැද ඉගෙන ගනිති. එසේ වුවත් අප කොතරම් වාසනාවන්ත ද? අපට පිරිවෙණෙන් හෝ දායකයන්ගෙන් හෝ නොමිලේ ම ආහාරපාන ලැබෙයි. රජය මගින් නොමිලේ පොත්පත් හා ඇඳුම් සැපයේ. පිරිවෙණේත් පාසලේත් ඉගෙනීමට මුදල් අය කරන්නේ නැත. එපමණක් නොව රජයේ සුරක්ෂා සිසු රක්ෂණ ක්‍රමය නිසා මෙම වර්ෂයේ පටන් අපට සෞඛ්‍ය රක්ෂණයක් ද ලැබී ඇත.

අද වන විට ලෝකයේ බොහෝ මිනිස්සු ආහාර පමණක් නොව බීමට ජලය ද නොමැති ව දුකට පත්ව සිටිති. ආහාර, ජලය, සිවුරු ආදිය අපතේ නොහැර ඒවායින් උපරිම ප්‍රයෝජන ගත යුතු යැයි අපගේ ශාස්තෘ වූ බුදුන් වහන්සේ විසින් අපට උගන්වා ඇත. ඒවා නාස්ති කිරීම වරදක් පමණක් නොව පාපයක් ද වේ. මේ පෙළපොත් ඔබට ලැබෙන්නේ ද නොමිලේ ය. ඒ සඳහා රජය මේ රටේ මිනිසුන්ගෙන් එකතු කර ගත් විශාල මුදලක් වැය කර ඇති බව අමතක නොකරන්න.

මෙම පෙළපොත් ප්‍රවේසමෙන් හා වුවමනාවෙන් පරිහරණය කරන්න; දැනුමෙන් පෝෂණය වන්න; විභාග සමත් වන්න. මේ රටට ආදරය කරන ලෝකයේ ජීවත් වන සැම කෙරෙහි කරුණා මෛත්‍රියෙන් යුක්ත සත්පුරුෂයකු වීමට ඔබත් අධිෂ්ඨාන කර ගන්න.

**මහාචාර්ය පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි,**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්),
අධ්‍යාපන අමාත්‍යාංශය.

# පෙරවදන

ශ්‍රී ලංකාව තුළ බුද්ධ ධර්මය ස්ථාපිත වීමත් සමග ම වාගේ විහාරාරාම ගොඩනැංවීම ආරම්භ විය. දිවයිනේ ප්‍රධාන විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් "පිරිවෙණ" නැමැති විද්‍යායතනය බිහි වී ඇත. ගිහි පැවිදි දෙපක්ෂයට ම අවශ්‍ය වූ කලා ශිල්ප, භාෂා හා සමය සමයාන්තර ඥානයත්, යහපත්, ගුණගරුක සමාජයක් බිහි කිරීමට අවශ්‍ය සාරධර්ම අධ්‍යාපනයත් බෙදා දුන්නේ පිරිවෙණ මගිනි. එම සාම්ප්‍රදායික අනන්‍යතාව රැක ගනිමින් ම, කාලීන අවශ්‍යතා ද සපුරාලමින් යහපත් සමාජයක් ගොඩනැගීමේ කාර්යය ඉදිරියට ගෙන යාමට පිරිවෙණ ඉටු කරන කාර්යභාරය සුළු කොට තැකිය නොහැකි ය.

සම්භාවනීය අධ්‍යාපන සම්ප්‍රදායන් රැක ගනිමින් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ මෙන් ම ගිහි සිසුන්ගේත් අවශ්‍යතා සැලකිල්ලට ගෙන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පිරිවෙන් සඳහා මෙම පාඨග්‍රන්ථය සම්පාදනය කර ඇත. එම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, ලේඛක හා සංස්කාරක මණ්ඩල සාමාජිකයන් සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මාගේ ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි.

**අයි.එම්.කේ.බී. ඉලංගසිංහ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2017.05.02

**නියාමනය හා අධීක්ෂණය :-**

| | |
|---|---|
| අයි.එම්.කේ.බී. ඉලංගසිංහ මයා | - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**මෙහෙයවීම :-**

| | |
|---|---|
| මහාචාර්ය පූජ්‍ය නාබිරිත්තන්කඩවර<br>ඥාණරතන හිමි | - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩබ්.ඩී. පද්මිණි නාලිකා මිය | - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්<br>(නිෂ්පාදන හා බෙදාහැරීම්)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| ඩබ්ලිව්.ඒ. නිර්මලා පියසීලි මිය | - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**උපදේශකත්වය :-**

| | |
|---|---|
| මහාචාර්ය පූජ්‍ය මකුරුප්පේ<br>ධම්මානන්ද හිමි | - පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය<br>කැලණිය විශ්වවිද්‍යාලය |

**සම්බන්ධීකරණය :-**

| | |
|---|---|
| පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි | - පාලි විෂය උපදේශක (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩී.එම්.ජේ. පුෂ්පකුමාර මයා | - නියෝජ්‍ය කොමසාරිස් (පාලන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| කේ.ඒ. සුමිත් ධර්ම ශ්‍රී මයා | - පාලි විෂය උපදේශක (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

**සංස්කරණය :-**

| | |
|---|---|
| මහාචාර්ය පූජ්‍ය මකුරුප්පේ<br>ධම්මානන්ද හිමි | - පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| පූජ්‍ය විජිතපුර ගුණරතන හිමි | - කථිකාචාර්ය<br>බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය |

**ලේඛක මණ්ඩලය :-**

| | |
|---|---|
| කේ.ඒ. සුමිත් ධර්ම ශ්‍රී මයා<br>(සභාපති) | - පාලි විෂය උපදේශක (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

| | |
|---|---|
| පූජ්‍ය වල්පොල පියරතන හිමි | - පරිවේණාචාර්ය<br>විද්‍යෝදය පිරිවෙණ,<br>මාලිගාකන්ද, මරදාන. |
| පූජ්‍ය කුඹල්ගොඩ ධම්මාලෝක හිමි | - පරිවේණාචාර්ය<br>සිරි ධම්මානන්ද මහා පිරිවෙණ,<br>නිහිළුව, බෙලිඅත්ත. |
| පූජ්‍ය වරාපිටියේ පියරතන හිමි | - පාලි ගුරු උපදේශක<br>මාර/සිරිරතනසාර පිරිවෙණ<br>බඹරැන්ද, කෝට්ටෙගොඩ. |

**සෝදුපත් කියවීම** :-

| | |
|---|---|
| පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි | - පාලි විෂය උපදේශක (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය. |

**පිටු නිර්මාණය සහ පිට කවරය** :-

| | |
|---|---|
| ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ මෙය | - පරිගණක අංශය,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**පරිගණකගත කිරීම** :-

| | |
|---|---|
| ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ මෙය | - පරිගණක අංශය,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |
| ඉසුරංගි කනකරත්න මෙය | - පරිගණක අංශය,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

# පටුන


| | | |
|---|---|---|
| 01 | නමාමි සත්ථාරමනන්තගොචරං | 01 |
| 02 | දානං සග්ගස්ස සොපාණං | 08 |
| 03 | රත්තක්ඛදමනො | 19 |
| 04 | වාරණරාජා | 29 |
| 05 | පුඤ්ඤකරණස්ස සහායො | 37 |
| 06 | පිතුසිනෙහං | 44 |
| 07 | දෙවෙන මය්හං පුත්තස්ස ජාතකාලෙ වරො දින්නො | 52 |
| 08 | කන්තාරතරණං | 58 |
| 09 | නත්ථි පූවමෙව පචෙය්‍යාසි | 66 |
| 10 | ජයං තෙ දම්මි | 73 |
| 11 | චූලෙකසාටක බ්‍රාහ්මණස්ස දානං | 83 |
| 12 | මහාබොධිපතිට්ඨාපනං | 91 |
| 13 | නිග්‍රොධසාමණෙරො | 101 |
| 14 | ගාමවාසිනො මම වචනං සුණාථ අජ්ජ රත්තිභාගෙ එකො අමනුස්සො ආගච්ඡති | 109 |
| 15 | තණ්හාය අභිභූතො කුමාරො | 116 |
| 16 | පාළි පාඨාවලී | 124 |
| 17 | මහාවංසය (පාලි වංස කථා) | 140 |
| 18 | මහාවංසො (6 පරිච්ඡේදය) | 146 |
| 19 | කච්චායන ධාතුමඤ්ජූසා | 156-157 |
| 20 | බාලාවතාර | 158-181 |
| 21 | ධම්මචක්කප්පවත්තන සුත්තං | 182-186 |

# ලඝු සංකේත

i. නා - නාම පදයකි
ii. සං - සන්ධි පදයකි
iii. කි - කිතක පදයකි
iv. ස - සමාස පදයකි
v. ත - තද්ධිත පදයකි
vi. නි - නිපාත පදයකි
vii. ක්‍රි - ක්‍රියා පදයකි
viii. තු - තුමන්ත ක්‍රියාවකි
ix. පූ.ක්‍රි - පූර්ව ක්‍රියා පදයකි
x. ස.නා - සර්වනාම පදයකි

පඨමො පාඨො

# නමාමි සත්ථාරමනන්තගොචරං

විසාරදං වාදපථාතිවත්තිනං
තිලොකපජ්ජෝතමසය්හසාහිනං,
අසෙසඤෙය්‍යාවරණප්පහායිනං
නමාමි සත්ථාරමනන්තගොචරං.

තිලොකනාථප්පභවං භයාපහං
විසුද්ධවිජ්ජාචරණෙහි සෙවිතං,
පපඤ්චසඤ්ඤොජනබන්ධනච්ඡිදං
නමාමි ධම්මං නිපුණං සුදුද්දසං.

පසාදමත්තෙන'පි යත්ථ පාණිනො
ඵුසන්ති දුක්ඛක්ඛයමච්චුතං පදං,
තමාහුණෙය්‍යං සුසමාහිතින්ද්‍රියං
නමාමි සඞ්ඝං මුනිරාජසාවකං.

(දාඨාවංසො)

පදමාලාව

| | | | |
|---|---|---|---|
| විසාරදං | (නා) | - | විශාරද වූ |
| වාදපථාතිවත්තිනං | (ස) | - | වාද මාර්ගයන් ඉක්මවන්නා වූ |
| තිලොකපජ්ජෝතං | (ස) | - | තුන්ලොවට පහනක් වූ |
| අසය්හසාහිනං | (ස) | - | ඉවසිය නොහැකි දෑ ඉවසන්නා වූ |
| ඤෙය්‍යාවරණප්පහායිනං | (ස) | - | ඥෙය්‍ය මණ්ඩලයට බාධක වූ (අවිද්‍යා ආදී) පාපධර්ම ප්‍රහාණය කරන |
| අනන්තගොචරං | (ස) | - | කෙළවරක් නැති විෂය පථය ඇති |
| සත්ථාරං | (නා) | - | ශාස්තෘන් වහන්සේ |
| තිලොකනාථප්පභවං | (ස) | - | තුන්ලොවට පිහිට වූ බුදුන් කෙරෙන් උපන් |
| භයාපහං | (ස) | - | භය දුරුකරන |
| විසුද්ධවිජ්ජාචරණෙහි | (ස) | - | පාරිශුද්ධ විජ්ජාචරණ ධර්මයන් ඇත්තවුන් විසින් |
| සෙවිතං | (කි) | - | සෙවුනා ලද |
| පපඤ්ච | (නා) | - | ප්‍රපඤ්ච ධර්ම (තණ්හා, මාන, දිට්ඨි) |
| සඤ්ඤොජනබන්ධනච්ඡිදං | (ස) | - | සංයෝජන බැමි සිඳින්නා වූ |
| නිපුණං | (කි) | - | සියුම් වූ |
| සුදුද්දසං | (ස) | - | දැකීමට අතිශයින් අපහසු වූ |

| | | |
|---|---|---|
| පසාදමත්තෙන | (ස) | - පැහැදීම් මාත්‍රයකින් |
| පාණිනො | (නා) | - සත්වයෝ |
| දුක්ඛක්ඛයං | (ස) | - දුක් දුරු කරන |
| අච්චුතං පදං | (නා) | - නිර්වාණපදය |
| ඵුසන්ති | (ක්‍රි) | - ස්පර්ශ කරති |
| ආහුණෙය්‍යං | (ත) | - දුරබැහැරින් ගෙනත් දීමට සුදුසු වූ |
| සුසමාහිතින්ද්‍රියං | (ස) | - මනාව සංසුන් ඉඳුරන් ඇති |
| මුනිරාජසාවකං | (ස) | - බුද්ධශ්‍රාවක වූ |

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. පඨමාය ගාථාය දායාවංසකත්තා කං නමස්සති ?
ii. දුතියාය ගාථාය කත්තා ධම්මස්ස කති ගුණානි දස්සෙති? තානි උද්ධරිත්වා දස්සෙතු.
iii. ධම්මො කෙහි සෙවිතො හොති ?
iv. පාණිනො කානි ඵුසන්ති ?
v. කෙ සුසමාහිතින්ද්‍රියා ආහුණෙය්‍යා භවන්ති?

2. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. බුදුරදුන් පිළිබඳ මෙහි දක්වා ඇති විශේෂ ගුණ මොනවා ද?
ii. සංයෝජන ධර්ම නම් කරන්න.
iii. ඉන්ද්‍රිය සංවර කළෝ කවරහු ද?
iv. තුන්ලොව නම් කරන්න.
v. තෙවන ගාථාවෙහි එන සඟගුණ කවරේද?

අක්ෂර මාලාව

භාෂාවකට අනන්‍ය වූ වර්ණ මාලාවක් ඇත. ව්‍යාකරණ සම්ප්‍රදායයන් අනුව පාලි වර්ණමාලාවෙහි වෙනස් කම් පවතී. එබඳු සම්ප්‍රදායයන් තුනකි.

කච්චායන සම්ප්‍රදාය
මොග්ගල්ලාන සම්ප්‍රදාය
සද්දනීති සම්ප්‍රදාය වශයෙනි.

මෙම සම්ප්‍රදායයන්ගෙන් ලංකාවේ වඩාත් ජනප්‍රිය වූයේ කච්චායන හා මොග්ගල්ලාන සම්ප්‍රදායයන් දෙකයි.

කච්චායන නම් තෙරනමකගේ කෘතියකින් ඇරඹෙන කච්චායන සම්ප්‍රදාය අක්ෂර 41ක් දක්වයි. මෙම සම්ප්‍රදායට අයත් වඩාත් ප්‍රකට ව්‍යාකරණ ග්‍රන්ථ තුනක් ඇත. කච්චායන, රූපසිද්ධි හා බාලාවතාරය වශයෙනි.

**කච්චායන සම්ප්‍රදායට අනුව ස්වර 08කි.**

අ ආ ඉ ඊ උ ඌ එ ඔ යනුවෙනි.

මොග්ගල්ලාන නම් තෙරනමකගේ කෘතියකින් ඇරඹෙන මොග්ගල්ලාන සම්ප්‍රදාය අක්ෂර 43ක් දක්වයි. ප්‍රකට ව්‍යාකරණ ග්‍රන්ථ වන්නේ මොග්ගල්ලායනය, පදසාධනය හා පයොගසිද්ධියයි.

මොග්ගල්ලාන සම්ප්‍රදායට අනුව ස්වර 10 කි. අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ වශයෙනි. එය කච්චායන සම්ප්‍රදායෙන් වෙනස් වන්නේ ඒ සහ ඕ යනුවෙන් දීර්ඝ ස්වර දෙකක් දැක්වීම නිසාය.

**පාලි අක්ෂරමාලාව**

බාලාවතාරයට අනුව පාලි භාෂාවට අයත් වන අකුරු සංඛ්‍යාව 41කි. **(අක්ඛරාපාදයො එකචත්තාලීසං)**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | ආ | ඉ | ඊ | උ | ඌ | එ | ඔ |
| ක | ඛ | ග | ඝ | ඞ | | | |
| ච | ඡ | ජ | ඣ | ඤ | | | |
| ට | ඨ | ඩ | ඪ | ණ | | | |
| ත | ථ | ද | ධ | න | | | |
| ප | ඵ | බ | භ | ම | | | |
| ය | ර | ල | ව | ස | හ | ළ | (අ)ං |

**ස්වර 08 (තත්ථොදන්තා සරා අට්ඨ)**

**අ ආ ඉ ඊ උ ඌ එ ඔ**

හ්‍රස්ව හා දීර්ඝ යනුවෙන් ස්වර කොටස් දෙකකට බෙදේ.

| | | |
|---|---|---|
| ලඝු (හ්‍රස්ව) 03 | අ ඉ උ | **ලහුමත්තා තයො රස්සා** |
| ගුරු (දීර්ඝ) 05 | ආ ඊ ඌ එ ඔ | **අඤ්ඤෙ දීඝා** |

**ව්‍යඤ්ජනාක්ෂර**

ඉතිරි වර්ණ සියල්ල ව්‍යඤ්ජන ය. **(සෙසා බ්‍යඤ්ජනා)** හල් අකුරු හෙවත් ව්‍යඤ්ජන තනි ව ශබ්ද කළ නො හැකි ය. ස්වරයක ආධාරය අවශ්‍ය ය. එබඳු ව්‍යඤ්ජනාක්ෂර 33කි. ක යන්නේ පටන් බින්දුව දක්වා ඇති අක්ෂර එයට අයත් වේ.

**වර්ගාක්ෂර 25**

ව්‍යඤ්ජනාක්ෂරවලින් 25ක් වර්ගාක්ෂරයෝ ය. ඒවා 'ක' වර්ගය ආදි ලෙස පහ බැගින් ගෙන මුල ඇති අකුරේ නමින් හැඳින්වේ. එබඳු වර්ග පහකි. එහි අක්ෂර 25 කි. **(වග්ගා පඤ්චපඤ්චසො මන්තා)**

| | | | | | |
|---|---|---|---|---|---|
| ක වග්ග - | ක | ඛ | ග | ඝ | ඞ |
| ච වග්ග - | ච | ඡ | ජ | ඣ | ඤ |
| ට වග්ග - | ට | ඨ | ඩ | ඪ | ණ |
| ත වග්ග - | ත | ථ | ද | ධ | න |
| ප වග්ග - | ප | ඵ | බ | භ | ම |

| අල්පප්‍රාණ (සිථිල) සිථිලං නාම වග්ගෙසු පඨමතතියා (රූපසිද්ධිටීකා) | මහප්‍රාණ (ධනිත) ධනිතං නාම දුතිය චතුත්ථා (රූපසිද්ධිටීකා) |
|---|---|
| අඩු උත්සාහයකින් උච්චාරණය කළ හැකි ය.<br><br>ක ග, ච ජ, ට ඩ, ත ද, ප බ | උච්චාරණයේ දී වැඩි උත්සාහයක් දැරිය යුතු ය.<br><br>ඛ ඝ, ඡ ඣ, ඨ ඪ, ථ ධ, ඵ භ, |

**වර්ගාන්තාක්ෂර 05:-**

වර්ගවල අවසානයට ඇති ඞ ඤ ණ න ම අකුරු වර්ගාන්ත නම් වේ. **නාසික්‍ය** යනු ද මේවාට තවත් නමකි.

**ඊෂත්පෘෂ්ට අක්ෂර:-**

උච්චාරණයේ දී මඳක් උත්පත්ති ස්ථානය ස්පර්ශ ව උත්පත්තිය සිදුවන්නේ ඊෂත්පෘෂ්ට නම් වේ. අන්ත්‍යස්ථ නමින් ද මේවා හැඳින්වේ.

ය ර ල ව යනු යි.

| | |
|---|---|
| **අඝෝෂාක්ෂර 11**<br>**'වග්ගානං පඨමදුතියා සොචාඝොසා'**<br>(වර්ගාක්ෂරවල පළමු හා දෙවන අකුරුත් 'ස' අකුරත් අඝෝෂ ය.) | **ක ඛ ච ඡ ට ඨ ත ථ ප ඵ ස** |
| **ඝෝෂාක්ෂර 21**<br>**'ළන්තාඤ්ඤෙ ඝොසා '**<br>(ළ අන්තකොට ඇති ඉතිරි අකුරු ඝෝෂ ය.) | ග ඝ ඞ ජ ඣ ඤ ඩ ඪ ණ ද ධ න<br>බ භ ම ය ර ල ව හ ළ |

**නිග්ගහීතයː-**

නිග්ගහීතය යනු 'ං' ට (බින්දුව) තවත් නමකි. පූර්ව යුගයන්හි මෙය අකුර උඩ ලියා ඇත. එනිසා බින්දුව සිළුමිණක් බඳුයැයි කියනු ලැබේ.

**"බින්දුචූළාමණාකාරො - නිග්ගහීතන්ති වුච්චති**
**කෙවලස්සාපපයොගත්තා - අකාරොසන්නිධීයතෙ"**

තනි ව ශබ්ද කළ නොහැකි නිසා බින්දුව මුලට 'අ' කාරයක් යොදා උච්චාරණය කරනු ලැබේ. **(අං ඉති නිග්ගහීතං)**

**අකුරු උපදින ස්ථානː-**

සෑම අකුරක් ම උච්චාරණය වනුයේ යම් ස්ථානයක් හෝ කීපයක් ඇසුරු කරගෙන ය. අකුරු උපදින ස්ථාන මෙසේ ය.

| අකුරු උපදින ස්ථාන | උපදින අකුරු | බාලාවතාර නියමය |
|---|---|---|
| උගුර - කණ්ඨ | අ ආ ක ඛ ග ඝ ඞ හ | අකවග්ගහා කණ්ඨජා |
| තල්ල - තාලු | ඉ ඊ ච ඡ ජ ඣ ඤ ය | ඉචවග්ගයා තාලුජා |
| තල්ලේ මුදුන -මුද්ධ | ට ඨ ඩ ඪ ණ ර ළ | ටවග්ගරළා මුද්ධජා |
| දත් - දන්ත | ත ථ ද ධ න ල ස | තවග්ගලසා දන්තජා |
| තොල් - ඔට්ඨ | උ ඌ ප ඵ බ භ ම | උපවග්ගා ඔට්ඨජා |
| නහය - නාසිකා | ඞ ඤ ණ න ම (අ)ං | |
| උගුර හා තල්ල - කණ්ඨ තාලු | එ | එකණ්ඨතාලුජො |
| උගුර හා තොල් - කණ්ඨ ඔට්ඨ | ඔ | ඔකණ්ඨොට්ඨජො |
| දත් හා තොල් - දන්ත ඔට්ඨ | ව | වොදන්තොට්ඨජො |

**විශේෂ**

ඡන්දස් ශාස්ත්‍රයේ දී අක්ෂර භාවිතය වැදගත් වේ. එහි දී අකුරු තුනක් 'ගණ' නමින් හැඳින්වේ. අලංකාර ශාස්ත්‍රයේ දී, විශේෂයෙන් පද්‍ය බන්ධනයේ දී මෙය වැදගත් වේ. එහි දී ලඝු (තනි මාත්‍රාව හෙවත් හ්‍රස්ව) ගුරු (මාත්‍රා දෙකක් හෝ වැඩි ප්‍රමාණයක්) වශයෙන් අකුරු ගණනය කරනු ලැබේ. ස්වර ප්‍රස්ථාර ඇඳීමක් ද මෙහි දී සිදු කෙරේ. එම ස්වර ප්‍රස්ථාර සඳහා යොදාගනු ලබන සංකේත අනුව හ්‍රස්වාක්ෂරය නම් කරනුයේ කෙටි ඉරකිනි. (-) එවන් අකුරු තුනක් ගණයක් ලෙස සැලකේ.

උදා:-

**සරණ** (---) මෙහි ඇත්තේ ලඝු ම අකුරු තුනකි.

ඡන්දස් ලකුණු කිරීමේ දී දීර්ඝාක්ෂරය සඳහා 'ගුරු' යන්න භාවිත කරන අතර එය සලකුණු කරනුයේ වක්‍ර රේඛාවකිනි. (◡)

උදා:-

**ආරාම** (◡◡- )

ඡන්දසේ දී ගුරු අකුරු නියමයන් පහත සඳහන් පරිදි වේ.

- දීර්ඝාක්ෂර ගුරු වේ. **ආචරියා** (◡ - - ◡)
- සංයෝගාක්ෂරයකට පෙර ඇති හ්‍රස්ව අකුර ගුරුකි. **එසනති** ( - ◡ -)
- නිග්ගහීතයට පූර්ව අකුර ගුරුකි. **අච්චුතං පදං** (◡ - ◡ - ◡ )
- ගාථාවක පාදාන්තය ගුරුකි. **ඉමිනා පුඤ්ඤකම්මෙන** (- - ◡◡ - ◡ ◡ ◡)

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් අනුව ස්වර පිළිබඳ වෙනස දක්වන්න.
ii. පහත වචන අකාරාදි පිළිවෙළට ලියන්න.
මාසෙ, රමෙම, ලංකා, සුගතො, උපාගතො, සිරොපරි,
ඨානං, විසොධෙතුං, එකයොජන, ගංගාතීරෙ,
iii. ඝෝෂ හා අඝෝෂ භේදය පැහැදිලි කරන්න.
iv. උප්පත්ති ස්ථාන අනුව වර්ණමාලාව ප්‍රභේදකර දක්වන්න.

2. පහත ගාථා පාඨ නිවැරදි ව ලියන්න.

i. කායොවිගුච්ජො සකලො සුගනෙධා
ii. එතතාවතාච අමෙමහි
iii. එතං කුසුම සනෙතාසිං
iv. ඉච්චිතං පච්චිතං
v. අජ්ජයං කම මෙ හනෙත

3. පහත සූත්‍රවල සිංහල තේරුම ලියන්න.

i. අං ඉති නිගගහීතං
ii. ළනතාඤ්ඤෙ සොසා
iii. වගගානං පඨමදුතියා සොචාසොසා
iv. තතෙථාදනතා සරා අටඨ
v. අකඛරාපාදයො එකචතතාළීසං

4. පහත සඳහන් වචනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කරන්න.

| | | | |
|---|---|---|---|
| අනනො | ---------- | විරත්ථචිත්තා | ---------- |
| බබූව | ---------- | සත්ථා සදාහන්තු | ---------- |
| සුඛිසත්තා | ---------- | සත්තාරො | ---------- |
| සඨසහස්ස | ---------- | පුරිසධම්මසාරති | ---------- |
| විඤ්ඤෙඤාභී'ති. | --------- | විබූසයං | ---------- |

i. සිථිල හා ධනිත අකුරු වෙන වෙන ම ලියන්න.
ii. 'ඉච වගගයා තාලුජා' යනු කුමන අකුරුදැයි ලියන්න.
iii. බින්දුව පුරාණ පොත්වල ලියා ඇති අයුරු දක්වෙන බාලාවතාර ඉගැන්වීම කුමක් ද?
iv. නාසිකාක්‍ෂර ලියා ඒවාට එසේ පවසන්නේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න.
v. ලංකාවේ ජනප්‍රිය වූ පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් දක්වා, ඒවාට අදාළ ප්‍රකට ග්‍රන්ථ ලියා දක්වන්න.

# දුතියො පාඨො

# දානං සග්ගස්ස සොපානං

අම්හාකං භගවති පරිනිබ්බුතෙ පාටලීපුත්තසමීපෙ අඤ්ඤතරස්මිං ගාමෙ අඤ්ඤතරො දුග්ගතමනුස්සො වසති. සො පනෙකදිවසං අඤ්ඤතරං ගාමං ගච්ඡන්තො දෙව සාටකෙ නිවාසෙත්වා මහන්තං අටවිං පාපුණි. තදෙවං දිස්වා එතස්ස වත්ථං ගණ්හිස්සාමීති එකො චොරො අනුබන්ධි. සො දූරතොව ආගච්ඡන්තං චොරං දිස්වා චින්තෙසි. අහමෙතස්මා පලායිතුං වා තෙන සද්ධිං යුජ්ඣිතුං වා න සක්කොමි අයමාගන්ත්වා අවස්සං අනිච්ඡන්තස්සාපි මෙ වත්ථං ගණ්හිස්සති. මයාපිස්ස නිරත්ථකෙන හරිතුං න සක්කා දානවසෙනස්ස දස්සාමීති සන්නිට්ඨානමකාසි. අථ චොරො ආගන්ත්වා වත්ථකං පරාමසි. අථ සො පුරිසො චිත්තං පසාදෙත්වා ඉමං මම වත්ථදානං භවභොගසුඛත්ථාය පච්චයො හොතූති වත්ථං දත්වා දුච්ඡාදිතත්තා මහාමග්ගං පහාය අඤ්ඤෙන ජංඝාමග්ගෙන ගච්ඡන්තො ආසිවිසෙන දට්ඨො කාලං කත්වා හිමවන්තප්පදෙසෙ ද්වාදසයොජනිකෙ කණකවිමානෙ නෙකච්ඡරාසහස්සපරිවුතො නිබ්බත්ති. විමානං පනස්ස පරිවාරෙත්වා තියොජනිකෙ ඨානෙ කප්පරුක්ඛා නිබ්බත්තිංසු. සො මහන්තං දිබ්බසම්පත්තිං දිස්වා සොමනස්සං පවෙදෙන්තො ආහ.

**"පරිණාමිතමත්තෙන, දානස්ස සකසන්තකං,**
**දදාති විපුලං භොගං, දිබ්බමිස්සරියං වරං."**

(රසවාහිනී)

**පදමාලාව**

| | | | |
|---|---|---|---|
| **සොපානං** | (නා) | - | ඉණිමග |
| **අම්හාකං** | (ස නා) | - | අපගේ |
| **භගවති පරිනිබ්බුතෙ** | (භාව සත්තමී) | - | භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි |
| **පාටලීපුත්තසමීපෙ** | (ස) | - | පාටලීපුත්‍ර නගරය සමීපයේ |
| **අඤ්ඤතරො** | (ස නා) | - | එක්තරා |
| **දුග්ගතමනුස්සො** | (ස) | - | දුප්පත් මනුෂ්‍යයෙක් |
| **ගච්ඡන්තො** | (කි) | - | යන්නේ |
| **සාටකෙ** | (නා) | - | සළු |
| **නිවාසෙත්වා** | (පූ ක්‍රි) | - | හැඳ |
| **අටවිං** | (නා) | - | වනයකට |
| **තදෙවං** | (සං) | - | එදා මෙසේ |
| **එතස්ස** | (ස නා) | - | මොහුගේ |
| **ගණ්හිස්සාමී** | (ක්‍රි) | - | ගන්නෙමියි |
| **අනුබන්ධි** | (ක්‍රි) | - | ලුහුබැන්දේ ය |
| **දූරතොව** | (සං) | - | දුරින් ම |

| | | | |
|---|---|---|---|
| ආගචඡනතං | (ක්‍රි) | - | එන්නා වූ |
| අහමෙතසමා | (සං) | - | මම මොහු කෙරෙන් |
| පලායිතුං | (තු) | - | පලායන්නට |
| යුජඣිතුං | (තු) | - | යුද්ධ කරන්නට |
| අයමාගනතවා | (සං) | - | මොහු අවුත් |
| අවසසං | (නි) | - | ඒකාන්තයෙන් |
| අනිචඡනතසසා' පි | (සං) | - | අකමැතිවූයේ නමුත් |
| මයාපිසස | (සං) | - | මා විසින් ද මොහුට |
| නිරතථකෙන | (නා) | - | නිෂ්ඵල වූවෙකු මෙන් |
| හරිතුං | (තුං) | - | ගෙනයන්නට |
| න සකකා | (නි ) | - | නො හැකි ය |
| දානවසෙනසස | (සං) | - | දානයක් වශයෙන් මොහුට |
| සනනිටඨානමකාසි | (සං) | - | තීරණය කළේ ය |
| පරාමසි | (ක්‍රි) | - | අතගෑවේ ය/පරාමර්ශනය කළේ ය |
| භවභොගසුඛතථාය | (ස) | - | භවභෝග සැප පිණිස |
| හොතුති | (සං) | - | වේවා යැයි |
| දුචඡාදිතතතා | (සං) | - | (ශරීරය) මනාව නොවසන ලද බැවින් (නිර්වස්ත්‍ර හෙයින්) |
| මහාමගගං | (ස) | - | ප්‍රධාන මාර්ගය |
| ජංඝාමගෙගන | (ස) | - | අඩි පාරකින් |
| දවාදසයොජනිකෙ | (ස) | - | යොදුන් දොළොසක් |
| කණකවිමානෙ | (ස) | - | රන් විමනෙක |
| නෙකචඡරාසහසසපරිවුතො | (ස) | - | නොයෙක් දහස් ගණනක් දිව්‍ය අප්සරාවන් පිරිවරණ ලද්දේ |
| නිබබතති | (ක්‍රි) | - | ඉපදුණි |
| පරිවාරෙතවා | (පූ.ක්‍රි) | - | පිරිවරා |
| තියොජනිකෙ | (ස) | - | යොදුන් තුනක් වූ |
| කපපරුකඛා | (ස) | - | කල්ප වෘක්ෂයෝ |
| පවෙදෙනෙතා | (ක්‍රි) | - | ප්‍රකාශ කරන්නේ |
| සකසනතකං | (ස) | - | තම සන්තකයේ ඇති |
| දිබබමිසසරියං | (සං) | - | දිව්‍යමය සැප සම්පත් |
| වරං | (නි) | - | උතුම් වූ |

**අභ්‍යාස**

01. ''දානං සග්ගස්ස සොපාණං'' යන ඡේදය සිංහලට නගන්න.

02. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. දුග්ගතමනුස්සො කස්මිං ගාමෙ වසති ?
ii. ගාමං ගච්ඡන්තො සො කිත්තකානි වත්ථානි පාරුපි?
iii. එකො චොරො කිමත්ථාය තං අනුබන්ධි ?
iv. චොරං දිස්වා සො කිං චින්තෙසි ?
v. කාලකතො සො කත්ථ නිබ්බත්ති?

03. පිළිතුරු සපයන්න.

i. පාටලීපුත්‍ර නගරය සම්බන්ධ ඓතිහාසික ශාසනික සිද්ධියක් නම් කරන්න.
ii. බුදුදහම අනුව දුප්පත්ව ඉපදීමට හේතු කවරේද?
iii. බුදුරදුන් වදාළ පරිදි වස්ත්‍ර දුරීමේ ප්‍රයෝජන මොනවා ද ?
iv. අල්ප දෙයක් දන් දී මහේශාක්‍ය සම්පත් විඳි තවත් චරිත දෙකක් නම් කරන්න.
v. මෙම කථා පුවතින් ගතහැකි ජීවිතාදර්ශ දෙකක් ලියන්න.

04. මුල් පාලි ඡේදයේ වාක්‍ය රීතිය අනුගමනය කරමින් පහත ඡේදය පාලියට නගන්න.

පෙර ලක්දිව අනුරාධපුරයේ මහවැව නම් ගමක් විය. එහි වෙසෙන එක්තරා දුප්පත් ගොවියෙක් දිනපතා කුඹුරට යන්නේ බත්මුලක් (භත්තපුටං) රැගෙන යයි. ඉක්බිති එක් දවසක් එක් මගියෙක් (අද්ධිකො) දුර දී ම ඔහු දැක බත්මුල ඉල්ලන්නට ඔහු ලුහුබැන්දේ ය. මොහු අවුත් අනිවාර්යයෙන් මාගේ බත්මුල ඉල්ලන්නේ ය.මම දානයක් ලෙස මොහුට මෙය දෙන්නෙමි'යි සිතී ය. ඉක්බිති ඒ ගොවියා සිත පහදාගෙන මේ දානය සැප පිණිස වේවා'යි දන් දී යන්නේ අතරමග දී සර්පයෙකු විසින් දෂ්ට කරන ලද්දේ කළුරිය කොට දිව්‍ය ලෝකයේ උපන්නේ ය.

**නාමපද**

යම් කෙනෙකු හෝ යම් දෙයක් හෝ යම් ගුණයක් හෝ යම් සිද්ධි මාත්‍රයක් හෝ හැඳින ගැනීම සඳහා යොදනු ලබන සංඥාවන්ට **නාම** යැයි කියනු ලැබේ.

උදා :-

බුද්ධ, මනුස්ස, සෙත, ගච්ඡන්ත, රුක්ඛ

## නාමපද ප්‍රභේද

නාම නාම, සමාස නාම, තද්ධිත නාම, කෘදන්ත නාම යැයි නාම පද පිළිබඳ ප්‍රභේද හතරක් වේ. ඊට අමතරව තවත් විවිධ ප්‍රභේදයන් ද දැකගත හැක. බාලාවතාරයේ නාම පිළිබඳ දක්වා ඇති ප්‍රභේදයන් මෙසේ ය.

| නාමපද ප්‍රභේද | | උදාහරණ |
|---|---|---|
| පුල්ලිංග නාම | | බුද්ධ, නාග, දෙව, මනුස්ස, අත්ත, රාජ, ගුණවන්තු, අග්ගි, දණ්ඩි, හික්ඛු, නත්තු |
| ඉත්ථිලිංග නාම | | කඤ්ඤා, රත්ති, නදී, ජම්බු, මාතු, ධීතු, අජා, එළකා, මාතුලානි, ගොතමී, ගුණවතී, මහන්තී |
| නපුංසකලිංග නාම | | චිත්ත, පුඤ්ඤ, පාප, ඵල, චක්ඛු, වසු, ධනු, මන, සිර, උර, තෙජ, යස, තප, පය, අට්ඨි |
| ද්විලිංග නාම | පුමිත්ථිලිංග (පුරුෂ - ස්ත්‍රී ලිංග ) | කට, සට, යට්ඨි, මුට්ඨි, සින්ධු, රේණු, |
| | පුමනපුංසකලිංග (පුරුෂ නපුංසක ලිංග ) | ධම්ම, කම්ම, කුසුම, සංඝ, පදුම, අස්සම, විහාර, සරීර, සුවණ්ණ, වණ්ණ, කහාපණ, හවන, හුවන, යොබ්බන, ආයන, සයන, ඔදන, ආකාස |
| | ඉත්ථි නපුංසකලිංග (ස්ත්‍රී නපුංසක ලිංග) | නගර, අච්චි |
| සබ්බනාම (සර්ව නාම) | | සබ්බ, කතර, කතම, උහය, අඤ්ඤ, අඤ්ඤතර, පුබ්බ, පර, අපර, දක්ඛිණ, උත්තර, ය, ත, එත, කිං, ඉම, අම්හ, තුම්හ |
| සංඛ්‍යානාම (සංඛ්‍යා ශබ්ද නාම) | | එක, ද්වි, ති, චතු, පංච, අට්ඨාරස |
| අලිංග නාම (මේවා ලිංග භජනය නොකරන නාමපද වේ. මේ සඳහා අව්‍ය තද්ධිතපද යෙදේ) | | සබ්බත්ථ, එත්ථ, කුහිං, සබ්බදා, කත්ථ, කදා, කුදාචනං |

## නාම වරනැඟීම

නාම පදයක මූලික ස්වරූපය ශබ්ද ප්‍රකෘතිය යි. එයට විභක්ති ප්‍රත්‍යය එක් කළ විට නාම පදයක් සාදාගත හැකි ය. එසේ සාදාගනු ලබන නාමපදය විභක්තීන්හි වරනැගිය හැකි ය. බාලාවතාරයේ එම විභක්ති ප්‍රත්‍යය මෙසේ දක්වා ඇත.

**සි යො ඉති පඨමා,**
**අං යො ඉති දුතියා,**
**නා හි ඉති තතියා,**
**ස නං ඉති චතුත්ථී,**
**ස්මා හි ඉති පඤ්චමී,**
**ස නං ඉති ඡට්ඨී,**
**ස්මිං සු ඉති සත්තමී,** ලෙසිනි.

## විභක්ති ප්‍රත්‍යය මාලාව

බාලාවතාරයේ ප්‍රත්‍යය දක්වා ඇත්තේ විභක්ති හතකට පමණි. එහෙත් සාමාන්‍ය වරනැඟීමේ දී විභක්ති නවයක් භාවිත වේ. එහි දී ආලපන හා කරණ යනුවෙන් විභක්ති දෙකක් ගැනේ. ආලපන විභක්ති ප්‍රත්‍යය වන්නේ ප්‍රථමාවේ ප්‍රත්‍යයන් ම ය. කරණ විභක්ති ප්‍රත්‍යය වන්නේ තතියා විභක්ති ප්‍රත්‍යයන් ම ය. ඒ අනුව විභක්ති නවයේ ප්‍රත්‍යය මෙසේ ය.

| විභක්ති | එකවචන | බහුවචන | බාලාවතාර සූත්‍රය | අර්ථය |
|---|---|---|---|---|
| පඨමා | සි (ඔ) | යො (ආ) | ලිංගත්ථෙ පඨමා | ලිංගාර්ථය |
| ආලපන | සි (අ, ආ) | යො (ආ) | ආලපනෙ ච | ආලපනාර්ථය |
| දුතියා | අං (අං) | යො (එ) | කම්මත්ථෙ දුතියා | කර්මාර්ථය |
| තතියා | නා (එන) | හි (එහි, එභි) | කත්තරි ච | කර්තෘ අර්ථය |
| කරණ | නා (එන) | හි (එහි, එභි) | කරණෙ තතියා | කරණ අර්ථය |
| චතුත්ථී | ස (ආය, අස්ස) | නං (ආනං) | සම්පදානෙ චතුත්ථී | සම්ප්‍රදාන අර්ථය |
| පඤ්චමී | ස්මා (ම්හා,ස්මා) | හි (එහි, එභි) | අපාදානෙ පඤ්චමී | වෙන්වීමේ අර්ථය |
| ඡට්ඨී | ස (ස්ස) | නං (ආනං) | සාමිස්මිං ඡට්ඨී | ස්වාමිත්ව අර්ථය |
| සත්තමී | ස්මිං (ම්හි, ස්මිං) | සු (එසු) | ඔකාසෙ සත්තමී | ආධාර අර්ථය |

විභක්ති ප්‍රත්‍යය යොදා නාමපදයක් සාදාගන්නා ආකාරය මෙසේ ය.

බුද්ධ + සි - තතො ච විභත්තියො
බුද්ධ් +අ + සි - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ
බුද්ධ් + ඔ - සො
බුද්ධ් + ඔ - සරලොපො මාදෙසපපච්චයාදිම්හි සරලොපෙ තු පකති
බුද්ධො - නයෙ පරං යුත්තෙ

බුද්ධ + යො - තතො ච විභත්තියො
බුද්ධ් +අ + යො- පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ
බුද්ධ් +අ +ආ - සබ්බයොනීන මා ඒ
බුද්ධ් +ආ - සරලොපො මාදෙසප්පච්චයාදිම්හි සරලොපෙ තු පකති
බුද්ධා - නයෙ පරං යුත්තෙ

මේ අයුරින් නාමපද සාධනයේ දී විභක්ති ප්‍රත්‍යයන්ට ආදේශ සිදුවන ආකාරය බාලාවතාරයේ නාම කාණ්ඩයේ දක්වා ඇත.

## උකාරන්ත ගුණවන්තු සද්දා - පුල්ලිංග

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | ගුණවා, ගුණවන්තො (ගුණවතා) | ගුණවන්තො, ගුණවන්තා (ගුණවත්හු) |
| ආලපන | (භෙ) ගුණවං, ගුණව, ගුණවා | (භවන්තො) ගුණවන්තො, ගුණවන්තා, (පිංවත් ගුණවතුනි) |
| දුතියා | ගුණවන්තං (ගුණවතා) | ගුණවන්තෙ (ගුණවතුන්) |
| තතියා | ගුණවතා, ගුණවන්තෙන (ගුණවතා විසින්) | ගුණවන්තෙහි, ගුණවන්තෙභි (ගුණවතුන් විසින්) |
| කරණ | ගුණවතා, ගුණවන්තෙන (ගුණවතා කරණකොට) | ගුණවන්තෙහි, ගුණවන්තෙභි (ගුණවතුන් කරණකොට) |
| චතුත්ථී | ගුණවතො, ගුණවන්තස්ස (ගුණවතාට) | ගුණවතං, ගුණවන්තානං (ගුණවතුන්ට) |
| පඤ්චමී | ගුණවතා, ගුණවන්තම්හා, ගුණවන්තස්මා (ගුණවතාගෙන්) | ගුණවන්තෙහි, ගුණවන්තෙභි (ගුණවතුන්ගෙන්) |
| ඡට්ඨී | ගුණවතො, ගුණවන්තස්ස (ගුණවතාගේ) | ගුණවතං, ගුණවන්තානං (ගුණවතුන්ගේ) |
| සත්තමී | ගුණවති, ගුණවන්තෙ, ගුණවන්තම්හි, ගුණවන්තස්මිං (ගුණවතා කෙරෙහි) | ගුණවන්තෙසු (ගුණවතුන් කෙරෙහි) |

## ඉත්ථිලිඞ්ග

| විභත්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | ගුණවතී | ගුණවන්තී, ගුණවන්තියො |
| ආලපන | (භොති) ගුණවතී | (භොතියා) ගුණවන්තියො |
| දුතියා | ගුණවන්තිං | ගුණවන්තී, ගුණවන්තියො |
| තතියා | ගුණවන්තියා | ගුණවන්තීභි, ගුණවන්තීහි |
| කරණ | ගුණවන්තියා | ගුණවන්තීභි, ගුණවන්තීහි |
| චතුත්ථී | ගුණවන්තියා | ගුණවන්තීනං |
| පඤ්චමී | ගුණවන්තියා | ගුණවන්තීභි, ගුණවන්තීහි |
| ඡට්ඨී | ගුණවන්තියා | ගුණවන්තීනං |
| සත්තමී | ගුණවන්තියං, ගුණවන්තියා | ගුණවන්තීසු |

## නපුංසකලිඞ්ග

| විභත්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | ගුණවං | ගුණවන්තා, ගුණවන්තානි |
| ආලපන | (හෙ) ගුණවං, ගුණව, ගුණවා | ගුණවන්තා, ගුණවන්තානි |
| දුතියා | ගුණවන්තං | ගුණවන්තෙ, ගුණවන්තානි |
| තතියා | ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙභි, ගුණවන්තෙහි |
| කරණ | ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙභි, ගුණවන්තෙහි |
| චතුත්ථී | ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| පඤ්චමී | ගුණවතා, ගුණවන්තම්හා, ගුණවන්තස්මා | ගුණවන්තෙභි, ගුණවන්තෙහි |
| ඡට්ඨී | ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| සත්තමී | ගුණවති, ගුණවන්තෙ, ගුණවන්තම්හි, ගුණවන්තස්මිං | ගුණවන්තෙසු |

**මඝවා** - ශක්‍රයා
**ඵලවා** - ඵල ඇත්තා
**ධනවා** - ධනවතා
**භගවා** - භාග්‍ය ඇත්තා
**බලවා** - බල ඇත්තා
**පඤ්ඤවා** - නුවණ ඇත්තා
**ධිතිමා** - ධෛර්ය ඇත්තා
**මුතිමා** - ප්‍රඥාව ඇත්තා
**ජුතිමා** - ශෝභා ඇත්තා
**ථුතිමා** - ස්තුති කරන්නා
**යතිමා** - තපස් ඇත්තා
**කලිමා** - කිලිටු ඇත්තා
**කසිමා** - සීසෑම් ඇත්තා
**බුද්ධිමා** - බුද්ධිමතා
**බන්ධුමා** - නෑයන් ඇත්තා
**සෙතුමා** - හේදඬු ඇත්තා
**රාහුමා** - රාහු
**ඛාණුමා** - කණු ඇත්තා
**කුලවා** - කුලවතා
**යසවා** - කීර්ති ඇත්තා
**සුතවා** - ඇසූතැන් ඇත්තා
**හිමවා** - හිම ඇත්තා
**සීලවා** - සිල් ඇත්තා
**සතිමා** - සිහි ඇත්තා
**ගතිමා** - ගමන් ඇත්තා
**මතිමා** - නුවණ ඇත්තා
**හිරිමා** - ලජ්ජා ඇත්තා
**රතිමා** - ඇලුම් ඇත්තා
**සුචිමා** - පිරිසිදුකම ඇත්තා
**බලිමා** - බිලි ඇත්තා
**රුචිමා** - කැමැත්ත ඇත්තා
**චක්ඛුමා** - ඇස් ඇත්තා
**හෙතුමා** - කාරණ ඇත්තා
**කෙතුමා** - කොඩි ඇත්තා
**භානුමා** - රශ්මි ඇත්තා
**විජ්ජුමා** - විදුලි ඇත්තා

යනාදී ශබ්ද ගුණවන්තු ශබ්දය මෙන් වරනැගේ.

ඒ ඒ පද පඨමා ආදී විභක්තිවල යෙදෙන ආකාරය පහත දැක්වේ. කළු අකුරින් මුද්‍රිත පද අදාළ විභක්තිය නියෝජනය කරයි.

| විභත්තිය | විස්තරය | උදාහරණය |
|---|---|---|
| **පඨමා** | වාක්‍යයක උක්ත පදය තබනුයේ පඨමා විභක්තියෙනි. ලිංගාර්ථයේ ද යෙදේ. | **බුද්ධො** ධම්මං භාසති.<br>සාමණෙරෙන **පාඨො** පඨීයතෙ. |
| **ආලපන** | ආමන්ත්‍රණ අර්ථය යෙදේ. | හෙ **කුමාර** උට්ඨාහි.<br>හෙ **පුරිස** ගච්ඡ. |
| **දුතියා** | වාක්‍යයක ක්‍රියාවට යටත්වන පදය හෙවත් කර්ම පදය දුතියාවෙන් යෙදේ. | දාසො **ඔදනං** පචති.<br>පුරිසො **රුක්ඛං** ඡින්දති. |
| **තතියා** | කර්තෘ අර්ථය යොදනුයේ තතියාවෙනි. කර්මකාරක වාක්‍යවල දී මෙය යෙදේ. | **උපාසකෙන** පදීපො ජාලීයතෙ.<br>**කස්සකෙහි** ඛෙත්තානි කසීයන්තෙ. |

| | | |
|---|---|---|
| **කරණ** | කරණාර්ථය ප්‍රකාශ කරනුයේ කරණ විභක්තියෙනි. | සිස්සා **ලේඛනියා** ලිඛති.<br>අහං **පාදේහි** ගච්ඡාමි. |
| **චතුත්ථී** | යම් දෙයක් කැමැත්තෙන් ප්‍රදානය කිරීමේ දී එය ලබන්නා තබනුයේ චතුත්ථී විභක්තියෙනි. | උපාසකො **භික්ඛුස්ස** දානං දෙති.<br>චාගී **යාචකස්ස** ධනං දෙති. |
| **පඤ්චමී** | වෙන්වීමේ අර්ථය ප්‍රකාශ කරනුයේ පඤ්චමී විභක්තියෙනි. | ඵලං **රුක්ඛම්හා** පතති.<br>වනිතායො **වනම්හා** දාරුං ආහරන්ති. |
| **ඡට්ඨී** | යමක අයිතිය ප්‍රකාශ කරනුයේ ඡට්ඨී විභක්තියෙනි. | **බුද්ධස්ස** සාවකා සප්පුරිසා හොන්ති.<br>**දාරකස්ස** මාතා ආහාරං ආහරති. |
| **සත්තමී** | ක්‍රියාව සිදුවීමට ආධාර වන තැන යොදනුයේ සත්තමී විභක්තියෙනි. | සාමණෙරා **පරිවෙණෙ** උග්ගණ්හන්ති.<br>ගාමවාසී භික්ඛු **ආරාමෙ** වසති. |

## විශේෂණ පද

භාෂා ව්‍යවහාරයේ දී නාමපදයක් මුලට විශේෂණ පද යොදා ලිවීමට හා කථා කිරීමට සිදු වේ. එහි දී විශේෂණ පද හා විශේෂ්‍ය පද යනුවෙන් දෙකක් ඇත. යම් පදයක් විස්තර කරන පද **විශේෂණ පද** නම් වේ. මෙහි දක්වූ **ගුණවන්තු** ආදී ශබ්දත් **ගච්ඡන්ත** ආදී ශබ්දත් සර්වනාම ශබ්දත් බොහෝ විට විශේෂණ පද වශයෙන් යෙදේ. පාලි රීතියට අනුව විශේෂණ විශේෂ්‍ය පද හැම විට ම ලිඞ්ගයෙන්, විභක්තියෙන් හා වචනයෙන් සමාන විය යුතු ය.

| පුල්ලිඞ්ග | ඉත්ථිලිඞ්ග | නපුංසකලිඞ්ග |
|---|---|---|
| ගච්ඡන්තො පුරිසො | ගච්ඡන්තියො වනිතායො | රත්තං වත්ථං |
| ධාවන්තා බාලකා | ධාවන්තී බාලිකා | පතිතානි ඵලානි |
| ලිඛන්තං ලේඛකං | ලිඛන්තී ලේඛිකායො | ධාවන්තං රථං |

විශේෂණ පද වාක්‍යවල යෙදෙන අයුරු පහතින් දැක්වේ.

**පුල්ලිඞ්ග :-**
**සො ගච්ඡන්තො පුරිසො** මුහුත්තං නිවත්තති.
(ඒ ගමන්කරන පුරුෂයා මොහොතක් නැවතී සිටියි.)

**ඉත්ථිලිඞ්ග :-**
**සා ගච්ඡන්ති වනිතා** අත්තනො ගෙහං ගච්ඡති.
(ඒ යන්නා වූ වනිතාව තමන්ගේ නිවසට යන්නීය.)

**නපුංසකලිඞ්ග :-**
**තං පතිතං ඵලං** අම්බං.
(ඒ වැටුණු ගෙඩිය අඹ ය.)

**අභ්‍යාස**

01. සිංහලට නගන්න.

i. සුද්ධොදනමහාරාජා කපිලවත්ථුපුරෙ වසි.
ii. මහාමායාදේවී කාලං කත්වා තුසිතපුරෙ නිබ්බත්ති.
iii. රාහුලකුමාරො දහරකාලෙයෙව අරහත්තං පාපුණි.
iv. සිද්ධත්ථකුමාරො ඡ වස්සං දුක්කරකිරියං අකාසි.
v. භගවා බාරාණසියං ඉසිපතනෙ අනුත්තරං ධම්මචක්කං පවත්තෙසි.

02. සිංහලට නගන්න.

i. භගවා පඤ්ඤාවන්තානං ධම්මං දෙසෙසි.
ii. සුතවා අරියසාවකො සීලවන්තීනං උපාසිකානං අභිධම්මකථං කථෙසි.
iii. බන්ධුමා යසවන්තං සෙට්ඨිං උපසංකමිත්වා ධීතරං යාචි.
iv. ථාමවන්තා කුමාරා ඵලවන්තං රුක්ඛං ආරුහිංසු.
v. බලවා පුරිසො වෙගෙන ගන්ත්වා ධජං ගණ්හි.

03. පහත නාම පදයන්හි විභක්තිය හා වචනය ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. භගවති | ii. අඤ්ඤතරස්මිං | iii. ගච්ඡන්තානං | iv. අටවිං |
| v. වත්ථං | vi. අහං | vii. චිත්තෙන | viii. අඤ්ඤෙන |
| ix. මග්ගෙන | x. විමානෙ | | |

04. ධනවන්තු ශබ්දය පුල්ලිංගයේ සියලු විභක්තිවල වරනගා අර්ථය ද ලියන්න.

05. පිළිතුරු සපයන්න.

i. පුම්ත්‍රීලිංග ශබ්ද 5ක් නම් කරන්න.
ii. ප්‍රශ්නවාචී සර්වනාම තුනක් නම් කරන්න.
iii. ඉත්‍ථීලිංග නාම 5ක් නම් කරන්න.
iv. 'සබ්බයොනීන මා එ' සූත්‍රයේ අර්ථය ලියා උදාහරණ දෙන්න.
v. ගුණවන්තු ශබ්දය මෙන් වරනැගෙන ශබ්ද 5ක් නම් කරන්න.

**තතියො පාඨො**

# රත්තක්ඛදමනො

සො යක්ඛො මතමතෙ නිරාසඞ්කො ඛාදති. තං යක්ඛං අදිස්වාපි යෙ යෙ නරා තෙන රොගෙනාතුරා තෙ පස්සන්ති, තෙපි සො රොගො ආවිසති. එවං නචිරෙනෙව යක්ඛභයෙන රොගෙන ච ජනපදො විරලජනො ජාතො. රාජා තං පවත්තිං සුත්වා මයි රජ්ජං කාරෙන්තෙ පජානං ඊදිසස්ස භයස්ස උප්පජ්ජනං අනනුච්ඡවිකන්ති මඤ්ඤමානො තදහෙව අට්ඨංගසීලං සමාදියිත්වා අත්තනා නිච්චං කරියමානානි දසකුසලකම්මානි අනුස්සරිත්වා අහං ධම්මවිජයී භවිස්සාමීති තං රක්ඛසං අදිස්වා න උට්ඨහිස්සාමීති දළ්හතරං අධිට්ඨාය වාසගබ්භෙ සයි. තස්ස තෙන ආචාරධම්මතෙජෙන රාජානුභාවෙන ච සො රක්ඛසො සන්තත්තො උත්තසිත්වා ඛණම්පි ඨාතුං අසහන්තො ආකාසෙනාගන්ත්වා බලවපච්චූසසමයෙ අන්තොගබ්භං පවිසිතුමසක්කොන්තො බාහිරෙ ඨත්වා රඤ්ඤො අත්තානං දස්සෙසි. රඤ්ඤා ච කොසි ත්වන්ති පුට්ඨො ආහ. රත්තක්ඛො නාමාහං රක්ඛසො දූරජනපදෙ ඨිතො අස්මි, අහං ඛණම්පි ඨාතුං අසක්කොන්තො තවානුභාවෙන බද්ධො විය හුත්වා ඉධානීතො, භායාමි දෙව තව දස්සනෙති.

(හත්ථවනගල්ලවිහාරවංස)

| | | | |
|---|---|---|---|
| මතමතෙ | (කි) | - | මැරුණු මැරුණු අය |
| නිරාසඞ්කො | (ස) | - | සැක රහිත ව |
| අදිස්වාපි | (සං) | - | නොදැක ම |
| ආවිසති | (ක්‍රි) | - | වැළඳගනී |
| නචිරෙනෙව | (සං) | - | නොබෝ දිනකින් ම |
| විරලජනො | (ස) | - | ජනයා විරල වූවක් |
| මයි රජ්ජං කාරෙන්තෙ | (භාවසත්තමී) | - | මා රජ කරන කල්හි |
| පජානං | (නා) | - | ප්‍රජාවට |
| ඊදිසස්ස | (නි) | - | මෙබඳු |
| මඤ්ඤමානො | (කි) | - | හඟිමින් |
| තදහෙව | (සං) | - | එදින ම |
| සමාදියිත්වා | (පූ.ක්‍රි.) | - | සමාදන් වී |
| දසකුසලකම්මානි | (ස) | - | දශකුශලකර්ම |
| අනුස්සරිත්වා | (පූ.ක්‍රි.) | - | සිහිකොට |
| ධම්මවිජයී | (ස) | - | ධර්මයෙන් ජයගත් තැනැත්තෙක් |
| දළ්හතරං | (ත) | - | දැඩිලෙස |
| අනනුච්ඡවිකං | (ස) | - | නුසුදුසු |
| වාසගබ්භෙ | (ස) | - | යහන්ගැබ |
| ආචාරධම්මතෙජෙන | (ස) | - | ආචාර ධර්ම තේජසින් |

| | | | |
|---|---|---|---|
| සනතතෙතා | (කි) | - | තැවුණේ |
| උත්‍රසිත්වා | (පූ.ක්‍රි.) | - | තැතිගෙන |
| ඛණමපි | (සං) | - | මොහොතක්වත් |
| ඨාතුං | (තුං) | - | සිටීමට |
| අසහනෙතා | (කි) | - | නොහැක්කේ |
| බලවපච්චුසසමයෙ | (ස) | - | උදෑසන ම |
| අනෙතාගබ්භං | (ස) | - | ගෙය තුළට |
| අසක්කොනෙතා | (කි) | - | නො හැක්කේ |
| පුටෙඨා | (කි) | - | විමසන ලද්දේ |
| දූරජනපදෙ | (ස) | - | දුර ජනපදයක |
| ඨිතො | (කි) | - | සිටියේ |
| තවානුභාවෙන | (සං) | - | ඔබගේ අනුහසින් |
| බද්ධො | (කි) | - | බැඳුනේ |
| ඉධානීතො | (සං) | - | මෙහි පමුණුවන ලද්දේ |

**අභ්‍යාස**

01. ''රත්‍තකබද්මනො'' යන ඡේදය සිංහලට නගන්න.

02. පහත ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො දළ්හතරං අධිට්ඨාය වාසගබ්භෙ සයි ?
ii. කො අනෙතාගබ්භං පවිසිතුමසක්කොනෙතා බාහිරෙ අට්ඨාසි ?
iii. යක්ඛො කානි අබාදි ?
iv. කො දූරජනපදෙ ඨිතො ?
v. යක්ඛො කස්මිං සමයෙ රාජගෙහං පාවිසි ?

03. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ජනපදය ජනශූන්‍ය වූයේ කුමක් නිසා ද ?
ii. දශකුශල කර්මපථ මොනවා ද ?
iii. රජු යක්ෂබිය දුරුකිරීම සඳහා කුමක් කළේ ද?
iv. රකුසා බියට පත්වූයේ කුමක් නිසා ද?
v. තුන් බිය නම් කරන්න.

## නාම වරනැගීම II

### ලිංගත්‍රයේ වරනැගීම.

පාලි භාෂාව තුළ නාම කාණ්ඩය විශේෂ තැනක් හිමිකර ගනියි. නාම යනු ශබ්දයන්ගේ මුල් ස්වභාවය හෙවත් ශබ්ද ප්‍රකෘතිය යි. එම නාම ප්‍රකෘතියට විභක්ති ප්‍රත්‍යය එක් කළ විට විභක්ති අර්ථයන්ට අනුව නාම පද නිපද වේ.

| | ශබ්ද ප්‍රකෘතිය | විභක්ති ප්‍රත්‍ය | | වරනැගීම | |
|---|---|---|---|---|---|
| | | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| **පඨමා** | බුද්ධ | සි (ඔ) | යො (ආ) | බුද්ධො | බුද්ධා |
| **ආලපන** | බුද්ධ | සි (අ , ආ) | යො (ආ) | (හෙ) බුද්ධ | (භවන්තො) බුද්ධා |
| **දුතියා** | බුද්ධ | අං (අං) | යො (එ) | බුද්ධං | බුද්ධෙ |
| **තතියා** | බුද්ධ | නා (එන) | හි (එහි, එභි) | බුද්ධෙන | බුද්ධෙහි, බුද්ධෙභි |
| **කරණ** | බුද්ධ | නා (එන) | හි (එහි, එභි) | බුද්ධෙන | බුද්ධෙහි, බුද්ධෙභි |
| **චතුත්ථි** | බුද්ධ | ස (ආය, ස්ස) | නං (ආනං) | බුද්ධාය, බුද්ධස්ස | බුද්ධානං |
| **පඤ්චමී** | බුද්ධ | ස්මා (මහා) | හි (එහි, එභි) | බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා | බුද්ධෙහි, බුද්ධෙභි |
| **ඡට්ඨී** | බුද්ධ | ස (ස්ස) | නං (ආනං) | බුද්ධස්ස | බුද්ධානං |
| **සත්තමී** | බුද්ධ | ස්මිං (ම්හි, ස්මිං) | සු (එසු) | බුද්ධෙ, බුද්ධම්හි බුද්ධස්මිං | බුද්ධෙසු |

මේ ආකාරයට ඕනෑම ශබ්ද ප්‍රකෘතියක් විභක්ති ප්‍රත්‍යය ගන්වා වරනැගිය හැකි ය. එහි දී ඒ ඒ ශබ්ද ප්‍රකෘතිවලට අනුව විභක්ති ප්‍රත්‍යයන්ට විශේෂ ආදේශ ආගමාදිය වේ.

නාමය හා නාමපදය අතර වෙනසක් ඇත. නාම යනු ධාතු ප්‍රත්‍යය විභක්තිවලින් තොර ශබ්දයන්ගේ මුල් ස්වභාවය හෙවත් ශබ්දප්‍රකෘතිය යි. ඒවායේ අර්ථයක් වේ. විභක්ති ප්‍රත්‍යයන්ගෙන් ලිංග භේදයෙන් යුතු ව ඒකවචන බහුවචන පද සාදාගත හැකි ය. ඒවා අර්ථයෙන් සම්පූර්ණ වූ නාමපද නම් වේ.

### නාම ප්‍රභේද

නාම කොටස් හයකි.

නාම නාම - (රාජ, අත්ත, පුරිස, ලොක, චිත්ත)
සබ්බ නාම - (සබ්බ, කතර, කතම, අඤ්ඤතර)
ගුණ නාම - (සෙත, දීඝ, ආදී, කල්‍යාණ)
ද්‍රව්‍ය නාම - (මඤ්ච, පීඨ, බෙලමලල)
ක්‍රියා නාම - (ගච්ඡන්ත, ඔලොකෙන්ත, නිසීදන්ත)
සඤ්ඤා නාම - (බිම්බිසාර, සුදෙධාදන, කොසල)

නාම ප්‍රභේදගත කිරීමේ දී ලිංග, විභක්ති, ගුණ, සඞ්ඛ්‍යා, ද්‍රව්‍ය, ක්‍රියා ආදිය ඇසුරු කරගනී. භාෂාවේ ඇති සියලු ම නාමපදයෝ ලිංග භේදය අනුව වර්ගකර ඇත. පාලි භාෂාවේ ලිංග තුනකි. ඒ ඒ ලිංගයන්ට අයත් නාමයන් විශේෂ වරනැගීම් සහිත ශබ්ද පහත වගුවෙහි දක්වේ.

| පුලලිංග (නාම) | ඉත්ථිලිංග (නාම) | නපුංසකලිංග (නාම) |
|---|---|---|
| බුද්ධ (අකාරන්ත) | කඤ්ඤා (ආකාරන්ත) | චිත්ත (අකාරන්ත) |
| අත්ත (අකාරන්ත) | රත්ති (ඉකාරන්ත) | මන (අකාරන්ත) |
| රාජ (අකාරන්ත) | නදී (ඊකාරන්ත) | ගුණවන්තු (උකාරන්ත) |
| ගුණවන්තු (උකාරන්ත) | යාගු (උකාරන්ත) | ගච්ඡන්ත (අකාරන්ත) |
| ගච්ඡන්ත (අකාරන්ත) | මාතු (උකාරන්ත) | අට්ඨි (ඉකාරන්ත) |
| අග්ගි (ඉකාරන්ත) | ධීතු (උකාරන්ත) | දණ්ඩී (ඊකාරන්ත) |
| ආදි (ඉකාරන්ත) | දුහිතු (උකාරන්ත) | ආයු (උකාරන්ත) |
| දණ්ඩී (ඊකාරාන්ත) | ජම්බු (උකාරාන්ත) | |
| භික්ඛු (උකාරාන්ත) | මාතුලානී (ඊකාරාන්ත) | |
| ජන්තු (උකාරාන්ත) | භොති (ඉකාරාන්ත) | |
| සත්ථු (උකාරාන්ත) | ගහපතිනී (ඊකාරාන්ත) | |
| නත්තු (උකාරාන්ත) | මෙධාවිනී (ඊකාරාන්ත) | |
| පිතු (අකාරාන්ත) | ධම්මචාරිනී (ඊකාරාන්ත) | |
| අභිභූ (ඌකාරාන්ත) | | |
| සබ්බඤ්ඤූ (ඌකාරාන්ත) | | |
| ගො (ඔකාරාන්ත) | | |

## ශබ්ද වරනැගීම

### අකාරාන්තපුල්ලිංගො ගච්ඡන්තසද්දො

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| **පඨමා** | ගච්ඡං, ගච්ඡන්තො | ගච්ඡන්තො, ගච්ඡන්තා |
| **ආලපන** | (හෙ) ගච්ඡං, ගච්ඡා | (භවන්තො) ගච්ඡන්තො, ගච්ඡන්තා |
| **දුතියා** | ගච්ඡන්තං | ගච්ඡන්තෙ |
| **තතියා** | ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙහි |
| **කරණ** | ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙහි |
| **චතුත්ථී** | ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| **පඤ්චමී** | ගච්ඡතා, ගච්ඡන්තම්හා ගච්ඡන්තස්මා | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙහි |
| **ඡට්ඨී** | ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං , ගච්ඡන්තානං |
| **සත්තමී** | ගච්ඡති, ගච්ඡන්තෙ, ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං | ගච්ඡන්තෙසු |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

### අකාරන්ත සබ්බනාමිනො තසද්දා පුමෙ

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | සො | තෙ,නෙ |
| දුතියා | තං, නං | තෙ, නෙ |
| තතියා | තෙන, නෙන | තෙහි, තෙභි, නෙහි, නෙභි |
| කරණ | තෙන, නෙන | තෙහි, තෙභි, නෙහි, නෙභි |
| චතුත්ථී | තස්ස, නස්ස | තෙසං, තෙසානං, නෙසං, නෙසානං |
| පඤ්චමී | තම්හා, තස්මා, නම්හා, නස්මා | තෙහි, තෙභි, නෙහි, නෙභි |
| ඡට්ඨී | තස්ස, නස්ස | තෙසං, තෙසානං, නෙසං, නෙසානං |
| සත්තමී | තම්හි, තස්මිං, නම්හි, නස්මිං | තෙසු, නෙසු |

### ඉත්ථියං

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | සා | තා, තායො, නා, නායො |
| දුතියා | තං, නං | තා, තායො, නා, නායො |
| තතියා | තාය, නාය | තාහි, තාභි, නාහි, නාභි |
| කරණ | තාය, නාය | තාහි, තාභි, නාහි, නාභි |
| චතුත්ථී | තිස්සා, තිස්සාය, තස්සා, තාය, නාය | තාසං, තාසානං, නාසං, නාසානං |
| පඤ්චමී | තාය, නාය | තාහි, තාභි, නාහි, නාභි |
| ඡට්ඨී | තිස්සා, තිස්සාය, තස්සා, තාය, නාය | තාසං, තාසානං, නාසං, නාසානං, |
| සත්තමී | තිස්සං, තස්සං, නායං, තායං | තාසු, නාසු |

### නපුංසකෙ

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | තං, නං | තෙ, තානි, නෙ, නානි |
| දුතියා | තං, නං | තෙ, තානි, නෙ, නානි |
| තතියා | තෙන, නෙන | තෙහි, තෙහි, නෙහි, නෙහි |
| කරණ | තෙන, නෙන | තෙහි, තෙහි, නෙහි, නෙහි |
| චතුත්ථි | තස්ස, නස්ස | තෙසං, තෙසානං, නෙසං, නෙසානං |
| පඤ්චමී | තම්හා, තස්මා, නම්හා, නස්මා | තෙහි, තෙහි, නෙහි, නෙහි |
| ඡට්ඨී | තස්ස, නස්ස | තෙසං, තෙසානං, නෙසං, නෙසානං |
| සත්තමී | තම්හි, තස්මිං, නම්හි, නස්මිං | තෙසු, නෙසු |

### අකාරාන්ත - සබ්බනාමිනො එත - සද්දො පුමෙ

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | එසො | එතෙ |
| දුතියා | එතං, එනං | එතෙ |
| තතියා | එතෙන | එතෙහි, එතෙහි |
| කරණ | එතෙන | එතෙහි, එතෙහි |
| චතුත්ථි | එතස්ස | එතෙසං, එතෙසානං |
| පඤ්චමී | එතම්හා, එතස්මා | එතෙහි, එතෙහි |
| ඡට්ඨී | එතස්ස | එතෙසං, එතෙසානං |
| සත්තමී | එතම්හි, එතස්මිං | එතෙසු |

### ඉත්ථියං

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | එසා | එතා, එතායො |
| දුතියා | එතං, එනං | එතා, එතායො |
| තතියා | එතාය | එතාහි, එතාහි |
| කරණ | එතාය | එතාහි, එතාහි |
| චතුත්ථි | එතිස්සාය, එතිස්සා, එතාය | එතාසං, එතාසානං |
| පඤ්චමී | එතාය | එතාහි, එතාහි |
| ඡට්ඨී | එතිස්සාය, එතිස්සා, එතාය | එතාසං, එතාසානං |
| සත්තමී | එතිස්සං, එතස්සං, එතායං, එතාය | එතාසු |


නොමිලේ බෙදා හැරීම පිණිසයි

## නපුංසකෙ

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | එතං | එතෙ, එතානි |
| දුතියා | එතං | එතෙ, එතානි |
| තතියා | එතෙන | එතෙභි, එතෙහි |
| කරණ | එතෙන | එතෙභි, එතෙහි |
| චතුත්ථී | එතස්ස | එතෙසං, එතෙසානං |
| පඤ්චමී | එතම්හා, එතස්මා | එතෙභි, එතෙහි |
| ඡට්ඨී | එතස්ස | එතෙසං, එතෙසානං |
| සත්තමී | එතම්හි, එතස්මිං | එතෙසු |

## සබ්බනාමිනො පුල්ලිංගො ඉම - සද්දො

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | අයං | ඉමෙ |
| දුතියා | ඉමං | ඉමෙ |
| තතියා | අනෙන, ඉමිනා | එභි, එහි, ඉමෙභි, ඉමෙහි |
| කරණ | අනෙන, ඉමිනා | එභි, එහි, ඉමෙභි, ඉමෙහි |
| චතුත්ථී | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| පඤ්චමී | අස්මා, අම්හා, ඉමම්හා, ඉමස්මා | එභි, එහි, ඉමෙභි, ඉමෙහි |
| ඡට්ඨී | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| සත්තමී | අස්මිං, අම්හි, ඉමම්හි, ඉමස්මිං | එසු, ඉමෙසු |

## ඉත්ථියං

| විභත්තියො | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | අයං | ඉමා, ඉමායො |
| දුතියා | ඉමං | ඉමා, ඉමායො |
| තතියා | ඉමාය | ඉමාභි, ඉමාහි |
| කරණ | ඉමාය | ඉමාභි, ඉමාහි |
| චතුත්ථී | අස්සාය, අස්සා, ඉමිස්සාය, ඉමිස්සා, ඉමාය | ඉමාසං, ඉමාසානං |
| පඤ්චමී | ඉමාය | ඉමාභි, ඉමාහි |
| ඡට්ඨී | අස්සාය, අස්සා, ඉමිස්සාය, ඉමිස්සා, ඉමාය | ඉමාසං, ඉමාසානං |
| සත්තමී | අස්සං, ඉමිස්සං, ඉමායං | ඉමාසු |

## නපුංසකලිංගො

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | ඉදං, ඉමං | ඉමෙ, ඉමානි |
| දුතියා | ඉදං, ඉමං | ඉමෙ, ඉමානි |
| තතියා | අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| කරණ | අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| චතුත්ථි | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| පඤ්චමී | අස්මා, අම්හා, ඉමම්හා, ඉමස්මා, | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| ඡට්ඨි | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසනං |
| සත්තමී | අස්මිං, අම්හි, ඉමම්හි, ඉමස්මිං | එසු, ඉමෙසු |

## සබ්බනාමිනො පුල්ලිංගො කිං - සද්දා

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | කො | කෙ |
| දුතියා | කං | කෙ |
| තතියා | කෙන | කෙහි, කෙභි |
| කරණ | කෙන | කෙහි, කෙභි |
| චතුත්ථි | කස්ස, කිස්ස | කෙසං, කෙසානං |
| පඤ්චමී | කම්හා, කස්මා | කෙහි, කෙභි |
| ඡට්ඨි | කස්ස, කිස්ස | කෙසං, කෙසානං |
| සත්තමී | කම්හි, කස්මිං | කෙසු |

## ඉත්ථිලිංගො

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | කා | කා, කායො |
| දුතියා | කං | කා, කායො |
| තතියා | කාය | කාහි, කාභි |
| කරණ | කාය | කාහි, කාභි |
| චතුත්ථි | කස්සා, කාය | කාසං, කාසානං |
| පඤ්චමී | කාය | කාහි, කාභි |
| ඡට්ඨි | කස්සා, කාය | කාසං, කාසානං |
| සත්තමී | කස්සං, කායං, කාය | කාසු |

### නපුංසකලිංගො

| විභත්ති | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | කං | කෙ, කානි |
| දුතියා | කං | කෙ, කානි |
| තතියා | කෙන | කෙහි, කෙභි |
| කරණ | කෙන | කෙහි, කෙභි |
| චතුත්ථී | කස්ස, කිස්ස | කෙසං, කෙසානං |
| පඤ්චමී | කම්හා, කස්මා | කෙහි, කෙභි |
| ඡට්ඨී | කස්ස, කිස්ස | කෙසං, කෙසානං |
| සත්තමී | කම්හි, කස්මිං | කෙසු |

මෙම සර්වනාම ශබ්ද බොහෝ විට යෙදෙනුයේ විශේෂණ පද වශයෙනි. එහි දී සර්වනාම පදය හා විශේෂ්‍ය පදය ලිංගයෙන් විභක්තියෙන් වචනයෙන් සමානව යෙදේ. පහත සඳහන් පරිද්දෙනි.

| | | |
|---|---|---|
| **සො පුරිසො** | - | ඒ පුරුෂයා |
| **සා ඉත්ථී** | - | ඒ ස්ත්‍රිය |
| **තං ඵලං** | - | ඒ ගෙඩිය |
| **ඉමෙසං භික්ඛූනං** | - | මේ භික්ෂූන්ගේ |
| **ඉමාසානං වනිතානං** | - | මේ වනිතාවන්ගේ |
| **ඉමෙසං රූපානං** | - | මේ රූපයන්ගේ |
| **කෙසං භික්ඛූනං** | - | කවර භික්ෂූන්ට |
| **කාසං භික්ඛුනීනං** | - | කවර භික්ෂුණීන්ට |
| **කෙසං ඵලානං** | - | කවර ගෙඩිවලට ආදී වශයෙනි. |

**පහත වාක්‍ය කියවා අවබෝධ කර ගන්න.**

**කො** නාම ථෙරො **කාසං** භික්ඛුනීනං **කස්ස** ධම්මං දෙසෙති.
ආනන්දො නාම ථෙරො **තාසං** භික්ඛුනීනං බුද්ධස්ස ධම්මං දෙසෙති.

**සා** වනිතා **තෙන** බාලකෙන සද්ධිං **තං** ආපනං ගච්ඡති.
අයං දාරකො ඉමාය වනිතාය පුත්තො හොති.

**අභ්‍යාස**

1. සිංහලට නගන්න.

i. අයං රාජා නහායිතුං එතං නදිං ගච්ඡති.
ii. සො භික්ඛු පුරෙභත්තං ඉමං නගරං ආගමිස්සන්ති.
iii. සො කුමාරො තස්ස සත්‍ථුනො ධම්මං සුත්වා තං ගෙහං ගච්ඡති.
iv. තස්ස සෙට්ඨිස්ස පුත්තො තෙසං ගහපතීනං ධනං දෙති.
v. තෙ කුමාරා තාහි කුමාරීහි සද්ධිං වනං පවිසන්ති.

2. පාලියට නගන්න.

i. රතු ගොණා නිල් තණ වේගයෙන් කයි.
ii. සිල්වත් භික්ෂුව සෑ මළුව හොඳින් අමදියි.
iii. කළු වඳුරා ඉදුණු ගෙඩි සෙමින් කඩයි.
iv. ගුණවත් උපාසිකාව සිල්වත් භික්ෂුවට නිතර දන් දෙයි.
v. ශ්‍රද්ධාවන්තයෝ සුදු මලින් නිතර බුදුන් පුදති.

3. සුදුසු නාමපදය හිස් තැනට යොදන්න.

i. ...................................... තාවතිංසභවනෙ පටිවසති.
ii. ...................................... මග්ගෙ ධාවන්ති.
iii. ...................................... දෙසිතො ධම්මො
iv. ...................................... ධාරෙථ චරාථ ධම්මෙ.
v. ...................................... චාරිකං චරථ.

4. පිළිතුරු සපයන්න.

i. නාම ප්‍රභේද නම්කර උදාහරණ එක බැගින් ලියන්න.
ii. 'ත' ශබ්දය යෙදුණු පාලි වාක්‍ය පහක් උපුටා ලියන්න.
iii. 'ඉම' ශබ්දය යෙදුණු පාලි වාක්‍යය පහක් උපුටා තේරුම ද ලියන්න.
iv. ලිංගත්‍රයට අයත් නාමපද පහ බැගින් ලියන්න.

5. පහත වාක්‍යාංශ පාලියට නගන්න.

i. ඒ භික්ෂූන්ගේ
ii. ඒ ස්ත්‍රීන් සමග
iii. කවර යක්ෂයන්ගේ
iv. මේ පින්කමින්
v. ඒ රජතුමාට
vi. මේ මල් සමූහය
vii. එම රටවල්වල
viii. කවර භික්ෂූන්ට
ix. මේ සත්‍ය වචනයෙන්
x. කවර භික්ෂුණීන්ගේ

# චතුත්ථො පාඨො

# වාරණරාජා

එකස්මිං කිර සමයෙ ලඞ්කායං දුට්ඨගාමිණී අභයො නාම රාජා රජ්ජං කාරෙසි. තදා තස්ස තිස්සො නාමෙකො චූලූපට්ඨාකො අබ්භන්තරිකො හුත්වා රාජකම්මං කරොති. තදා රඤ්ඤො කණ්ඩුලො නාම වාරණො නිගළඤ්ච ආලානඤ්ච භින්දිත්වා පාචීනපස්සං ගන්ත්වා වනං පවිසිත්වා කිසලපත්තාදයො ඡින්දිත්වා භින්දිත්වා ඛාදන්තො අනුක්කමෙන මහානිජ්ඣරවිහාරං ගන්ත්වා තෙසු තෙසු ඨානෙසු රුක්ඛමූලිකසුඤ්ඤාගාරිකාදයො යුත්තයොගෙ ඣානංගධරෙ භික්ඛූ දිස්වා පසන්නමානසො තෙසං ඵලාඵලාදයො ආහරිත්වා උපට්ඨානං කරොන්තො විහාසි. රාජා කිර තං හත්ථිනං ගතට්ඨානං උපපරික්ඛාපෙන්තො අදිස්වා චත්තාරො අමච්චෙ චතුද්දිසං පෙසෙන්තො චූලූපට්ඨාකතිස්සාමච්චං පාචීනපස්සං පෙසෙසි. සෙසදිසාසු ගතා හත්ථිං න පස්සිංසු. සො පනෙස අමච්චො ගාමනිගමපරම්පරාය විචරන්තො තමෙව විහාරං සම්පාපුණි. තතො කණ්ඩුලො නාම වාරණරාජා තදා සුපක්කං කාරඵලසහිතං කාරසාඛං භින්දිත්වා භික්ඛූනං පතිගණ්හාපෙසි. අමච්චො රඤ්ඤො සන්තිකං ගන්ත්වා දෙව, නිජ්ඣරවිහාරෙ භික්ඛුනො වෙය්‍යාවච්චං කරොන්තො හත්ථිනාගො මයා දිට්ඨොති කථෙසි. තං සුත්වා රාජා ත්වමෙව හණෙ හත්ථිං ගහෙත්වා ආගච්ඡාහීති නියොජෙසි.

(චූලතිස්සවත්ථු රසවාහිනී)

පද මාලාව

| | | | |
|---|---|---|---|
| චූලූපට්ඨාකො | (ස) | - | සුළු සේවකයෙක් |
| අබ්භන්තරිකො | (ත) | - | ඉතා විශ්වාස කටයුතු |
| රාජකම්මං | (ස) | - | රජගෙදර කටයුතු |
| වාරණො | (නා) | - | ඇතා |
| නිගළඤ්ච | (සං) | - | ඇතුන් බඳින දම්වැල ද |
| ආලානඤ්ච | (සං) | - | ඇතුන් බඳින කණුව ද |
| පාචීනපස්සං | (නා) | - | නැගෙනහිර දිසාව |
| කිසලපත්තාදයො | (සං) | - | දළුකොළ ආදිය |
| යුත්තයොගෙ | (ස) | - | යෝග භාවනාවෙහි යෙදුණු |
| ඣානංගධරෙ | (ස) | - | ධ්‍යානංගධාරී |
| පසන්නමානසො | (ස) | - | පහන් සිතැත්තේ |
| විහාසි | (ක්‍රි) | - | වාසය කළේ ය |
| උපපරික්ඛාපෙන්තො | (කි) | - | සොයා බලන්නේ |
| ඵලාඵලාදයො | (ස) | - | පලවැල ආදිය |
| ගතට්ඨානං | (ස) | - | ගියා වූ ස්ථානය |

| | | | |
|---|---|---|---|
| **සෙසදිසාසු** | (ස) | - | සෙසු දිසාවන්හි |
| **ගාමනිගම** | (ස) | - | ගම් නියම්ගම් |
| **සුපක්කං** | (කි) | - | මනාව ඉදුණු |
| **කාරඵල** | (ස) | - | කරගෙඩි |
| **කාරසාඛං** | (ස) | - | කරඅත්තක් |
| **වෙය්‍යාවච්චං** | (ස) | - | උපස්ථානය |
| **හත්ථිනාගො** | (ස) | - | ඇත්රජු |
| **දිට්ඨො** | (කි) | - | දක්නා ලදී |
| **නියොජෙසි** | (ක්‍රි) | - | යෙදවී ය |

**අභ්‍යාස**

1. වාරණරාජා යන ඡේදය සිංහලට නගන්න.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො නාම රාජා තදා ලංකායං රජ්ජං කාරෙසි ?
ii. වාරණො තෙසු තෙසු ඨානෙසු කිං අපස්සි ?
iii. රාජා ගජං උපපරික්ඛිතුං කති අමච්චෙ පෙසෙසි ?
iv. වාරණරාජා භික්ඛූනං කානි පතිගණ්හාපෙසි ?
v. වාරණරාජා කෙසං උපට්ඨානං අකාසි ?

3. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. දුටුගැමුණු රජුගේ විශ්වාසදායී සුළු සේවකයාගේ නම කුමක් ද?
ii. දුටුගැමුණු රජුගේ ඇතාගේ නම කුමක් ද ?
iii. භාවනාවට යෝග්‍ය ස්ථාන මොනවා ද?
iv. බුදුරජාණන් වහන්සේට තිරිසන් සතුන් විසින් උපස්ථාන කළ අවස්ථාවන් සඳහන් කරන්න.
v. සතර දිසාවන් නම් කරන්න.

## ආඛ්‍යාතය I

කිසියම් වීමක් හෝ කිරීමක් හැඟවෙන පද **ආඛ්‍යාත** නම් වෙයි. අර්ථවත් කථනය සහ ලේඛනය සඳහා ආඛ්‍යාතය අත්‍යන්තයෙන් උපකාරී වෙයි. පාලි ආඛ්‍යාත පදයන්ගේ සාමාන්‍ය ලක්ෂණ මෙසේ ය.

**"යං තිකාලං තිපුරිසං ක්‍රියාවාචී තිකාරකං**
**අත්තිලිංගං ද්විවචනං තදා'ඛ්‍යාතන්ති වුච්චති."** ඒ අනුව ආඛ්‍යාතය

**කාල තුනකින් යුක්ත ය.** - වර්තමාන කාල, අතීත කාල, අනාගත කාල වශයෙනි.

**පුරිස තුනකින් යුක්තය.** - පඨම පුරිස, මජ්ඣිම පුරිස, උත්තම පුරිස වශයෙනි.

**ක්‍රියාවාචී.** - යම්කිසි වීමක්/කිරීමක් ඇඟවීම ක්‍රියා වාචී නම් වේ.

**කාරක තුනකින් යුක්තය.** - කර්තෘ කාරක, කර්ම කාරක, භාව කාරක යනුවෙනි.

**ආඛ්‍යාතය ලිංග භජනය නො කරයි.**
වචන දෙකකින් යුක්ත ය. - ඒක වචන, බහු වචන වශයෙනි.

මෙසේ කාල පුරුෂ ආදී වශයෙන් යෙදෙන ආඛ්‍යාතයන්හි මූලය හඳුන්වනුයේ **ධාතු** යන නමිනි. ධාතුන් වරනැගෙන ස්වරූපය සලකා භූවාදී ගණ ආදී වශයෙන් ප්‍රභේදගත වෙයි. ධාතුමංජුසාවේ දක්වෙන්නේ එබඳු ක්‍රියා මූලයන් ය.

| | | | |
|---|---|---|---|
| **පච** | - **පාකෙ** | - **පච ධාතුව** | - **පිසීමෙහි** |
| **සප්ප** | - **ගතිම්හි** | - **සප්ප ධාතුව** | - **ගමනෙහි** |
| **සු** | - **සවණෙ** | - **සු ධාතුව** | - **ඇසීමෙහි** |
| **රඤ්ජ** | - **රාගෙ** | - **රඤ්ජ ධාතුව** | - **සායම් කිරීමෙහි** |
| **මුච** | - **මොචනෙ** | - **මුච ධාතුව** | - **මිදීමෙහි** |

මේ ආදී ධාතුමූලයන් ක්‍රියා විභක්තීන්හි වරනැගේ. විවිධාර්ථ නිපදවන එබඳු ආඛ්‍යාත විභක්ති 8ක් පාලි භාෂාවේ ඇත. ඒවා මෙසේ ය.

**වත්තමානා**
**අජ්ජතනී**
**භවිස්සන්ති**
**පඤ්චමී**
**සත්තමී**
**පරොක්ඛා**
**හීයත්තනී**
**කාලාතිපත්ති**

මෙම ක්‍රියා විභක්ති 8 අතුරෙන් මෙහි දී අවධානයට ලක්වන්නේ **වර්තමාන අජ්ජතනී** හා **භවිස්සන්ති** යන කාලත්‍රයට අයත් ක්‍රියා විභක්තීන් ය. විවිධ ධාතුන් ඒ ඒ ක්‍රියා විභක්තීන්හි වගුගත කිරීම හා අර්ථ ගැන්වීම පහත සඳහන් පරිදි වේ.

වත්තමානා ආඛ්‍යාතය

වර්තමාන කාලය යනු දැන් පවතින කාලය යි. එම කාලයට අයත් ක්‍රියා ප්‍රත්‍යය හා වරනැගීම පහත පරිදි වේ.

වත්තමානකාල කත්තරි පරස්සපද

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියාපදය | ප්‍රත්‍ය | ක්‍රියාපදය |
| පඨම පුරිස | ති | පචති | න්ති | පචන්ති |
| මජ්ඣිම පුරිස | සි | පචසි | ථ | පචථ |
| උත්තම පුරිස | මි | පචාමි | ම | පචාම |

වත්තමාන කාල කත්තරි පරස්සපද වාක්‍ය

සො ඔදනං පචති. - ඔහු බත පිසයි.
තෙ ඔදනං පචන්ති. - ඔවුහු බත පිසති.
ත්වං ඔදනං පචසි. - නුඹ බත පිසහි.
තුම්හෙ ඔදනං පචථ. - නුඹලා බත පිසහු.
අහං ඔදනං පචාමි. - මම බත පිසමි.
මයං ඔදනං පචාම. - අපි බත පිසමු.

වත්තමානකාල කත්තරි අත්තනොපද

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියාපදය | ප්‍රත්‍ය | ක්‍රියාපදය |
| පඨම පුරිස | තෙ | පචතෙ | න්තෙ | පචන්තෙ |
| මජ්ඣිම පුරිස | සෙ | පචසෙ | වෙහ | පචවෙහ |
| උත්තම පුරිස | ඒ | පචෙ | මෙහ | පචාමෙහ |

වර්තමාන කාල කත්තරි අත්තනොපද වාක්‍යය

සො ඔදනං පචතෙ. - හේ බත පිසයි.
තෙ ඔදනං පචන්තෙ. - ඔවුහු බත පිසති.

ත්වං ඔදනං පචසෙ. - නුඹ බත පිසහි.
තුම්හෙ ඔදනං පචවෙහ. - නුඹලා බත පිසහු.

අහං ඔදනං පචෙ. - මම බත පිසමි.
මයං ඔදනං පචාමෙහ. - අපි බත පිසමු.

## අජ්ජතනී ආඛ්‍යාතය

අතීත කාලය යනු ගෙවී ගිය කාලය යි. එම කාලයට අයත් ක්‍රියා පද හැඟවීම සඳහා අජ්ජතනී ආඛ්‍යාතය යෙදෙයි.

### අතීතකාල කත්තරි පරස්සපද

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| පඨම පුරිස | ඊ | අපචි/පචි<br>අපචී/පචී | උං | අපචිංසු / පචිංසු<br>අපචුං/පචුං |
| මජ්ඣිම පුරිස | ඔ | අපචො/පචො | ත්ථ | අපචිත්ථ/පචිත්ථ |
| උත්තම පුරිස | ඉං | අපචිං / පචිං | මහා | අපචිම්හ/පචිම්හ<br>අපචිම්හා/පචිම්හා |

### අතීත කාල කත්තරි පරස්සපද වාක්‍යය

සො ඔදනං පචී. - ඔහු බත පිසීය.
තෙ ඔදනං පචුං. - ඔවුහු බත පිසූහ.
ත්වං ඔදනං පචො. - නුඹ බත පිසූවෙහි.
තුම්හෙ ඔදනං පචිත්ථ. - නුඹලා බත පිසූවෙහු.
අහං ඔදනං පචිං. - මම බත පිසුවෙමි.
මයං ඔදනං පචිම්හා. - අපි බත් පිසුවෙමු.

### අතීත කාල කත්තරි අත්තනොපද

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| පඨම පුරිස | ආ | අපචා /පචා/<br>අපචිත්ථ/ පචිත්ථ | ඌ | අපචූ / පචූ |
| මජ්ඣිම පුරිස | සෙ | අපචිසෙ/පචිසෙ | වහං | අපචිවහං/ පචිවහං |
| උත්තම පුරිස | අ | අපචං / පචං /<br>අපච / පච | මෙහ | අපචිම්හෙ/පචිම්හෙ |

සො ඔදනං අපචා. - හේ බත පිසී.
තෙ ඔදනං අපචූ. - ඔවුහු බත පිසී.

ත්වං ඔදනං අපචිසෙ. - නුඹ බත පිසිහි.
තුමෙහ ඔදනං අපචිවහං. - තෙපි බත පිසූහු.

අහං ඔදනං පච. - මම බත පිසීමි.
මයං ඔදනං පචිමෙහ. - අපි බත පිසූමු.

### භවිස්සන්ති ආඛ්‍යාතය

අනාගත කාලය යනු නොපැමිණි කාලය යි. එම කාලයට අයත් ක්‍රියා පද හැඟවීම සඳහා පහත ප්‍රත්‍යය යොදා ගනියි.

### අනාගත කාල කත්තරි පරස්සපද

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ස්සති | පචිස්සති | ස්සන්ති | පචිස්සන්ති |
| **මජ්ඣිම පුරිස** | ස්සසි | පචිස්සසි | ස්සථ | පචිස්සථ |
| **උත්තම පුරිස** | ස්සාමි | පචිස්සාමි | ස්සාම | පචිස්සාම |

### අනාගතකාල කත්තරි පරස්සපද වාක්‍යය

සො ඔදනං පචිස්සති - ඔහු බත පිසන්නේ ය.
තෙ ඔදනං පචිස්සන්ති - ඔවුහු බත පිසන්නෝ ය.
ත්වං ඔදනං පචිස්සසි - නුඹ බත පිසන්නෙහි.
තුමෙහ ඔදනං පචිස්සථ - නුඹලා බත පිසන්නෙහු.
අහං ඔදනං පචිස්සාමි - මම බත පිසන්නෙමි.
මයං ඔදනං පචිස්සාම - අපි බත පිසන්නෙමු.

### අනාගතකාල කත්තරි අත්තනොපද

| පුරිස | එක වචන | | බහු වචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ස්සතෙ | පචිස්සතෙ | ස්සන්තෙ | පචිස්සන්තෙ |
| **මජ්ඣිම පුරිස** | ස්සසෙ | පචිස්සසෙ | ස්සවෙහ | පචිස්සවෙහ |
| **උත්තම පුරිස** | ස්සං | පචිස්සං | ස්සාමෙහ | පචිස්සාමෙහ |

## අනාගතකාල කත්තරි අත්තනොපද වාක්‍ය

| | | |
|---|---|---|
| සො ඔදනං පචිස්සතෙ | - | හේ බත පිසන්නේ ය. |
| තෙ ඔදනං පචිස්සන්තෙ | - | ඔවුහු බත පිසන්නෝ ය. |
| ත්වං ඔදනං පචිස්සසෙ | - | නුඹ බත පිසන්නෙහි ය. |
| තුම්හෙ ඔදනං පචිස්සව්හෙ | - | නුඹලා බත පිසන්නෙහුය. |
| අහං ඔදනං පචිස්සං | - | මම බත පිසන්නෙමි. |
| මයං ඔදනං පචිස්සාමෙහ | - | අපි බත පිසන්නෙමු. |

**අභ්‍යාස**

1. පහත සඳහන් ඒකවචන ක්‍රියාපද බහුවචනයට හරවන්න.

i. කාරෙසි -
ii. පචිස්සති -
iii. භින්දිං -
iv. පස්සි -
v. ආහරිස්සති -
vi. පෙසෙසි -
vii. සම්පාපුණි -
viii. සුණො -
ix. භින්දිස්සං -
x. පතිගණ්හාපෙසි -

2. පහත වාක්‍ය අතීත හා අනාගත කාලයට හරවා ලියන්න. අර්ථය ද ලියන්න.

i. සොමපාලො නාමෙකො උපාසකො අබ්භන්තරිකො හුත්වා ථෙරස්ස වෙය්‍යාවච්චං කරොති.
ii. පරිවෙණෙ සාමණෙරා තෙසු තෙසු ඨානෙසු නිසීදිත්වා පොත්ථකානි පඨන්ති.
iii. සංචාරකජනා ගාමනිගමරාධානීසු විචරිත්වා කොළම්බනගරමෙව පාපුණන්ති.
iv. මයං පසන්නමනසා එලාඑලාදයො ආහරිත්වා භික්ඛූනං පූජෙම.
v. තුම්හෙ චතුද්දිසං ගන්ත්වා චොරෙ උපපරික්ඛථ.

3. හිස්තැනට සුදුසු ක්‍රියාපදය යොදා මෙම වාක්‍යය සිංහලට නගන්න.

(පටිසෙවාමි, වන්දෙ, ආමන්තෙසි, අභිනන්දුං, අනුස්සරෙථ)

i. තත්‍ර බො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ --------------
ii. අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං ----------------
iii. --------- සම්බුද්ධං භයං තුම්හාකං නො සියා
iv. පටිසංඛායොනිසො සෙනාසනං ---------
v. අහං ------------ තං බොධිපාදපං

4. පාලියට නගන්න.

i. මම හැමදා ම පිරිවෙණට යමි.
ii. අපි සියලු දෙනා ම දිනපතා බුදුන් වඳිමු.
iii. ඔබ ගෙදර යන්න කැමති ද ?
iv. නුඹලා මවුපියන්ට සලකහු.
v. ඔබ පාලි භාෂාව ඉගෙනීමට කැමති වන්නෙහි ද?

5. සිංහලට නගන්න.

i. රාජානො අත්තානං කුමාරෙ නා නා සිප්පානි සික්ඛාපෙසුං.
ii. මනුස්සා ආයුක්ඛයෙන ච පුඤ්ඤක්ඛයෙන මරන්ති.
iii. 'තයො මෙ භික්ඛවෙ ගිලානා සංවිජ්ජමානා ලොකස්මිං'
iv. අනාථපිණ්ඩිකො නිබද්ධං දිවසස්ස ද්වෙ වාරෙ තථාගතස්සුපට්ඨානං ගච්ඡති.
v. බොධිසත්තො භාතිකසතස්ස කනිට්ඨො අහොසි.

# පඤ්චමො පාඨො

# පුඤ්ඤකරණස්ස සහායො

අථ අපරභාගෙ එකො අස්සවාණිජකො අස්සවණිජ්ජාය පුබ්බන්තාපරන්තං ගච්ඡන්තො ආගම්ම ඉමිස්සා ගෙහෙ නිවාසං ගණ්හි. අථ සො වාණිජො තං දිස්වා ධීතුසිනෙහං පතිට්ඨාපෙත්වා ගන්ධමාලවත්ථාලංකාරාදීහි තස්සා උපකාරකො හුත්වා ගමනකාලෙ අම්ම, එතෙසු අස්සෙසු තව රුච්චනකං අස්සං ගණ්හාහීති ආහ. සා'පි අස්සෙ විලොකෙත්වා එකං සින්ධවපොතකං දිස්වා එතං මෙ දෙහීති ආහ. වාණිජො අම්ම, එසො සින්ධවපොතකො අප්පමත්තා හුත්වා පටිජග්ගාහී'ති වත්වා තං පටිපාදෙත්වා අගමාසි. සා'පි තං පටිජග්ගමානා ආකාසගාමීභාවං ඤත්වා සම්මා පටිජග්ගන්තී එවං චින්තෙසි. ''පුඤ්ඤකරණස්ස මෙ සහායො ලද්ධො''ති. අගතපුබ්බා ච මෙ භගවතො සමාරං මාරබලං විධමෙත්වා බුද්ධභූතස්ස ජයමහාබොධිභූමි. යන්නූනාහං තත්ථ ගන්ත්වා භගවතො ජයමහාබොධිං වන්දෙය්‍යන්ති චින්තෙත්වා බහුරජතසුවණ්ණමාලාදයො කාරාපෙත්වා එකදිවසං අස්සමභිරුය්හ ආකාසෙන ගන්ත්වා බොධිමාලකෙ ඨත්වා ආගච්ඡන්තු අය්‍යා සුවණ්ණමාලා පූජෙතුන්ති උග්ඝොසෙසි.

(රසවාහිනී)

## පදමාලාව

| | | | |
|---|---|---|---|
| අපරභාගෙ | (ස) | - | පසුකලෙක |
| අස්සවාණිජකො | (ස) | - | අශ්ව වෙළෙන්දෙක් |
| අස්සවණිජ්ජාය | (ස) | - | අශ්ව වෙළඳාම පිණිස |
| පුබ්බන්තාපරන්තං | (ස) | - | පෙර අපර |
| ගච්ඡන්තො | (කි) | - | යන්නේ |
| ආගම්ම | (පූ.ක්‍රි) | - | පැමිණ |
| ධීතුසිනෙහං | (ස) | - | දුවට සෙනෙහස |
| පතිට්ඨාපෙත්වා | (පූ.ක්‍රි) | - | පිහිටුවා |
| වත්ථාලංකාරාදීහි | (ස) | - | වස්ත්‍ර අලංකාර ආදියෙන් |
| ගමනකාලෙ | (ස) | - | යන කල්හි |
| අම්ම | (නි) | - | දරුව |
| රුච්චනකං | (කි) | - | රුචි |
| විලොකෙත්වා | (පූ.ක්‍රි) | - | බලා |
| සින්ධවපොතකං | (ස) | - | සෛන්ධව පැටවෙකු |
| අප්පමත්තා | (කි) | - | නොපමාව |
| පටිජග්ගාහි | (ක්‍රි) | - | පෝෂණය කරව |
| පටිපාදෙත්වා | (පූ.ක්‍රි) | - | සකසා දී |
| ආකාසගාමීභාවං | (ස) | - | අහසින් යන බව |
| සමාරං | (ස) | - | මරුන් සහිත |

| | | | |
|---|---|---|---|
| මාරබලං | (ස) | - | මාර බලය |
| විධමෙත්වා | (පූ.ක්‍රි) | - | නසා |
| රජතසුවණ්ණමාලාදයො | (ස) | - | රන්රිදී මල් මාලා ආදිය |
| අබ්භුග්ගඤ්ඡි | (ක්‍රි) | - | අහසට නැගී |

**අභ්‍යාස**

(1) 'පුබ්බණ්හසමයෙ සාවත්ථියා…' යන ඡේදය සිංහලට නගන්න.

(2) පාලි භාෂාවෙන් පිළිතුරු සපයන්න.

i. කො ඉමිස්සා ගෙහෙ නිවාසං ගණ්හි ?
ii. අනාථපිණ්ඩිකො තස්සා කිං අදාසි ?
iii. සා සිත්ථපොතකස්ස කීදිසං විසෙසං අඤ්ඤාසි ?
iv. සා කථං බොධිමාලකං අගමාසි ?

(3) ඡේදය ඇසුරින් සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. නිවැසි කාන්තාවට වෙළෙන්දාගෙන් ලැබුණු දේ මොනවා ද?
ii. ''ජයමහාබොධිභූමිං'' ලෙස එම ස්ථානය හැඳින්වීමට හේතුව ලියන්න.
iii. ආර්යයන් වහන්සේලාට බෝධිමලුවට වඩින්නැයි අයැද සිටියේ කුමක් සඳහා ද?
iv. 'අරියසාවක' යන්නට අයත් ආර්ය පුද්ගලයෝ කවරහු ද?

## ආඛ්‍යාත II

### පඤ්චමී ආඛ්‍යාතය

'**පඤ්චමී තු අන්තු හි ථ මි ම, තං අන්තං ස්සු වෙහො එ ආමසෙ ඉති පඤ්චමී සඤ්ඤා**' යනුවෙන් බාලාවතාරයේ තු ආදී ප්‍රත්‍යය පඤ්චමියේ යෙදෙන බව දැක්වෙයි. පඤ්චමී, ආඛ්‍යාතය **අණකිරීම**, **ආශීර්වාද කිරීම** යන ප්‍රධාන අර්ථ දෙකක යෙදේ. (**ආණත්‍යාසිට්ඨෙනුත්තකාලෙ පඤ්චමී**) පඤ්චමී ප්‍රත්‍යයමාලාව එක්වී ක්‍රියාපද සැදෙන අයුරු මෙසේ ය.

**කත්තුකාරක පරස්සපද - වරනැගීම**

| පුරිස | ධාතුව | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| පඨම පුරිස | වන්ද | තු | වන්දතු | අන්තු | වන්දන්තු |
| මජ්ඣිම පුරිස | | හි | වන්දාහි | ථ | වන්දථ |
| උත්තම පුරිස | | මි | වන්දාමි | ම | වන්දාම |

### කත්තරි අත්තනොපද - වරනැගීම

| පුරිස | ධාතුව | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| පඨම පුරිස | වන්‍ද | තං | වන්‍දතං | අන්තං | වන්‍දන්තං |
| මජ්ඣිම පුරිස | | ස්සු | වන්‍දස්සු | වෙහා | වන්‍දවෙහා |
| උත්තම පුරිස | | ඒ | වන්‍දේ | ආමසෙ | වන්‍දාමසෙ |

පඤ්චමී ආඛ්‍යාත පද වාක්‍යවල යෙදෙනවිට අර්ථ දක්වන්නේ මෙසේ ය.

**භුඤ්ජතු භවං ගොතමො.** - පින්වත් ගෞතමයන් වහන්සේ වළඳන සේක්වා.
**රක්ඛන්තු සබ්බදෙවතා.** - සියලු දෙවියෝ රකිත්වා.
**එහි සාරථී නගරං ගච්ඡාහි.** - රියදුරාණනි, එන්න නගරයට යන්න.
**නික්ඛම සමණ පවිස සමණ.** - ශ්‍රමණය නික්මෙන්න, ශ්‍රමණය පිවිසෙන්න.
**ආරහථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධසාසනෙ.** - අරඹව් නික්මෙව් බුදු සසුනෙහි යෙදෙව්.
**අහං සුඛී භවාමි.** - මම සැප ඇත්තෙක් වෙම්වා.
**මයං සුඛී භවාම.** - අපි සැප ඇත්තෝ වෙමුවා.

### සත්තමී ආඛ්‍යාත

**සත්තමී එය්‍ය, එය්‍යුං, එය්‍යාසි, එය්‍යාථ , එය්‍යාමි, එය්‍යාම, එථ එරං එථො එය්‍යවෙහා එය්‍යං එය්‍යාමෙහ එය්‍යාදීනං සත්තමී සඤ්ඤා** (බාලාවතාරය) යනුවෙන් සත්තමී ආඛ්‍යාත ප්‍රත්‍යය මාලාව දක්වෙයි.

සත්තමී ආඛ්‍යාතයෙන් පැවසෙන්නේ හොඳයි, යහපතැයි කරන්න, යනුවෙන් අනුදැනීම යි. වේදෝ හෝ නොවේදෝ හෝ යන තීරණයක් නොමැති අවස්ථා ද පැවසෙයි. (**අනුමති පරිකප්පත්ථෙසු සත්තමී**) **කිං, සචෙ, යදි, සෙය්‍යථාපි** වැනි නිපාත පද සත්තමී ආඛ්‍යාත පද යෙදෙන වාක්‍යයන් සමග යෙදේ. සත්තමී ක්‍රියාපද සහිත වැකි මෙසේ දක්වේ.

- **යන්නූනාහං සයමෙව එකං කුමරිකං ආනෙය්‍යං.**
  යම්හෙයකින් මම ම එක් කුමාරිකාවක ගෙනෙන්නේ නම් මැනවි.
- **යදි පන මෙ පරාජයො භවෙය්‍ය මතං සෙය්‍යො.**
  ඉදින් මාගේ පරාජය වන්නේ නම් මරණය ශ්‍රේෂ්ඨ ය.
- **සචෙ සො පචෙය්‍ය මයං භුඤ්ජෙය්‍යාම.**
  ඉදින් හේ පිසන්නේ නම් අපි අනුභව කරන්නෙමු.
- **සචෙ ත්වං රොදෙය්‍යාසි නාහං කථෙය්‍යාමි.**
  ඉදින් ඔබ අඬන්නේ නම් මම නො කියන්නෙමි.

### කත්තරි පරස්සපද - වරනැඟීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | එය්‍ය | පචෙය්‍ය<br>පිසන්නේ නම් | එය්‍යුං | පචෙය්‍යුං<br>පිසන්නෝ නම් |
| **මජ්ඣිම පුරිස** | එය්‍යාසි | පචෙය්‍යාසි<br>පිසන්නෙහි නම් | එය්‍යාථ | පචෙය්‍යාථ<br>පිසන්නෙහු නම් |
| **උත්තම පුරිස** | එය්‍යාමි | පචෙය්‍යාමි<br>පිසන්නෙම් නම් | එය්‍යාම | පචෙය්‍යාම<br>පිසන්නෙමු නම් |

### කත්තරි අත්තනොපද - වරනැඟීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | එථ | පචෙථ<br>පිසෙන්නේ නම් | එරං | පචෙරං<br>පිසෙන්නෝ නම් |
| **මජ්ඣිම පුරිස** | එථො | පචෙථො<br>පිසන්නෙහි නම් | එය්‍යව්හො | පචෙය්‍යව්හො<br>පිසන්නෙහු නම් |
| **උත්තම පුරිස** | එය්‍යං | පචෙය්‍යං<br>පිසන්නෙම් නම් | එය්‍යාම්හෙ | පචෙය්‍යාම්හෙ<br>පිසන්නෙමු නම් |

## හීයත්තනී ආඛ්‍යාතය

අතීත කාල ක්‍රියා සිද්ධියක් පැවසෙයි. "**හීයොපපභුති අතීතකාලෙ හීයත්තනී හොති**" ඊයේ පටන් ප්‍රත්‍යක්ෂ අතීතකාලය පැවසීමේ දී හීයත්තනී ආඛ්‍යාතය යෙදේ. එහි ප්‍රත්‍යය මාලාව මෙසේ ය.

**හීයත්තනී** "**ආ ඌ ඔ ත්ථ අ ම්හා, ත්ථ ත්ථුං සෙ ව්හං ඉං ම්හසෙ'ති ආ ආදීනං හීයත්තනී සඤ්ඤා**" (බාලාවතාර) ඒ අනුව ක්‍රියා වරනැගෙන්නේ පහත පරිද්දෙනි.

### කත්තරි පරස්සපද - වරනැඟීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ආ | අපචා (පිසී) | ඌ | අපචූ (පිසූ) |
| **මජ්ඣිම පුරිස** | ඔ | අපචො (පිසුවෙහි) | ත්ථ | අපචත්ථ (පිසුවෙහු) |
| **උත්තම පුරිස** | අ | අපච (පිසීමි) | ම්හා | අපචම්හා (පිසූමු) |

### කත්තරි අත්තනොපද - වරනැගීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| පඨම පුරිස | ත්ථ | අපචත්ථ (පිසී) | ත්ථුං | අපචත්ථුං (පිසූ) |
| මජ්ඣිම පුරිස | සෙ | අපචසෙ (පිසුවෙහි) | වහං | අපචවහං (පිසීවෙහු) |
| උත්තම පුරිස | ඉං | අපචිං (පිසීම්) | මහසෙ | අපචමහසෙ (පිසූමු) |

**පරොක්ඛා ආඛ්‍යාතය**

"**අක්ඛ**" (**පචච+අක්ඛ**) යනු ඉන්ද්‍රියයන්ට කියන නමකි. ඉන්ද්‍රියන් ඇසුරු කළේ "**පච්චක්ඛ**" නම් වේ. ඉන්ද්‍රියන් ඇසුරු නොකළේ "**අපච්චක්ඛ**" නම් වේ. තමන් නුදුටු ස්ථිර ලෙස නොදත් දේ කීමට **පරොක්ඛා** ආඛ්‍යාතය යොදයි. ("**අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ**"). "**පරොක්ඛා අ උ එ ත්ථ අ මහ, ත්ථ රෙ ත්වො වෙහා ඉ මෙහ' ති අ ඉත්‍යාදීනං පරොක්ඛා සඤ්ඤා**" යනුවෙන් බාලාවතාරයේ ප්‍රත්‍යය මාලාව දැක්වේ. ඒ අනුව ක්‍රියා වරනැගෙන්නේ පහත පරිද්දෙනි.

### කත්තරි පරස්සපද - වරනැගීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| පඨම පුරිස | අ | පපච (පිසුවේලු) | උ | පපචු (පිසුවාහුලු) |
| මජ්ඣිම පුරිස | එ | පපචෙ (පිසුවෙහිලු) | ත්ථ | අපචත්ථ (පිසුවෙහුලු) |
| උත්තම පුරිස | අ | පපච (පිසුවෙමමිලු | මහ | පිපචිමහ (පසුවෙමිලු) |

### කත්තරි අත්තනොපද - වරනැගීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| පඨම පුරිස | ත්ථ | පපචිත්ථ (පිසුවෙවේලු | රෙ | පපචිරෙ (පිසුවාහුලු) |
| මජ්ඣිම පුරිස | ත්ථො | පපචිත්ථො (පිසුවෙහිලු) | වෙහා | පපචිවෙහා (පිසුවෙහිලු) |
| උත්තම පුරිස | ඉ | පපචි (පිසුවෙමිලු) | මෙහ | පපචිමෙහ (පිසුවෙමුලු) |

## කාලාතිපත්ති ආඛ්‍යාතය

කිසියම් හේතුවකින් ක්‍රියාව වැළකීගිය අතීත කාලයක් වේ නම් එය කාලාතිපත්ති නම් වේ. '**ක්‍රියාතිපනෙන'තීතෙ කාලාතිපත්ති**'. විරුද්ධ සාධක නිසා බාධා පමුණුවන හේතු නිසා ක්‍රියා සිද්ධිය අභාවයට යාම මෙහි ලක්ෂණය යි. බාලාවතාරයේ **සසා සසංසු සස සසථ සසං සසම්හා, සසථ සසිංසු සසවෙහ සසාමහසෙ'ති සසාදීනං කාලාතිපත්ති සඤ්ඤා** යනුවෙන් ප්‍රත්‍යය මාලාව දක්වේ. කාලාතිපත්ති ආඛ්‍යාත පද සැදෙන්නේ පහත පරිද්දෙනි.

**කත්තරි පරස්සපද - වරනැගීම**

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| පඨම පුරිස | සසා | අපචිස්සා (පිසුවේ නම්) | සසුං | අපචිස්සංසු (පිසුවෝ නම්) |
| මජ්ඣිම පුරිස | සෙස | අපචිස්සෙ (පිසුවෙහි නම්) | සසථ | අපචිස්සථ (පිසුවෙහු නම්) |
| උත්තම පුරිස | සසං | අපචිස්සං (පිසුවෙම් නම්) | සසම්හා | අපචිස්සම්හා (පිසුවෙමු නම්) |

**කත්තරි පරස්සපද - වරනැගීම**

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| පඨම පුරිස | සසථ | අපචිස්සථ (පිසුවේ නම්) | සසිසුං | අපචිස්සිංසු (පිසුවෝ නම්) |
| මජ්ඣිම පුරිස | සසසෙ | අපචිස්සසෙ (පිසුවෙහි නම්) | සසවෙහ | අපචිස්සවෙහ (පිසුවෙහු නම්) |
| උත්තම පුරිස | සසං | අපචිස්සං (පිසුවෙම් නම්) | සසාමහසෙ | අපචිස්සාමහසෙ (පිසුවෙමු නම්) |

**අභ්‍යාස**

(1) පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. අනුරාධපුරෙ මහාචෙතියානි සන්ති.
ii. බුද්ධො ලංකාභූමියං තික්ඛත්තුං පාපුණි.
iii. තුම්හෙ පතිදිනං මාතාපිතූනං උපට්ඨහථ.
iv. සො විහාරං ගන්ත්වා බුද්ධං වන්දිත්වා පුන ගෙහං ගච්ඡති
v. පුඤ්ඤවන්තො කුමාරො පුඤ්ඤං කරිස්සති.

(2) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. සියලු පව් නො කරන්න, කුසල් වඩන්න, සිත දමනය කරගන්න, යන මෙය බුදුරදුන්ගේ අනුශාසනාව යි.
ii. පමාවීම මරණයට හේතුවයි. නොපමාව නිවණට හේතු වෙයි.
iii. බුදුරජාණන් වහන්සේ මුල මැද අග යහපත් වූ ධර්මය දෙසූ සේක.
iv. සෝක නො කරන්න. නො වැළපෙන්න. ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුණේ වෙමු.
v. සියලු සත්වයෝ සතුටු සිතැත්තෝ වෙත්වා.

(3) පහත වචන යොදා වාක්‍ය සකස් කරන්න.

| | | | |
|---|---|---|---|
| i. | ගවෙෂය්‍ය | vi. | දදිස්සති |
| ii. | පපච්ඡුං | vii. | භවෙය්‍යාම |
| iii. | පපච | viii. | අකාසි |
| iv. | ලිඛමහා | ix. | සුණාතු |
| v. | ධාවිස්සං | x. | අදදිං |

(4) භූ, ලිඛ, සු, ධා, කර, යන ධාතු අජ්ජතනී, පරොක්ඛා, භවිස්සන්ති යන ආඛ්‍යාතවල පරස්සපදයෙහි වරනගන්න.

# අට්ඨමො පාඨො

# පිතුසිනෙහං

අතීතෙ උත්තරාපථෙ කංසභොගෙ අසිතඤ්ජනනගරෙ මහාකංසො නාම රාජා රජ්ජං කාරෙසි. තස්ස කංසො ච, උපකංසො චාති ද්වෙ පුත්තා අහෙසුං, දෙවගබ්භා නාම එකා ධීතා. තස්සා ජාතදිවසෙ නෙමිත්තකබ්‍රාහ්මණා 'එතිස්සා කුච්ඡියං නිබ්බත්තපුත්තො කංසගොත්තං කංසවංසං නාසෙස්සතී'ති බ්‍යාකරිංසු. රාජා බලවසිනෙහෙන ධීතරං නාසෙතුං නාසක්ඛි, 'භාතරො ජානිස්සන්තී'ති යාවතායුකං ඨත්වා කාලමකාසි. තස්මිං කාලකතෙ කංසො රාජා අහොසි, උපකංසො උපරාජා. තෙ චින්තයිංසු 'සචෙ මයං භගිනිං නාසෙස්සාම, ගාරය්හා භවිස්සාම, එතං කස්සචි අදත්වා නිස්සාමිකං කත්වා පටිජග්ගිස්සාමා'ති. තෙ එකථූණකං පාසාදං කාරෙත්වා තං තත්ථ වසාපෙසුං. නන්දගොපා නාම තස්සා පරිචාරිකා අහොසි. අන්ධකවෙණ්හු නාම දාසො තස්සා සාමිකො ආරක්ඛමකාසි. තදා උත්තරමධුරාය මහාසාගරො නාම රාජා රජ්ජං කාරෙසි. තස්ස සාගරො, උපසාගරො චාති ද්වෙ පුත්තා අහෙසුං. තෙසු පිතු අච්චයෙන සාගරො රාජා අහොසි, උපසාගරො උපරාජා. සො උපකංසස්ස සහායකො එකාචරියකුලෙ එකතො උග්ගහිතසිප්පො. සො භාතු අන්තෙපුරෙ දුබ්භිත්වා ගය්හමානො පලායිත්වා කංසභොගෙ උපකංසස්ස සන්තිකං අගමාසි. උපකංසො තං කංස රඤ්ඤො දස්සෙසි, රාජා තස්ස මහන්තං යසං අදාසි. සො රාජුපට්ඨානං ගච්ඡන්තො දෙවගබ්භාය නිවාසං එකථූණකපාසාදං දිස්වා 'කස්සෙසො නිවාසො'ති පුච්ඡිත්වා තං කාරණං සුත්වා දෙවගබ්භාය පටිබද්ධචිත්තො අහොසි.

(ඝත ජාතක, ජාතකට්ඨකථා)

**පදමාලාව**

| | | | |
|---|---|---|---|
| **උත්තරාපථෙ** | (ස) | - | උතුරු පෙදෙසෙහි |
| **අසිතඤ්ජනනගරෙ** | (ස) | - | අසිතඤ්ජන නුවර |
| **ජාතදිවසෙ** | (ස) | - | උපන්දා |
| **නෙමිත්තකබ්‍රාහ්මණා** | (ස) | - | නිමිති කියන බමුණෝ |
| **කුච්ඡියං** | (නා) | - | කුසෙහි |
| **නිබ්බත්තපුත්තො** | (ස) | - | උපන් පුතා |
| **ව්‍යාකරිංසු** | (ක්‍රි) | - | ප්‍රකාශ කළහ |
| **බලවසිනෙහෙන** | (ස) | - | බලවත් සෙනෙහසින් |
| **යාවතායුකං** | (ස) | - | දිවිඇතිතාක් |
| **ගාරය්හා** | (කි) | - | ගැරහිය යුතු වූවෝ |
| **නිස්සාමිකං** | (ස) | - | ස්වාමි පුරුෂයා නැති තැනැත්තියක |
| **පටිජග්ගිස්සාම** | (ක්‍රි) | - | රැක බලා ගන්නෙමු / පෝෂණය කරන්නෙමු |
| **එකථූණකං** | (ස) | - | එක්ටැමින් යුතු |
| **වසාපෙසුං** | (ක්‍රි) | - | වාසය කරවූහ |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

| | | | |
|---|---|---|---|
| **පරිචාරිකා** | (ස) | - | පරිවාර ස්ත්‍රියක් |
| **අච්චයෙන** | (නා) | - | ඇවෑමෙන් |
| **එකතො** | (නි) | - | එකට |
| **උගගහිතසිප්පො** | (ස) | - | උගත් ශිල්ප ඇත්තා |
| **අනෙතපුරෙ** | (ස) | - | අන්තඃපුරය |
| **දුබ්භිත්වා** | (පූ.ක්‍රි.) | - | ද්‍රෝහ වී |
| **ගය්හමානො** | (ක්‍රි) | - | අල්ලා ගනු ලබන්නේ |
| **පටිබද්ධචිත්තො** | (ස) | - | බැඳුණු සිතැත්තේ |

**අභ්‍යාස**

01. 'පිතුසිනෙහං' යන ඡේදය සිංහලට නගන්න.

02. ඡේදය ඇසුරෙන් පාලියෙන් පිළිතුරු ලියන්න.

i. මහාකංසො රාජා කස්මිං නගරෙ රජ්ජං කාරෙසි?
ii. මහාකංසරඤ්ඤො කා නාම ධීතා අහොසි?
iii. මහාකංසරඤ්ඤො කෙ නාම පුත්තා අහෙසුං?
iv. උත්තරමධුරායං කො රජ්ජං කාරෙසි?
v. දෙවගබ්භාය කා නාම පරිචාරිකා අහොසි?

03. සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. මහාකංස රජුගේ දියණිය උපන්දා නිමිති පාඨකයෝ රජුට කුමක් කීවාහු ද?
ii. සහෝදරවරු නැගණිය නොමරා පෝෂණය කළේ කුමක් නිසාද?
iii. උපසාගර යුවරජු උත්තරමධුරාවෙන් පැන ආවේ කුමක් නිසා ද?
iv. උපසාගර හා උපකංස අතර වූයේ කවර හිතවත් බවක් ද?

03. ඡේදයේ වාක්‍ය රටාව අනුගමනය කොට පාලියට නගන්න.

පෙර ලක්දිව මාගම් නුවර කාවන්තිස්ස (කාකවණ්ණතිස්ස) නම් රජෙක් රාජ්‍ය කරවීය. ඔහුට අභය හා තිස්ස යැයි කුමාරවරු දෙදෙනෙක් වූහ. එක දියණියක් ද වූවා ය. අභය කුමාරයා පියරජුගේ වචනයට ද්‍රෝහී වී (දුබ්භිත්වා) දීඝවාපියට පලා ගියේ ය. දියණිය ගිහිගෙන් නික්ම පැවිදිවූවා ය. පියරජුගේ ඇවෑමෙන් අභය කුමාරයා රජ වීය. තිස්ස කුමරු යුවරජ විය.

## සරල වාක්‍ය රචනා නිර්මාණය

රචනයක් යනු යමක් විසිතුරු ලෙස කීම සඳහා වචන ගැළපීම යි. වාක්‍ය සමූහයක් උචිත පරිදි ගැළපීම වාක්‍ය රචනාවකි. මල් සමූහයක් පිළිවෙළකට ගෙතීම, මුතු ඇට සමූහයක් නිසි පරිදි ඇමිණීම ද රචනාවකි. තැනට උචිත පරිදි මුතු මල් ආදිය යොදා ගෙතීමෙන් මාලය අලංකාර වේ. එමෙන් ම වාක්‍ය රචනය ද උචිත වැකි නිසි තැනට යොදා ගැළපීමෙන් අලංකාර වේ. උපමා රූපක උද්ධෘත පාඨ මඟින් රචනය වඩාත් විසිතුරු කළ හැකි ය.

රචනාවක් ලියන්නේ රචකයා දන්නා වාක්කෝෂය උපයෝගී කොට ගෙන ය. පාලි රචනා ලිවීමේ දී ද අප විසින් අනුගමනය කළ යුත්තේ තමා දන්නා වචනමාලාව උපයෝගී කරගෙන වාක්‍යය නිර්මාණය කිරීමයි. නිර්මාණය කළ වාක්‍යය උචිත පරිදි ගැළපීමෙන් හොඳ රචනාවක් බිහි වේ. පාලි වාක්‍ය රචනයේ දී විශේෂයෙන් උපයුක්ත වන වචනමාලා, නිපාත හා සංඛ්‍යා භාවිතය පිළිබඳ කරුණු කීපයක් මෙහි ලා උගනිමු.

### නිපාත

රචනය විසිතුරු කර ගැනීමට නිපාත උපයෝගී වේ. එනිසා මෙහි ලා පාලියේ නිතර භාවිත නිපාත කීපයක් අර්ථ සහිතව දක්වමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| **අචිරං** | - | වැඩි කලක් යන්නට පෙර | **අජ්ජ** | - | අද |
| **අඤ්ඤත්‍ර** | - | වෙන තැනක | **අඤ්ඤථා** | - | වෙන ක්‍රමයකින් |
| **අත්‍ර** | - | මෙහි | **අද්ධා** | - | ඒකාන්තයෙන් |
| **අධුනා** | - | දැන් | **අධො** | - | යට |
| **අන්තො** | - | ඇතුළත | **අභික්ඛණං** | - | නිතර |
| **අබ්භුම්මෙ** | - | අපොයි | **අලං** | - | කම් නැත |
| **ආරා** | - | දුරින් | **ආවි** | - | ප්‍රකට |
| **උද්ධං** | - | උඩ | **එකක්ඛත්තුං** | - | එක්වරක් |
| **එකදා** | - | එක්කලෙක | **එතරහි** | - | දැන් |
| **එත්තාවතා** | - | මෙපමණකින් | **කතිධා** | - | කී ආකාරයකින් |
| **කතික්ඛත්තුං** | - | කීවරක් | **කිත්තාවතා** | - | කොපමණකින් |
| **ඛිප්පං** | - | වහා | **චිරෙන** | - | බොහෝ කලකින් |
| **තස්මා** | - | එහෙයින් | **තිරියං** | - | හරහට |
| **දිවා** | - | දවල් | **ධුවං** | - | ඒකාන්තයෙන් |
| **නනු** | - | නොවේ ද | **පච්ඡා** | - | පසුව |
| **පටිගච්චෙව** | - | කල් ඇතිවම | **පාතො** | - | උදෑසන |
| **පුනප්පුනං** | - | නැවත නැවත | **පුරතො** | - | ඉදිරියෙන් |
| **පුරා** | - | පෙර | **බහුසො** | - | බොහෝ සෙයින් |
| **මිච්ඡා** | - | මිථ්‍යාව | **මුධා** | - | නොමිලේ, නිකම්ම |
| **මුසා** | - | බොරුව | **යදා** | - | යම්කලෙක |
| **යථා** | - | යම්සේ | **යාව** | - | යම් පමණ |

| | | | | | |
|---|---|---|---|---|---|
| වත | - | ඒකාන්තයෙන් | විනා | - | නැතිව |
| සක්කා | - | හැකිය | සද්ධිං | - | සමග |
| සබ්බත්ථ | - | හැමතැනම | සමන්තා | - | හාත්පස |
| සායං | - | සවස | සුවෙ | - | හෙට |
| හීයො | - | ඊයේ | | | |

යුගල පද

| | | |
|---|---|---|
| අන්නපාන | - | ආහාරපාන |
| අන්ධබධිර | - | අඳ බිහිරි |
| උච්චාරපස්සාව | - | මළ මූත්‍ර |
| කයවික්කය | - | මිළදී ගැනීම විකිණීම |
| ඛජ්ජභොජ්ජ | - | කෑ යුතු අනුභව කළ යුතු දේ |
| ඛයවයං | - | විනාශය හා ගෙවීයාම |
| ඛෙත්තවත්ථු | - | කෙත් වතු |
| කෙසමස්සු | - | කෙස් රවුල් |
| දෙවමනුස්ස | - | දෙව් මිනිස් |
| පත්තචීවර | - | පා සිවුරු |
| පුත්තදාර | - | අඹු දරු |
| මාතාපිය | - | ඇඟ පුටු |
| රත්තින්දිවා | - | රෑ දවල් |
| වධබන්ධන | - | හිංසාව හා හිරකිරීම |
| වාතාතප | - | වාතය හා අව්ව |
| සුරාමෙරය | - | පෙරූ මත්පැන් හා පැසවූ මත්පැන් |
| හිසිබිමෙහාහන | - | කොට්ට මෙට්ට |
| හත්ථපාද | - | අත් පා |
| හට්ඨපහට්ඨ | - | තුටු පහටු |

විරුද්ධාර්ථ විශේෂණ පද

| | | | |
|---|---|---|---|
| අණු | කුඩා | ථූල | මහත් |
| අප්පස්සුත | නූගත් | බහුස්සුත | උගත් |
| අප්පාබාධ | අල්පරෝග ඇති | බව්හාබාධ | බොහෝ රෝග ඇති |
| අප්පිච්ඡ | අල්පේච්ඡ | මහිච්ඡ | මහත් ආශා ඇති |
| උච්ච | උස් | නීච | මිටි / පහත් |
| උජු | ඍජු | වඞ්ක | වක් වූ |
| ඌන | අඩු | අධික | වැඩි |
| කිස | කෙට්ටු | ථූල | මහත් |
| ථාවර | නිශ්චල | ජඞ්ගම | චංචල |

| | | | |
|---|---|---|---|
| දහර | බාල | මහලලක | මහලු |
| නිච්ච | වෙනස් නොවන | අනිච්ච | වෙනස් වන |
| පිය | ප්‍රිය වූ | අප්පිය | අප්‍රිය වූ |
| බාල | මෝඩ | පණ්ඩිත | නුවණැති |
| විවට | විවෘත වූ | පටිච්ඡන්න | වැසුණු |
| සාවජ්ජ | වැරදි සහිත | අනවජ්ජ | වැරදි රහිත |

## දින මාස හා සංඛ්‍යා යෙදීම

නිවැරැදි ව දින මාස සංඛ්‍යා ආදිය යෙදීම සාර්ථක රචනයකට අවශ්‍ය වෙයි. එනිසා මෙහි ලා ඒ පිළිබඳ ව කෙටි හැඳින්වීමක් දක්වේ.

**සතියේ දවස්**

| | |
|---|---|
| රවිවාරෝ | ඉරිදා |
| චන්දවාරෝ | සඳුදා |
| කුජවාරෝ | අඟහරුවාදා |
| බුධවාරෝ | බදාදා |
| ගුරුවාරෝ | බ්‍රහස්පතින්දා |
| කවිවාරෝ/ සුක්කවාරෝ | සිකුරාදා |
| සනිවාරෝ | සෙනසුරාදා |

**මාස 12**

| | |
|---|---|
| ඵුස්ස | දුරුතු |
| මාඝ | නවම් |
| ඵග්ගුණ | මැදින් |
| චිත්ත | බක් |
| වෙසාඛ | වෙසක් |
| ජෙට්ඨ | පොසොන් |
| ආසාළ්හ | ඇසළ |
| සාවණ | නිකිණි |
| පොට්ඨපාද | බිනර |
| අස්සයුජ | වප් |
| කත්තික | ඉල් |
| මාගසිර | උඳුවප් |

සංඛ්‍යාවක් පාලියෙන් ලිවීමේ දී අනුගමනය කරන්නේ අග සංඛ්‍යාවේ සිට ලිවීමේ ක්‍රමය යි. මෙහි දී සංඛ්‍යාවන්හි සම්බන්ධතාව දැක්වීමට **අධික** හෝ **උත්තර** යන පද යොදා ගැනේ.

1932 යන්න පාලියෙන් ලිවීමේ දී

| | | |
|---|---|---|
| **32** | - | **ද්වත්තිංස** |
| **900** | - | **නවසත** |
| **1000** | - | **සහස්ස** |

**ද්වත්තිංස** + **අධික** + **නවසත** + **උත්තර** + **සහස්සං** යන මෙය සන්ධි කොට **ද්වත්තිංසාධිකනවසතුත්තරසහස්සං** යනුවෙන් යොදයි.

2556 යන්න

| | | |
|---|---|---|
| **56** | - | **ඡපඤ්ඤාස** |
| **500** | - | **පඤ්චසත** |
| **2000** | - | **ද්විසහස්ස** |

**ඡපඤ්ඤාසාධිකපඤ්චසතුත්තරද්විසහස්සං** යනුවෙන් ලිවිය යුතු ය.

ඒ අනුව වර්ෂ මාසාදිය පහත සඳහන් පරිදි පාලියෙන් ලිවිය හැකි ය.

2017 හි උඳුවප් මස 18 වැනි සඳුදා අනුරාධපුරයේ මහා පූජෝත්සවයක් පැවැත්වේ.

**සත්තරසාධිකද්විසහස්සෙ වස්සෙ මාගසිරෙ අට්ඨාරසමෙ චන්දවාරෙ අනුරාධපුරෙ මහාපූජොස්සවං පවත්තති.**

බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ 236 දී පොසොන් මස පුර පසළොස්වක දා මිහිඳු හිමි ලක්දිවට පැමිණියේ ය.

**භගවතො පරිනිබ්බානතො ඡත්තිංසාධිකද්විසතෙ වස්සෙ ජෙට්ඨමාසෙ සුක්කපක්ඛෙ පණ්ණරසියං මහාමහින්දත්ථෙරො ලඞ්කාදීපං ආගමි.**

බුද්ධ වර්ෂ 2565දී වෙසක් මස පළමු වෙනි සඳුදා අපගේ පිරිවෙණෙහි පූජාවක් වන්නේ ය.

**සම්බුද්ධපරිනිබ්බානතො පඤ්චසට්ඨ්‍යාධිකපඤ්චසතුත්තරද්විසහස්සෙ වස්සෙ වෙසාඛමාසෙ පඨමස්මිං චන්දවාරෙ අම්හාකං පරිවෙණෙ මහාපූජා භවිස්සති.**

## සරල රචනා ලිවීම

යම්කිසි මාතෘකාවක් අනුව අප දන්නා වචන උපයෝගී කරගෙන නිවැරැදි උක්තාඛ්‍යාත ගැළපීමෙන් වාක්‍යය ලියා එම වාක්‍යය නිසි පිළිවෙළට ගැළපීමෙන් වාක්‍ය රචනයක් බිහි වේ. ආදර්ශ රචනා කීපයක් මෙහි දැක් වේ.

**සීහො**

සීහො පන චතුප්පදො සත්තො. සීහා වනෙ වසන්ති. අප්‍රිකාමහාදීපෙ සීහා බහුසො ජීවන්ති. සීහස්ස මිගරඤ්ඤො නාදං සීහනාදන්ති වොහරන්ති. සීහනාදං සුත්වා තිරච්ඡානගතා සත්තා යෙභුය්‍යෙන භයං සංවෙගං සන්තාසං ආපජ්ජන්ති. සීහා පන මංසඛාදකා සත්තා භවන්ති. තෙ කදා'පි තිණානි න ඛාදන්ති. සීහො පන මහෙසක්ඛො මහානුභාවො සත්තො හොති. තස්මා සීහො මිගරාජා'ති වදන්ති.

**පාලිභාසා**

පාලිභාසා පන මාගධීභාසා තන්තිභාසා ආදි නාමෙහි ච වොහරන්ති. සම්මාසම්බුද්ධො පාලිභාසාය ධම්මං දෙසෙසි. බුද්ධසාවකා බුද්ධධම්මං ච පාලිභාසා ච භාණකපරම්පරාය ආනෙසුං. පච්ඡා තෙ බුද්ධධම්මං පාලිභාසාය පොත්ථකෙසු ලිඛිංසු. තෙපිටකං අට්ඨකථා ටීකා ච පකරණගන්ථා ච වංසකථායො ච පාලිභාසාය රචිතා හොන්ති. අජ්ජා'පි සොගතා ජනා පාලිභාසාය තෙසං ආගමිකකිච්චානි කරොන්ති. පාලිභාසා පන කොමලා මනොරමා භාසා භවති. අට්ඨකථාචරියා '**සා මාගධී මූලභාසා'ති** පාලිභාසා එව ආදිකප්පිකානං මනුස්සානං භාසා'ති ආහංසු.

**අභ්‍යාස**

01. සුදුසු පද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවා සිංහලට නගන්න.

(නිවාසිතත්තා/ නාම/ රඤ්ඤො/ පට්ඨාය/ අකංසු/ උත්තරමජ්ඣිමපදෙසෙ/ නක්ඛත්තෙන/ සිරිලංකායං/ චිරකාලං/ මහාමහින්දත්ථෙරො/ අජ්ජා'පි/ වන්දිතුං/ බුද්ධසාසනං/ විදෙසීය/ පස්සිතුං)

**අනුරාධපුරං**

අනුරාධපුරං පන .......................... පතිට්ඨිතං හොති. අනුරාධනාම අමච්චෙන .......................... වා අනුරාධ .......................... පතිට්ඨාපිතත්තා ච අනුරාධපුරං .......................... හොති. පණ්ඩුකාභය .......................... කාලෙ ඉදං පුරං .......................... අගගරාජධානි අහොසි. තතො .......................... බහවො සීහලරාජානො .......................... අගගරාජධානිං කත්වා රට්ඨපරිපාලනං .......................... . දෙවානම්පියතිස්සරඤ්ඤො කාලෙ .......................... ලඞ්කාදීපෙ .......................... පතිට්ඨාපෙසි. තතොප්පභුති අස්මිං නගරෙ චෙතියාරාමපාසාදමන්දිරා කාරාපිතා හොන්ති. සිරිමහාබොධිං ච සොවණ්ණමාලිමහාචෙතිං ච .......................... අනුරාධපුරෙ දිස්සති. එතරහි දෙසීය .......................... සංචාරකා පූජනීයට්ඨානානි .......................... නට්ඨාවසිට්ඨානි .......................... අනුරාධපුරං ගච්ඡන්ති.

02. පහත සඳහන් වාක්‍යය සිංහලට නගන්න.

i. සිද්ධත්ථකුමාරො ආසාළ්හපුණ්ණමායං රත්තියං සරාභිනික්ඛමි.
ii. සංඝමිත්තාථෙරී දක්ඛිණබොධිසාඛං ගහෙත්වා මාගසිරෙ පණ්ණරසියං ලංකාදීපමුපාගමි.
iii. භගවා එකස්මිං ඵුස්සමාසෙ චන්දවාරෙ ලංකාදීපමාගන්ත්වා යක්ඛෙ දමෙසි.
iv. භගවතො පරිනිබ්බානතො චත්තාලීසාධිකචතුසතෙ වස්සෙ ථෙරා මාතුලපදෙසෙ ආලොකගුහායං තෙපිටකං පොත්ථකෙසු ලිඛිංසු.
v. මයං චන්දවාරතොප්පභුති යාව සුක්කවාරො පරිවෙණං ගන්ත්වා තත්ථ සිප්පං ගණ්හාම.

03. පහත සංඛ්‍යා පාලියෙන් ලියන්න.

i. 276
ii. 2568
iii. 3264
iv. 5635
v. 84000

04. පහත මාතෘකා සඳහා වාක්‍ය 06කට නොඅඩු රචනා පාලියෙන් ලියන්න.

i. මම පරිවෙණං
ii. සිරිලංකාදීපං
iii. පුලත්ථිපුරං
iv. සාරිපුත්තත්ථෙරො
v. ගජො

## සත්තමො පාඨො

# දෙවෙන මය්හං පුත්තස්ස ජාතකාලෙ වරො දින්නො

අතීතෙ කාසිරට්ඨෙ බාරාණසියං බ්‍රහ්මදත්තො රාජා අහොසි. තදා බොධිසත්තො තස්ස අග්ගමහෙසියා කුච්ඡිස්මිං පටිසන්ධිං ගණ්හි. තස්ස නාමග්ගහණදිවසෙ මහිංසාසකුමාරොති නාමං අකංසු. තස්ස ආධාවිත්වා පරිධාවිත්වා විචරණකාලෙ රඤ්ඤො අඤ්ඤොපි පුත්තො ජාතො. තස්ස චන්දකුමාරොති නාමං අකංසු. තස්ස පන අධාවිත්වා පරිධාවිත්වා විචරණකාලෙ බොධිසත්තමාතා කාලමකාසි. රාජා අඤ්ඤං අග්ගමහෙසිට්ඨානෙ ඨපෙසි. සා රඤ්ඤො පියා අහොසි, මනාපා. සා පියසංවාසමන්වාය එකං පුත්තං විජායි. සුරියකුමාරොතිස්ස නාමං අකංසු. රාජා පුත්තං දිස්වා තුට්ඨචිත්තො භද්දෙ, පුත්තස්ස තෙ වරං දම්මීති ආහ. දෙවී වරං ඉච්ඡිතකාලෙ ගහෙතබ්බං කත්වා ඨපෙසි. සා පුත්තෙ වයප්පත්තෙ රාජානං ආහ. දෙවෙන මය්හං පුත්තස්ස ජාතකාලෙ වරො දින්නො. පුත්තස්ස මෙ රජ්ජං දෙහීති. රාජා මය්හං ද්වෙ පුත්තා අග්ගික්ඛන්ධා විය ජලමානා විචරන්ති. න සක්කා තව පුත්තස්ස රජ්ජං දාතුන්ති පටික්ඛිපිත්වා තං පුනප්පුනං යාචමානමෙව දිස්වා අයං මය්හං පුත්තානං පාපකම්පි චින්තෙය්‍යාති පුත්තෙ පක්කොසාපෙත්වා ආහ. තාත, අහං සුරියකුමාරස්ස ජාතකාලෙ වරං අදාසිං. ඉදානිස්ස මාතා රජ්ජං යාචති. අහං තස්ස න දාතුකාමො. මාතුගාමො නාම පාපො. තුම්හාකං පාපකම්පි චින්තෙය්‍ය. තුම්හෙ අරඤ්ඤං පවිසිත්වා මමච්චයෙන කුලසන්තකෙ නගරෙ රජ්ජං කරෙය්‍යාථාති කන්දිත්වා රොදිත්වා සීසෙ චුම්බිත්වා උය්‍යොජෙසි. තෙ පිතරං වන්දිත්වා පාසාදා ඔරොහන්තෙ රාජංගණෙ කීළමානො සුරියකුමාරොපි දිස්වා තං කාරණං ඤත්වා අහම්පි භාතිකෙහි සද්ධිං ගමිස්සාමීති තෙහි සද්ධිං යෙව නික්ඛමි. තෙ හිමවන්තං පවිසිංසු. බොධිසත්තො මග්ගා ඔක්කම්ම රුක්ඛමූලෙ නිසීදිත්වා සුරියකුමාරං ආමන්තෙසි. තාත සුරිය, එතං සරං ගන්ත්වා නහාත්වා ච පිවිත්වා ච පදුමිනිපණ්ණෙහි අම්හාකම්පි පානීයං ආනෙහීති. තං පන සරං වෙස්සවණස්ස සන්තිකා එකෙන දකරක්ඛසෙන ලද්ධං හොති. වෙස්සවණො ච තං ආහ. ඨපෙත්වා දෙවධම්මජානනකෙ යෙ අඤ්ඤෙ ඉමං සරං ඔතරන්ති තෙ ඛාදිතුං ලභසි. අනොතිණ්ණෙ න ලභසීති.

(දෙවධම්මජාතක - ජාතකට්ඨකථා)

**පදමාලාව**

| | | | |
|---|---|---|---|
| **නාමග්ගහණදිවසෙ** | **(ස)** | - | නම් තබන දිනයෙහි |
| **ආධාවිත්වා පරිධාවිත්වා** | **(පූ.ක්‍රි)** | - | දුව පැන |
| **විචරණකාලෙ** | **(ස)** | - | ඇවිදින කාලයේ |
| **පියසංවාසමන්වාය** | **(ස)** | - | ප්‍රිය සංවාසය නිසා |
| **තුට්ඨචිත්තො** | **(ස)** | - | සතුටු සිතැත්තේ |
| **දම්මි** | **(ක්‍රි)** | - | දෙමි |
| **ඉච්ඡිතකාලෙ** | **(ස)** | - | කැමති කාලයක |

| | | | |
|---|---|---|---|
| ගහෙතබ්බං | (කි) | - | ගතයුත්තක් |
| වයප්පත්තෙ | (ස) | - | වියපත් කල්හි |
| අග්ගික්ඛන්ධො විය | (ස) | - | ගිනිකඳක් මෙන් |
| ජලමානා | (කි) | - | දිලෙමින් |
| පටික්ඛිපිත්වා | (පූ.ක්‍රි) | - | ප්‍රතික්ෂේප කොට |
| ඉදානිස්ස | (සං) | - | දැන් මොහුගේ |
| දාතුකාමො | (කි) | - | දෙනු කැමැත්තේ |
| පක්කොසාපෙත්වා | (පූ.ක්‍රි) | - | කැඳවා |
| මාතුගාමො | (නා) | - | මාගම, කාන්තාව |
| චින්තෙය්‍ය | (ක්‍රි) | - | සිතන්නේය |
| මමච්චයෙන | (සං) | - | මගේ ඇවෑමෙන් |
| කුලසන්තකෙ | (ස) | - | කුලයට අයත් |
| කන්දිත්වා | (පූ.ක්‍රි) | - | හඬා |
| රොදිත්වා | (පූ.ක්‍රි) | - | වැළපී |
| චුම්බිත්වා | (පූ.ක්‍රි) | - | සිඹ |
| උය්‍යොජෙසි | (ක්‍රි) | - | පිටත් කළේ ය |
| ඔරොහන්තො | (කි) | - | බසිනුයේ |
| රාජඞ්ගණෙ | (ස) | - | රජමිදුලේ |
| කීළමානො | (කි) | - | ක්‍රීඩා කරන |
| ඔක්කම්ම | (පූ.ක්‍රි) | - | ඉවත් වී |
| පදුමිනිපණ්ණෙහි | (ස) | - | නෙළුම් කොළවලින් |
| දකරක්ඛසෙන | (ස) | - | දිය රකුසෙකු විසින් |
| ලද්ධං | (කි) | - | ලබන ලදී |
| ජානන්තකෙ | (කි) | - | දන්නවුන් |
| අනොතිණ්ණෙ | (කි) | - | නො බැස්සවුන් |
| ඔතරන්ති | (ක්‍රි) | - | බසිති |

**අභ්‍යාස**

01. ''දෙවෙන මය්හං පුත්තස්ස ජාතකාලෙ වරො දින්නො'' යන ඡේදය සිංහලට නගන්න.

02. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. බ්‍රහ්මදත්තරඤ්ඤො කෙ නාම කුමාරා අහෙසුං ?
ii. රාජා කාය වරං අදාසි ?
iii. කා රඤ්ඤො පියා මනාපා අහොසි ?
iv. සුරියකුමාරො කෙහි සද්ධිං වනං ගච්ඡි?
v. කෙන එකං සරං ලද්ධං හොති?

03. සිංහලෙන් පිළිතුරු ලියන්න.
.
i. මෙම ඡේදයෙහි සඳහන් වරයන් දෙක මොනවාද ?
ii. මෙහි එන උපමාවක් උපුටා විස්තර කරන්න.
iii. 'වෙස්සවණ' යන්න විස්තර කරන්න.
iv. ඡේදයෙන් ලැබෙන උපදේශ දෙකක් ලියන්න.

## කර්තෘකාරක හා කර්මකාරක වාක්‍යය

එක ම අදහසක් ප්‍රකාශ කරන විධි දෙකක් කර්තෘකාරක වාක්‍යය හා කර්මකාරක වාක්‍යය යනුවෙන් හඳුන්වයි.

**මම ගස කපමි - (අහං රුක්ඛං ඡින්දාමි)**

යන වාක්‍යයේ 'කපමි' යන ක්‍රියාවෙන් කියවෙන පදයේ (උක්තපදයේ) ක්‍රියාව කරන්නා හෙත් කර්තෘ 'මම' (අහං) යන්න යි. ක්‍රියාවෙන් කියවෙන පදය කර්තෘ වන බැවින් එම වාක්‍යය කර්තෘකාරක වෙයි.

**මවිසින් ගස කැපේ - (මයා රුක්ඛො ඡින්දීයතෙ)**

මෙහි කපනු ලැබේ **(ඡින්දීයතෙ)** ක්‍රියාවෙන් උක්ත වන්නේ **රුක්ඛො** යන කර්ම පදය යි. එනිසා එය කර්මකාරක වාක්‍යයකි. පාලි භාෂාවේ කර්මකාරක කර්තෘකාරක වාක්‍යයන්හි වෙනස්කම් පහත වගුවෙහි දැක්වේ.

| කර්තෘකාරක වාක්‍යය | කර්මකාරක වාක්‍යය |
|---|---|
| කර්තෘ පදය උක්ත වී පඨමා විභක්තියෙන් සිටී.<br>උදා:- **බුද්ධො** ධම්මං දෙසෙති. | කර්තෘ පදය අනුක්ත වී තතියා විභක්තියෙන් සිටී.<br>උදා:- **බුද්ධෙන** ධම්මො දෙසීයතෙ. |
| කර්මපදය දුතියා විභක්ති වේ.<br>උදා:- බුද්ධො **ධම්මං** දෙසෙති. | කර්මපදය උක්ත වී පඨමා විභක්ති වේ.<br>උදා:- බුද්ධෙන **ධම්මො** දෙසීයතෙ. |
| උක්ත කර්තෘගේ පුරුෂයට, වචනයට අනුව ක්‍රියාපදය තබනු ලැබේ.<br>උදා:- බුද්ධො ධම්මං **දෙසෙති.** | උක්ත කර්මයේ පුරුෂයට, වචනයට අනුව ක්‍රියාපදය යෙදේ.<br>උදා:- බුද්ධෙන ධම්මො **දෙසීයතෙ.** |

මේ ලක්ෂණ අනුව කර්මකාරකයට යොමු වූ පහත වාක්‍යය බලන්න.

| | | |
|---|---|---|
| **සීහො මිගෙ මාරෙති.** | > | සීහෙන මිගා මාරීයන්ති. |
| **අහං ඔදනං පචාමි.** | > | මයා ඔදනො පච්චතෙ. |
| **මයං පොත්ථකෙ පඨාම.** | > | අම්හෙහි පොත්ථකානි පඨීයන්ති. |
| **කුමාරා අම්හෙ පහරන්ති.** | > | කුමාරෙහි මයං පහරීයාම. |

මේ වාක්‍යවල උක්තපද අනුව ක්‍රියාපදවල පුරුෂ වචන වෙනස් වී ඇති අයුරු අවබෝධ කර ගත යුතු ය.

කර්මකාරකයේ දී ක්‍රියාපද සාධනය හා භාවිතය ගැන අවබෝධයක් තිබිය යුතු ය. කර්මකාරක ක්‍රියාපද සාධනයේ දී ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරට 'ය' යන ප්‍රත්‍යය යෙදිය යුතු ය. **(භාවකම්මෙසු යො)** 'ය' ප්‍රත්‍යය යෙදෙන විට බොහෝ තැන්වල ප්‍රත්‍යයට මුලින් ඊකාරයක් ආගම වේ.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **කර** | + | **ඊය** | + | **ති** | > | **කරීයති** | - | කරනු ලැබේ |
| **වන්ද** | + | **ඊය** | + | **ති** | > | **වන්දීයති** | - | වඳිනු ලැබේ |
| **කස** | + | **ඊය** | + | **ති** | > | **කසීයති** | - | සීසානු ලැබේ |
| **බන්ධ** | + | **ඊය** | + | **ති** | > | **බන්ධීයති** | - | බඳිනු ලැබේ |
| **ධොව** | + | **ඊය** | + | **ති** | > | **ධොවීයති** | - | සෝදනු ලැබේ |

කර්මකාරක පද සාධනයේ දී ඇතැම් ක්‍රියාපදවල ධාත්වන්තය සමග 'ය' ප්‍රත්‍යයට සන්ධිකාර්ය වී පහත සඳහන් පරිදි පද සිද්ධ වේ.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **පච** | + | **ය** | + | **ති** | > | **පච්චති** | - | පිසිනු ලැබේ |
| **සජ** | + | **ය** | + | **ති** | > | **සජ්ජති** | - | සරසනු ලැබේ |
| **හන** | + | **ය** | + | **ති** | > | **හඤ්ඤති** | - | නසනු ලැබේ |
| **භිද** | + | **ය** | + | **ති** | > | **භිජ්ජති** | - | බිඳිනු ලැබේ |
| **බුධ** | + | **ය** | + | **ති** | > | **බුජ්ඣති** | - | අවබෝධ කරගනු ලැබේ |
| **ලභ** | + | **ය** | + | **ති** | > | **ලබ්භති** | - | ලැබේ |
| **දම** | + | **ය** | + | **ති** | > | **දම්මති** | - | දමනය කරනු ලැබේ |
| **වච** | + | **ය** | + | **ති** | > | **වුච්චති** | - | කියනු ලැබේ |
| **දිස** | + | **ය** | + | **ති** | > | **දිස්සති** | - | දක්නට ලැබේ |
| **ගහ** | + | **ය** | + | **ති** | > | **ගය්හති** | - | ගනු ලැබේ |

කර්මකාරකයේ දී ක්‍රියාපද වෙනුවට කිතක පද ද භාවිත වේ. අතීත කාලයේ දී බහුල ව යෙදෙන්නේ කිතක පද යි. වර්තමාන කාලයේ දී ද කිතක පද භාවිත වේ. එසේ භාවිත වන වර්තමාන කිතක පද කීපයක් මෙසේ ය.

**ඡින්දියමාන** - සිඳිනු ලබන
**වුච්චමාන** - කියනු ලබන
**දීයමාන** - දෙනු ලබන
**භුඤ්ජියමාන** - අනුභව කරනු ලබන
**කරීයමාන** - කරනු ලබන

කිතක පද ක්‍රියා පද වශයෙන් යෙදෙන විට උක්ත පදය හා ලිංගයෙන් විභක්තියෙන් වචනයෙන් සමාන ව යෙදේ.

උදා:- සූදෙන **ඔදනො පච්චමානො** හොති.
වානරෙහි රුක්ඛම්හා **ඵලානි පාතියමානානි** හොන්ති.
දායකෙහි **භික්ඛුනියො භොජීයමානායො** හොන්ති.
ආදී වශයෙනි.

අතීත කිතක පද කීපයක් මෙහිලා දැක්වේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **භුජ** | + | **ත** | > | **භුත්ත** | - | අනුභව කරන ලද |
| **මද** | + | **ත** | > | **මත්ත** | - | මත් කරන ලද |
| **මුච** | + | **ත** | > | **මුත්ත** | - | මිදෙන ලද |
| බධ | + | **ත** | > | බද්ධ | - | බඳන ලද |
| දුහ | + | **ත** | > | දුද්ධ | - | දොවන ලද |
| පූර | + | **ත** | > | පුණ්ණ | - | පුරවන ලද |
| **භිද** | + | **ත** | > | **භින්න** | - | බිඳින ලද |
| **ඡිද** | + | **ත** | > | **ඡින්න** | - | වසන ලද |
| **සු** | + | **ත** | > | **සුත** | - | අසන ලද |
| දා | + | **ත** | > | **දින්න** | - | දෙන ලද |
| **ලිඛ** | + | **ත** | > | **ලිඛිත** | - | ලියන ලද |
| වන්ද | + | **ත** | > | **වන්දිත** | - | වඳින ලද |
| ඛාද | + | **ත** | > | **ඛාදිත** | - | කන ලද |
| ඤා | + | **ත** | > | ඤාත | - | දන්නා ලද |

අතීත කිතක පද ද ලිංගයෙන් විභක්තියෙන් වචනයෙන් උක්තපදය හා සමානව යෙදේ.

උදා:- බුද්ධෙන ධම්මො දෙසිතො.
අම්හෙහි භික්ඛූනං වත්ථානි දින්නානි.
පුත්තෙහි මාතාපිතරො වන්දිතා.

## අභ්‍යාස

01. පහත වාක්‍යය සිංහලට නගන්න.

i. තාය දාසියා ධෙනුයො බන්ධියන්ති.
ii. මයං අම්හාකං ධීතරෙහි වන්දියාම.
iii. සද්ධෙහි උපාසකෙහි භික්ඛූනං දානං දින්නං අහොසි.
iv. හීයො අහිනා දට්ඨො බාලො වෙජ්ජස්ස සන්තිකං නීතො හොති.
v. එකං සරං වෙස්සවණ්ණස්ස සන්තිකා එකෙන දකරක්ඛසෙන ලද්ධං හොති.

02. පහත වාක්‍යය පාලියට නගන්න
.
i. බුදුරදුන් විසින් දෙවියන්ට ද මිනිසුන්ට ද ධර්මය දෙසන ලදී.
ii. සිංහයන් විසින් වනයෙහි මුවෝ මරන ලදහ.
iii. දාසිය විසින් බත පිසනු ලබයි.
iv. අප විසින් බොහෝ ළමුන්ට පාඩම් කියා දෙන ලදී.
v. තොප විසින් බුදුරදුන්ට මල් පූජා කරන ලදී.

03. කර්මකාරකයට හරවා ලියන්න.

i. අයං පුරිසො එකං වත්ථං යාචති.
ii. සුවෙ මයං නගරං ගන්ත්වා භණ්ඩානි කිණිස්සාම.
iii. සීහො ධාවිත්වා මිගං මාරෙසි.
iv. ගොපාලො ගොණෙ වික්කිණාති.
v. චොරා මනුස්සානං අසෙස චොරෙන්ති.

04. කර්තෘකාරකයට හරවා ලියන්න.

i. මුනිනා ධම්මො දෙසිතො.
ii. අම්හෙහි චන්දො පස්සීයති.
iii. තුම්හෙහි භික්ඛූනං ආහාරො දිනෙනා.
iv. චොරෙන ගොණො චොරීයති.
v. දාසෙහි මිත්තානං සුනඛො හරීයතෙ.

05. සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(ගතො/ මනුස්සෙහි/ අහිනා/ ආහටානි/ දිනෙනා/ ධොවීයන්ති/ වත්ථානි/ වනිතාහි/ භගවතා/ චීවරානි/ සත්ථාරා/ පුග්ගලා/ දෙවෙන)

i. හීයො‍ය්‍යා අරඤ්ඤං .................. පුරිසො .................. දට්ඨො කාලකතො හොති.
ii. වාණිජෙහි නගරතො .................. භණ්ඩානි .................. කීතානි හොන්ති.
iii. .................. මය්හං පුත්තස්ස ජාතකාලෙ වරො .................. හොති.
iv. අජ්ජ .................. බහූනි .................. ගංගායං ..................
v. ආවුසො .................. තීණි .................. අනුඤ්ඤාතානි.
vi. .................. චත්තාරො .................. කථිතා.

# අට්ඨමො පාඨො

# කන්තාරතරණං

අතීතෙ කාසිරට්ඨෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො සත්ථවාහකුලෙ පටිසන්ධිං ගහෙත්වා වයප්පත්තො පඤ්චහි සකටසතෙහි වණිජ්ජං කරොන්තො විචරති. සො එකදා සට්ඨියොජනිකං මරුකන්තාරං පටිපජ්ජි. තස්මිං කන්තාරෙ සුඛුමවාලිකා මුට්ඨිනා ගහිතා හත්ථෙ න තිට්ඨති. සුරියුග්ගමනතො පට්ඨාය අඞ්ගාරරාසිවිය උණ්හා හොති න සක්කා අක්කමිතුං. තස්මා තං පටිපජ්ජන්තා දාරුදකතිලතණ්ඩුලාදීනි සකටෙහි ආදාය රත්තිමෙව ගන්ත්වා අරුණුග්ගමනෙ සකටානි පරිවත්තං කත්වා මත්ථකෙ මණ්ඩපං කාරෙත්වා කාලස්සෙව ආහාරකිච්චං නිට්ඨාපෙත්වා ඡායාය නිසින්නා දිවසං ඛෙපෙත්වා අත්ථංගතෙ සුරියෙ සායමාසං භුඤ්ජිත්වා භූමියා සිතලාය ජාතාය සකටානි යොජෙත්වා ගච්ඡන්ති. සමුද්දගමනසදිසමෙව ගමනං හොති. ථලනියාමකො නාම ලද්ධුං වට්ටති. සො තාරකසඤ්ඤාය සත්ථං තාරෙසි.

**(වණ්ණුපථජාතක ජාතකට්ඨකථා)**

## පදමාලාව

| | | | |
|---|---|---|---|
| **සත්ථවාහකුලෙ** | (ස) | - | ගැල්ගෙන යන කුලයක |
| **පටිසන්ධිං ගහෙත්වා** | (පූ.ක්‍රි.) | - | පිළිසිඳ ගෙන |
| **වයප්පත්තො** | (ස) | - | වැඩිවියට පත්වූයේ |
| **වණිජ්ජං** | (ත) | - | වෙළඳාම |
| **සට්ඨියොජනිකං** | (ස) | - | සැට යොදුනක් පමණ වූ |
| **මරුකන්තාරං** | (ස) | - | වැලි කාන්තාරයට |
| **පටිපජ්ජි** | (ක්‍රි) | - | පිළිපන්නේ ය |
| **සුඛුමවාලිකා** | (ස) | - | සියුම්වැලි |
| **මුට්ඨිනා** | (නා) | - | මිටින් |
| **ගහිතා** | (කි) | - | ගන්නා ලද්දේ |
| **සුරියුග්ගමනතො** | (ස) | - | හිරු උදාවීමේ පටන් |
| **අඞ්ගාරරාසි** | (ස) | - | ගිනි අඟුරු ගොඩක් |
| **අක්කමිතුං** | (තු) | - | පාගන්නට |
| **සක්කා** | (නි) | - | හැකි ය |
| **පටිපජ්ජන්තා** | (කි) | - | පිවිසෙන්නෝ |
| **දාරුදකතිලතණ්ඩුලාදීනි** | (ස) | - | දර ජලය තල සහල් ආදිය |
| **රත්තිමෙව** | (සං) | - | රාත්‍රියේ ම |
| **අරුණුග්ගමනෙ** | (ස) | - | හිරු උදාවීමේ දී |
| **පරිවත්තං කත්වා** | (පූ.ක්‍රි.) | - | වටකොට |

| | | | |
|---|---|---|---|
| මත්ථකෙ | (නා) | - | මත්තෙහි (උඩ) |
| කාලසෙසව | (සං) | - | කල් ඇතිව |
| ආහාරකිච්චං | (ස) | - | අහරකිස |
| බෙපෙත්වා | (පූ.ක්‍රි) | - | ගෙවා |
| අත්ථං ගතෙ | (ක්‍රි) | - | අස්තයට ගිය කල්හි |
| සායමාසං | (ස) | - | රාත්‍රී ආහාරය |
| සමුද්දගමණසදිසං | (ස) | - | මුහුදු ගමනක් මෙනි |
| ථලනියාමකො | (ස) | - | ගොඩබිම නියමුවා |
| තාරකසඤ්ඤාය | (ස) | - | තරු ලකුණින් |

**අභ්‍යාස**

01. 'කන්තාරතරණං' යන ඡේදය සිංහලට නගන්න.

02. පාලියෙන් පිළිතුරු ලියන්න.

i. අතීතෙ බාරාණසියං කො රජ්ජං කාරෙසි?
ii. මරුකන්තාරං කිත්තකප්පමාණං අහොසි?
iii. සුරියුග්ගමනතො පට්ඨාය වාලිකා කීදිසා අහොසි?
iv. සත්ථවාහො කස්මිං සමයෙ කන්තාරං තාරෙති?
v. වාණිජා දිවා කන්තාරෙ කථං වසන්ති?

03. ඡේදය ඇසුරෙන් සිංහලෙන් පිළිතුරු ලියන්න.

i. 'සත්ථවාහකුල' යන්න පැහැදිලි කරන්න?
ii. කාන්තාරයෙහි වැලි සියුම් බව ජාතකකරු කීවේ කෙසේ ද?
iii. ඡේදයෙහි එන උපමා පද දෙකක් උපුටා ලියන්න.
iv. කාන්තාරයෙන් එතරවන අය කවර ලකුණකින් එතර වේ ද?
v. දවල් කාලයෙහි වෙළෙන්දෝ කාන්තාරයේ වාසය කළේ කෙසේ ද?

04. ඡේදයේ එන වාක්‍ය රටාව අනුව පාලියට නගන්න.

i. සිරිසඟබෝ රජතුමා රාජ්‍යය කරවන විට අනුරාධපුර මහත් රෝගෝපද්‍රවයක් විය.
ii. රාජපුත්‍රයා රථ පන්සීයකින් නගරයේ හැසිරෙයි.
iii. අපි හිරු අවරට ගිය කල්හි ගෙදර ගොස් රාත්‍රී ආහාර ගනිමු.
iv. ළමයි පුටු වටේට තබා මණ්ඩපයක් කොට සෙල්ලම් කරයි.

## වාක්‍ය පරිවර්තනය

පාලි ලිවීමේ දී සහ දේශනා කිරීමේ දී පරිවර්තනය කිරීම ඉතා වැදගත් වේ. පරිවර්තකයා මාධ්‍ය භාෂාවත් පාලි භාෂාවත් දෙක ම දැනගෙන සිටිය යුතු ය. මෙතෙක් උගත් ව්‍යාකරණ ප්‍රයෝගත්, තවත් සුවිශේෂී ප්‍රයෝගත් මෙහි දී හඳුනාගත යුතු ය. මෙම පාඩමේ දී අපේක්ෂා කරන්නේ පාලි භාෂාවේ ඇති සුවිශේෂී වාක්‍ය රටා කීපයක් හඳුනාගෙන එබඳු වාක්‍ය රටාවන් පාලියෙන් සිංහලටත් සිංහලෙන් පාලියටත් නැගීමට පුරුදු වීමයි.

## වාක්‍ය රටා - I

සාමාන්‍යයෙන් පාලි භාෂාවේ යම් තැනකට යේ නම්, බසී නම්, නගී නම් එම ස්ථාන හෝ වෙත යන යන අදහස හැඟවෙන පදය ද්‍විතියාවෙන් තැබීම සිදු වේ.

i. **සාරිපුත්තො සාවත්ථිං ගච්ඡති.** - සැරියුත් තෙර සැවැත්නුවරට යයි

ii. **බ්‍රාහ්මණො භගවන්තං උපසංකමි** - බමුණා බුදුරදුන් වෙත එළඹියේ ය.

iii. **වානරො රුක්ඛං ආරුහති** - වඳුරා ගසට නගී.

iv. **ගජා නදිං ඔතරන්ති.** - ඇත්තු නදියට බසිති.

සාමාන්‍ය රීතිය මෙසේ වුව ද ත්‍රිපිටක පාලියේ 'ය' හා 'ත' ශබ්ද උපයෝගී කරගෙන සුවිශේෂී වාක්‍ය රටාවකින් මේ අදහස ප්‍රකාශ කෙරේ. 'යෙන' සහ 'තෙන' යන පද දෙක යොදා වාක්‍ය සාදා ගන්නා ආකාරය පහත වගුවෙන් තේරුම් ගන්න.

නිද: අඤ්ඤතරා දෙවතා යෙන භගවා තෙනුපසංකමි.

| | උක්ත පදය | 'ය' ශබ්දය තතියා | පඨමා | 'ත' ශබ්දය තතියා | |
|---|---|---|---|---|---|
| i | අඤ්ඤතරා දෙවතා | යෙන | භගවා | තෙන | උපසංකමි |
| ii | භාරද්වාජො බ්‍රාහ්මණො | යෙන | භගවා | තෙන | උපසංකමි |
| iii | සුදෙධාදනො සක්කො | යෙන | සාවත්ථි | තෙන | උපසංකමි |
| iv | චත්තාරො මහාරාජා | යෙන | භගවා | තෙන | උපසංකමිංසු |
| v | භගවා | යෙන | රාහුලො | තෙන | උපසංකමි |

එවිට වාක්‍යයන්හි අර්ථය මෙසේ වේ.

i. එක්තරා දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතනට එළඹියේ ය.
ii. භාරද්වාජ බමුණා භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතනට එළඹියේ ය.
iii. ශුද්ධෝදන ශාක්‍ය තෙම සැවැත්නුවර යම් තැනක ද එතනට එළඹියේ ය.
iv. සතරවරම් මහරජවරු භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට එළඹියහ.
v. භාග්‍යවතුන් වහන්සේ රාහුල යම් තැනක ද එතනට එළඹි සේක.

'ය' හා 'ත' ශබ්ද භාවිතයෙන් පාලි භාෂාවේ නාම විශේෂණ අවයව වාක්‍යය යෙදී තිබෙනු දැක ගත හැකි ය. ඒවා පරිවර්තනය කරන්නේ පහත සඳහන් පරිදි ය.

i. **යෙසං ලජ්ජා නත්‍ථි තෙසං සාමඤ්ඤං රිත්තං හොති.**
යමෙකුට ලජ්ජාව නැද්ද ඔවුන්ගේ මහණකම හිස් වෙයි.

ii. **යො අප්පමාදො හොති සො සග්ගං උපෙති.**
යමෙක් අප්‍රමාදී වේ නම් හේ දෙව්ලොව යයි.

iii. **යස්ස පසීදති තස්ස දාතබ්බං.**
යමෙකුට පහදී ද ඔහුට දිය යුතු ය.

iv. **යො ධම්මං පස්සති සො මං පස්සති.**
යමෙක් ධර්මය දකී ද හේ මා දකියි.

v. **යස්මිං දෙසෙ මයං පබ්බජිම්හා තස්මිං දෙසෙව උපසම්පජ්ජිස්සාම.**
යම් රටක අපි පැවිදි වීමු ද එහි ම උපසම්පදා වන්නෙමු.

යමෙකුගේ සිතෙහි යම් සිතුවිල්ලක් පහළ වූ බව පැවසීමට '**එතදහොසි**' යන සාම්ප්‍රදායික යෙදුම භාවිත වේ. එකී වාක්‍ය රටාවේ දී අදහස පහළවුණු තැනැත්තා පැවසෙන පදය චතුත්‍ථී විභක්තියෙන් තැබීමත් සිතුවිල්ල පැවසෙන අන්තර්වාක්‍යය 'එතදහොසි' යන්නට පසුව යෙදීමත් පාලි රීතිය යි.

i. **මය්හං එතදහොසි 'අහමපි පබ්බජිස්සාමී'ති.**
මට 'මම ද පැවිදි වන්නෙමි' යන සිතුවිල්ල විය.

ii. **දීඝාවුස්ස කුමාරස්ස එතදහොසි 'චිරදිට්ඨා ඛො මෙ මාතාපිතරො'ති.**
දීඝාවු කුමාරයාට 'මවිසින් මව්පියෝ බොහෝ කලකට පසු දක්නා ලදහ' යන සිතුවිල්ල විය.

iii. **තස්ස මය්හං එතදහොසි 'සුවෙ අහං ආචරියස්ස සන්තිකං ගච්ඡිස්සාමි'ති.**
ඒ මට 'හෙට මම ගුරුවරයා වෙත යන්නෙමි' යන සිතුවිල්ල විය.

iv. **සයනගතාය තාය වනිතාය එතදහොසි 'කදාහං භගවතො සාසනෙ පබ්බජිස්සාමී'ති.**
යහනට ගියා වූ ඒ වනිතාවට 'කවදා මම බුදුරදුන්ගේ ශාසනයෙහි පැවිදිවන්නෙම් ද' යන සිතුවිල්ල විය.

### නිර්ධාරණාර්ථය

'නිර්ධාරණාර්ථය' නම් යම් ගොඩකින් හෝ කණ්ඩායමකින් එක් දෙයක් හෝ කෙනෙක් වෙන් කර ගැනීම යි. මෙහි දී සමූහවාචී පදය **ෂෂ්ඨී** හෝ **සත්තමී** බහුවචනයෙන් තබනු ලැබේ.

i. සාරිපුත්තො **භික්ඛූනං** පඤ්ඤාවන්තතරො අහොසි. (ඡට්ඨී)
සාරිපුත්තො **භික්ඛූසු** පඤ්ඤාවන්තතරො අහොසි. (සත්තමී)
(සැරියුත් තෙර භික්ෂූන් අතුරෙන් වඩා නුවණැත්තේ විය.)

ii. කො **සිස්සානං** වුද්ධතරො හොති ? (ඡට්ඨී)
කො **සිස්සෙසු** වුද්ධතරො හොති ? (සත්තමී)
(ශිෂ්‍යයන් අතුරෙන් කවරෙක් වඩා වැඩිමහල් වේ ද?)

iii. දාරුචීරියො **අරහන්තානං** අඤ්ඤතරො අහොසි. (ඡට්ඨී)
දාරුචීරියො **අරහන්තෙසු** අඤ්ඤතරො අහොසි. (සත්තමී)
(දාරුචීරිය රහතුන් අතරෙහි එක්තරා කෙනෙක් විය)

iv. සිවන්ති **ධාවන්තානං බාලිකානං** සීඝතමා අහොසි. (ඡට්ඨී)
සිවන්ති **ධාවන්තීසු බාලිකාසු** සීඝතමා අහොසි. (සත්තමී)
(සිවන්ති තොමෝ දුවන්නා වූ බාලිකාවන් අතරෙහි වේගයෙන් ම දුවන්නී වූවා ය.)

### භාවසත්තමී ප්‍රයෝගය

එකිනෙකට වෙනස් උක්ත පද දෙකක් සහිත වාක්‍යය දෙකක් තනිවාක්‍යයක් බවට පත් කිරීමේ දී යෙදෙන වාක්‍ය රටාව භවාසත්තමී නම් වේ. මෙහි දී මුලින් යෙදෙන වාක්‍යයේ උක්ත පදය සත්තමී විභක්තියෙන් තැබේ. එම වාක්‍යයේ ක්‍රියාපදය වෙනුවට යෙදෙනුයේ කිතක පදය යි. එය ද සත්තමී විභක්තියෙන් යෙදේ.

බ්‍රහ්මදත්තො රාජා රජ්ජං කාරෙති
බොධිසත්තො සෙට්ඨිකුලෙ නිබ්බත්ති.

මෙම වාක්‍යය දෙක ඉහත දැක්වූ පරිදි භාව සත්තමී ප්‍රයෝගයට පත් කළ පසු

**බ්‍රහ්මදත්තෙ රාජිනි** රජ්ජං **කාරෙන්තෙ** බොධිසත්තො සෙට්ඨිකුලෙ නිබ්බත්ති.
බ්‍රහ්මදත්ත රජ රාජ්‍යය කරවන කල්හි බෝසත්තෙම සිටුකුලයේ උපන්නේ ය.

අහං ගාමං ගච්ඡිං.
එකො මිත්තො අන්තරාමග්ගෙ සම්මුඛී භවි.

**මයි** ගාමං **ගච්ඡන්තෙ** එකො මිත්තො අන්තරාමග්ගෙ සම්මුඛී භවි.
මා ගමට යන කල්හි මාගේ එක් මිත්‍රයෙක් මට හමුවිය.

රාහුලකුමාරො පබ්බජි.
සුද්ධොදනො මහාරාජා දුක්ඛං වසි.

**රාහුලකුමාරෙ පබ්බජිතෙ** සුද්ධොදනො මහාරාජා දුක්ඛං වසි.
රාහුල කුමාරයා පැවිදි වූ විට සුද්ධෝදන මහරජතුමා දුකින් විසීය.

නිපාත පද කීපයක් ඒ ඒ විභක්ති සමග ම යෙදිය යුතු ය.

■ 'නමො', 'සොත්ථි' යන නිපාත පද චතුත්ථී විභක්තිය සමග ම යෙදේ.

**නමො තස්ස භගවතො** - ඒ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා !
**සොත්ථි තෙ හොතු** ! - ඔබට සෙත් වේවා !

■ 'සන්තිකෙ', 'සන්තිකං', 'සමීපං', 'සමීපෙ', 'අවිදූරෙ' යන නිපාත ඡට්ඨී විභක්තිය සමග යෙදේ.

කුමාරො **ආචරියස්ස සන්තිකෙ** උග්ගණ්හාති. - කුමාරයා ගුරුවරයා ළඟ උගනී.

**විහාරස්ස සමීපෙ** වාපිං භවති. - විහාරය ළඟ වැවක් වෙයි.

සාරිපුත්තො **භගවතො සමීපං** උපගච්ඡති. - සැරියුත් තෙර භාග්‍යවතුන් වහන්සේ සමීපයට එළඹෙති.

**නගරස්ස අවිදූරෙ** නාවාපට්ටනං භවති. - නගරයට නොදුරෙහි නැව්තොටක් වෙයි.

■ 'සහ', 'සද්ධිං', 'සමං', 'විනා', 'නානා', 'අඤ්ඤත්‍ර' නිපාත සමග තතියා විභක්තිය යෙදේ.

මනුස්සො **භරියාය සද්ධිං** වසති. - මිනිසා බිරිය සමග වසයි.
**ආනන්දෙන විනා** සංගීතිං කාතුං න සක්කා. - ආනන්ද නැතිව සංගීතිය කළ නො හැකි ය
**අඤ්ඤත්‍ර භගවතා** අහං උපොසථං කරිස්සාමි. - භාග්‍යවතුන් වහන්සේ නැතිව මම පොහොය කරමි.

■ පඤ්චමී විභක්ති අර්ථය '**තො**' යන ප්‍රත්‍යය නාමයන්ගෙන් පසුව යෙදේ.

භයං **රාජතො** වා **අග්ගිතො** වා **චොරතො** වා භවති.
බිය රජුන්ගෙන් හෝ ගින්නෙන් හෝ සොරුන්ගෙන් හෝ වෙයි.
හන්ද **කුතො** නු ත්වං ආගච්ඡසි දිවා දිවස්ස.
නුඹ මහදවල් කොහි සිට එන්නෙහි ද?

මනුස්සා **රුක්ඛතො** පතන්ති.
මිනිස්සු ගසෙන් වැටෙති.

පරිවර්තනය සාර්ථක හා නිවැරැදි එකක් වීමට මෙම ව්‍යාකරණ සිද්ධාන්ත පිළිබඳ අවබෝධය තිබිය යුතු ය.

**අභ්‍යාස**

01. පහත වාක්‍ය සිංහලට නගා ව්‍යාකරණ සිද්ධාන්තය පැහැදිලි කරන්න.

i. නන්දෙ පබ්බජිතෙ මහන්තං දුක්ඛං අහොසි.
ii. මෙත්තං මෙ අපාදකෙහි සද්ධිං භවති.
iii. භගවා සායණ්හසමයං යෙන අම්බලට්ඨිකා තෙනුපසඞ්කමි.
iv. යෙසං නත්ථි සම්පජානමුසාවාදෙ ලජ්ජා තෙසං සාමඤ්ඤං පරිත්තං භවති.
v. එකදිවසං තස්සා එතදහොසි, අහම්පි භික්ඛුනී උපස්සයං ගන්ත්වා පබ්බජිස්සාමී'ති.
vi. නගරතො කීවදූරෙ සක්‍යානං නිගමො භවති ?

02. සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණ සිද්ධාන්ත අනුගමනය කරමින් පාලියට නගන්න.

i. අජාසත් මහරජතුමා එදවස ම බුදුරදුන් යම් තැනක ද එතනට එළඹිණි.
ii. ස්වාමීනි, ඊයේ රාත්‍රියෙහි මට 'තෘෂ්ණාව නිසා මිනිස්සු දුකසේ වසන්නාහ' යන සිතුවිල්ල විය.
iii. යමෙක් උත්සාහවත් ද ඔවුහු සියලු තන්හි ජය ලබති.
iv. භික්ෂූන් අතුරෙහි ආනන්ද තෙර වඩාත් බහුශ්‍රැත වෙයි.
v. මා කොළඹ ගිය කල්හි මගේ පසුම්බිය සොරෙක් ගත්තේ ය.

03. හිස්තැන් පුරවා සිංහලට නගන්න.

(එතදහොසි/ අරඤ්ඤං /එළකෙසු /අවිදූරෙ /පුබ්බණ්හසමයං /අඤ්ඤත්‍ර )

i. එකො සාවත්ථිවාසී බ්‍රාහමණො අචිරවතී නදියා .................... ඛෙත්තකරණත්ථාය ........................ කොට්ටෙසි.
ii. තස්ස වාණිජස්ස .................... 'අත්ථි නු ඛො මෙ එවරූපෙ පතිට්ඨාති.
iii. .................... මෙළමාතා නාම එළිකා ව්‍යත්තා අහොසි උපාය කුසලා.
iv. ආයස්මා ආනන්දො .................... නිවාසෙත්වා සාවත්ථියං පිණ්ඩාය පාවිසි.
v. අජ්ජතග්ගෙ අහං ආවුසො ආනන්ද භගවතා .................... උපොසථං කරිස්සාමි.

04. භාව සත්තමී ප්‍රයෝගය භාවිත කර තනි වාක්‍යය සේ ගළපා ලියන්න.

i. අහං පාතො'ව පාඨං පඨාමි. මෙ ආචරියො තත්ථාගන්ත්වා පඤ්හං පුච්ඡි.
ii. රාජා පරිසං ආමන්තෙසි. තදා මනුස්සා අපෙක්ඛා ඨෙසුං (අත්පුඩි ගැසූහ)
iii. ථෙරො ධම්මං දෙසෙති. උපාසකා සාධුකාරමදංසු.
iv. නාවා පට්ටනං ආගච්ඡි. වාණිජා තත්ථ සන්නිපතිංසු.
v. මණිඅක්ඛිකො රාජා කල්‍යාණියං රජ්ජං කාරෙති. භගවා භික්ඛූහි සද්ධිං ලඞ්කාදීපමුපාගමි.

05. ව්‍යාකරණ රීති අනුගමනය කොට පාලියට නගන්න.

පෙර ලක්දිව දේවානම්පියතිස්ස රජ රාජ්‍යය කරවීය. පොසොන් පොහොය දිනයෙහි රජතුමා මන්ත්‍රීවරුන් සමග මිස්සක පර්වතය යම් තැනක ද එතනට දඩයම් පිණිස (වධත්ථාය) ගියේ ය. රජතුමා මුවකු ලුහු බඳින විට (අනුබන්ධන්තෙ) මහා මහින්ද තෙර ඔහු දුටුවේ ය. එවිට මහා මහින්ද තෙරුන්ට 'මම දැන් රජතුමාට තිස්ස යයි අමතමි'යි සිතුවිල්ල විය. මහා මහින්ද තෙර 'තිස්ස තිස්ස' යයි ඇමතී ය. එවිට රජතුමාට කවරෙක් මහවනයෙහි මට 'තිස්ස' යයි අමතන්නේ දැ'යි සිතුවිල්ල විය.

# නවමො පාඨො

# නත්ථි පූවමෙව පචෙය්‍යාසි

නගරපරිග්ගාහිකා දෙවතා චින්තෙසුං අනුරුද්ධසක්කෙන අන්නභාරකාලෙ අත්තනො භාගභත්තං උපරිට්ඨපච්චෙකබුද්ධස්ස දත්වා 'නත්ථීති' මෙ වචනස්ස සවණං මා හොතු භොජනුප්පත්තියා ජානනං මා හොතු'ති පත්ථනා කතා. සචා'යං තුච්ඡපාතිං පස්සිස්සති, දෙවසමාගමං පවිසිතුං. න ලභිස්සාම, සීසම්පි නො සත්තධා ඵාලෙය්‍යා'ති. අථ නං පාතිං දිබ්බපූවෙහි පුණ්ණං අකංසු. තස්සා ගුළමණ්ඩලෙ ඨපෙත්වා උග්ඝාටිතමත්තාය පූවගන්ධො සකල නගරෙ ඡාදෙත්වා ඨිතො. පූවඛණ්ඩං මුඛෙ ඨපිතමත්තමෙව සත්තරසහරණිසහස්සානි අනුඵරි. සො චින්තෙසි ''නාහං මාතු පියො, එත්තකං මෙ කාලං ඉමං නත්ථිපූවං නාම න පචි, ඉතො පට්ඨාය අඤ්ඤං පූවං නාම න ඛාදිස්සාමී'ති ගෙහං ගන්ත්වාපි මාතරං පුච්ඡි; ''අම්ම තුම්හාකං අහං පියො, අප්පියො'ති ''තාත එකක්ඛිනො අක්ඛි විය ච හදයං විය ච අතිපියො මෙ'ති අථ කස්මා එත්තකං කාලං මය්හං නත්ථිපූවං න පචිත්ථ අම්මා'ති. සා චුල්ලුපට්ඨාකං පුච්ඡි. අත්ථි කිඤ්චි පාතියං තාතා'ති ? පරිපුණ්ණා අය්‍යෙ පාති පූවෙහි, එවරූපා පූවා නාම මෙ න දිට්ඨපුබ්බා''ති. සා චින්තෙසි ''මය්හං පුත්තො පුඤ්ඤවා, කථාභිනීහාරො භවිස්සති''ති අථ නං පුත්තො අම්ම ඉතො පට්ඨායාහං අඤ්ඤං පූවං නාම න ඛාදිස්සාමි, නත්ථි පූවමෙව පචෙය්‍යාසි දෙවෙතාහි පාතිං පූරෙත්වා පූවා පහිතා භවිස්සන්තීති'. සා පි'ස්ස තතො පට්ඨාය'' පූවං ඛාදිතු කාමොම්හී'ති වුත්තෙ තුච්ඡපාතිමෙව අඤ්ඤාය පාතියා පටිකුජ්ජිත්වා පෙසෙති, යාව ආගාරමජ්ඣෙ වසි, තාවස්සදෙවතා දිබ්බපූවෙ පහිණිංසු.

( දෙවදත්තත්ථෙරවත්ථු, ධම්මපදට්ඨකථා)

**පදමාලාව**

| | | | |
|---|---|---|---|
| අනුරුද්ධසක්කෙන | (ස) | - | අනුරුද්ධ ශාක්‍යයා විසින් |
| අන්නභාරකාලෙ | (ස) | - | අන්නභාර නමින් උපන් කල්හි |
| භාගභත්තං | (ස) | - | බත් කොටස |
| උපරිට්ඨපච්චෙකබුද්ධස්ස | (ස) | - | උපරිට්ඨ පසේ බුදුන්ට |
| නගරපරිග්ගහිතා | (ස) | - | නගරය ආරක්‍ෂා කරන |
| භොජනුප්පත්තියා | (ස) | - | බොජුන් උපදින ආකාරය ගැන |
| ජානනං | (කි) | - | දැනීමක් |
| මා හොතු | (ක්‍රි) | - | නොවේවා |
| පත්ථනං | (කි) | - | ප්‍රාර්ථනය |
| තුච්ඡපාතිං | (ස) | - | හිස් පාත්‍රය |
| පස්සිස්සති | (ක්‍රි) | - | දක්නේය |
| දෙවසමාගමං | (ස) | - | දේවසභාවට |
| පවිසිතුං | (තු) | - | පිවිසෙන්නට |
| ලභිස්සාම | (ක්‍රි) | - | ලබන්නෙමු |
| සත්තධා | (ත) | - | සත්කඩකට |

| | | | |
|---|---|---|---|
| ඵාලෙය්‍ය | (ක්‍රි) | - | පැලෙන්නේ ය |
| දිබ්බපූවෙහි | (ස) | - | දිව්‍ය කැවුමෙන් |
| පුණ්ණං | (කි) | - | පිරුණක් |
| ගුළමණ්ඩලෙ | (ස) | - | ක්‍රීඩා පිට්ටනියෙහි |
| උග්ඝාටිතමත්තාය | (ස) | - | වැසුම් හැරි පමණින් |
| පූවගන්ධො | (ස) | - | කැවුම් සුවඳ |
| ඡාදෙත්වා | (පූ.ක්‍රි) | - | වසා |
| ඨිතො | (කි) | - | සිටියේ |
| පූවඛණ්ඩං | (ස) | - | කැවුම් කෑල්ලක් |
| සත්තරසහරණිසහස්සානි | (ස) | - | සත්දහසක් රස නහර |
| නත්ථි පූවං නාම | (ස) | - | නැති කැවුම් නම් |
| එකක්ඛිනො | (ස) | - | එක ඇසක් ඇත්තහු |
| එත්ථකං | (නි) | - | මෙපමණ |
| න දිට්ඨපුබ්බා | (ස) | - | නොදුටු විරූය |
| පුඤ්ඤවා | (ත) | - | පින් ඇත්තෙකි |
| කථාභිනීහාරො | (ස) | - | කරන ලද ප්‍රාර්ථනා ඇත්තෙකි |
| ඉතො පට්ඨාය | (නි) | - | මෙතැන් පටන් |
| ඛාදිතුකාමො | (කි) | - | කනු කැමැත්තේ |
| ආගරමජ්ඣෙ | (ස) | - | ගිහිගෙය |
| පහිණිංසු | (ක්‍රි) | - | යැවූහ |

**අභ්‍යාස**

1. ''නත්ථි පූවමෙව පචෙය්‍යාසාසි'' යන ඡේදය සිංහලට නගන්න.
2. ඡේදය ඇසුරෙන් පාලියෙන් පිළිතුරු ලියන්න.

i. කෙ තුච්ඡපාතිං දිබ්බපූවෙහි පූරෙසුං ?
ii. රසහරණියො කිත්තකප්පමාණා භවන්ති ?
iii. යදි දෙවා තුච්ඡපාතිං දිබ්බපූවෙහි න පූරෙය්‍යුං තෙ කිං න ලභෙය්‍යුං ?
iv. අනුරුද්ධො කෙන කම්මෙන දිබ්බපූවානි ලභි ?
v. මාතා තතො පට්ඨාය කිං කත්වා නත්ථි පූවං පෙසෙසි.

3. ඡේදය ඇසුරෙන් පිළිතුරු ලියන්න.

i. අනුරුද්ධ ශාක්‍යයා කළ පුණ්‍ය කර්මය කුමක් ද?
ii. 'අභිනීහාර ' යන්න පැහැදිලි කරන්න.
iii. අනුරුද්ධ කුමාරයා තමාගේ මවගෙන් ප්‍රිය අප්‍රිය භාවය විසීමට හේතුව කුමක් ද?
iv. ඡේදයේ එන උපමා දෙකක් උපුටා ලියන්න.
v. 'භොජනුප්පත්තියා ජානනං මා හොතු' යන්නේ තේරුම ලියන්න.

# වාක්‍ය පරිවර්තනය II

**හැඳින්වීම:-**

වාක්‍ය පරිවර්තනයේ දී ක්‍රියාපද සම්බන්ධ සුවිශේෂී ප්‍රයෝග හඳුනා ගැනීම වැදගත් වෙයි. භාෂාවේ නිවැරැදි ව භාවිතය ඒ සඳහා ඉවහල් වේ. මෙහි දී **ආඛ්‍යාත විභක්තීන්හි සුවිශේෂී අර්ථ, ද්විකර්මක ධාතු යෝගය, මා නිපාත යෝගය හා ක්‍රියා විශේෂණ භාවිතය** පිළිබඳ නිවැරැදි අවබෝධයෙන් පරිවර්තන කාර්යය සිදු කරන අයුරු හඳුන්වා දෙමු.

**විශේෂ ධාතු ප්‍රයෝග:-**

**ද්විකර්මක ධාතු**

**'දුහ යාච රුධි පුච්ඡ - භික්ඛ සාසු වචාදයො**
**නී වහ හරාදයො ච - උභයෙ තෙ ද්විකම්මකා'**

යනුවෙන් **'දුහ', 'යාච', 'රුධි', 'පුච්ඡ', 'භික්ඛ', 'සාසු', 'වච', 'නී', 'වහ', 'හර'** යනාදී ධාතු දැක්වේ. මේ ධාතු යෝගයේ දී කර්ම පදයත්, පූර්ව සීමාර්ථවත් පඤ්චමී විභක්ත්‍යර්ථවත් පදයත් යන දෙක ම දුතියාවෙන් තැබේ. පාලියෙහි පදය දුතියා වුව ද සිංහලට පරිවර්තනයේ දී එය පඤ්චමී අර්ථයෙන් තැබිය යුතු ය.

ආචරියො **සිස්සං** පඤ්හං පුච්ඡති. - ගුරුවරයා **ශිෂ්‍යයාගෙන්** ප්‍රශ්න අසයි.
අද්ධිකො **මානවකං** මග්ගං පුච්ඡති. - මගියා **තරුණයාගෙන්** මග අසයි.
යාචකො **සෙට්ඨිං** ආහාරං භික්ඛති. - හිඟන්නා **සිටුවරයාගෙන්** ආහාර සිඟයි.
ගොපාලො **ගාවං** පයං දොහති. - ගොපල්ලා **දෙනගෙන්** කිරි දොවයි.
කුමාරො **ගජං** මනුස්සං අවරුන්ධති. - කුමාරයා **ඇතාගෙන්** මිනිසා වළක්වයි.

**ගහාදී ධාතු යෝගය**

ගහ, කමු, චුබි ධාතු යෝගයේ දී සුවිශේෂී වාක්‍ය රටාවන් පාලියෙහි දැකගත හැකි ය. මෙහි දී 'ගහ' ආදී ධාතුන්ගෙන් සිද්ධ ක්‍රියා පද හා බැඳෙන පදය සත්තමී විභක්තියෙන් තබනු ඇත. සිංහලට පරිවර්තනය කිරීමේ දී සිංහල භාෂාවට උචිත පරිදි පරිවර්තනය කළ යුතු ය.

නාරදො දෙවලං **ජටාසු අක්කමි.** - නාරද දේවලගේ ජටාව පෑගුවේ ය.
මාතා පුත්තං **මුද්ධනි චුම්බි.** - මව පුතාගේ හිස සිම්බා ය.
අය්‍යා දාසිං **කෙසෙසු ගහෙත්වා** පහරි - ආර්යාව දාසිය කෙස්වැටියෙන් ගෙන පහර දුන්නීය.
**පාදෙසු ගහෙත්වා** ත්වං පාරගංගං ඛිපිස්සාමි. - පාවලින් අල්ලා තා ගඟින් එතරට විසිකරමි.
සො බිළාලං **නංගුට්ඨෙ අක්කමි.** - ඔහු බළලාගේ නඟුට පෑගුවේය.

සාමණෙරො **යට්ඨිකොටියං ගහෙත්වා** ථෙරං නයති - සාමණේර තෙමේ යෂ්ටි කෙළවර ගෙන තෙරුන් වහන්සේ රැගෙන යයි.

## මා නිපාත යෝගය

මා නිපාතය ප්‍රතිෂේධාර්ථයෙහි යෙදෙන්නකි. '**මා යොගෙ සබ්බකාලෙ ච**' යන සූත්‍රයට අනුව මා නිපාතය හා බැඳෙන ආඛ්‍යාතය හීයත්තනී හෝ අජ්ජතනී වෙයි. විකල්පයෙන් පඤ්චමී විභක්තිය වෙයි. කවර ක්‍රියා විභක්තියක් සමග යෙදුණ ද එහි අර්ථය ප්‍රතිෂේධාර්ථ විධානයක් වීම හෝ ප්‍රාර්ථනයක් වීම සුවිශේෂී වෙයි. පහත නිදර්ශන විමසන්න.

මා මං අපාදකො **හිංසි.** - පා නැත්තා මට හිංසා නො කරන්න.
**මාවොච** ඵරුසං කඤ්චි. - කිසිවෙකුට රළු බස් නො කියන්න.
ආවුසො මා **සොචිත්ථ** මා **පරිදෙවිත්ථ.** - ඇවැත්නි ශෝක නො කරන්න. නො වැළපෙන්න.
මා මෙ **කුජ්ඣි** මහාවීර. - මහාවීරයාණෙනි, මට නො කිපෙන්න.
මා පුනපි එවං **සද්දමකාසි.** - නැවත මෙවැනි ශබ්ද නො කරන්න.
මා තෙ **භවතු** අන්තරායො. - ඔබට අනතුරක් නො වේවා !
මා මෙ බාලසමාගමො **හොතු.** - මට බාල ඇසුරක් නො වේවා !

## ප්‍රයෝජ්‍ය ක්‍රියා භාවිතය

'**ධාතූහි ණෙ ණය ණාපෙ ණාපයා කාරිතානි හෙතුවත්ථෙ**' යන සූත්‍රයට අනුව හේත්වර්ථයෙහි හෙවත් ප්‍රයෝජ්‍යාර්ථයෙහි **ණෙ, ණය, ණාපෙ, ණාපය** යන ප්‍රත්‍යය ධාතූන්ගෙන් පසුව යෙදේ. 'ණ'කාරය ධාතුව වෘද්ධි කිරීම සඳහා ය. අන්‍යයෙකු ලවා කරවන ක්‍රියා ප්‍රයෝජ්‍ය ක්‍රියා නම් වේ. ක්‍රියාපද සෑදෙන්නේ පහත සඳහන් පරිද්දෙනි.

**කර** + **ණෙ** + **ති** > **කාරෙති** - කරවයි
**කර** + **ණය** + **ති** > **කාරයති** - කරවයි
**කර** + **ණාපෙ** + **ති** > **කාරාපෙති** - කරවයි
**කර** + **ණාපය** + **ති** > **කාරාපයති** - කරවයි

කවර ප්‍රත්‍යය යෙදුව ද අර්ථය වෙනස් නො වේ. පරිවර්තනයේ දී මෙය වැදගත් වන්නේ එය වාක්‍යවල යෙදීමේ සුවිශේෂත්වය නිසා ය.

ප්‍රයෝජ්‍ය ක්‍රියාව යෙදෙන විට අකර්මක ක්‍රියා සකර්මක වෙයි.

උදා:- **දාරකො රොදති.** - **දාසී දාරකං රොදෙති.**
ළමයා හඬයි. - දාසිය දරුවා හඬවයි.

**සුනඛො භසති.** - **සෙට්ඨී සුනඛං භසාපෙති.**
බල්ලා බුරයි. - සිටුවරයා බල්ලා බුරවයි.

**කුමාරො පතති.** - **අරි කුමාරං පාතෙති.**
කුමාරයා වැටෙයි. - සතුරා කුමාරයා වට්ටවයි.

ප්‍රයෝජ්‍ය ක්‍රියාව යෙදෙන විට සකර්මක ක්‍රියා ද්විකර්මක වෙයි.

**පුරිසො රුක්ඛං ඡින්දති.** - **අමච්චො පුරිසං රුක්ඛං ඡේදාපෙති.**
පුරුෂයා ගස කපයි. - ඇමතිතුමා පුරුෂයා ලවා ගස කප්පවයි.

**දාසො භාරං හරති.** - **සාමි දාසං භාරං හරාපෙති.**
දාසයා බර ගෙනයයි. - ස්වාමියා දාසයා ලවා බර ගෙනියවයි.

**සාමණෙරො පොත්ථකං පඨති.** - **ථෙරො සාමණෙරං පොත්ථකං පාඨෙති.**
සාමණේර තෙමේ පොත පාඩම් කරයි. - තෙරුන් වහන්සේ සාමණේරයා ලවා පොත පාඩම් කරවයි.

**වඩ්ඪකී ගෙහං කරොති.** - **ධනවා වඩ්ඪකිං ගෙහං කාරෙති.**
වඩුවා ගෙය කරයි. - ධනවතා වඩුවා ලවා ගෙය කරවයි.

ප්‍රයෝජ්‍ය ක්‍රියාවේ දී ප්‍රයෝජ්‍ය කර්තෘ පදය තතියා විභක්තියෙන් ද සිටිය හැකි ය. පරිවර්තනයේ දී අර්ථය වෙනස් නො වේ.

**පුරිසො රුක්ඛං ඡින්දති.** - **අමච්චො පුරිසෙන රුක්ඛං ඡේදාපෙති.**
**දාසො භාරං හරති.** - **සාමි දාසෙන භාරං භාරාපෙති.**

**සාමණෙරො පොත්ථකං පඨති** - **ථෙරො සාමණෙරෙන පොත්ථකං පාඨෙති.**
**වඩ්ඪකී ගෙහං කරොති** - **ධනවා වඩ්ඪකිනා ගෙහං කාරෙති.**

මෙසේ ප්‍රයෝජ්‍ය ක්‍රියා යෙදෙන ආකාරය අවබෝධ කර ගැනීමෙන් පරිවර්තන කාර්යය සාර්ථක කරගත හැකි ය.

**ක්‍රියා විශේෂණ**

පරිවර්තනයේ දී ක්‍රියාපදය සම්බන්ධ තවත් වැදගත් අංගයක් ලෙස ක්‍රියා විශේෂණ භාවිතය පිළිබඳ අවබෝධය දැක්විය හැකි ය.

**ක්‍රියා විසෙසණං යාව - තං සබ්බං හි නපුංසකෙ**
**සියා ච එකවචනං - යථා භික්ඛු සුඛං ඨිතා**

යන බාලාවතාර නිර්දේශයට අනුව පාලි භාෂාවේ ක්‍රියා විශේෂණ නපුංසක ලිංග දුතියා ඒකවචන වෙයි. ඇතැම් විට තතියා විභක්ති ඒකවචනයෙන් ද සිටියි. ඇතැම් නිපාත පද ද ක්‍රියා විශේෂණ වශයෙන් යෙදී ඇත. අර්ථාවබෝධය සඳහා මෙහිලා ක්‍රියා විශේෂණ පද කීපයක් දක්වමු.

| | | | |
|---|---|---|---|
| **සාධුකං** | - මනාකොට | **විසුං** | - වෙන් වූ |
| **සීඝං** | - වහා | **එවං** | - මෙසේ |
| **ඛිප්පං** | - වහා | **සහසා** | - වහා |
| **දුක්ඛං** | - දුකසේ | **පච්ඡතො** | - පසුව |
| **සුඛං** | - සැපසේ | **පුරතො** | - ඉදිරියෙන් |
| **නිච්චං** | - නිතර | **අන්තමසො** | - අඩුම ගණනේ |
| **කිච්ඡං** | - අමාරුවෙන්, දුකසේ | **උපරි** | - උඩ |
| **අභික්ඛණං** | - නිතර | **පඨමං** | - පළමු ව |
| **අභිණ්හං** | - නිතර | **නිබද්ධං** | - නිතර |
| **සතතං** | - නිතර | **සක්කච්චං** | - මනාව |
| **සනිකං** | - හෙමින් | **සම්මා** | - මනාව |
| **සමං** | - සම ලෙස | | |

ක්‍රියා විශේෂණ වාක්‍යවල යෙදෙන නිශ්චිත තැනක් නැත. පහත වාක්‍යය බලන්න.

i. විඤ්ඤූ **ඛිප්පං** ධම්මං විජානාති.
නුවණැත්තා වහා ධර්මය දැනගනියි.

ii. කුමාරො **සුඛං** සයති.
කුමාරයා සුවසේ නිදයි.

iii. යාචකො **කසිරෙන** ඝාසච්ඡාදං ලභති.
හිඟන්නා දුකසේ ආහාර ලබයි.

iv. මයං **සුඛෙන** සයිතුං ලභිස්සාම.
අපි සුවසේ නිදා ගැනීමට ලබමු.

v. භටා අමච්චස්ස **පුරතො** ගච්ඡන්ති.
භටයෝ ඇමතිතුමාට පෙරටුව යති.

**අභ්‍යාස**

01. සුදුසු ක්‍රියා විශේෂණ පද යොදා වාක්‍යය සම්පූර්ණ කොට සිංහලට නගන්න.
(නිබද්ධං, ඛිප්පං, අභිණ්හං, සහසා, සුසුඛං)

i. පඤ්ඤාවන්තා ..................... ධම්මං විජානන්ති.
ii. භගවා ..................... භික්ඛූනං අප්පමාදෙන ඔවදි.
iii. මනුස්සා ..................... ගන්ත්වා ආසනානි පඤ්ඤාපෙසුං.
iv. ..................... වත ජීවාම වෙරිනෙසු අවෙරිනො.
v. ථෙරො තස්ස ගෙහෙ ..................... භුඤ්ජති.

02. සිංහලට නගන්න.

i. ආචරියො සිස්සං ධම්මං බොධෙති.
ii. අසප්පුරිසා සයම්පි පාපානි කරොන්ති පරෙහි’පි කාරාපයන්ති.
iii. අමච්චා සූදෙන ඔදනං පචාපෙති.
iv. මාතා දාසිං දාරකං සයාපෙති.
v. ගුරු බහුසිස්සෙ ධම්මං උග්ගණ්හාපෙති.

03. පාලියට නගන්න.

i. රාජපුරුෂයෝ ගම්වැසියන් ලවා හෙට මාර්ගය ශුද්ධ කරවන්නාහ.
ii. ඇදුරුතෙම ශිෂ්‍යයා ලවා අකුරු ලියවයි.
iii. අපි ළමුන් ලවා මල් කඩවා බුදුන්ට පූජා කරමු.
iv. තොපි අද ම මෙහෙකරුවන් ලවා පාසල් බිම ශුද්ධ කරවු.
v. පාපකාරයා ඔහුගේ සොහොයුරන් ලවා පක්ෂීන් මරවයි.

04. පහත වාක්‍යය සිංහලට නගන්න.

i. මාතා පුත්තං බාහාසු ගහෙත්වා පණ්ණසාලං ගච්ඡති.
ii. පිතා කුමාරං මුද්ධනි චුම්බිත්වා යුද්ධාය උය්‍යොජෙසි.
iii. සබ්බෙ භද්‍රානි පස්සන්තු මා කඤ්චි පාපමාගමා.
iv. මා මෙ කුජ්ඣි මහාවීර, මා මෙ කුජ්ඣි මහාමුනි.
v. මයං ගොතමං පරාභවන්තං පුරිසං පුච්ඡාම.

05. පාඩමෙන් උගත් වාක්‍යවලට අනුව පාලියට හරවන්න.

i. ඔවුහු කෙස්වලින් අල්ලා එකිනෙකාට ගසති.
ii. නන්දිමිත්‍ර යෝධයෙකු දෙපයින් අල්ලා ගඟිනෙතරට වීසි කළේය.
iii. හිඟන්නා අමාරුවෙන් ආහාරපාන සොයා ගෙන ඉක්මනින් අනුභව කරයි.
iv. තොපි ශෝක නො කරවු නො හඬවු නො වැළපෙවු.
v. සාමණේර තෙම අතවැසියා ලවා තෙරුන් වහන්සේගෙන් ප්‍රශ්න විමසවයි.

දසමො පාඨො

# ජයං තෙ දම්මි

අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො සීහො හුත්වා හිමවන්තප්පදෙසෙ පබ්බතගුහායං වාසං කප්පෙසි. තස්ස අවිදූරෙ එකං සරං නිස්සාය බහූ සූකරා නිවාසං කප්පෙසුං. තමෙව සරං නිස්සාය තාපසාපි පණ්ණසාලාසු වාසං කප්පෙසුං. අථෙකදිවසං සීහො මහිසවාරණාදීසු අඤ්ඤතරං වධිත්වා යාවදත්ථං මංසං ඛාදිත්වා තං සරං ඔතරිත්වා පානීයං පිවිත්වා උත්තරි. තස්මිං ඛණෙ එකො ථූලසූකරො තං සරං නිස්සාය ගොචරං ගණ්හාති. සීහො තං දිස්වා 'අඤ්ඤං එකදිවසං ඉමං ඛාදිස්සාමි, මං ඛො පන දිස්වා පුන න ආගච්ඡෙය්‍යා'ති තස්ස අනාගමනභයෙන සරතො උත්තරිත්වා එකෙන පස්සෙන ගන්තුං ආරභි. සූකරො ඔලොකෙත්වා 'එස මං දිස්වා මම භයෙන උපගන්තුං අසක්කොන්තො භයෙන පලායති, අජ්ජ මයා ඉමිනා සීහෙන සද්ධිං පයොජෙතුං වට්ටතී'ති සීසං උක්ඛිපිත්වා තං යුද්ධත්ථාය අව්හයන්තො පඨමං ගාථාමාහ.

**චතුප්පදො අහං සම්ම, ත්වම්පි සම්ම චතුප්පදො.**
**එහි සම්ම නිවත්තස්සු, කිං නු භීතො පලායසී' ති.**

සීහො තස්ස කථං සුත්වා 'සම්ම සූකර, අජ්ජ අම්හාකං තයා සද්ධිං සඞ්ගාමො නත්ථි, ඉතො පන සත්තමෙ දිවසෙ ඉමස්මිංයෙව ඨානෙ සඞ්ගාමො හොතූ'ති වත්වා පක්කාමි. සූකරො 'සීහෙන සද්ධිං සඞ්ගාමෙස්සාමී'ති හට්ඨපහට්ඨො තං පවත්තිං ඤාතකානං ආරොචෙසි. තෙ තස්ස කථං සුත්වා භීතතසිතා 'ඉදානි ත්වං සබ්බෙපි අම්හෙ ජීවිතක්ඛයං පාපෙස්සති, සාහසිකකම්මං මා කරී'ති ආහංසු. සො'පි භීතතසිතො 'ඉදානි කිං කරොමී'ති පුච්ඡි. සූකරා 'සම්ම, ත්වං එතෙසං තාපසානං උච්චාරභූමිං ගන්ත්වා පූතිගූථෙ සත්තදිවසානි සරීරං පරිවත්තෙත්වා සුක්ඛාපෙත්වා සත්තමෙ දිවසෙ සරීරං උස්සාවබින්දූහි තෙමෙත්වා සීහස්ස ආගමනතො පුරිමතරං ගන්ත්වා වාතයොගං ඤත්වා උපරිවාතෙ තිට්ඨ, සුචිජාතිකො සීහො තව සරීරගන්ධං ඝායිත්වා තුය්හං ජයං දත්වා ගමිස්සතී'ති ආහංසු. සො තථා කත්වා සත්තමෙ දිවසෙ තත්ථ අට්ඨාසි. සීහො තස්ස සරීරගන්ධං ඝායිත්වා ගූථමක්ඛිතභාවං ඤත්වා 'සම්ම සූකර, සුන්දරො තෙ ලෙසො චින්තිතො, සචෙ ත්වං ගූථමක්ඛිතො නාභවිස්ස, ඉධෙව තං ජීවිතක්ඛයං අපාපෙස්සං, ඉදානි පන තෙ සරීරං නෙව මුඛෙන ඩංසිතුං, න පාදෙන පහරිතුං සක්කා, ජයං තෙ දම්මී'ති ආහ.

**(ජාතකට්ඨකථා)**

## පදමාලාව

| | | | |
|---|---|---|---|
| කාරෙන්ත | (කි) | - | කරවන කල්හි |
| හුත්වා | (පූ.ක්‍රි) | - | වී |
| පබ්බතගුහායං | (ස) | - | පර්වත ගුහාවෙහි |
| වාසං කප්පෙසි | (ක්‍රි) | - | වාසය කළේය |
| අවිදූරෙ | (නි) | - | නුදුරෙහි |
| සරං | (නා) | - | විල |
| නිස්සාය | (නි) | - | නිසා /ඇසුරු කොට |
| තමෙව | (සං) | - | එයම |
| පණ්ණසාලාසු | (නා) | - | පන්සල්වල |
| මහිසවාරණාදීසු | (ස) | - | මීහරක් ඇතුන් ආදීන් අතුරෙන් |
| අඤ්ඤතරං | (ස.නා) | - | එක්තරා |
| වධිත්වා | (පූ.ක්‍රි) | - | නසා |
| යාවදත්ථං | (සං) | - | ඇතිතාක් |
| ඔතරිත්වා | (පූ.ක්‍රි) | - | බැස |
| උත්තරි | (ක්‍රි) | - | එතෙර වීය |
| තස්මිංඛණෙ | (නි) | - | එකෙණෙහි |
| ථූලසූකරො | (ස) | - | මහත ඌරෙක් |
| අඤ්ඤං | (ස.නා) | - | වෙනත් |
| න ආගච්ඡෙය්‍යා'ති | (සං) | - | නො එන්නේය යැයි |
| අනාගමනභයෙන | (ස) | - | නොපැමිණෙන බියෙන් |
| එකෙන පස්සෙන | (නා) | - | එක් පැත්තකින් |
| ආරභි | (ක්‍රි) | - | පටන් ගත්තේය |
| උපගන්තුං | (තු) | - | සමීපයට යන්නට |
| අසක්කොන්තො | (කි) | - | නොහැකි වන්නේ |
| පලායති | (ක්‍රි) | - | පළායයි |
| පයොජෙතුං | (තු) | - | යෙදෙන්නට |
| වට්ටතී'ති | (සං) | - | වටී යැයි |
| උක්ඛිපිත්වා | (පූ.ක්‍රි) | - | ඔසවා |
| අවහයන්තො | (කි) | - | කැඳවන්නේ |
| සම්ම | (නි) | - | මිතුර |
| කිං නු | (නි) | - | කුමක් නිසා |
| සඞ්ගාමො | (නා) | - | යුද්ධයක් |
| ඉතො | (නි) | - | මෙයින් |
| සත්තමෙ දිවසෙ | (නා) | - | හත්වැනි දවසේ |
| ඉමස්මිංයෙව | (සං) | - | මෙතැන ම |
| හොතූ'ති | (සං) | - | වේවා යැයි |
| පක්කාමි | (ක්‍රි) | - | ගියේය |
| හට්ඨපහට්ඨො | (ස) | - | තුටු පහටු වූයේ |

| | | | |
|---|---|---|---|
| ආරොචෙසි | (ක්‍රි) | - | දැන්වීය |
| භීතතසිතා | (ස) | - | බියව තැතිගත්තෝ |
| සාහසිකකම්මං | (ස) | - | සැහැසි ක්‍රියාව |
| (මා) කරී | (ක්‍රි) | - | (නො) කරන්න |
| උච්චාරභූමිං | (ස) | - | මළපහ දමන තැනට |
| පූතිගූථෙ | (ස) | - | කුණුගඳ හමන අසූචියෙහි |
| පරිවට්ටෙත්වා | (පූ.ක්‍රි) | - | පෙරළී |
| සුක්ඛාපෙත්වා | (පූ.ක්‍රි) | - | වියළා |
| උස්සාවබින්දූහි | (ස) | - | පිනිබින්දුවලින් |
| තෙමෙත්වා | (පූ.ක්‍රි) | - | තෙමා |
| පුරිමතරං | (ත) | - | කලින් ම/ මුලින් ම |
| සුචිජාතිකො | (ස) | - | පිරිසිදු ජාතිකයෙක් / පිරිසිදු ස්වභාව ඇත්තෙකි |
| ඝායිත්වා | (පූ.ක්‍රි) | - | ආඝ්‍රාණය කොට |
| ගූථමක්ඛිතභාවං | (ස) | - | අසූචිවලින් වැකුණු බව |
| ලෙසො චින්තිතො | (නා) | - | සිතු ස්වල්පය |
| නාභවිස්ස | (සං) | - | නොවන්නේ නම් |
| ඉධෙව | (සං) | - | මෙහි ම |
| අපාපෙස්සං | (ක්‍රි) | - | පමුණුවන්නෙමි |
| ඩංසිතුං | (තු) | - | හපන්නට |

**අභ්‍යාස**

01. 'ජයං තෙ දම්මි' යන ජේදය සිංහලට නගන්න.

02. පහත දැක්වෙන වාක්‍යවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. සීහො කත්ථ වාසං කප්පෙසි ?
ii. පලායන්තං සීහං දිස්වා සූකරො කිං චින්තෙසි ?
iii. සූකරස්ස ඤාතකා කිං ආහංසු ?
iv. සීහං පරාජෙතුං සූකරො කිං උපායං අකාසි ?
v. සීහො කස්මා සූකරස්ස ජයං අදදි ?

03. සිංහලෙන් පිළිතුරු ලියන්න.

i. සිංහයා ළඟ ඇති විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.
ii. සිංහයා පරාජය කිරීමට ඌරා යෙදූ උපක්‍රමය ලියන්න.
iii. මෙම කථාවෙන් ගත හැකි ආදර්ශ හතරක් ලියා දක්වන්න.
iv. මහත ඌරා සහ ඌගේ ඤාතීන් අතර වූ සංවාදය ගෙනහැර දක්වන්න.

# සන්ධි

**හැඳින්වීම.**

වෙන් වෙන්ව පවත්නා ලී කැබලි දෙකක් එකට ගළපා එක ලීයක් බවට පත් කරන්නාක් මෙන් වෙන් වෙන්ව පවත්නා පද දෙකක් ලෝප, ආදේශ, ආගම ආදී විවිධ සන්ධි කාර්යයන් අනුගමනය කොට එකපදයක් වන සේ ගැළපීම සන්ධි නම් වේ. '**වණ්ණානං සන්නිධි සන්ධි නාම**' වර්ණයන්ගේ මනා වූ ගැළපීම සන්ධි නම් වේ.

සන්ධි කිරීමේ දී භාවිත කරන ක්‍රමෝපායන් කීපයක් ඇත. ඒවා සන්ධිවිධි හෙවත් සන්ධි කාර්යයන් ලෙස හැඳින්වේ.

**ලෝප** - අකුරු ඉවත් කිරීම, කපා දැමීම නොහොත් නොකියා හැරීම.
**ආදේශ** - අකුරක් වෙනුවට අමුතුවෙන් වෙනත් අකුරක් පැමිණීම.
**ආගම** - අකුරු දෙකක් අතරට එම අකුරු තිබිය දී අලුතෙන් අකුරක් පැමිණීම.
**හ්‍රස්ව** - අකුරු කෙටිවීම හෙවත් මාත්‍රා ගණන අඩු වීම.
**දීර්ඝ** - අකුරු දීර්ඝ වීම හෙවත් මාත්‍රා ගණන වැඩි වීම.
**ද්විත්ව** - කිසියම් අකුරක් අකුරු දෙකක් බවට පත්වීම.

සන්ධි කිරීමෙන් භාෂාවට ලැබෙන **ප්‍රයෝජන** කිහිපයක් ද ඇත.

- උච්චාරණ පහසුව හෙවත් සුඛෝච්චාරණය
- ශ්‍රවණ මාධුර්යය ඇති වීම.
- ලිවීමේ පහසුව ඇති වීම.
- භාෂාවේ ක්‍රමානුකූලබව හා ව්‍යක්ත බව ඇති වීම.
- පද්‍ය රචනයේ දී ඡන්දස හා විරිත ආරක්‍ෂා වීම.

## සන්ධි ප්‍රභේද

පාලි භාෂාවේ ප්‍රධාන වශයෙන් සන්ධි ප්‍රභේද 03ක් වේ.

i. **ස්වර සන්ධි**
ii. **ව්‍යඤ්ජන සන්ධි**
iii. **නිග්ගහීත සන්ධි**

මීට අමතරව **වොමිස්සක සන්ධි** යනුවෙන් ද සන්ධි ප්‍රභේදයක් බාලාවතාරයේ දක්නට ඇත.

## ස්වර සන්ධි

සන්ධි වන පද දෙකෙන් පෙර පදයේ අග හා පර පදයේ මුල ස්වරයක් තිබී ලෝප, ආදේශ, ආගම ආදී සන්ධි විධියක් ආශ්‍රයෙන් තනි පදයක් බවට පත්වීම ස්වර සන්ධි නම් වේ. මෙහිදී සන්ධි විධි කීපයක් භාවිත කෙරෙන අතර ඒවා පහත දැක්වේ.

ලෝපය

| පූර්වස්වර ලෝපය (සරා සරෙ ලොපං)* | පරස්වර ලෝපය (වා පරො අසරූපා) |
|---|---|
| ලොක + අග්ගො | ජායා + ඉව |
| ලොක් + අ + අග්ගො [1] | ජාය් + ආ + ඉව [1] |
| ලොක් + අග්ගො | ජාය් + ආ + ව |
| ලොකග්ගො [2] | ජායාව [2] |

- ලොප් කිරීමේ දී පද දෙකේ ම සමාන ස්වර ඇති හැම විට මුල් ස්වරය ලොප් කළ යුතු ය.

1. පදයක ස්වර ව්‍යඤ්ජන වෙන් කිරීම සඳහා '**පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ**' සූත්‍රය යෙදේ.
2. සන්ධි කාර්යයෙන් පසු පද දෙක එකතු කිරීම සඳහා '**නයෙ පරං යුත්තෙ**' සූත්‍රය යෙදේ.

| දීර්ඝ | |
|---|---|
| පූර්වස්වර දීර්ඝය<br><br>පරස්වරය ලොප් කළ විට පූර්වස්වරය විකල්පයෙන් දීර්ඝ වේ. (පුබ්බො ච) | පරස්වර දීර්ඝය<br><br>පූර්වස්වරය ලොප් කළ විට පරස්වරය විකල්පයෙන් දීර්ඝ වේ. (දීඝං) |
| කිංසු + ඉධ<br>කිංස් + උ + ඉධ [1]<br>කිංස් + උ + ධ [2]<br>කිංස් + ඌ + ධ - පුබ්බොච<br>කිංසූධ[4]<br><br>1. පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ<br>2. වා පරො අසරූපා<br>3. සරා සරෙ ලොපං<br>4. නයෙ පරං යුත්තෙ | සද්ධා + ඉධ<br>සද්ධ් + ආ + ඉධ [1]<br>සද්ධ් + ඉධ [3]<br>සද්ධ් + ඊ + ධ - දීඝං<br>සද්ධීධ[4] |

**අසවර්ණාදේශය**

පූර්වස්වරය ලොප් කළ විට පරස්වරයේ ඇති 'ඉ'කාරය විකල්පයෙන් 'එ'කාරයක් බවට පත්වේ.

උප + ඉක්ඛති
උප් + අ + ඉක්ඛති - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ
උප් + ඉක්ඛති - සරා සරෙ ලොපං
උප් එක්ඛති - ක්වචාසවණ්ණං ලුත්තෙ
උපෙක්ඛති - නයෙ පරං යුත්තෙ

පූර්වස්වරය ලොප් කළ විට පරස්වරයේ ඇති 'උ'කාරය විකල්පයෙන් 'ඔ'කාරයක් බවට පත්වේ.

න + උපෙති
න් + අ + උපෙති - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ
න් + උපෙති - සරා සරෙ ලොපං
න් ඔපෙති - ක්වචාසවණ්ණං ලුත්තෙ
නොපෙති - නයෙ පරං යුත්තෙ

**යකාරාදේශය**

i. 'එ'කාරයට යකාරාදේශ වීම.

ස්වරයා පර කල්හි පූර්ව පදාන්තයේ ඇති 'එ'කාරයට **යමෙදන්තස්සාදෙසො** යන සූත්‍රයෙන් 'ය'කාරයක් ආදේශ වේ.

තෙ + අජ්ජ
ත් + එ + අජ්ජ - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ
ත් + ය් + අජ්ජ - යමෙදන්තස්සාදෙසො
ත්‍යජ්ජ - නයෙ පරං යුත්තෙ

ii. 'ඉ'වර්ණයට යකාරාදේශ වීම

ස්වරයා පර කල්හි පූර්ව පදාන්තයේ ඇති 'ඉ'වර්ණයට 'ය'කාරයක් ආදේශ වේ. මෙය සිදුවනුයේ **ඉවණ්ණො යං නවා** යන සූත්‍රයෙනි.

වුත්ති + අස්ස (විසන්ධිය)
වුත්ත් + ඉ + අස්ස - (පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ)
වුත්ත් + ය් + අස්ස - (ඉවණ්ණො යං නවා)
වුත්‍යස්ස - (නයෙ පරං යුත්තෙ)

| වකාරාදේශය | දකාරාදේශය |
|---|---|
| ස්වරයක් පර පදයේ මුල ඇති විට මුල් පදයේ අග ඇති 'ඕ'කාරයට සහ 'උ'කාරයට ඇතැම් විට 'ව'කාරයක් ආදේශ වේ.<br>**(වමොදුදන්තානං)**<br><br>කො + අහං<br>ක් + ඔ + අහං - පුබ්බමධොඨිතමස්සරං ....<br>ක් + ව් + අහං - වමොදුදන්තානං<br>ක් + ව්+ ආහං - දීඝං<br>ක්වාහං - නයෙ පරං යුත්තෙ<br><br>සු + ආගතං<br>ස් + උ + ආගතං - පුබ්බමධොඨිතමස්සරං ....<br>ස් + ව් + ආගතං - වමොදුදන්තානං<br>ස්වාගතං - නයෙ පරං යුත්තෙ | ස්වරයා පර කල්හි පූර්වයේ ඇති මහාප්‍රාණ 'ධ'කාරයට අල්පප්‍රාණ 'ද'කාරයක් '**දොධස්ස ච**' යන සූත්‍රයෙන් ආදේශ වේ. ඇතැම් විටෙක ව්‍යඤ්ජනාක්ෂරයක් පර කල්හි ද මේ ආදේශය සිදුවේ.<br><br>ඉධ + අහං<br>ඉද + අහං - දොධස්ස ච<br>ඉද් + අ + අහං - පුබ්බමධොඨිතමස්සරං ...<br>ඉද් + අහං - සරා සරෙ ලොපං<br>ඉද් +ආ + හං - දීඝං<br>ඉදාහං - නයෙ පරං යුත්තෙ<br><br>ඉධ භික්ඛවෙ<br>ඉදභික්ඛවෙ - දොධස්ස ච |

### රිකාරාදේශය

ස්වරයා කෙරෙන් පර වූ එව ආදී ශබ්දයන්ගේ 'එ'කාරය 'රි'කාරයක් බවට පත් වේ. ඇතැම් විටෙක පූර්ව පදයට ගැළපෙන සේ හ්‍රස්ව ද වේ. මෙම කාර්යයන් දෙක ම සිදුවනුයේ '**එවාදිස්සරිපුබ්බො ච රස්සො**' යන සූත්‍රයෙනි.

යථා එව
යථ් + ආ + එව - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ
යථ් + ආ + රි ව - එවාදිස්සරිපුබ්බො ච රස්සො
යථරිව - නයෙ පරං යුත්තෙ

### අබ්භාදේශය

ස්වරයක් පර කල්හි අභි උපසර්ග පදයට 'අබ්භ' ආදේශ වේ. මෙය සිදුවනුයේ '**අබ්භො අභි**' යන සූත්‍රයෙනි.

අභි + උග්ගතො
අබ්භ + උග්ගතො - අබ්භො අභි
අබ්භ් + අ + උග්ගතො - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ
අබ්භ් + උග්ගතො - සරා සරෙ ලොපං
අබ්භුග්ගතො - නයෙ පරං යුත්තෙ

### ආගම

බාලාවතාරයේ ඇති **'යවමදනතරලා චාගමා'** යන සූත්‍රයේ බලයෙන් ස්වරයක් පර කල්හි පද මධ්‍යයට 'ය' 'ව' 'ම' 'ද' 'න' 'ත' 'ර' 'ල' 'ග' යන අකුරු 09 ආගම වේ. ආදේශයේ දී මෙන් පවත්නා අකුරක් විනාශ නොකොට අලුත් අකුරක් ලෙසින් පද මධ්‍යයට පැමිණෙන හෙයින් ආගම මිතුරෙකු වැනි යැයි ද ව්‍යාකරණඥයෝ උගන්වති.

| | | | |
|---|---|---|---|
| 'ය' ආගම | න + ඉමස්ස | - නයිමස්ස | ය |
| 'ව' ආගම | ති + අඞ්ගුලං | - තිවඞ්ගුලං | ව |
| 'ම' ආගම | ඉධ + ආහු | - ඉධමාහු | ම |
| 'ද' ආගම | යාව + අත්ථං | - යාවදත්ථං | ද |
| 'න' ආගම | ඉතො + ආයති | - ඉතොනායති | න |
| 'ත' ආගම | අජ්ජ + අග්ග | - අජ්ජතග්ග | ත |
| 'ර' ආගම | නි + උපද්දවං | - නිරුපද්දවං | ර |
| 'ල' ආගම | ඡ + අභිඤ්ඤා | - ඡළභිඤ්ඤා | ලා |
| 'ග' ආගම | පුථ + එව | - පුථගෙව | චාගමා |

### ද්විත්ව සන්ධිය

ස්වරයා පර කල්හි මුලින් ඇති අකුර ඇතැම් විටෙක **'පරදෙවභාවො ඨානෙ'** යන සූත්‍රයෙන් ද්විත්ව කරනු ලැබේ.

පති + අන්තං
පත් + ඉ + අන්තං - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ
පත් + ය් + අන්තං - ඉවණ්ණො යං නවා
ප + ච් + අන්තං - සබ්බො චන්ති
ප + ච් + ච් + අන්තං - පරදෙවභාවො ඨානෙ
පච්චන්තං - නයෙ පරං යුත්තෙ

ව්‍යඤ්ජනයා පරකල්හිද ද්විත්ව වේ.

ඉධ + පමාද
ඉධ + පමාදෙ - පරදෙව භාවො ඨානෙ
ඉදප්පමාද - නයෙපරං යුත්තෙ

**අභ්‍යාස**

01. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න. සන්ධි පද විසන්ධි කරන්න.

i. ආචරියාදීනං වචනං අකරොන්තො සො කදාචිපි සුඛං න ලභති.
ii. තතො නං සුඛමන්වෙති ඡායාව අනපායිනී.
iii. මහාමහින්දත්ථෙරො ලංකාදීපමාගන්ත්වා ජිනෙරිතං ධම්මං දීපවාසීනං දෙසෙසි.
iv. සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං - ධම්මො සුචිණ්ණො සුඛමාවහාති.
v. සබ්බමෙව බුද්ධවචනං ධම්මො ච විනයො චාති ද්විධා විභජිතුං සක්කා.

02. පාඩමේ දක්වා ඇති පාලි ඡේදය ආශ්‍රයෙන් සන්ධි කළ යුතු තැන් සන්ධි කොට පහත දැක්වෙන වාක්‍ය පාලියට නගන්න.

i. බුදුරදුන්ගේ ජීවමාන කාලයේම සැවත්නුවර පාටික නම් ආජීවකයෙක් වාසය කළේය.
ii. ඔහුගේ සමීපයේ බොහෝ අතවැසියෝ ද සහායකයෝ ද වූහ.
iii. අද මා බුදුරදුන් සමග ප්‍රාතිහාර්ය (පාටිහාරියං) කරන්නට සුදුසු යැයි ඔහු සිතුවේය.
iv. භාග්‍යවතුන් වහන්සේ ද අර්හත් ය. මම ද අර්හත් ය. ඒ නිසා එන්න යැයි කීය.
v. මම මෙයින් සත්වන දින බුදුරදුන් සමග වාද කරන්නෙමි'යි යහලුවන්ට දැනුම් දුන්නේය.

03. පහත දැක්වෙන විසන්ධි පද සූත්‍රානුසාරයෙන් සන්ධි කරන්න.

| | | | |
|---|---|---|---|
| i. | චන්ද + උදය | ix. | අත්ථ + අත්ථං |
| ii. | ජින + ඊරිතං | x. | නි + අන්තරං |
| iii. | පාතො + එව | xi. | ගච්ඡාමි + ඉති |
| iv. | වන්දෙ + අහං | xii. | සු + ආගතං |
| v. | යස්ස + ඉදානි | xiii. | සාධු + ඉති |
| vi. | අභි + උග්ගතො | xiv. | අභි + ඔකාසො |
| vii. | අනු + එති | xv. | අති + අන්තං |
| viii. | තස්මා + ඉහ | | |

04. පහත දක්වෙන සන්ධි පද විසන්ධි කරන්න.

| | | | |
|---|---|---|---|
| i. | අථෙකදා | vi. | අන්වද්ධමාසං |
| ii. | නාගවෙජ්ජයා | vii. | ලොකගෙගා |
| iii. | කාලසෙසව | viii. | වීතිනාමෙති |
| iv. | පුප්ඵානොචිනිතුං | ix. | තතොපපභුති |
| v. | පාතොවුට්ඨාය | x. | සුරියොදයො |

05. 'ජයං තෙ දමමි' පාඨයේ දක්වෙන ස්වර සන්ධි කාණ්ඩයට අයත් සන්ධි පද තෝරා විසන්ධි කොට අදාළ සූත්‍රය ද ලියන්න.

# ඒකාදසමො පාඨො

# චූලෙකසාටකබ්‍රාහ්මණස්ස දානං

විපස්සිදසබලස්ස කාලස්මිඤ්හි මහාඒකසාටකබ්‍රාහ්මණො නාම අහොසි. අයං පන එතරහි සාවත්ථියං චූලෙකසාටකො නාම. තස්ස හි එකො නිවාසනසාටකො අහොසි, බ්‍රාහ්මණියාපි එකො. උභින්නම්පි එකමෙව පාරුපනං, බහි ගමනකාලෙ බ්‍රාහ්මණො වා බ්‍රාහ්මණී වා තං පාරුපති. අථෙකදිවසං විහාරෙ ධම්මස්සවණෙ ඝොසිතෙ බ්‍රාහ්මණො ආහ. ''භොති ධම්මසවණං ඝොසිතං, කිං දිවා ධම්මස්සවණං ගමිස්සසි, උදාහු රත්තිං. පාරුපනස්ස හි අභාවෙන න සක්කා අම්හෙහි එකතො ගන්තු''න්ති. බ්‍රාහ්මණී, ''සාමි, අහං දිවා ගමිස්සාමී''ති සාටකං පාරුපිත්වා අගමාසි. බ්‍රාහ්මණො දිවසභාගං ගෙහෙ වීතිනාමෙත්වා රත්තිං ගන්ත්වා සත්ථු පුරතො නිසින්නොව ධම්මං අස්සොසි. අථස්ස සරීරං ඵරමානා පඤ්චවණ්ණා පීති උප්පජ්ජි. සො සත්ථාරං පූජිතුකාමො හුත්වා ''සචෙ ඉමං සාටකං දස්සාමි, නෙව බ්‍රාහ්මණියා, න මය්හං පාරුපනං භවිස්සතී''ති චින්තෙසි. අථස්ස මච්ඡෙරචිත්තානං සහස්සං උප්පජ්ජි, පුනෙකං සද්ධාචිත්තං උප්පජ්ජි. තං අභිභවිත්වා පුන මච්ඡෙරසහස්සං උප්පජ්ජි. ඉතිස්ස බලවමච්ඡෙරං බන්ධිත්වා ගණ්හන්තං විය සද්ධාචිත්තං පටිබාහතියෙව. තස්ස''දස්සාමි, න දස්සාමී''ති චින්තෙන්තස්සෙව පඨමයාමො අපගතො, මජ්ඣිමයාමො සම්පත්තො. තස්මිම්පි දාතුං නාසක්ඛි. පච්ඡිමයාමෙ සම්පත්තෙ සො චින්තෙසි. ''මම සද්ධාචිත්තෙන මච්ඡෙරචිත්තෙන ච සද්ධිං යුජ්ඣන්තස්සෙව ද්වෙයාමා වීතිවත්තා, ඉදං මම එත්තකං මච්ඡෙරචිත්තං වඩ්ඪමානං චතුහි අපායෙහි සීසං උක්ඛිපිතුං න දස්සති, දස්සාමි න''න්ති. සො මච්ඡෙරසහස්සං අභිභවිත්වා සද්ධාචිත්තං පුරෙචාරිකං කත්වා සාටකං ආදාය සත්ථුපාදමූලෙ ඨපෙත්වා 'ජිතං මෙ. ජිතං මෙ''ති තික්ඛත්තුං මහාසද්දමකාසි.

(ධම්මපදට්ඨකථා)

## පදමාලාව

| | | | |
|---|---|---|---|
| **විපස්සිදසබලස්ස** | (ස) | - | විපස්සි බුදුරදුන්ගේ |
| **කාලස්මිඤ්හි** | (සං) | - | කාලයෙහි වනාහි |
| **මහාඒකසාටකබ්‍රාහ්මණො** | (ස) | - | එනම් ඇති බමුණා, (එක්සළුවක් ඇති බමුණා) |
| **අහොසි** | (ක්‍රි) | - | විය |
| **එතරහි** | (නි) | - | දැන් |
| **නිවාසනසාටකො** | (ස) | - | අඳිනා සළුව |
| **උභින්නම්පි** | (සං) | - | දෙදෙනාම |
| **එකමෙව** | (සං) | - | එක ම |
| **පාරුපණං** | (නා) | - | පොරවන |
| **බහි ගමනකාලෙ** | (ස) | - | බැහැරට යන කල්හි |
| **පාරුපති** | (ක්‍රි) | - | පොරවයි |
| **අථෙකදිවසං** | (සං) | - | ඉක්බිති එක් දවසක් |

| | | | |
|---|---|---|---|
| සොසිතෙ | (කි) | - | ශබ්ද කළ කල්හි |
| උදාහු | (නි) | - | නැතහොත් |
| අභාවෙන | (ස) | - | නොමැතිකමින් |
| න සක්කා | (නි) | - | නො හැකිය |
| අම්හෙහි | (ස.නා) | - | අප විසින් |
| දිවසභාගං | (ස) | - | දහවල් කාලය |
| වීතිනාමෙත්වා | (පූ.ක්‍රි) | - | කල්යවා, ඉක්මවා |
| සත්ථු පුරතො | (ස) | - | බුදුරදුන්ගේ ඉදිරියෙහි |
| අස්සොසි | (ක්‍රි) | - | ඇසීය |
| අථස්ස | (සං) | - | ඉක්බිති ඔහුගේ, ඉක්බිති ඔහුට |
| එරමානා | (කි) | - | පැතිරෙන |
| පූජිතුකාමො | (කි) | - | පුදනු කැමැති ව |
| හුත්වා | (පූ.ක්‍රි) | - | වී |
| සචෙ | (නි) | - | ඉදින් |
| මච්ඡරචිත්තානං | (ස) | - | මසුරුසිත් |
| සහස්සං | (න) | - | දහසක් |
| සද්ධාචිත්තං | (ස) | - | සැදැහැ සිතක් |
| අභිභවිත්වා | (පූ.ක්‍රි) | - | යටපත් කොට / මැඩගෙන |
| බලවමච්ඡරං | (ස) | - | බලවත් මසුරුකම |
| පටිබාහති | (ක්‍රි) | - | වළකියි |
| චින්තෙන්තස්සෙව | (ක්‍රි) | - | සිතන්නහුට ම |
| පඨමයාමො | (ස) | - | පළමු යාමය |
| අපගතො | (කි) | - | ඉකුත්විය |
| සම්පත්තෙ | (කි) | - | උදාවූ කල්හි, සම්ප්‍රාප්ත වූ කල්හි |
| තස්මිම්පි | (සං) | - | එහිදී ද |
| නාසක්ඛි | (ස) | - | නොහැකි විය |
| එත්තකං | (ති) | - | මෙපමණ |
| වඩ්ඪමානං | (කි) | - | වැඩෙන්නේ |
| උක්ඛිපිතුං | (තු) | - | ඔසවන්නට |
| පුරෙචාරිකං | (ස) | - | පෙරටු |
| ජිතං | (කි) | - | දිනන ලද |
| තික්ඛත්තුං | (නි) | - | තුන්වරක් |
| මහාසද්දමකාසි | (සං) | - | මහා ශබ්දයක් කළේය |

**අභ්‍යාස**

01. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. චූළෙකසාටකො බ්‍රාහමණො කත්‍ථ වසි ?
ii. තස්ස කිත්තකා සාටකා?
iii. ධම්මසවණාය සොසිතෙ බ්‍රාහමණො බ්‍රාහමණිං කිං අවොච ?
iv. කස්මා බ්‍රාහමණස්ස සද්ධාචිත්තං පටිබාහි ?
v. බ්‍රාහමණො 'ජිතං මෙ'ති කතික්ඛත්තුං සද්දමකාසි ?

02. පිළිතුරු සපයන්න.

i. මහා එකසාටක බමුණා විසූවේ කවර කාලයක ද?
ii. නිවාසනසාටකයේ සහ පාරුපනසාටකයේ වෙනස කුමක් ද?
iii. මසුරුකම දුරලීමට පුරුදු කළයුතු ගුණාංග තුනක් ලියන්න.
iv. රාත්‍රියක දී ඉක්මී යන යාම තුන නම් කරන්න.
v. මෙම කථා පුවතෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියා දක්වන්න.

03. ඉහත ඡේදය ආශ්‍රයෙන් පාලියට නගන්න.

i. අත්‍ථදස්සි බුදුරදුන්ගේ කාලයේ සුමන නම් ගොවියෙක් විය.
ii. ඔහු කුඹුරට යන කල්හි බිරිය සමග ම යයි.
iii. ඉක්බිති එක් දවසක් එක් මගියෙක් ඇවිත් ඔහුගෙන් උදැල්ල (කුද්දාලං) ඉල්ලුවේ ය.
iv. ඔහු උදැල්ල දෙම්දෝ නොදෙම්දෝයි සිතමින් ම බොහෝ වේලාවක් ඉක්මවී ය.
v. මසුරු සිත සමග යුද්ධ කොට එය මැඩපවත්වා 'මං දිනුවා මං දිනුවා'යැයි කියමින් ම ඔහුට උදැල්ල දුන්නේ ය.

## ව්‍යඤ්ජන සන්ධි

ව්‍යඤ්ජනාක්ෂරයන්ට මූලිකත්වය දී පර පදයේ ව්‍යඤ්ජන අකුරක් ඇති විට කරනු ලබන සන්ධිය ව්‍යඤ්ජන සන්ධි නම් වේ. බාලාවතාරයට අනුව ව්‍යඤ්ජන සන්ධියේ ප්‍රභේද හතරක් දක්නට ඇත.

i. **ලෝපාගම සන්ධිය**
ii. **අසමාන ද්විත්ව සන්ධිය**
iii. **ඔකාරාගම සන්ධිය**
iv. **ඔකාරාදේශ සන්ධිය**

### ලෝපාගම සන්ධිය

ව්‍යඤ්ජනාක්ෂරයක් පර කල්හි මුලින් ඇති ස්වරය ඇතැම් විට ලොප් වේ. ඒ ලොප් කළ තැනට 'අ'කාරයක් ආගම වේ. මෙය සිදුවනුයේ බාලාවතාරයේ ඇති **'ලොපඤ්ච තත්‍රාකාරො'** යන සූත්‍රයෙනි. මෙම සූත්‍රයේ ඇති 'ච'කාරයේ බලයෙන් ඇතැම් විට 'උ'කාරයක් ද, 'ඔ'කාරයක් ද ආගම වේ.

සො + මුනි
ස් + ඔ + මුනි
ස් + අ + මුනි
සමුනි ←

ලොපඤ්ච තත්‍රාකාරො
නයෙ පරං යුත්තෙ

→ ජානෙම + තං
ජානෙම් + අ + තං
ජානෙම් + උ + තං
ජානෙමුතං

කචචිනු + ත්වං > කචචිනොත්වං

### අසමාන ද්විත්ව සන්ධිය

අක්ෂර මාලාවේ ඇති වර්ගාක්ෂරයන්ගේ දෙවැනි හතරවැනි අක්ෂරයන්ට පිළිවෙලින් පළමුවැනි, තුන්වැනි අකුරු ද්විත්ව වේ. මෙය සිදුවනුයේ **'වග්ගෙ ඝොසාඝොසානං තතියපඨමා'** යන බාලාවතාර සූත්‍රයෙනි. මෙහි දී සිදුවනුයේ මහාප්‍රාණ අක්ෂරයන්ට අල්පප්‍රාණ අක්ෂර ද්විත්ව වීම යි.

| | | | |
|---|---|---|---|
| ඛ - ක | අ + ඛාතො | - | අක්ඛාතො |
| ඝ - ග | උ + ඝොසො | - | උග්ඝොසො |
| ඡ - ච | සෙත + ඡත්ත | - | සෙතච්ඡත්ත |
| ඣ - ජ | අ + ඣායක | - | අජ්ඣායක |
| ඨ - ට | ගත + ඨාන | - | ගතට්ඨාන |
| ථ - ත | සාරිපුත්ත + ථෙර | - | සාරිපුත්තත්ථෙර |
| ධ - ද | ඡ + ධා | - | ඡද්ධා |
| ඵ - ප | දුම + ඵලා | - | දුමප්ඵලා |
| භ - බ | මහා + භය | - | මහබ්භය |

(වග්ගෙ ඝොසා'ඝොසානං තතියපඨමා)

| ඔකාරාගම සන්ධිය | ව්‍යඤ්ජනයක් පර කල්හි සමහර තැනෙක්හි **'ක්වචි ඔ ව්‍යඤ්ජනෙ'** යන සූත්‍රයෙන් 'ඔ'කාරයක් ආගම වේ. |
|---|---|
| | පර + සහස්සං |
| | පර් + අ + සහස්සං - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ |
| | පර් + අ + ඔ සහස්සං - ක්වචි ඔ ව්‍යඤ්ජනෙ |
| | පර් + ඔ + සහස්සං - සරා සරෙ ලොපං |
| | පරොසහස්සං - නයෙ පරං යුත්තෙ |

| | |
|---|---|
| ඔකාරාදේශ සන්ධිය<br><br>අව > ඔ | බ්‍යඤ්ජනයක් පර කල්හි ඇතැම් විට 'ඔ අවස්සෙ' යන සූත්‍රයෙන් අව යන උපසර්ගයට 'ඔ'කාරයක් ආදේශ වේ. ඇතැම් තැන්වල මෙය සිදු නො වේ.<br>අව+ කාසො<br>ඔ + කාසො - ඔ අවසෙස<br>ඔකාසො - නයෙ පරං යුත්තෙ<br><br>අව > නද්ධා - ඔනද්ධා, අව > රොහති - ඔරොහති |

## නිග්ගහීත සන්ධිය

නිග්ගහීතයට මූලිකත්වය දෙමින් සිදු කරනු ලබන සන්ධිය නිග්ගහීත සන්ධි නම් වේ. මෙහි පූර්වපදයේ අන්තය නිග්ගහීතයකින් යුක්ත වන අතර පරපදය ස්වරයකින් හෝ ව්‍යඤ්ජනයකින් යුක්ත වේ. බාලාවතාරයට අනුව නිග්ගහීත සන්ධිය ද ප්‍රභේද හතරකින් යුක්ත වේ.

i. **ආදේශ සන්ධිය** ii. **ආගම සන්ධිය**
iii. **ලෝප සන්ධිය** iv. **විසඤ්ඤොග සන්ධිය**

ආදේශ සන්ධිය ද නැවත කොටස් 04කින් යුක්ත වේ.

i. **වර්ගාන්තාදේශය** ii. **'ම'කාරාදේශය**
iii. **'ද'කාරාදේශය** iv. **'ඤ'කාරාදේශය**

## වර්ගාන්තාදේශය

'ක'වර්ග 'ච'වර්ග ආදී වර්ග බ්‍යඤ්ජනාක්ෂරයක් පරපදයේ තිබී පූර්ව පදාන්තයේ නිග්ගහීතයක් ඇති විට එම නිග්ගහීතයට පර වූ වර්ග බ්‍යඤ්ජනාක්ෂරයේ වර්ගාන්තාක්ෂරය හෙවත් අනුනාසික්‍ය අක්ෂරය ආදේශ වේ. **(වග්ගන්තං වා වග්ගෙ)**

| | | |
|---|---|---|
| ඞ | සරණංකරො > සරණඞ්කරො, සංඛාත > සඞ්ඛාත<br>සංගායනා > සඞ්ගායනා, සංසාදිසෙස > සඞ්ඝාදිසෙස | වග්ගන්තං වා වග්ගෙ |
| ඤ | සංචාර > සඤ්චාර, සංජිඤති > සඤ්ජිඤති<br>සංජීව > සඤ්ජීව, සංඤාපන > සඤ්ඤාපන | |
| ණ | සංඨිතො > සණ්ඨිතො පුංඩරීක > පුණ්ඩරීක | |
| න | සං තොස > සන්තොස සංථාර > සන්ථාර<br>සංදෙහ > සන්දෙහ තං ධනං > තන්ධනං | |
| ම | සං පටිච්ඡන > සම්පටිච්ඡන සං ඵුට්ඨ > සම්ඵුට්ඨ<br>සං බන්ධ > සම්බන්ධ සං භාවනා > සම්භාවනා | |
| | මෙහි ඇති 'ව'කාරයේ බලය මත ලකාරය පර කල්හි ද නිග්ගහීතයට 'ල'කාරයක් ආදේශ වේ.<br>පුං ලිංග > පුල්ලිඞ්ග<br>සං + ලෙඛ > සල්ලෙඛ | |

## 'ම'කාරාදේශය හා 'ද'කාරාදේශය

ස්වරයක් පර කල්හි ඊට මුලින් ඇති නිග්ගහීතයට '**මදාසරෙ**' යන සූත්‍රයෙන් 'ම'කාරයක් හෝ 'ද'කාරයක් ආදේශ වේ.

| | | | | |
|---|---|---|---|---|
| එවං + එව | | | | යං + අනිච්චං |
| එව + ම් + එව | ← ම් | මදාසරෙ | ද් → | ය + ද් + අනිච්චං |
| එවමෙව | | නයෙ පරං යුත්තෙ | | යදනිච්චං |

## 'ඤ'කාරාදේශය - I

'එ'කාරය හෝ 'හ'කාරය පරව සිට පූර්වයේ නිග්ගහීතයක් වේ නම් එයට 'ඤ'කාරයක් ආදේශ වේ. මෙය සිදුවනුයේ '**එහෙඤ්ඤං**' යන සූත්‍රයෙනි.

| | | |
|---|---|---|
| තං + එව | | |
| තඤ් + එව | - | එහෙඤ්ඤං |
| ත + ඤ් + ඤ් + එව | - | පරද්වෙභාවො ඨානෙ |
| තඤ්ඤෙව | - | නයෙ පරං යුත්තෙ |

තං + හි > තඤ්හි

## 'ඤ'කාරාදේශය - II

'ය'කාරය පර කල්හි ද මුලින් ඇති බිංදුවට එම 'ය'කාරය ද සමගින් 'ඤ'කාරයක් ආදේශ වේ. මෙය .... බාලාවතාරයේ '**සයෙච**' යන සූත්‍රයෙන් සිදුවේ.

| | |
|---|---|
| සං + යොගො | |
| සං + ය් + ඔ + ගො | - පුබ්බමධොඨිතමස්සරං සරෙන වියොජයෙ |
| ස + ඤ් + ඔගො | - සයෙච |
| ස + ඤ් + ඤ් + ඔගො | - පරද්වෙභාවො ඨානෙ |
| සඤ්ඤොගො | - නයෙ පරං යුත්තෙ |

## ආගම සන්ධිය

ස්වරයක් හො ව්‍යඤ්ජනයක් පරකල්හි ඇතැම් තැනෙක බිඳුව ආගම වේ. (**නිග්ගහීතඤ්ච**)

| | | | |
|---|---|---|---|
| නිද : | චක්ඛු | + උදපාදි | > චක්ඛුං උදපාදි |
| | අව | + සිරො | > අවංසිරො |
| | අණු | + ථූලානි | > අණුංථූලානි |

**ලෝප සන්ධිය**

i. **ක්වචි ලොපං** යන සූත්‍රයෙන් ස්වරයා පරකල්හි නිග්ගහීතය ලොප් වේ.

විදූනං + අග්ගං > විදූනග්ගං
අදාසිං + අහං > අදාසහං

ii. **බ්‍යඤ්ජනෙ ච** යන සූත්‍රයෙන් බ්‍යඤ්ජන අකුරක් පරකල්හි ද නිග්ගහීතය ලොප් වේ.

බුද්ධානං + සාසනං > බුද්ධානසාසනං
අරියසච්චානං + දස්සනං > අරියසච්චානදස්සනං

iii. **පරො වා සරො** යන සූත්‍රයෙන් බින්දුවෙන් පරව ඇති ස්වරය ලොප් වේ. ස්වරය ලොප් වූ පසු වර්ගාන්තා දේශය ද වේ.

| | | | |
|---|---|---|---|
| දුතියං | + | අපි | |
| දුතියං | + | පි | පරො වා සරො |
| දුතියම්පි | . | | වග්ගන්තං වා වග්ගෙ |

| | | | |
|---|---|---|---|
| අභිනන්දුං | + | ඉති | . |
| අභිනන්දුං | + | ති | .පරො වා සරො |
| අභිනන්දුන්ති | . | | වග්ගන්තං වා වග්ගෙ |

**විසඤ්ඤොගා සන්ධිය**

**බ්‍යඤ්ජනො ච විසඤ්ඤොගො** යන සූත්‍රයෙන් බින්දුවෙන් පර ස්වරය ලොප්කළ පසු සංයුක්ත ව්‍යඤ්ජනය විසංයුක්ත වේ. මෙහි දී මුලින් ඇති ව්‍යඤ්ජනය ලොප් වේ.

| | |
|---|---|
| එවං + අස්ස | |
| එවං + ස්ස | පරො වා සරො |
| එවං + ස | බ්‍යඤ්ජනො ච විසඤ්ඤොගො |
| එවංස | නයෙ පරං යුත්තෙ |

අභ්‍යාස

01. සිංහලට නගන්න.

i. රාජා නගරෙ චරන්තො ධම්මං දෙසෙන්තමෙකං තාපසං පස්සි.
ii. මනුස්සා ආයුක්ඛයෙන කම්මක්ඛයෙන පුඤ්ඤක්ඛයෙන ච මරන්ති.
iii. අප්පමාදො අමතං පදං පමාදො මච්චුනො පදං.
iv. සබ්බෙව මයං ධම්මං සුත්වා තං සාධුකං මනසිකරොම.
v. කරොමි තෙ තං වචනං'ත්වංසි ආචරියො මම'.
vi. ආනන්දත්ථෙරො විපස්සනං වඩ්ඪෙත්වා පච්ඡිමයාමෙ යෙව අරහත්තමපාපුණි.
vii. ධම්මදෙසනාවසානෙ භික්ඛවො සාරිපුත්තත්ථෙරස්ස වචනං සුත්වා සමෙමාදිංසු.
viii. අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති.

02. සන්ධි කළයුතු තැන් සන්ධි කොට පාලියට නගන්න.

i. දෙවිවරු පින් ගෙවීමෙන් ද ආයුෂ ගෙවීමෙන් ද දෙව්ලොවින් චුත වෙති.
ii. රූපය පෙණ පිඬක් වැනි යැයි තථාගතයන් වහන්සේ වදාළහ.
iii. මිනිස්සු ආර්ය සංඝයාට දන් දී මහත්ඵල මහානිසංස ලබත්.
iv. ධෛර්‍යමත් සාමණේරවරු උදෑසනම නැඟිට බුදුන් වැඳ පාඩම් කරත්.
v. දැහැමි පාලකයෝ බුද්ධ ශාසනය ද විහාරාරාමයන් ද ආරක්‍ෂා කරත්.

03. 'චූලෙකසාටකබ්‍රාහ්මණස්ස දානං' යන ඡේදයේ එන සන්ධිපද තෝරා වගු ගත කරන්න.

| සන්ධිපදය | විසන්ධිපදය | බාලාවතාරසූත්‍ර |
|---|---|---|
| උදා:- කාලසම්ඤ්හි | කාලසම්ං හි | එහෙඤ්ඤං |

04. හිස්තැන් පුරවන්න.

i. මහාප්‍රාණ අක්‍ෂරයන්ට අල්පප්‍රාණ අක්‍ෂර ද්විත්ව වීම................................ නම් වේ.
ii. බිංදුවෙන් පරවූ ස්වරයක් ඇතිවිට........................සූත්‍රයෙන් 'ම' කාරාදේශ වේ.
iii. ව්‍යඤ්ජන සන්ධියේ දී සන්ධි කාර්යයන් දෙකක් එකවිට සිදුවනුයේ ........... සූත්‍රයෙනි.
iv. 'අවනද්ධා' යන පදය......................ලෙස.......................යන සූත්‍රයෙන් සන්ධි වේ.
v. බිංදුවෙන් පරවූ ස්වරය ලොප් වනුයේ..............................යන සූත්‍රයෙනි.

# ද්වාදසමො පාඨො

# මහාබොධිපතිට්ඨාපනං

දෙවානම්පියතිස්සමහාරාජාපි උත්තරද්වාරතො පට්ඨාය යාව ජම්බුකොලපට්ටනා මග්ගං සොධාපෙත්වා අලංකාරාපෙත්වා නගරතො නික්ඛමනදිවසෙ උත්තරද්වාරසමීපෙ සමුද්දසාලාවත්ථුස්මිං ඨිතො තාය විභූතියා මහාසමුද්දෙ ආගච්ඡන්තං යෙව මහාබොධිං ථෙරස්සානුභාවෙන දිස්වා තුට්ඨමානසො නික්ඛමිත්වා සබ්බං මග්ගං පඤ්චවණ්ණෙහි පුප්ඵෙහි ඔකිරන්තො අන්තරන්තරා පුප්ඵග්ඝියානි ඨපෙන්තො එකාහෙනෙව ජම්බුකොලපට්ටනං ගන්ත්වා සබ්බතාලාවචරපරිවුතො පුප්ඵධූපගන්ධාදීහි පූජයමානො ගලප්පමානං උදකං ඔරුය්හ ආගතො වත රෙ දසබලස්ස සරසරංසිජාලං විස්සජ්ජනකො බොධිරුක්ඛොති පසන්නචිත්තො මහාබොධිං උක්ඛිපිත්වා උත්තමංගෙ සිරස්මිං පතිට්ඨපෙත්වා මහාබොධිං පරිවාරෙත්වා ආගතෙහි සොළසහි ජාතිසම්පන්නකුලෙහි සද්ධිං සමුද්දතො පච්චුත්තරිත්වා සමුද්දතීරෙ බොධිං ඨපෙත්වා තීණි දිවසානි සකලතම්බපණ්ණිරජ්ජෙන පූජෙසි. අථ චතුත්ථෙ දිවසෙ මහාබොධිං ආදාය උළාරං පූජං කුරුමානො අනුපුබ්බෙන අනුරාධපුරං සම්පත්තො අනුරාධපුරෙපි මහාසක්කාරං කත්වා චාතුද්දසී දිවසෙ වඩ්ඪමානකච්ඡායාය මහාබොධිං උත්තරද්වාරෙන පවෙසෙත්වා නගරමජ්ඣෙන අතිහරිත්වා දක්ඛිණද්වාරෙන නික්ඛමිත්වා දක්ඛිණද්වාරතො පඤ්චධනුසතිකෙ ඨානෙ යත්ථ අම්හාකං සම්මා සම්බුද්ධො නිරොධසමාපත්තිං සමාපජ්ජිත්වා නිසිදි, පුරිමකා ච තයො සම්මා සම්බුද්ධා සමාපත්තිං අප්පෙත්වා නිසීදිංසු. යත්ථ ච කකුසන්ධස්ස භගවතො සිරීසබොධි කොණාගමනස්ස භගවතො උදුම්බරබොධි කස්සපස්ස භගවතො නිග්‍රොධබොධි පතිට්ඨාසි, තස්මිං මහමෙඝවනුය්‍යානස්ස තිලකභූතෙ කතභූමිපරිකම්මහි රාජවත්ථුද්වාරකොට්ඨකට්ඨානෙ මහාබොධිං පතිට්ඨාපෙසි.

(බොධිආගමනකථා - ථූපවංසො)

පද මාලාව

| | | | |
|---|---|---|---|
| මහාරාජාපි | (ස) | - | මහරජු ද |
| උත්තරද්වාරතො | (ස) | - | උතුරු දොරටුවෙන් |
| පට්ඨාය | (පූ.ක්‍රි) | - | පටන් |
| ජම්බුකොලපට්ටනා | (ස) | - | දඹකොළපටුන (දක්වා) |
| සොධාපෙත්වා | (පූ.ක්‍රි) | - | පිරිසිදු කරවා |
| අලඞ්කාරාපෙත්වා | (පූ.ක්‍රි) | - | අලංකාර කරවා |
| නික්ඛමනදිවසෙ | (ස) | - | නික්මෙන දිනයෙහි |
| උත්තරද්වාරසමීපෙ | (ස) | - | උතුරු දොරටුව ළඟ |
| සමුද්දසාලාවත්ථුස්මිං | (ස) | - | සමුද්‍ර ශාලා |
| මහාසමුද්දෙ | (ස) | - | මහමුහුදෙහි |
| ථෙරස්සානුභාවෙන | (ස) | - | තෙරුන්ගේ අනුහසින් |

| | | | |
|---|---|---|---|
| **විභූතියා** | (නා) | - | අලංකාරයෙන් |
| **තුට්ඨමානසො** | (ස) | - | සතුටු සිතැත්තේ |
| **නික්ඛමිත්වා** | (පූ.ක්‍රි) | - | නික්මී |
| **පඤ්චවණ්ණෙහි** | (ස) | - | වර්ණ පහකින් යුතු |
| **පුප්ඵෙහි** | (නා) | - | මල්වලින් |
| **ඔකිරන්තො** | (කි) | - | ඉසිමින් |
| **අන්තරන්තරා** | (ස) | - | තැනින් තැන (අතරතුර) |
| **පුප්ඵගසියානි** | (ස) | - | මල් ඇගෑ |
| **එකාහෙනෙව** | (ස) | - | එක්දිනකින්ම |
| **ජම්බුකොලපට්ටනං** | (ස) | - | දඹකොළපටුන |
| **සබ්බතාලාවචරපරිවුතො** | (ස) | - | සියලු තූර්යනාදයන් පිරිවරණ ලද |
| **පුප්ඵධූපගන්ධාදීහි** | (ස) | - | මල් සුවඳදුම් ආදියෙන් |
| **පූජයමානො** | (කි) | - | පුදනු ලබන්නේ |
| **ගලප්පමාණං** | (ස) | - | ගෙළ දක්වා |
| **ඔරුය්හ** | (පූ.ක්‍රි) | - | බැස |
| **දසබලස්ස** | (ස) | - | බුදුරදුන්ගේ |
| **සරසරංසිජාලං** | (ස) | - | හාත්පස රස්මිජාලය |
| **විස්සජ්ජනකො** | (කි) | - | විහිදුවන |
| **පසන්නචිත්තො** | (ස) | - | පැහැදුණු සිතැත්තේ |
| **උක්ඛිපිත්වා** | (පූ.ක්‍රි.) | - | ඔසවා |
| **උත්තමඞ්ගෙ** | (ස.) | - | හිසෙහි |
| **පරිවාරෙත්වා** | (පූ.ක්‍රි) | - | පිරිවරා |
| **ආගතෙහි** | (කි) | - | ආවා වූ |
| **සොළසහි** | (නා) | - | දහසයක් |
| **ජාතිසම්පන්නකුලෙහි** | (ස) | - | ජාතියෙන් යුතු කුලයන් සමග |
| **පච්චුත්තරිත්වා** | (පූ.ක්‍රි) | - | ගොඩවී |
| **සමුද්දතීරෙ** | (ස) | - | මුහුදුතෙර |
| **කුරුමානො** | (කි) | - | කරන්නේ |
| **අනුපුබ්බෙන** | (ස) | - | අනුපිළිවෙලින් |
| **මහාසක්කාරං** | (ස) | - | මහත් සත්කාර |
| **චාතුද්දසී දිවසෙ** | (ස) | - | තුදුස්වක් දිනයෙහි |
| **වඩ්ඪමානකච්ඡායාය** | (ස) | - | සවස (සෙවනැල්ල වැඩෙන කාලයේ) |
| **උත්තරද්වාරෙන** | (ස) | - | උතුරු දොරටුවෙන් |
| **දක්ඛිණද්වාරෙන** | (ස) | - | දකුණු දොරටුවෙන් |
| **පඤ්චධනු සතිකෙ ඨානෙ** | (ස) | - | දුනු පන්සියයක් දුර තැන |
| **නිරොධසමාපත්තිං** | (ස) | - | නිරෝධසමාපත්තියට |
| **පුරිමකා** | (ත) | - | පෙර සිටි |
| **අප්පෙත්වා** | (පූ.ක්‍රි) | - | පැමිණ (සමවැදී) |
| **කතභූමිපරිකම්මෙ** | (ස) | - | කරන ලද භූමි පරිකර්ම ඇති (සැකසූ බිම ඇති) |
| රාජවත්ථුද්වාරකොට්ඨකට්ඨානෙ | (ස) | - | රාජ වස්තු තැන්පත් කෝෂ්ඨාගාරය පිහිටි තැන |

| | | | |
|---|---|---|---|
| **සිරිසබොධි** | (ස) | - | මහරි බෝධිය |
| **උදුම්බරබොධි** | (ස) | - | දිඹුල් බෝධිය |
| **නිග්‍රොධබොධි** | (ස) | - | නුග බෝධිය |

**අභ්‍යාස**

1. 'මහා බොධිපතිට්ඨාපනං' යන ඡේදය සිංහලට නගන්න.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. දෙවානම්පියතිස්සො රාජා කිත්තමාණං මග්ගං සොධාපෙසි ?
ii. සමුද්දතීරෙ බොධිං ඨපෙත්වා කති දිවසානි පූජෙසි ?
iii. මහාබොධිං පරිවාරෙත්වා කති ජාතිසම්පන්නා කුලා ආගච්ඡිංසු ?
iv. රාජා මහාබොධිං චාතුද්දසීදිවසෙ කස්මිං සමයෙ රාජවත්ථුද්වාරකොට්ඨකෙ පතිට්ඨාපෙසි ?
v. කො මහාබොධියා තම්බපණ්ණිරජ්ජෙන පූජෙසි ?

3. පහත ප්‍රශ්නවලට ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.

i. සමුද්දසාලාවත්ථු යන්න පැහැදිලි කරන්න.
ii. තිස්ස රජුට අනුරාධපුර සිට දඹකොළ පටුනට යාමට කොපමණ කලක් ගතවීද ?
iii. ගෞතම බුදුන් වහන්සේ නිරෝධ සමාපත්තියට සමවැද සිටියේ බෝධියට කවර දිසාවක කොපමණ දුරක ද ?
iv. පෙර කවර බුදුවරුන්ගේ කවර බෝධීන් වහන්සේලා ශ්‍රී මහා බෝධිය පිහිටි තැන පිහිටුවා තිබුණි ද?
v. අනුරපුරයෙහි මහාබෝධිය පිහිට වූයේ දවසේ කවර වෙලාවේද ?

**සමාස හැඳින්වීම**

නාමපද දෙකක් හෝ ඊට වැඩිගණනක් එක්කොට එක පදයක් බවට පත්කිරීම සමාස නම් වේ. නාමපදයක් ක්‍රියාපදයක් සමග කිසිවිටෙක සමාස නො වෙයි. **"නාමානං සමාසො යුත්තත්ථො"** යනුවෙන් අර්ථවත් නාමයන් නිසි පරිදි ගැළපීම සමාස නම් වේ.

**සමාස පදවල ප්‍රධාන ලක්ෂණ**

| | | |
|---|---|---|
| පද කෙටිවීම | - | සමාසො පදසංඛෙපො |
| එක් පදයක් බවට පත්වීම | - | එකපදත්තා සංයුත්තං |
| එක්ව උච්චාරණය | - | එකොච්චාරණතො යුතං |
| එක් විභක්තියක් වීම | - | එකවිභත්තිතා යුත්තං |

සමාස තුළින් ලැබෙන ප්‍රයෝජන

ව්‍යක්තබව ඇතිවීම.
මටසිලිටිබව ඇතිවීම.
උච්චාරණයට පහසුවීම.
ලිවීමට පහසුවීම.

සමාසප්‍රභේද

සමාස නාමයන්ගේ ලක්‍ෂණ හා සමාස වූ පසු දක්නට ලැබෙන ලක්‍ෂණ අනුව කොටස් හයකට බෙදෙයි.

| | |
|---|---|
| කම්මධාරය සමාසය | 'ද්විපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො' |
| දිගු සමාසය | 'සංඛ්‍යා පුබ්බො දිගු' |
| තප්පුරිස සමාසය | 'අමාදයො පරපදෙහි' |
| ද්වන්ද සමාසය | 'නාමානං සමුච්චයො ද්වන්දො' |
| බහුබ්බීහි සමාසය | 'අඤ්ඤපදත්ථෙසු බහුබ්බීහි ' |
| අව්‍යයීභාව සමාසය | 'උපසග්ගනිපාතපුබ්බකො අව්‍යයීභාවො' |

කම්මධාරය සමාසය

'ද්විපදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො'. සෑමවිටම පරපදය ප්‍රධාන අතර විශේෂණ පද විශේෂ්‍ය පද සමග සමාස වෙයි. ලිංග, විභක්ති, වචන නාම පදයක දක්නට ලැබෙන ලක්‍ෂණයි. එය අධිකරණ නම් වේ. නාම යුගලයක් ඉහත කී ලිංග වචන විභක්තිවලින් සමාන නම් එය තුල්‍යාධිකරණ යයි. අසමාන නම් එය භින්නාධිකරණ යයි.

කම්මධාරය සමාසයේ ප්‍රභේද 09 කි.

i. විසෙසන පුබ්බපද
ii. විසෙසන උත්තරපද
iii. විසෙසන උභයපද
iv. උපමානොත්තරපද
v. සම්භාවනා පුබ්බපද
vi. අවධාරණ පුබ්බපද
vii. න නිපාත පුබ්බපද
viii. කු නිපාත පුබ්බපද
xi. ප ආදී නිපාත පුබ්බපද

විශේෂණ පුබ්බපද කම්මධාරය සමාසය

විශේෂණ පද මුලිනුත් විශේෂ්‍ය පද අගිනුත් යොදයි.

උදා:- නීලං ච තං උප්පලං - නීලුප්පලං (නිල් උපුල්)
බ්‍රාහ්මණී ච සා දාරිකා - බ්‍රාහ්මණදාරිකා (බමුණු දැරිය)
කණ්හො ච සො සප්පො - කණ්හසප්පො (කළු සර්පයා)

**විශේෂණ උත්තරපද කම්මධාරය සමාසය**

විශේෂ්‍ය පද මුලිනුත් විශේෂණ පද පසුවත් යෙදෙයි.

උදා:- ආචරියො ච සො ගුත්තිලොචාති - ගුත්තිලාචරියො (ඇදුරු ගුත්තිල)
මහාකස්සපො ච සො ථෙරොචාති - මහාකස්සපත්ථෙරො (මහාකස්සප තෙරුන්)
සාරිපුත්තො ච සො ථෙරොචාති - සාරිපුත්තත්ථෙරො (සැරියුත් තෙරුණුවෝ)

**විශේෂණ උභයපද කම්මධාරය සමාසය**

මෙහි දී පද දෙකම විශේෂණ වී යෙදෙයි.

උදා:- අන්ධො ච සො බධිරො - අන්ධබධිරො (අඳ බිහිරි)
සීතං ච තං උණ්හං - සීතුණ්හං (සීතල ද උණුසුම ද)
ඡින්නං ච තං භින්නං - ඡින්නභින්නං (සිඳුණු බිඳුණු)

**උපමානොත්තරපද කම්මධාරය සමාසය.**

උපමේය පදය මුලිනුත් උපමාන පදය අගිනුත් යෙදෙයි.

උදා:- චන්දො විය මුඛං - මුඛචන්දො (සඳ වැනි මුහුණ)
නාගො විය බුද්ධො - බුද්ධනාගො (ඇතෙකු වැනි බුදුරජු )
සීහො විය මුනි - මුනිසීහො (සිංහයෙකු වැනි මුනිවරයා)

**සම්භාවනා පුබ්බපද කම්මධාරය සමාසය**

සම්භාවනාවට ලක්වන 'ඉති' පදය යොදා එය ලොප් කොට ගලපන සමාසය.

උදා:- ධම්මො ඉති බුද්ධි - ධම්මබුද්ධි (ධර්මය බුද්ධිය)
අත්තා ඉති දිට්ඨි - අත්තදිට්ඨි (ආත්ම දෘෂ්ටිය)
අනිච්ච ඉති සඤ්ඤා - අනිච්චසඤ්ඤා (අනිත්‍ය සංඥාව)

**අවධාරණ පුබ්බපද කම්මධාරය සමාසය**

අවධාරණයට ලක් වන "එව" පදය ලොප්කොට ගලපන සමාසය.

උදා:- සීලං එව ධනං - සීලධනං (සීලධනය)
ගුණො එව ධනං - ගුණධනං (ගුණධනය)
සද්ධා එව ධනං - සද්ධාධනං (ශ්‍රද්ධාධනය)

**න නිපාත පුබ්බපද කම්මධාර සමාසය.**

'න' නිපාත පදය විශේෂණ වශයෙන් යෙදී ගලපන සමාසය.

උදා:- න සුරො - අසුරො (අසුර)
න බ්‍රාහමණො - අබ්‍රාහමණො (බමුණෙකු නොවන)
න අරියෝ - අනරියො (ආර්ය නොවූ)



නොමිලේ බෙදා හැරීම පිණිසයි

**'කු' නිපාත පුබ්බපද කම්මධාර සමාසය.**

'කු' නිපාතය විශේෂණ වශයෙන් යෙදී ගලපන සමාසය.

උදා:- කු පුරිසො - කාපුරිසො (නින්දිත පුරුෂයා)
කු දිට්ඨි - කුදිට්ඨි (වැරදි දෘෂ්ටිය)
කු දාරා - කුදාරා (නින්දිත ගැහැණිය)

**'ප' ආදී නිපාත කම්මධාරය සමාසය.**

'ප' ආදී නිපාත මුලට යෙදේ.

උදා:- ප වචනං - පාවචනං (බුද්ධ වචනය)
අධි සීලං - අධිසීලං (අධිසීලය)
සු ගන්ධො - සුගන්ධො (සුවඳ)

## දිගු සමාසය

සංඛ්‍යා වාචී පදයක් මුලට යෙදී සිදුවන සමාසයයි. '**සංඛ්‍යා පුබ්බො දිගුති**' යන සූත්‍රයෙන් එය දැක්වේ. මෙහි ප්‍රභේද දෙකකි.

සමාහාර දිගු
අසමාහාර දිගු

**සමාහාර දිගු සමාසය**

පද සමාස වූ පසු නිත්‍ය ඒකවචන හා නපුංසකලිංග වන පදයි.

උදා:- චතස්සො දිසා - චතුද්දිසං (සතර දිශාව)
චත්තාරි සච්චානි - චතුසච්චං (සත්‍ය සතර)
තයො ලොකො - තිලොකං (තුන්ලොව)

**අසමාහාර දිගු සමාසය**

පද සමාස වූ පසු ලිංගත්‍රයේ හා ඒකවචන බහුවචනයන්හි යෙදෙයි.

උදා:- චතස්සො දිසා - චතුද්දිසා (සතර දිශාව)
තයො භවා - තිභවා (තුන්භවය)
එකො ච සො ධම්මො - එකධම්මො (එක් දහමක්)

## තප්පුරිස සමාසය

දුතියා විභක්තියේ සිට සත්තමී විභක්තිය දක්වා නාමයකට පරව තවත් පදයක් එක් වී සිදුවන සමාසය තප්පුරිස සමාසයයි. **අමාදයො පරපදෙහි** යනුවෙන් 'අං' ආදී විභක්ත්‍යර්ථවත් පද සමඟ යෙදෙන බව දක්වා ඇත.

**දුතියා විභත්ති තප්පුරිස සමාසය**

උදා:- ගාමං ගතො - ගාමගතො (ගමට ගියේ)
ධම්මං නිස්සිතො - ධම්මනිස්සිතො (ධර්මය ආශ්‍රිත වූයේ)
අරඤ්ඤං ගතො - අරඤ්ඤගතො (කැලයට ගියේ)

**තතියා විභත්ති තප්පුරිස සමාසය**

| | | | |
|---|---|---|---|
| උදා:- | බුද්ධෙන දෙසිතො | - බුද්ධදෙසිතො | (බුදුන් විසින් දෙසන ලද) |
| | රාගෙන පීළිතො | - රාගපීළිතො | (රාගයෙන් පෙළුනේ) |
| | ගුණෙහි වුද්ධො | - ගුණවුද්ධො | (ගුණයෙන් වෘද්ධ) |

**චතුත්ථී විභත්ති තප්පුරිස සමාසය**

| | | | |
|---|---|---|---|
| උදා:- | පාසාදාය දබ්බං | - පාසාදදබ්බං | (පහයට ද්‍රව්‍ය) |
| | කඨිනාය දුස්සං | - කඨිනදුස්සං | (කඨිනය පිණිස රෙදි) |
| | සංඝස්ස භත්තං | - සංඝභත්තං | (භික්ෂූන්ට දෙන දානය) |

**පඤ්චමී විභත්ති තප්පුරිස සමාසය**

| | | | |
|---|---|---|---|
| උදා:- | රුක්ඛග්ගා පතිතො | - රුක්ඛග්ගපතිතො | (අතු අගින් වැටුණු) |
| | චොරස්මා භයං | - චොරභයං | (සොරුගෙන් වන බිය) |
| | නගරා නිග්ගතො | - නගරනිග්ගතො | (නුවරින් පිටවූයේ) |

**ඡට්ඨී විභත්ති තප්පුරිස සමාසය**

| | | | |
|---|---|---|---|
| උදා:- | ජිනස්ස වචනං | - ජිනවචනං | (බුදුන්ගේ වචනය) |
| | බුද්ධස්ස සාවකො | - බුද්ධසාවකො | (බුදුන්ගේ ශ්‍රාවකයා) |
| | රුක්ඛස්ස මූලං | - රුක්ඛමූලං | (ගස්මුල්) |

**සත්තමී විභත්ති තප්පුරිස සමාසය**

| | | | |
|---|---|---|---|
| උදා:- | වනෙ මහිසො | - වනමහිසො | (වනයෙහි මීමා) |
| | ගාමෙ සූකරො | - ගාමසූකරො | (ගමෙහි ඌරා) |
| | ධම්මෙ රතො | - ධම්මරතො | (ධර්මයෙහි ඇලුණු) |

## ද්වන්ද සමාසය

සමාන විභක්ති ඇති නාමපද දෙකක් හෝ කිහිපයක් එක් කිරීමෙන් සෑදෙන සමාස ද්වන්ද සමාසය නම් වේ. (නාමානං සමුච්චයො ද්වන්දො) මෙහිදී ච යන නිපාතයෙන් පද එකිනෙක සම්බන්ධ වෙයි. මෙහි ප්‍රභේද දෙකකි.

සමාහාර ද්වන්ද
ඉතරීතර යෝග ද්වන්ද

**සමාහාර ද්වන්ද**

පදයන් සමාස වූ පසු නිත්‍ය බහු වචනයෙන් සිටී.

| | | | |
|---|---|---|---|
| උදා:- | චන්දො ච සූරියො ච | - චන්දසූරියා | (සඳහිරු) |
| | සමණා ච බ්‍රාහමණා ච | - සමණබ්‍රාහමණා | (ශ්‍රමණ බ්‍රාහ්මණයෝ) |
| | මාතා ච පිතා ච | - මාතාපිතරො | (මව්පියෝ) |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

**ඉතරීතරයෝග ද්වන්ද**

පදයක් සමාස වූ පසු නිත්‍ය ඒකවචන නපුංසක ලිංග වෙයි.

උදා:- මුඛං ච නාසිකා ච - මුඛනාසිකං (මුහුණ ද නහය ද)
පුබ්බා ච අපරා ච - පුබ්බාපරං (පෙර දිග ද අපරදිග ද)
හත්ථිනො ච අස්සා ච - හත්ථස්සං (ඇත්තු ද අශ්වයෝ ද)

**බහුබ්බීහි සමාසය**

සමාස වූ පසු එහි අර්ථය හැර වෙනත් අර්ථයක් ලැබෙන සමාසය මෙනමින් හැඳින්වේ. අඤ්ඤපදත්ථෙසු බහුබ්බී'හි දුතියා විභක්තියේ සිට සත්තමී විභක්තිය දක්වා විභක්තිවල මෙම සමාසය සිදුවෙයි.

**දුතියා විභත්ති බහුබ්බීහි සමාසය**

ආරූළ්හා වානරො යං සො - ආරූළ්හවානරො (ගස)
ආගතා සමණා යං සො - ආගතසමණො (විහාරය)
ආරූළ්හා වාණිජා යං සො - ආරූළ්හවාණිජො (නැව)

**තතියා විභත්ති බහුබ්බීහි සමාසය**

විජිතා මාරා යෙන සො - විජිතමාරො (බුදුරජ)
ජිතානි ඉන්ද්‍රියානි යෙන සො - ජිතින්ද්‍රියො (මුනි)
දිට්ඨො ධම්මො යෙන සො - දිට්ඨධම්මො (බුද්ධශ්‍රාවක)

**චතුත්ථී විභත්ති බහුබ්බීහි සමාසය**

උපනීතං භොජනං යස්ස සො - උපනීතභොජනො (දුගී)
දින්නො සුංකො යස්ස සො - දින්නසුංකො (රජු)
උපහටො බලි යස්ස සො - උපහටබලි (ප්‍රේත)

**පඤ්චමී විභත්ති බහුබ්බීහි සමාසය**

අපෙතං විඤ්ඤාණං යස්මා සො - අපෙතවිඤ්ඤාණො (මළසිරුර)
නිග්ගතො අයො යස්මා සො - නිරයො (නිරය)
නිග්ගතා ජනා යස්මා සො - නිග්ගතජනො (ගම)

**ඡට්ඨී විභත්ති බහුබ්බීහි සමාසය**

තිස්සො විජ්ජා යස්ස සො - තෙවිජ්ජො (බුදුරදුන්)
චත්තාරො පාදා යස්ස සො - චතුප්පදො (සිවුපා)
ඛීණා ආසවා යස්ස සො - ඛීණාසවො (කෙළෙස් රහිත)

**සත්තමී විභත්ති බහුබ්බීහි සමාසය**

බහවො සාමිකා යස්මිං තං - බහුසාමිකං (නගරය)
බහු ජම්බු යස්මිං තං - බහුජම්බුකං (වනය)
ආකිණ්ණා මනුස්සා යස්මිං සො - ආකිණ්ණමනුස්සො (රාජධානිය)

## අව්‍යයීභාව සමාසය

නිපාත හා උපසර්ග යන අව්‍ය පදයන් මුල්වී සිදුවන සමාසය අව්‍යයීභාව සමාසයයි. **"උපසග්ගනිපාතපුබ්බකො අව්‍යයීභාවො"** යනුවෙන් ඒ බව දැක්වේ. අව්‍යයිභාව සමාසය නපුංසක ලිංග ඒකවචන වේ. නිපාත හෝ උපසර්ග පදය යෙදෙන ආකාරය අනුව අර්ථ සමූහයක යෙදේ.

**සමීපාර්ථය.**

නගරස්ස සමීපං - උපනගරං (නුවර සමීපය)

**අභාවාර්ථ.**

දරථානං අභාවො - නිද්දරථං (විඩාව නැති)

**පශ්චාදර්ථය.**

වාතස්ස අනු - අනුවාතං (යටි සුළඟ)

**යොගාර්ථය.**

ගන්ධස්ස අනු - අනුගන්ධං (සුවඳට සුදුසු)

**විප්සාර්ථය.**

අද්ධමාසං අනු - අන්වද්ධමාසං (අඩ මසක් පාසා)

**අනුපූර්වාර්ථය.**

ථෙරානං අනුපුබ්බො - අනුථෙරං (තෙරුන්ගේ පිළිවෙළ)

**ප්‍රතිලෝමාර්ථය.**

වාතස්ස පටි - පටිවාතං (උඩු සුළඟ)

**සමෘද්ධාර්ථය.**

භික්ඛාය සමිද්ධිං - සුභික්ඛං (ආහාර සුලබ)

**මර්දායාර්ථය.**

පාණකොටි යාව - ආපාණකොටිං (දිවි ඇතිතාක්)

**නිපාත පූර්වක**

නගරම්හා බහි - බහිනගරං (නුවරින් පිට)

**අභ්‍යාස**

(1) පහත සඳහන් අසමස්ත පද සමාස කර සමාසය නම් කරන්න.

i. මහන්තො රාජා
ii. ජම්බුකොළ නාම පට්ටනං
iii. ථෙරස්ස ආනුභාවෙන
iv. පඤ්චහි වණ්ණෙහි
v. තුට්ඨමානසො යස්ස සො
vi. එකෙන අහෙන
vii. දසබලානි යස්ස සො
vii. සොළසෙහි කුලෙහි
ix. තීණි දිවසානි
x. මහතී බොධි

(2) සමාසපද විග්‍රහ කොට සමාසය නම් කරන්න.

i. නගරමජ්ඣේ
ii. මහාසමුද්දෙ
iii. අනන්තරාමගෙග
iv. පුප්ඵගන්ධියානි
v. පුප්ඵධූපානි
vi. ගලප්පමාණං
vii. ජාතිසම්පන්නෙනා
viii. තම්බපණ්ණිරජ්ජං
ix. අනුපුබ්බෙන
x. දක්ඛිණද්වාරං
xi. උදුම්බරබොධිං

(3) සුදුසු සමාසපද යොදා වාක්‍යය සම්පූර්ණ කර තේරුම් ලියන්න.

පුනදිවසෙ, දසබලස්ස, ආගමනමග්ගං, මහාදානං, මහාමහින්දත්ථෙරො, චුල්ලහත්ථිපදොපමසුත්තං, ලඞ්කාවාසීනං, මහාබොධියා, මහාසක්කාරං, ලංකාවාසිනො, එකාහෙනෙව, ජයමහාබොධිං, පසන්නමානසො, ඛීණාසවො, පඨමමහාධම්මසංගීතිං

i. --------------------මනුස්සා --------- -------------- අලංකරිත්වා ---------- සජ්ජෙසුං.
ii. --------- -------------- ආසාළ්හපුණ්ණමදිවසෙ නහසා ආගන්ත්වා ----------- ------------- දෙසෙසි.
iii. තතො පට්ඨාය ----------- සොගතා ජනා ----------- ---------- අකංසු.
iv. දෙවානම්පියතිස්ස මහාරාජා ------------ ජම්බුකොලපට්ඨනං ගන්ත්වා ---------- දිස්වා -------- අහොසි.
v. ----------මහාකස්සපො ------------- රාජගහෙ සත්තපණ්ණිගුහාද්වාරෙ අකාසි.

(4) පහත සඳහන් වාක්‍ය පාලියට පරිවර්තනය කරන්න.

i. පිණ්ඩෝල භාරද්වාජ හිමියෝ අහසින් ගොස් පාත්‍රය ගත්හ.
ii. දේවානම්පියතිස්ස රජතුමා මහාමහින්ද තෙරුන්ගේ ධර්මය අසා බුද්ධශ්‍රාවකයෙක් විය.
iii. බුදුන් වහන්සේ සත්දිනක් අනුපිය අඹ වනයෙහි විසූ සේක.
iv. වෙළෙන්දා ආයුධයක් ගෙන දොරටුපාලයාට පහර දුන්නේය.
v. බරණැස් මහරජ බෑණාට ස්වකීය දූ කුමරිය දී රාජ්‍යයෙහි අභිෂේක කරවීය.

(5) පිළිතුරු ලියන්න.
i. සමාස වර්ග කීයද ? ඒ මොනවාද?
ii. සමාසවල ප්‍රයෝජන කවරේද?
iii. 'මහාබොධිපතිට්ඨාපනං' ඡේදයේ එන සමාසපද 10ක් උපුටා වර්ග කරන්න.
iv. පහත සඳහන් පද වාක්‍යවල යොදන්න.
පච්ඡාභත්තං, යාවජීවං, ජිනවචනං, ගුත්තිලාචරියො, චොරභයං

# තෙරසමො පාඨො

# නිග්‍රොධසාමණෙරො

එවං ගච්ඡන්තෙ කාලෙ එකදිවසං සීහපඤ්ජරෙ ඨිතො අද්දස, නිග්‍රොධසාමණෙරං රාජඞ්ගණෙ ගච්ඡන්තං දන්තං ගුත්තං සන්තින්ද්‍රියං ඉරියාපථසම්පන්නං, කො පනායං නිග්‍රොධො නාම, බින්දුසාරරඤ්ඤො ජෙට්ඨපුත්තස්ස සුමනරාජකුමාරස්ස පුත්තො. 'තත්‍රායං ආනුපුබ්බී, කථා; බින්දුසාරරඤ්ඤො කිර දුබ්බලකාලෙයෙව අසොකකුමාරො අත්තනා ලද්ධං උජ්ජෙනිරජ්ජං පහාය ආගන්ත්වා සබ්බං නගරං අත්තනො හත්ථගතං කත්වා සුමනරාජකුමාරං අග්ගහෙසි. තං දිවසමෙව සුමනස්ස රාජකුමාරස්ස සුමනා නාම දෙවී පරිපුණ්ණගබ්භා අහොසි. සා අඤ්ඤාතකවෙසෙන නික්ඛමිත්වා අවිදූරෙ අඤ්ඤතරං චණ්ඩාලගාමං සන්ධාය ගච්ඡති. ජෙට්ඨකචණ්ඩාලස්ස ගෙහතො අවිදූරෙ එකස්මිං නිග්‍රොධරුක්ඛෙ අධිවත්ථාය දෙවතාය ඉතො එහි සුමනෙ'ති වදන්තියා සද්දං සුත්වා තස්සා සමීපං ගතා. දෙවතා අත්තනො ආනුභාවෙන එකං සාලං නිම්මිණිත්වා එත්ථ වසාහීති පාදාසි. සා තං සාලං පාවිසි. ගතදිවසෙයෙව පුත්තං විජායි. සා තස්ස නිග්‍රොධදෙවතාය පරිග්ගහිතත්තා නිග්‍රොධොත්වෙව නාමං අකාසි. ජෙට්ඨකචණ්ඩාලො දිට්ඨදිවසතොප්පභුති තං අත්තනො සාමිධීතරං විය මඤ්ඤමානො නිබද්ධං වට්ටං පට්ඨපෙසි. රාජධීතා තත්ථ සත්තවස්සානි වසි. නිග්‍රොධකුමාරො'පි සත්තවස්සිකො ජාතො. තදා මහාවරුණත්ථෙරො නාම එකො අරහා දාරකස්ස හෙතුසම්පදං දිස්වා විහරමානො සත්තවස්සිකො'දානි දාරකො, කාලො, නං පබ්බාජෙතුන්ති චින්තෙත්වා රාජධීතාය ආරොචාපෙත්වා නිග්‍රොධකුමාරං පබ්බාජෙසි. කුමාරො ඛුරග්ගෙයෙව අරහත්තං පාපුණි.

(ථූපවංස)

**පදමාලාව**

| | | | |
|---|---|---|---|
| **සීහපඤ්ජරෙ** | (ස) | - | සීමැදුරෙහි |
| **අද්දස** | (ක්‍රි) | - | දුටුවේය |
| **රාජඞ්ගණෙ** | (ස) | - | රජ මිදුලෙහි |
| **දන්තං** | (කි) | - | දැමුණු |
| **ගුත්තං** | (කි) | - | (ඉඳුරන්) රැකුණු |
| **සන්තින්ද්‍රියං** | (ස) | - | සන්සුන් ඉඳුරන් ඇති |
| **ඉරියාපථසම්පන්නං** | (ස) | - | ඉරියව්වලින් යුතු |
| **ජෙට්ඨපුත්තස්ස** | (ස) | - | දෙටුපුතුගේ |
| **දුබ්බලකාලෙයෙව** | (ස) | - | දුර්වල කාලයේදීම |
| **ලද්ධං** | (කි) | - | ලබන ලද |
| **හත්ථගතං කත්වා** | (පූ.ක්‍රි) | - | අත්පත් කොට |
| **පරිපුණ්ණගබ්භා** | (ස) | - | පිරිපුන් ගැබ් ඇත්තී |
| **අඤ්ඤාතකවෙසෙන** | (ස) | - | නොදන්නා වේශයෙන් (වෙස්වළාගෙන) |

| | | | |
|---|---|---|---|
| අඤ්ඤතරං | (ස.නා) | - | එක්තරා |
| ජෙට්ඨක | (ත) | - | ජ්‍යෙෂ්ඨ |
| නිග්‍රොධරුක්ඛ | (ස) | - | නුග ගසක |
| අධිවත්ථාය | (කි) | - | අධිගෘහිත |
| වදන්තියා | (කි) | - | කියන්නා වූ |
| ගතදිවසෙ | (ස) | - | ගිය දවසෙහිම |
| පරිග්ගහිතත්තා | (ත) | - | රැකගත් බැවින් |
| දිට්ඨදිවසතොප්පභූති | (සං) | - | දක්නා ලද දිනයේ පටන් |
| සාමිධීතරං විය | (ස) | - | සාමි දියණිය මෙන් |
| මඤ්ඤමානො | (කි) | - | සිතන්නේ |
| නිබද්ධං | (නි) | - | නිතර |
| වට්ටං | (නා) | - | වැටුප් |
| පට්ඨපෙසි | (ක්‍රි) | - | පිහිටුවීය |
| සත්තවස්සිකො | (ස) | - | සත් හැවිරිදි |
| හෙතුසම්පදං | (ස) | - | පුණ්‍ය මහිමය |
| ආරොචාපෙත්වා | (පූ.ක්‍රි.) | - | දන්වවා |
| ඛුරග්ගෙයෙව | (ස) | - | දැළිපිහියෙන් හිස මුඩුකොට අවසන් වෙද්දීම |
| අරහත්තං | (න) | - | රහත්බවට |

**අභ්‍යාස**

1. 'නිග්‍රොධ සාමණෙරො' යන ඡේදය සිංහලට නගන්න.

2. ඡේදය ඇසුරින් පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො පන දන්තො ගුත්තො සන්තින්ද්‍රියො ඉරියාපථසම්පන්නො අහොසි ?
ii. සුමනස්ස රාජකුමාරස්ස කා නාම දෙවී අහොසි ?
iii. කො සුමනාය දෙවියා සාලං නිම්මිණිත්වා අදාසි ?
iv. නිග්‍රොධසාමණෙරස්ස කො නාම ආචරියො අහොසි ?
v. නිග්‍රොධකුමාරො කතිවස්සිකකාලෙ පබ්බජි.

3. සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. නිග්‍රොධ කුමරුගේ මව සහ පියා කවුද?
ii. සුමනා දේවිය වෙස්වළාගෙන යාමට හේතු වූ කරුණ කුමක් ද?
iii. සුමනා දේවිය සැඩොල්ගම කොපමණ කාලයක් විසුවා ද?
iv. 'ඛුරග්ගෙයෙව අරහත්තං පාපුණි' යන්නට විවරණයක් සපයන්න.

## තද්ධිත නාම I

තද්ධිත යනු නාමයකින් පරව ප්‍රත්‍යයක් යෙදී සෑදෙන ද්විතීයික නාමයකි. සමාසයෙන් වන පද සංක්ෂේපයට වඩා තද්ධිතයෙන් පදවල අති සංක්ෂිප්ත බවක් ඇති වේ. භාෂාව විසිතුරුවීම, අර්ථය හරවත් වීම, ව්‍යක්ත වීම, උච්චාරණය පහසු වීම හා එකම පදයක් වීම තද්ධිතයන්හි සුවිශේෂී ප්‍රයෝජනයන් ය.

නාමයකින් පරව විශේෂ අර්ථයක් ගෙන දෙන ප්‍රත්‍යයක් එකතුවීමෙන් සාදාගන්නා නාම තද්ධිත නම් වේ.

**නිදඃ- සූකර +ණික - සූකරික - ඌරන් මරන්නා**

තද්ධිත පද සාධනයේ දී බොහෝවිට පදයේ මුල් ස්වරය වෘද්ධි වේ. වෘද්ධි වනුයේ ප්‍රත්‍යයේ යෙදෙන ණ කාරයේ බලපෑමෙනි. වෘද්ධි කාර්යය සිදුවනුයේ පහත සූත්‍රයට අනුවය. (**ආයුවණ්ණානං චායො වුද්ධි - අකාර ඉවණ්ණුවණ්ණානං ආ එ ඔ වුද්ධියො හොන්ති**) ඒ අනුව,

| | | | | |
|---|---|---|---|---|
| අ | > ආ වේ - | සමණ + ණෙර | - සාමණෙර | (ශ්‍රමණයාගේ පුතා) |
| ඉ ඊ | > එ වේ - | වීණා + ණික | - වෙණික | (වීණා ශිල්පය දන්නා) |
| උ ඌ | > ඔ වේ - | උපගු + ණව | - ඔපගව | (උපගුගේ පුත්‍රයා) |

වෘද්ධිකාර්ය වනුයේ නාමයේ මුලම ස්වරයටයි.

තද්ධිතපද සාධනය බාලාවතාර සූත්‍රානුසාරයෙන් මෙසේය.

**සමණ +ණෙර - ණෙර විධවාදිතො**
**සා මණ +ණෙර - අයුවණ්ණානං චායො වුද්ධි**
**සා මණ් + එර - සරා සරෙ ලොපං**
**සාමණෙර - නයෙ පරං යුත්තෙ.**

මෙසේ තද්ධිත පද සාධනය වේ.

## තද්ධිත ප්‍රභේද

තද්ධිතය ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදේ.

1. සාමඤ්ඤ තද්ධිතය
2. භාව තද්ධිතය
3. අව්‍ය තද්ධිතය වශයෙනි.

නැවත එහි සාමඤ්ඤ තද්ධිතයෙහි ප්‍රභේද 4කි. **අපච්චත්‍ථ තද්ධිතය, අනෙකත්‍ථ තද්ධිතය අත්ථ්‍යත්‍ථ තද්ධිතය, සංඛ්‍යා තද්ධිතය** යනුවෙනි.

ඒ අනුව තද්ධිත නාමවල ප්‍රභේද හයකි.

**අපච්චත්‍ථ තද්ධිතය**
**අනෙකත්‍ථ තද්ධිතය**
**අත්ථ්‍යත්‍ථ තද්ධිතය**
**සංඛ්‍යා තද්ධිතය**
**භාව තද්ධිතය**
**අව්‍යය තද්ධිතය** වශයෙනි.

### අපච්චත්‍ථ තද්ධිත නාම

පුත්‍රාර්ථය ප්‍රකාශ කරන ණ ආදී ප්‍රත්‍යය එක් වී අපච්චත්‍ථ තද්ධිත පද සෑදේ. **ණ (වාණපපච්චෙ) ණායන, ණාන, (ණායන ණානා වච්චාදිතො) ණෙය්‍ය (ණෙය්‍යො කත්තිකාදීහි) ණි, ණික, බ, (අතොණි වා) ණව (ණවොපගවාදීහි) ණෙර (ණෙර විධවාදිතො)** යන ප්‍රත්‍යය අපත්‍යාර්ථය ප්‍රකාශ කරයි.

i ණ -

ෂෂ්ඨී විභක්ත්‍යන්ත ශබ්දවලින් පරව පුත්‍රාර්ථය ප්‍රකාශ කිරීමට ණ ප්‍රත්‍යය යෙදේ. **(වාණපපච්චෙ- ඡට්ඨන්තා සද්දා තස්සාපච්චමිච්චස්මිං අත්‍ථෙ ණො වා හොති)**

**වසිට්ඨස්ස අපච්චං = වසිට්ඨ + ණ = වාසිට්ඨ = (වසිට්ඨගේ පුතු)**
**ගොතමස්ස අපච්චං = ගොතම + ණ = ගොතම = (ගොතමගේ පුතු)**
**වසුදෙවස්ස අපච්චං = වසුදෙව + ණ = වාසුදෙව = (වසුදේවගේ පුතු)**

ii. **ණායන, ණාන**

වච්ච ආදී ගෝත්‍ර ගණ වාචක ශබ්දවලින් පරව ගෝත්‍රාර්ථයෙහි ණායන, ණාන ප්‍රත්‍යය යෙදේ. **(ණායන ණානා වච්ඡාදිතො - වච්ඡාදිතො ගොත්තගණතො ණායන ණානා ච හොති. අපච්චං පපුත්තප්පභුති ගොත්තං)**

**කච්චස්ස අපච්චං = කච්ච + ණායන = කච්චායන = (කච්චගේ පුතු)**
**කච්චස්ස අපච්චං = කච්ච + ණාන = කච්චාන = (කච්චගේ පුතු)**
**වච්ඡස්ස අපච්චං = වච්ඡ + ණායන = වච්ඡායන = (වච්ඡගේ පුතු)**
**වච්ඡස්ස අපච්චං = වච්ඡ + ණාන = වච්ඡාන = (වච්ඡගේ පුතු)**

iii. ණෙය්‍ය

කත්තිකාදී ස්ත්‍රීවාචක නාමයන්ගෙන් පර ව ණෙය්‍ය ප්‍රත්‍යය වේ. (ණෙය්‍යො කත්තිකාදීහි)

විනතාය අපච්චං = විනතා + ණෙය්‍ය = වෙණතෙය්‍ය = (විනතාවගේ පුතු)
භගිනියා අපච්චං = භගිනී + ණෙය්‍ය = භාගිණෙය්‍ය = (නැගණියගේ පුතු)
රොහිණියා අපච්චං = රොහිණි + ණෙය්‍ය = රොහිණෙය්‍ය = (රෝහිණියගේ පුතු)

iv. ණි ණික ඛ - අකාරාන්ත ශබ්දයන්ගෙන් පරව ණි ප්‍රත්‍යය ද ඇතැම්විට ණික ප්‍රත්‍යය ද ඛ ප්‍රත්‍යය ද වේ. (අතොණි වා අකාරන්තතො අපච්චත්ථෙ ණි වා හොති පුන වා සද්දෙන ණිකො අකාරන්තා අනකාරන්තා ච ඛො පි.)

දක්ඛස්ස අපච්චං = දක්ඛ + ණි = දක්ඛි = (දක්‍ෂගේ පුතු)
සක්‍යපුත්තස්ස අපච්චං = සක්‍යපුත්ත + ණික = සක්‍යපුත්තික = (සක්‍යපුත්‍රගේ පුතු)
භාතුස්ස අපච්චං = භාතු + ඛ = භාතුබ්බ = (සොහොයුරාගේ පුතු)

v. ණව - උපගු ආදී ශබ්දවලින් පර ව ණව ප්‍රත්‍යය වේ. (ණවොපගවාදීහි)

උපගුනො අපච්චං = උපගු + ණව = ඔපගව = (උපගුගේ පුතු)
මනුනො අපච්චං = මනු + ණව = මානව = (මනුගේ පුතු)

ණෙර - විධවා ආදී ශබ්දවලින් පරව ණෙර ප්‍රත්‍යය වේ. (ණෙර විධවාදිතො)

විධවාය අපච්චං = විධවා + ණෙර = වෙධවෙර = (විධවාගේ පුතු)
සමණස්ස අපච්චං = සමණ + ණෙර = සාමණෙර = (ශ්‍රමණයාගේ පුතු)

## අනෙකාර්ථ තද්ධිත නාම

ඇතැම් ප්‍රත්‍යයක බොහෝ අර්ථ ඇත. ඒවා අනේකාර්ථ ප්‍රත්‍යය නම්. අනේකාර්ථ ප්‍රත්‍යයවලින් අනේකාර්ථ තද්ධිත නාම සෑදේ.

සත + ණික - සාතික - (ගිතෙලින් තැනූ)
සකට + ණික - සාකටික - (ගැලෙන් යන)

## ප්‍රත්‍ය මාලාව

i. ණික (යෙන වා සංසට්ඨං තරති චරති වහති ණිකො) (තමධිතෙ තෙනකතාදිසන්නිධාන නියොග සිප්ප භාණ්ඩ ජීවිකත්ථෙසුච)

(අ) තෙන සංසට්ඨො - සත + ණික - සාතික - (ගිතෙලින් යුතු)
(ආ) තෙන තරති - උළුම්ප + ණික - ඔළුම්පික - (පාරුවෙන් එතෙරවන්නා)
(ඉ) තෙන චරති - සකට + ණික - සාකටික - (ගැල්පදවන්නා)
(ඊ) තෙන වහති - සීස + ණික - සීසික - (හිසින් ගෙනයන්නා)
(උ) තං අධීතෙ - අභිධම්ම + ණික - ආභිධම්මික - (අභිධර්මය උගත්තා)
(ඌ) තෙන කතං - වචසා + ණික - වාචසික - (වචනයෙන් කරන ලද)
(එ) තස්මිං සන්නිධානං - සරීර + ණික - සාරීරික - (ශරීරයේ හටගත්)
(ඔ) තස්මිං නියුත්තං - ද්වාර + ණික - දොවාරික - (දොරටුවෙහි නියුක්ත)
(ක) අස්ස සිප්පං - වීණා + ණික - වෙණික - (වීණා ශිල්ප දත්)
(කා) අස්සභණ්ඩං - තණ්ඩුල + ණික - තණ්ඩුලික - (සහල් විකුණන)

ii. එය්‍යක, ණක

එහි වසයි එහි උපනි ආදී අර්ථවල **'ඉත්ථිලිඞ්ග'** නාමවලින් පරව යෙදේ. **(ඉත්ථිලිඞ්ගතො එය්‍යකො ණකො ච)**

**චම්පා + එය්‍යක - චම්පෙය්‍යක - (චම්පාවෙහි වසන්නා වූ)**
**කුසිනාරා + ණක - කොසිණාරක - (කුසිනාරාවෙහි වසන්නා වූ)**

iii. ආජානීය්‍ය - ඒ ජාතියෙහි විශිෂ්ට යන අර්ථය දේ.

**අස්ස+ආජානීය්‍ය - අස්සාජානිය්‍ය - (විශිෂට අශ්වයා)**

iv. ණ - එයින් පැහැගැන්විණි ආදී අර්ථවල යෙදේ.
**(ණ රාගා තෙන රත්තං තස්සෙදමඤ්ඤත්ථෙසු ච)**

**(අ) තෙන රත්තං - හලිද්ද +ණ - හාලිද්ද = (කහපැහැ ගැන්වූ)**
**(ආ) තත්ථ ජාතං - මගධ+ණ - මාගධ = (මගධයෙහි උපන්)**

v. ඉම, ඉය, කිය - ජාති ආදී ශබ්දවලට පරව යෙදේ. **(ජාතාදීන මිමියා ච- ජාතාදිසු ඉමො ඉයො ච හොති ච සදෙදන කියො ච)**

**පච්ඡාජාතො - පච්ඡිමො - (පසුව උපන් තැනැත්තා)**
**මනුස්සජාතියා ජාතො - මනුස්සජාතියො - (මිනිස් ජාතියෙහි උපන් තැනැත්තා)**
**අන්ධකෙ ජාතො - අන්ධකියො - (අන්ධක රටෙහි උපන් තැනැත්තා)**

vi. එයට සුදුසු එයට අයත් යන අර්ථවල ණෙය්‍ය ප්‍රත්‍යය යෙදේ.

**වන + ණෙය්‍ය > වානෙය්‍ය = වනයේ හටගත්**
**දක්ඛිණා + ණෙය්‍ය > දක්ඛිණෙය්‍ය = දක්ෂිණාවට සුදුසු**

**අභ්‍යාස**

1. පහත වාක්‍ය සිංහලට නගන්න.

i. අථ ඛො වච්ඡායනො මානවො යෙන භගවා තෙනුපසංකමි.
ii. අභිධම්මිකො ආචරියො ආරඤ්ඤකානං භික්ඛූනං සන්දිට්ඨිකං ධම්මං කථෙසි.
iii. දොවාරිකො භණ්ඩාගාරිකං ඝාතෙත්වා රඤ්ඤො ධනං චොරෙසි.
iv. ලංකායං සුත්තන්තිකා ච වෙනයිකා ච ආභිධම්මිකා ච මාතුලගාමෙ ආලොකගුහං සන්නිපතිත්වා භගවතො ධම්මං පොත්ථකෙසු ලිඛිංසු.
v. භාණ්ඩාගාරිකස්ස භාගිණෙය්‍යො රාජකොට්ඨාගාරා බහුං ධනං ගහෙත්වා අත්තනො අත්ථාය යොජෙසි.

2. පාලියට නගන්න. (සුදුසු තන්හි තද්ධිත පද යොදන්න)

i. භාරද්වාජගේ පුත්‍රයා කච්චායන තෙරුන්ගේ බෑණා වීය.
ii. අතීතයෙහි මාර්ගවල බොහෝ කරත්තකරුවෝ ද පදිකයෝ ද වූහ.
iii. තෙරුන් වහන්සේලාගේ පේළියෙහි අන්තයෙහි සිටින සාමණේර හිමි අභිධර්මය උගත් කෙනෙක් වෙයි.
iv. ඡබ්බග්ගිය භික්ෂූහු ශාක්‍යපුත්‍රක භික්ෂූන්ට නුසුදුසු (අනුච්ඡවික) කටයුතු රාශියක් කළහ.
v. නගරවැසියන්ගේ දරුවෝ රනින් කරන ලද හෝ රිදියෙන් කරන ලද මල්මාලා පළඳිති.

3. පහත අදහස එන තද්ධිත පදය සුදුසු ප්‍රත්‍යය උපයෝගීකර ගෙන සකස් කරන්න.

i. විධවා (වැන්දඹුවගේ පුතු)
ii. කුසිනාරා (කුසිනාරාවෙහි උපන්)
iii. දක්ඛිණා (දක්ෂිණාවට සුදුසු)
iv. වන (වනයෙහි හටගත්)
v. වීණා (වීණාශිල්ප දන්නා)
vi. සංඝ (සංඝයාට අයත්)
vii. පරදාර (පරඹුවන් සේවනය කරන්නා)
viii. අන්ත (කෙළවර සිටින)
ix. ලොක (ලෝකයට අයත්)
x. සූකර (ඌරන් මරන්නා)

4. පහත ‘අ’ කොටසේ විග්‍රහයට අදාළ තද්ධිත පදය ‘ආ’ කොටසින් තෝරා ප්‍රකෘති ප්‍රත්‍යය වෙන්කර ලියන්න.

| ‘අ’ | ‘ආ’ |
|---|---|
| වසුදෙවස්ස පුත්තො | ආදිච්චො |
| රොහිණියා පුත්තො | ගාමතා |
| අදිතියා පුත්තො | එණෙය්‍යං |
| නාවාය තරතීති | පඤ්චවග්ගියා |
| ධම්මෙ පසන්නො | රොහිණෙය්‍යො |
| නිරයෙ ජාතො | නෙරයිකො |
| පච්ඡා ජාතො | පච්ඡිමො |
| පඤ්චවග්ගෙ භවා | නාවිකා |
| එණතො ජාතං | වාසුදෙවො |
| ගාමානං සමූහො | ධම්මිකො |

5. දී ඇති තද්ධිත පද යෝග්‍ය පරිදි යොදා පහත ඡේදය පාලියට නගන්න.

ගෞතම ගෝත්‍රයේ උපන් ශාක්‍යපුත්‍ර වූ භාග්‍යවතුන් වහන්සේ එක්තරා කාලයක කුසිනාරාවට ගොස් කුසිනාරා වැසියන්ට තමා විසින් දතයුතු වූ ධර්මය දේශනා කළ සේක. කුසිනාරාවෙහි වසන තෙල් වෙළෙන්දෝ සහල් වෙළෙන්දෝ ගැල්පදවන්නෝ පයින් යන්නෝ දොරටුපාලවරු භාණ්ඩාගාරිකවරු ආදී බොහෝ මිනිස්සු ධර්මය ඇසූහ. බණ අසා ධර්මයෙහි පැහැදුණාහු උදෑසන පිණ්ඩපාතික භික්ෂූන්ට දන් පිරිනැමූහ. සමහරු ධනය යොදවා ආරාම කොට සංඝයාට අයත්කොට පූජා කළහ. සමහරු පැවිදි වූහ. පැවිදි වී සූත්‍රාන්ත උගත්තෝ විනය උගත්තෝ අභිධර්මය උගත්තෝ වූහ. ඇතැම් භික්ෂූහු ආරණ්‍යක වූ වෘක්ෂමූලික වූවෝ බවුන් වඩා රහත්බව ලැබූහ.

| | | |
|---|---|---|
| අරහත්තං | පිණ්ඩපාතිකානං | දොවාරිකා |
| ආරඤ්ඤකා | සුත්තන්තිකා | ධම්මිකා |
| සක්‍යපුත්තිකො | ආභිධම්මිකා, | සන්දිට්ඨිකං |
| තණ්ඩුලිකා | ගොතමො | සංඝිකං |
| පදිකා | රුක්ඛමූලිකා | වෙනයිකා |
| භාණ්ඩාගාරිකා | භගවා | තෙලික |
| කොසිනාරකා | සාකටිකා | කොසිනාරකානං |

# චුද්දසමො පාඨො

# ගාමවාසිනො මම වචනං සුණාථ අජ්ජ රත්තිභාගෙ එකො අමනුස්සො ආගච්ඡති

සීහළදීපෙ කිර මහාතලාකනාම විහාරං අහොසි. තත්ථ එකො අභයත්ථෙරො නාම පරියත්තිධරො තෙපිටකො ගාමන්තසෙනාසනං පහාය තස්සාසන්නෙනයෙව එකස්මිං වනසණ්ඩෙ කතපණ්ණසාලාය පටිවසති. සො අපරභාගෙ ආරඤ්ඤකමහාභයත්ථෙරොති පාකටො අහොසි. අථෙකස්මිං සමයෙ එකො උපාසකො තං උපසංකමිත්වා වන්දිත්වා ධම්මං සුත්වා පසන්නමානසො තං යාචිත්වා ද්වාදසසංවච්ඡරානි පච්චයෙහි චතූහි පටිජග්ගි. සො ථෙරස්ස චීවරත්ථාය කාලෙන කාලං සාටකං දෙති. දින්නදින්නානි තස්සෙව අන්තරගෙහෙ හරන්තිකො නාම එකො චොරො රත්තියං ගහෙත්වා හරති. ථෙරො දුබ්බලචීවරොයෙව හොති. අථෙකස්මිං දිවසෙ උපාසකො විහාරං ගන්ත්වා ථෙරස්ස දුබ්බලානි චීවරානි දිස්වා චීවරත්ථාය සාටකානි දත්වා එවං චින්තෙසි. මයා පනිමස්ස බහූනි චීවරසාටකානි දින්නානි. නාපි චීවරං කත්වා පාරුපති. න සන්නිධිට්ඨානං වා අඤ්ඤස්ස දානං වා පඤ්ඤායති. කාරණෙන ඉමස්ස භවිතබ්බන්ති ආසන්නට්ඨානෙ මග්ගා ඔක්කම්ම නිලීනො අට්ඨාසි. ගච්ඡන්තාගච්ඡන්තෙ උපපරික්ඛමානො. තතො චොරො ථෙරස්ස සාටකානි උපනීතභාවං ඤත්වා තං ගණ්හිස්සාමීති රත්තිභාගෙ විහාරං ගන්ත්වා සාටකානි ගහෙත්වා පුන තෙනෙව මග්ගෙන ආගච්ඡති. තතො උපාසකො සහභණ්ඩකං චොරං දිස්වා වෙගෙන ගන්ත්වා තස්ස චූළං ගහෙත්වා එත්තකං කාලං අය්‍යස්ස මයා දින්නානි සාටකානි ගණ්හන්තො ත්වමරෙති පුච්ඡි. තෙන හි ආම සාමීති සම්පටිච්ඡිතෙ උපාසකො තස්ස හත්ථතො චීවරවත්ථං ගහෙත්වා හත්ථපාදෙහි තං පොථෙත්වා දුබ්බලං කත්වා ආමකසුසානං නෙත්වා මතමනුස්සං අධොමුඛං කත්වා තස්ස පිට්ඨියං උත්තානං සයාපෙත්වා හත්ථපාදපිට්ඨිතො බන්ධනං අමොචනං කත්වා විසුං විසුං කත්වා දළ්හං බන්ධිත්වා සයාපෙත්වා සයං නහාත්වා පුරිමතරං ගාමමාගම්ම ගාමමජ්ඣෙ ඨත්වා 'භො ගාමවාසිනො මම වචනං සුණාථ අජ්ජරත්තිභාගෙ එකො අමනුස්සො ආගච්ඡති. සො තුම්හාකං මහාවිනාසං කරිස්සති. ඛෙමට්ඨානං පත්වා ද්වාරානි පිධාය නිසීදථාති උග්ඝොසෙසි.

(රසවාහිනී)

## පදමාලාව

| | | | |
|---|---|---|---|
| **පරියත්තිධරො** | (ස) | - | පර්යාප්තිය දරන්නා වූ |
| **තෙපිටකො** | (ස) | - | ත්‍රිපිටකධාරී වූ |
| **ගාමන්තසෙනාසනං** | (ස) | - | ග්‍රාමාශ්‍රිත සෙනසුන |
| **වනසණ්ඩෙ** | (ස) | - | වන ලැහැබක |
| **කතපණ්ණසාලාය** | (ස) | - | කරන ලද පන්සලක |
| **ගාමවාසිනො** | (ස) | - | ගම්වැසියෝ |
| **අජ්ජ** | (නි) | - | අද |
| **රත්තිභාගෙ** | (ස) | - | රාත්‍රී කාලයෙහි |

| | | | |
|---|---|---|---|
| අපරභාගෙ | (ස) | - | පසුකලෙක |
| පටිවසති | (ක්‍රි) | - | වාසය කරයි |
| පාකටො | (කි) | - | ප්‍රකට |
| පසන්නමානසො | (ස) | - | පැහැදුණු සිතැත්තේ |
| අථෙකසමිං | (සං) | - | ඉක්බිති එක් |
| තස්සාසනෙනෙයෙව | (සං) | - | ඒ අසලම |
| ද්වාදසසංවච්ඡරානි | (ස) | - | අවුරුදු දොළහක් |
| චතූහි පච්චයෙහි | (නා) | - | සිවුපසයෙන් |
| පටි ජග්ගි | (ක්‍රි) | - | පෝෂණය කළේය |
| චීවරත්ථාය | (ස) | - | සිවුරු පිණිස |
| කාලෙන කාලං | (නා) | - | කලින් කල |
| දින්නදින්නානි | (කි) | - | දෙන දෙන ලද |
| අන්තරාමගෙග | (ස) | - | අතරමග |
| දුබ්බලචීවරො | (ස) | - | දුබල සිවුරු ඇත්තේ |
| චීවරසාටකානි | (ස) | - | සිවුරු රෙදි |
| පාරුපති | (ක්‍රි) | - | පොරවයි |
| සන්නිධිට්ඨානං | (ස) | - | රැස්කරන තැනක් |
| පඤ්ඤායති | (ක්‍රි) | - | ප්‍රකට වෙයි |
| ආසන්නට්ඨානෙ | (ස) | - | සමීප තැනක |
| ඔක්කම්ම | (පූ.ක්‍රි) | - | ඉවත් වී |
| නිලීනො | (කි) | - | සැඟවුණේ |
| උපපරික්ඛමානො | (කි) | - | සොයමින් |
| චූළං | (නා) | - | කොණ්ඩය |
| එත්තකං කාලං | (නා) | - | මෙපමණ කල් |
| චීවරවත්ථං | (ස) | - | සිවුරු රෙදි |
| සම්පටිච්ඡිතෙ | (කි) | - | පිළිගත් කල්හි |
| පොථෙත්වා | (පූ.ක්‍රි) | - | තළා |
| ආමකසුසානං | (ස) | - | අමුසොහොනට |
| අධොමුඛං කත්වා | (පූ.ක්‍රි) | - | මුහුණ යටට සිටින සේ කර |
| පිට්ඨියං | (නා) | - | පිටෙහි |
| උත්තානං | (නා) | - | උඩුබැලි අතට |
| අමොචනං කත්වා | (පූ.ක්‍රි) | - | මුදාගත නොහැකි කොට |
| පුරිමතරං | (ත) | - | පෙරටුව |
| ගාමමාගම්ම | (පූ.ක්‍රි) | - | ගමට අවුත් |
| ඛෙමට්ඨානං | (ස) | - | ආරක්ෂිත ස්ථානයකට |
| පිධාය | (පූ.ක්‍රි) | - | වසා |
| උග්ඝොසෙසි | (ක්‍රි) | - | හඬ නැගීය |

**අභ්‍යාස**

1. ගාමවාසිනො මම වචනං සුණාථ අජ්ජරත්තිභාගෙ එකො අමනුස්සො ආගච්ඡති. යන ඡේදය සිංහලට නගන්න.

2. පාලි භාෂාවෙන් පිළිතුරු සපයන්න.

i. කතරස්මිං රට්ඨෙ මහාතලාකවිහාරො අහොසි ?
ii. කො ගාමන්තසෙනාසනං පහාය අරඤ්ඤකො අහොසි ?
iii. කො අරඤ්ඤකමහාභයත්ථෙරං පටිජග්ගි ?
iv. කති වස්සානි සො ථෙරං උපට්ඨහි ?
v. හරන්තිකො කිං අකාසි ?
vi. උපාසකො බහූසු චීවරෙසු දින්නෙසුපි කස්මා ථෙරො දුබ්බලවිහාරො යෙව අහොසි ?
vii. ථෙරො කෙන කාරණෙන දුබ්බලචීවරොයෙව භවිස්සතීති උපපරික්ඛිතුං උපාසකො කිං අකාසි ?
viii. මග්ගා ඔක්කම්ම නිලීනෙන උපාසකෙන කිං දිට්ඨං ?
ix. සභණ්ඩකං චොරං දිස්වා උපාසකො කිං පුච්ඡි?
x. උපාසකො ගාමවාසිනං කිං ආහ ?

3. ඡේදය ඇසුරෙන් සිංහලෙන් පිළිතුරු ලියන්න.

i. ත්‍රිපිටකය නම් කරන්න.
ii. මහා අභය තෙරුන් වැරැහැලි සිවුරු ඇත්තෙක් වීමට හේතුව පැහැදිලි කරන්න.
iii. උපාසකයා අභය තෙරුන්ට වසර කීයක් උවටැන් කළේ ද?
iv. සොරා අල්ලාගත් උපාසකයා ඔහුට කුමක් කළේ ද?
v. මෙම ඡේදයෙන් උගත හැකි ආදර්ශ දෙකක් ගෙනහැර දක්වන්න.

## තද්ධිත II

### අස්ත්‍යර්ථ තද්ධිත නාම

ඇත, අතිශය යන අරුත් ඇති ප්‍රත්‍යය එකතු වී සෑදෙන තද්ධිත පද අස්ත්‍යර්ථ තද්ධිත නම් වේ.

### ප්‍රත්‍යය මාලාව

ආලු (**ආලුතබ්බහුලෙ**), තර, තම, ස්සික, ඉය, ඉට්ඨ, (**විසෙසෙ කතරමමිස්සිකයිට්ඨා**) වි, (**තදස්සාත්ථි ති වි**), සී (**තපාදිතො සි**), ඉක, ඊ (**දණ්ඩාදිතො ඉක ඊ**), වන්තු (**ගුණාදිතො වන්තු**), මන්තු (**සත්‍යාදීහි මන්තු**), ණ (**සද්ධාදිතො ණ**), ආදී ප්‍රත්‍යය මෙහි වේ.

i. ආලු - එය බහුලව ඇත යන අරුත දෙයි. (ආලුතබ්බහුලෙ)

අභිජ්ඣා + ආලු - අභිජ්ඣාලු - (අභිධ්‍යාව බහුලව ඇති)
දයා + ආලු - දයාලු - (දයාව බහුලව ඇති)

ii. තර තම ඉස්සික ඉය ඉට්ඨ - ප්‍රත්‍යය අතිශයාර්ථය දේ. (විසෙසෙ තරතමමිස්සිකිට්ඨා)

පාප + තර - පාපතර/හීනතර
පාප + තම - පාපතම /හීනතම
පාප + ඉස්සික - පාපිස්සික
පාප + ඉය - පාපිය
පාප + ඉට්ඨ - පාපිට්ඨ /කනිට්ඨ/ජෙට්ඨ

iii. වි - එය ඇත යන අර්ථය දේ (තදස්සාත්ථී ති වි)

මෙධා + වී - මෙධාවී - (නුවණ ඇත්තා)
මයා + වී - මායාවී - (මායා ඇත්තා)

iv. සි - ඇත යන අරු දේ (තපාදිතො සි)

තප + සී = තපස්සී - තපස් ඇත්තා
යස + සී = යසස්සී - කීර්ති ඇත්තා

v. ඉක ඊ දණ්ඩ ආදී ශබ්දවලින් පරව ඉක, ඊ ප්‍රත්‍ය වේ. ඇත යන අරුත දේ.
(දණ්ඩාදිතො ඉක ඊ)

දණ්ඩ + ඉක = දණ්ඩික - (දඬු ඇත්තා)
දණ්ඩ + ඊ = දණ්ඩී - (දඬු ඇත්තා)
ගණ + ඉක = ගණික - (සමූහ ඇත්තා)
ගණ + ඊ = ගණී - (සමූහ ඇත්තා)

vi. වන්තු මන්තු - අකාරාන්ත ශබ්දවලින් පර ව වන්තු ද ඉකාරාන්ත උකාරන්ත ශබ්දවලින් පර ව මන්තු ද වේ.
(ගුණාදිතො වන්තු, සත්‍යා, දීහි මන්තු)

ගුණ + වන්තු - ගුණවන්තු - (ගුණ ඇත්තා)
සති + මන්තු - සතිමන්තු - (සිහි ඇත්තා)

vii. ණ - ඇත යන අරුත දේ. (සද්ධාදිතො ණ)

සද්ධා + ණ - සද්ධ - (සැදැහැ ඇත්තා)

## භාවාර්ථ තද්ධිත නාම

භාවාර්ථවත් ණ්‍ය ආදී ප්‍රත්‍ය යෙදී සෑදේ. (ණ්‍යත්ත තා භාවෙ තු - භාවෙත්ථ ණ්‍යත්තතා හොන්ති. තු සද්දෙන ත්තනො වා)

ණ (ණවිසමාදීහි) කණ් (රමණීයාදිතො කණ්) ආදී ප්‍රත්‍යය භාවාර්ථයෙහි වේ.

I. ණ්‍ය - කුසල + ණ්‍ය - කොසල්ල - (දක්‍ෂබව)
අරොග + ණ්‍ය - ආරොග්‍ය - (නිරෝගී බව)
දුබ්බල + ණ්‍ය - දුබ්බල්‍ය - (දුබල බව)

II. ත්ත - මනුස්ස + ත්ත - මනුස්සත්ත - (මිනිස්බව)
අරහ + ත්ත - අරහත්ත - (රහත් බව)
යාචක + ත්ත - යාචකත්ත - (යාචක බව)

III. තා - අප්පිච්ඡ+ තා - අප්පිච්ඡතා - (අල්පේච්ඡ බව)
ලහු + තා - ලහුතා - (සැහැල්ලු බව)
කතඤ්ඤු + තා - කතඤ්ඤුතා - (කළගුණ දත් බව)

Iv. ණ - විසම + ණ - වෙසම - (අසමාන බව)
පටු + ණ - පාටව - (දක්‍ෂ බව)
ගරු + ණ - ගාරව - (ගරුත්වය)

v. කණ් - රමණීය + කණ් - රමණීයකං - (සිත් අලවන බව)
මනුඤ්ඤ + කණ් - මානුඤ්ඤකං - (මිනිස්බව)

## සංඛ්‍යා තද්ධිත නාම

සංඛ්‍යා ශබ්දයකින් පරව පූරණාර්ථ ප්‍රත්‍යය යෙදී සෑදේ. (සංඛ්‍යා පූරණෙ මො)

ප්‍රත්‍යය මාලාව

තිය (ද්විතීහි තියො) ථ ඨ (චතුච්ඡෙහි ථඨා) ම (සංඛ්‍යා පූරණෙ මො) (ද්වාදිතො කො නෙකත්ථෙව චෙ) ආදී ප්‍රත්‍යය වේ.

I. තිය - ද්වි + තිය - දුතිය/තතිය
II. ථ - චතු + ථ - චතුත්ථ
III. ඨ - ඡ + ඨ - ඡට්ඨ
IV. ම - පඤ්ච + ම - පඤ්චම
V. ක - එකක/දුක/තික

අව්‍යය තද්ධිත නාම

වාර විභාගාදී අර්ථ ප්‍රකාශ කරන ප්‍රත්‍යය එක් වී තැනේ. තද්ධිත නාමය අව්‍ය බවට පත්වේ.

I. ක්ඛත්තුං - ද්වි+ ක්ඛත්තුං - ද්වික්ඛත්තුං (එකාදිතො සකිස්ස ක්ඛත්තුං)
II. ධා - එක + ධා - එකධා (විභාගෙ ධා)
III. ථා - සබ්බ + ථා - සබ්බථා (සබ්බනාමෙහි පකාරවචනෙ තු ථා)
IV. ථං - ක + ථං - කථං/ඉත්ථං (කිම්මෙහි ථං)
V. තන - අජ්ජතන, පුරාතන, සව්‍යාතන (භාවත්ථෙ තනපච්චයො ච)

**අභ්‍යාස**

1. සිංහලට නගන්න.

i. මාණව, අහං තෙ සොවණ්ණමයං වා මණිමයං වා රජතමයං වා චක්කයුගං දස්සාමීති බ්‍රාහමණො වදි.
ii. දයාලු භගවා මහාජනතං අනුකම්පමානො සබ්බදා එකත්ථ අවසිත්වා තත්ථ තත්ථ විචරන්තො සන්දිට්ඨිකං ධම්මං දෙසෙසි.
iii. චුල්ලපන්ථකො සහස්සක්ඛත්තුං අත්තානං නිම්මිණිත්වාන යාව කාලප්පවෙදනා රම්මෙ අම්බවනෙ නිසීදි.
iv. දාළිද්දියෙ වෙපුල්ලංගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි.
v. ගුණවතී උපාසිකා සීලවන්තියා භික්ඛුනියා දිවසස්ස ද්වික්ඛත්තුං දානං අදාසි.

2. පාලියට නගන්න.

i. ගිලන්බවට පත් රෝගීහු බෙහෙත් අනුභවකොට ආරෝග්‍යය ලැබ තම තමන්ගේ සොම්නස ප්‍රකාශ කළහ.
ii. ශ්‍රේෂ්ඨ පුරවැසියෝ සැම කල්හි හැමතැනම පහළ නො වෙති.
iii. අපි දවසට තුන්වරක් බුදුන් වඳිමු.
iv. පාපතර මිනිස්සු කායික වූ ද වාචසික වූ ද අකුසල් කොට අපායේ උපදිති.
v. සිල්වත් ගුණවත් කුලවත් යසෝදරා කුමරිය සිද්ධාර්ථ කුමරුගේ බිරිඳ වූවාය.

3. දී ඇති ශබ්ද ප්‍රකෘතිය ඇසුරින් නියමිත අර්ථානුකූල තද්ධිත පද නිර්මාණය කරන්න.

i. සුගත (බුදුන් වහන්සේට අයත්)
ii. ලොක (ලෝකයට අයත්)
iii. දන්ත (දළ ඇත්තා)
iv. මායා (මායා ඇත්තා)
v. අරොග (නිරෝගී බව)
vi. කුසල (දක්ෂ බව)
vii. ද්වි (දෙකඩකට)
viii. චතු (සතරවරක්)
xi. එක (එක් දවසක්)
x. සබ්බ (හැම තැනම)

4. පහත තද්ධිත පදවල ප්‍රකෘති ප්‍රත්‍යය වෙන් කර වගුව සම්පූර්ණ කරන්න.

| තද්ධිතය | ප්‍රකෘති ප්‍රත්‍යය | තද්ධිතය නාමය | අර්ථය |
|---|---|---|---|
| රජ්ජ | රාජ+ණ්‍ය | භාවතද්ධිත | රජබව |
| සීලවන්තු<br>යසස්සී<br>දුබ්බල්‍යං<br>ආධිපතෙය්‍ය<br>ධානසො<br>කදා<br>ද්විකඛත්තුං<br>චතුත්‍ථො<br>පඤ්චමො<br>වණිජ්ජං | | | |

5.

i. තද්ධිත යන්න හඳුන්වා දෙන්න.
ii. තද්ධිතවලින් භාෂාවට ලැබෙන ප්‍රයෝජන මොනවාද ?
iii. තද්ධිත ප්‍රභේද නම් කරන්න.
iv. තද්ධිතයන්හි වෘද්ධි කාර්යය නිදසුන් මගින් පහදන්න.
v. 'කොසල්ල' යන තද්ධිත පදය සූත්‍ර දක්වමින් සිද්ධ කරන්න.

## පඤ්චදසමො පාඨො

# තණ්හාය අභිභූතො කුමාරො

අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තස්ස රඤ්ඤො ද්වෙපුත්තා අහෙසුං. සො ජෙට්ඨස්ස උපරජ්ජං අදාස, කණිට්ඨස්ස සෙනාපතිට්ඨානං. අපරභාගෙ බ්‍රහ්මදත්තෙ කාලකතෙ අමච්චා ජෙට්ඨකස්ස අභිසෙකං පට්ඨපෙසුං. සො 'න මය්හං රජ්ජෙනත්ථො, කණිට්ඨස්ස මෙ දෙථා'ති වත්වා උපරජ්ජාදීනිපි න ඉච්ඡි. 'තෙන හි සාධූනි භොජනානි භුඤ්ජන්තො ඉධෙව වසාහී'ති වුත්තෙපි 'න මෙ ඉමස්මිං නගරෙ කිච්චං අත්ථී'ති බාරාණසිතො නික්ඛමිත්වා පච්චන්තං ගන්ත්වා එකං සෙට්ඨීකුලං නිස්සාය සහත්ථෙන කම්මං කරොන්තො වසි. තෙ අපරභාගෙ තස්ස රාජකුමාරභාවං ඤත්වා කම්මං කාතුං නාදංසු. කුමාරපරිහාරෙනෙව තං පරිහරිංසු. අපරභාගෙ රාජකම්මිකා ඛෙත්තප්පමාණගණ්හනත්ථාය තං ගාමං අගමිංසු. සෙට්ඨී රාජකුමාරං උපසඞ්කමිත්වා, 'සාමි, මයං තුම්හෙ පොසෙම. කණිට්ඨභාතිකස්ස පණ්ණං පෙසෙත්වා අම්හාකං බලිං හාරෙථා'ති ආහ. සො 'සාධූ'ති සම්පටිච්ඡිත්වා 'අහං අසුකසෙට්ඨීකුලං නාම උපනිස්සාය වසාමි, මං නිස්සාය එතෙසං බලිං විස්සජ්ජෙහී'ති පණ්ණං පෙසෙසි. රාජා 'සාධූ'ති වත්වා තථා කාරෙසි.

අථ නං සකලගාමවාසිනොපි ජනපදවාසිනොපි උපසඞ්කමිත්වා 'මයං තුම්හාකඤ්ඤෙව බලිං දස්සාම, අම්හාකම්පි සුඞ්කං විස්සජ්ජාපෙහී'ති ආහංසු. සො තෙසම්පි අත්ථාය පණ්ණං පෙසෙත්වා විස්සජ්ජාපෙසි. තතො පට්ඨාය තෙ තස්සෙව බලිං අදංසු. අථස්ස මහාලාභසක්කාරො නිබ්බත්ති. තෙන සද්ධිං යෙවස්ස තණ්හාපි මහතී ජාතා. සො අපරභාගෙ සබ්බං තං ජනපදං යාචි. උපඩ්ඪරජ්ජං යාචි. කණිට්ඨොපි තස්ස අදාසියෙව. සො තණ්හාය වඩ්ඪමානාය උපඩ්ඪරජ්ජෙනපි අසන්තුට්ඨො රජ්ජං ගණ්හිස්සාමී'ති ජනපදපරිවුතො තං නගරං ගන්ත්වා බහිනගරෙ ඨත්වා 'රජ්ජං වා මෙ දෙතු යුද්ධං වා'ති කණිට්ඨස්ස පණ්ණං පහිණි. කණිට්ඨො චින්තෙසි. 'අයං බාලො පුබ්බෙ රජ්ජම්පි උපරජ්ජාදීනිපි පටික්ඛිපිත්වා ඉදානි 'යුද්ධෙන ගණ්හාමී'ති වදති. සචෙ ඛො පනාහං ඉමං යුද්ධෙන මාරෙස්සාමි ගරහා මෙ භවිස්සති, කිං මෙ රජ්ජෙනාති. අථස්ස 'අලං යුද්ධෙන, රජ්ජං ගණ්හාතූ'ති පෙසෙසි. සො රජ්ජං ගණ්හිත්වා කණිට්ඨස්ස උපරජ්ජං දත්වා තතො පට්ඨාය රජ්ජං කරොන්තො තණ්හාවසිකො හුත්වා එකෙන රජ්ජෙන අසන්තුට්ඨො ද්වෙ තීණි රජ්ජානි පත්ථෙත්වා තණ්හාය කොටිං නාද්දස.

(ජාතකට්ඨකථා)

### පදමාලාව

| | | | |
|---|---|---|---|
| අභිභූතො | (කි) | - | මඩනා ලද්දේ |
| බාරාණසියං | (නා) | - | බරණැස් නුවර |
| රඤ්ඤො | (නා) | - | රජුට |
| ද්වෙපුත්තා | (ස) | - | පුත්තු දෙදෙනෙක් |
| අහෙසුං | (ක්‍රි) | - | වූහ |

| | | | |
|---|---|---|---|
| ජෙට්ඨස්ස | (ත) | - | ජ්‍යෙෂ්ඨයාට, වැඩිමහල්ලාට |
| උපරජ්ජං | (ස) | - | උපරජකම |
| අදාසි | (ක්‍රි) | - | දුන්නේය |
| කණිට්ඨස්ස | (ත) | - | කණිෂ්ඨයාට, වයසින් බාලයාට |
| සෙනාපතිට්ඨානං | (ස) | - | සේනාපති තනතුර |
| අපරභාගෙ | (ස) | - | පසුකලෙක |
| කාලකතෙ | (කි) | - | කළුරිය කළ කල්හි |
| අභිසෙකං | (කි) | - | අභිෂේකය, රාජ්‍යත්වය පැවරීමේ මංගල්‍යය |
| පට්ඨපෙසුං | (ක්‍රි) | - | තැබූහ |
| රජ්ජෙනත්ථො | (සං) | - | රජකමෙන් ප්‍රයෝජනයක් |
| දෙවාති | (සං) | - | දෙව යැයි |
| භුඤ්ජන්තො | (කි) | - | අනුභව කරමින් |
| ඉධෙව | (සං) | - | මෙහි ම |
| වසාහීති | (සං) | - | වාසය කරව යැයි |
| වුත්තෙපි | (සං) | - | කී කල්හිද |
| කිච්චං | (කි) | - | වැඩක්, කටයුත්තක් |
| පච්චන්තං | (සං) | - | පිටිසර පළාතකට, පසල් දනව්වකට |
| සෙට්ඨිකුලං | (ස) | - | සිටුකුලයක් |
| නිස්සාය | (නි) | - | ඇසුරු කොට |
| සහත්ථෙන | (නා) | - | සියතින් |
| කරොන්තො | (කි) | - | කරමින් |
| ඤත්වා | (පූ.ක්‍රි) | - | දැන |
| නාදංසු | (ක්‍රි) | - | නො දුන්හ |
| කුමාරපරිහාරෙනෙව | (සං) | - | රාජකුමාරයා යන හැඟීමෙන් ම |
| රාජකම්මිකා | (ස) | - | රාජ්‍ය සේවකයෝ |
| ඛෙත්තප්පමාණගණ්හනත්ථාය | (ස) | - | කුඹුරු සඳහා වූ බදු ගැනීම පිණිස |
| පණ්ණං | (නා) | - | ලියුමක් / පත්‍රයක් |
| බලිං | (නා) | - | පූජා, බදු, සංග්‍රහ |
| හාරෙථාති | (සං) | - | ලබාගන්න යැයි |
| සම්පටිච්ඡිත්වා | (පූ.ක්‍රි) | - | පිළිගෙන |
| අසුකසෙට්ඨිකුලං | (ස) | - | අසවල් සිටුකුලය |
| උපනිස්සාය | (ස) | - | ඇසුරු කොට |
| සකලගාමවාසිනොපි | (ස) | - | සියලු ගම්වැසියෝ ද |
| තුම්හාකඤ්ඤෙව | (සං) | - | ඔබට ම |
| සුඞ්කං | (නා) | - | අයබදු |
| මහාලාභසක්කාරො | (ස) | - | මහත් වූ ලාභ සත්කාර |
| නිබ්බත්ති | (ක්‍රි) | - | උපන්නේය |
| උපඩ්ඪරජ්ජං | (ස) | - | රජකමෙන් අඩක් |
| අදාසියෙව | (සං) | - | දුන්නේ ම ය |
| අසන්තුට්ඨො | (කි) | - | නොසතුටු සිත් ඇත්තේ |
| ගණ්හිස්සාමී | (ක්‍රි) | - | ගන්නෙමි |
| ජනපදපරිවුතො | (ස) | | ජනපදය පිරිවරන ලද්දේ |
| බහිනගරෙ | (ස) | - | නගරයෙන් පිටත |

| | | | |
|---|---|---|---|
| **පටික්ඛිපිත්වා** | (පූ.ක්‍රි) | - | ප්‍රතික්ෂේප කොට |
| **ගරහා** | (නා) | - | ගර්හාවක්, නින්දාවක් |
| **තණ්හාවසිකො** | (සං) | - | තෘෂ්ණාවේ වසඟයෙක් |
| **පත්ථෙත්වා** | (පූ.ක්‍රි) | - | ප්‍රාර්ථනා කොට |
| **කොටිං** | (නා) | - | කෙළවර |

**අභ්‍යාස**

01. 'තණ්හාය අභිභූතො කුමාරො' යන ඡේදය සිංහලට නගන්න.

02. පාලියෙන් පිළිතුරු සපයන්න.

i. බ්‍රහ්මදත්තස්ස රඤ්ඤො කිත්තකා පුත්තා අහෙසුං?
ii. සො කස්ස උපරජ්ජං අදාසි කස්ස සෙනාපතිට්ඨානං ?
iii. අමච්චා කං අභිසෙකං පට්ඨපෙසුං ?
iv. රාජකම්මිකාති කෙ?
v. ජෙට්ඨකුමාරො රජ්ජං යාචිත්වා කණිට්ඨස්ස පණ්ණං පෙසිතෙ සො කිං චින්තෙසි ?

03. සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. බරණැස් නුවර හා ගෞතම බුදුසසුන අතර ඇති සම්බන්ධය කුමක් ද?
ii. ඉපැරණි රාජ්‍යයක ප්‍රධාන තනතුරු තුනක් නම් කරන්න.
iii. 'මුළුමණින්ම මුල නොසිඳූ ගස නැවත වැඩෙන්නා සේ සැඟව ඇති තෘෂ්ණාව ද වැඩෙන බව මෙම කථා පුවතෙන් කියවේ' මෙම අදහස ඇති ධම්මපද ගාථාව සොයා ලියන්න.
iv. මෙම පාඩමේ සඳහන් සන්ධි පද හතරක් හා සමාස පද දෙකක් උපුටා දක්වන්න.
v. 'කම් නැත' නොහොත් 'වැඩක් නැත' මෙම අදහස ඇති නිපාත පදය පාඩමෙන් තෝරා ලියන්න.

04. ඉහත පාලි ඡේදයේ වාක්‍ය රටාව අනුගමනය කරමින් මේ වාක්‍ය පාලියට නගන්න.

i. පෙර ලක්දිව කාවන්තිස්ස රජුට පුත්තු දෙදෙනෙක් වූහ.
ii. ඒ රජු වැඩිමහල්ලාට යුවරජකම ද බාලයාට සේනාපති තනතුර ද දුන්නේ ය.
iii. පසුකලෙක කාවන්තිස්ස රජු කුමාරවරුන් දෙදෙනා කැඳවා 'යුද්ධයෙන් වැඩක් නැත' එළාර සමග යුද්ධ නොකරන්නැ'යි ඉල්ලී ය
iv. කෝපාවිෂ්ට වූ වැඩිමහල්ලා 'මට යුවරජකමෙන් ඵලක් නැතැ'යි කියා ජන පදයෙන් නික්මී පිටිසර පළාතකට පැන ගියේ ය.
v. රජු මියගිය කල්හි ඇමතියෝ කුමාරවරුන් කැඳවා වැඩිමහල්ලාට රජකම ද බාලයාට යුවරජකම ද ලබාදුන්හ.
vi. බාලකුමාරයා දීඝවාපියට ගොස් සියතින් වැඩ කරමින් කුඹුරු සීසාමින් සේනාව රැස්කරමින් වාසය කළේ ය.

## කිතක පද

ධාතුවක් අගට ප්‍රත්‍යය එකතු කිරීමෙන් සාදා ගන්නා පද දෙවර්ගයක් වෙයි. ඒවා නම් **ආඛ්‍යාත** පද හා **කිතක** පද යි. මෙම පද දෙවර්ගය ම ක්‍රියාවාචී අර්ථයක් නිෂ්පාදනය කළ ද මේ දෙකෙහි වෙනස්කම් කීපයක් දැක ගත හැක. කිතක පද කෘදන්ත පද ලෙස ද හැඳින්වේ.

| ආඛ්‍යාත පද | කිතක පද |
|---|---|
| ක්‍රියාර්ථයත්, කාලාර්ථයත් ප්‍රකාශ වේ. | ක්‍රියාර්ථයත්, කාලාර්ථයත් ප්‍රකාශ වේ. |
| ධාතුව අගට ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය එක් කොට තනා ගනී (උදාඃ- √භූ + ති = භවති) | ධාතුව අගට විශේෂ ප්‍රත්‍යය එක් කොට කිතක පද තනා ගනී (උදාඃ-√දිස +අනීය = දස්සනීය) |
| කර්තෘ, කර්ම, භාව යන කාරකත්‍රය ම කියවේ. | කාරක හයේ (කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අපදාන, ආධාර) හා භාව කාරකයේ යෙදේ. |
| පුරුෂ භේදය (පඨම, මජ්ඣිම, උත්තම) ඇත. | පුරුෂ භේදය (පඨම, මජ්ඣිම, උත්තම) නැත. |
| පුරුෂ වශයෙන් බෙදී ඒකවචන බහුවචනයන්හි වරනැඟේ. (උදාඃ- ගච්ඡති - ගච්ඡන්ති - ගච්ඡසි...) | කිතක පද ( නාම විභක්තිවල වරනැඟේ උදාඃ- ගච්ඡං - ගච්ඡන්තො, ගච්ඡන්තාං ...) |
| ආඛ්‍යාතය කිසිවිටෙකත් නාමපදයක් නො වේ. | ඇතැම් විටෙක කිතකය නාමපදයක් වෙයි. |
| ආඛ්‍යාතය ලිංග භාජනය නො කරයි. | කිතක පද ලිංග භාජනය කරයි. |

## කිතක ප්‍රභේද

කිතක පිළිබඳ ප්‍රභේද හයක් ව්‍යාකරණඥයන් විසින් දක්වා ඇත.

1. **ත්‍රෛකාලික කිතකය**
2. **අතීත කිතකය**
3. **වර්තමාන කිතකය**
4. **අනාගත කිතකය**
5. **උණාදී කිතකය**
6. **තුනාදී කිතකය**

කිතක ප්‍රත්‍යයෝ වර්ග 02ක් වෙති. ඒවා 1. කිච්ච 2. කිත් යනුවෙන් හැඳින්වේ. කිච්ච ප්‍රත්‍යයෝ ස්වල්ප දෙනෙක් වන අතර, කිත් ප්‍රත්‍යයෝ බොහෝ වෙති. **තබ්බ, අනීය, ණ්‍ය, රිච්ච, ණිය, තය්‍ය** යන මේවා කිච්ච ප්‍රත්‍යයෝ වන අතර ඒවා ත්‍රෛකාලික කිතකයේ යෙදේ.

**ත්‍රෛකාලික කිතක**

| | | | |
|---|---|---|---|
| √දා + තබ්බ | - | දාතබ්බං | (දිය යුතුය) |
| √භූ + තබ්බ | - | භවිතබ්බං | (විය යුතුය) |
| √භුජ + තබ්බ | - | භුඤ්ජිතබ්බං | (අනුභව කළ යුතුය) |
| √ඛාද + අනීය | - | ඛාදනීය | (කෑ යුතු) |
| √වද + ණ්‍ය | - | වජ්ජං | (කිව යුතු දෙය) |
| √ගමු + ණ්‍ය | - | ගම්ම | (අවබෝධ කටයුතු දෙය) |
| √ඛාද + ණ්‍ය | - | ඛජ්ජ | (කෑ යුතු දෙය) |
| √කර + රිච්ච | - | කිච්ච | (කටයුත්ත) |
| √ඤා + තය්‍ය | - | ඤාතය්‍ය | (දැනගත යුත්ත) |

- **අම්හෙහි දානං දාතබ්බං, පුඤ්ඤං කාතබ්බං සම්මා භුඤ්ජිතබ්බං.**
  (අප විසින් දන් දිය යුතුය, පින් කළ යුතුය, මැනවින් අනුභව කළ යුතුය.)
- **මාතා ඛාදනීයං පණීතං භොජනං ආනෙසි.**
  (මව් තොමෝ කෑ යුතු ප්‍රණීත බොජුන් ගෙනාවා ය)
- **සුදස්සං වජ්ජං අඤ්ඤෙසං - අත්තනො පන දුද්දසං.**
  (අන්‍යයන්ගේ වරද පහසුවෙන් දත හැක. තමාගේ වරද දැකීම අපහසු ය.)
- **න මෙ ඉමස්මිං නගරෙ කිච්චං අත්ථි.**
  (මට මේ නගරයේ කටයුත්තක් නැත.)

**අතීත කාලික කිතක**

| | | |
|---|---|---|
| √භුජ + ත | - | භුත්ත |
| √කර + ත | - | කත |
| √පච + ත | - | පචිත / පක්ක |
| √යා + ත | - | යීත |
| √ඤා + ත | - | ඤාත |
| √මර + ත | - | මත |
| √මුච + ත | - | මුත්ත |
| √ජිද + න | - | ජිණ්ණ |
| √තර + ඉ + න | - | තිණ්ණ |

- **ඉච්ඡිතං පත්ථිතං තුය්හං ඛිප්පමෙව සමිජ්ඣතු**
  (ඔබගේ කැමති වන ලද, ප්‍රාර්ථනා කරන ලද දේ වහා ම සමෘද්ධ වේවා )

- **අප්පමත්තා න මීයන්ති - යෙ පමත්තා යථා මතා**
  අප්‍රමාදීවූවෝ නො මැරෙති - පමාවූවෝ (ජීවත් වුව ද) මළඅය මෙනි.

- **දනෙතා සො දමනාය ධමමං දෙසෙති.**
  (ඉඳුරන්) දමනය වූ උන්වහන්සේ දමනය වීම පිණිස ධර්මය දේශනා කරති.

- **මමෙව කතමඤ්ඤන්තු ගිහී පබ්බජිතා උභො**

  (මා විසින් ම කරන ලදැ'යි ගිහි පැවිදි දෙපාර්ශ්වය ම දැන ගනිත්වා)

- **තස්ස ගච්ඡන්තස්සෙව භත්තං පක්කං අහොසි.**
  (ඔහු එතනට යද්දී ම බත පිසින ලද්දේ විය.)

**වර්තමාන කාලික කිතක**

√ගමු + මාන - ගච්ඡමානො
√චර + මාන - චරමානො
√දිස + මාන - දිස්සමානො
√ගමු + අන්ත - ගච්ඡන්තො
√භුජ + අන්ත - භුඤ්ජන්තො
√කර + අන්ත - කරොන්තො
√වද + අන්ත - වදන්තො
√පාල + අන්ත - පාලෙන්තො

- එතං භයං මරණෙ **පෙක්ඛමානො** - පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි
  (මරණයෙහි මේ බිය බලමින් සැප එළවන පින් කරව්)

- ගුණං **වදන්තො** බුද්ධස්ස - බුද්ධපීතිසමායුතො
  (බුදුරදුන්ගේ ගුණ කියන්නේ බුද්ධ ප්‍රීතියෙන් යුක්ත වූයේ විය)

- සො රාජා ධම්මෙන රජ්ජං **පාලෙන්තො** මනුස්සෙ පීණෙති.
  (ඒ රජතුමා ධර්මයෙන් රාජ්‍යය පාලනය කරන්නේ මනුෂ්‍යයන් පිණවයි.)

- සො එකං සෙට්ඨිකුලං නිස්සාය සහත්ථෙන කම්මං **කරොන්තො** වසි.
  (ඔහු එක් සිටුකුලයක් ඇසුරුකොට සියතින් වැඩ කරමින් වාසය කළේ ය)

## අභ්‍යාස

01. සිංහලට නගන්න.

i. අන්නං පානං ඛාදනීයං භොජනං ච මහාරහං - භුඤ්ජති සපරිවාරො නිච්ඡාරෙන්තො නිලීයති.

ii. උපාසකො ධම්මං සුත්වා නගරං පවිසන්තො සත්ථු ගුණකථං කථෙන්තොව පවිසති.

iii. සුමෙධපණ්ඩිතො උපරිපාසාදවරතලෙ රහොගතො හුත්වා පල්ලඞ්කං ආභුජිත්වා නිසින්නො චින්තෙසි.

iv. චක්කවත්තිරාජා ධම්මංයෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරු කරොන්තො ධම්මං මානෙන්තො ධම්මං පූජෙන්තො ධම්මං අපචායමානො රජ්ජමකරි.

v. තාත සුදින්න, භුඤ්ජ ච පිව ච පරිවාරෙහි ච, භුඤ්ජන්තො පිවන්තො පරිචාරෙන්තො කාමෙ පරිභුඤ්ජන්තො පුඤ්ඤානි කරොන්තො අභිරමස්සු.

vi. තිණ්ණො සො භගවා තරණාය ධම්මං දෙසෙති.

vii. පරපටිබද්ධා මෙ ජීවිකාති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං.

viii. ඛජ්ජ - භොජ්ජ - ලෙය්‍ය - පෙය්‍ය වසෙන චතුබ්බිධා හොන්ති මනුස්සානං ආහාරා.

ix. අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය

x. සචෙ උපජ්ඣායො ජන්තාඝරං පවිසිතුකාමො හොති, චුණ්ණං සන්නෙතබ්බං, මත්තිකා තෙමෙතබ්බා.

02. පාලියට නගන්න.

i. සැදැහැයෙන් පැවිදිවූවන් විසින් ධර්මය උගත යුතු ය. බුදුන් වැන්ද යුතු ය.

ii. අප විසින් පින් කළ යුතු ය. සිල් රැකිය යුතු ය. වත් පිරිය යුතු ය.

iii. මහාකාශ්‍යප තෙරණුවෝ රහසිගතව ධර්මය දෙස බලමින් වනයෙහි කල් ගෙවූහ.

iv. මහණෙනි, නැටුම ආර්ය විනයෙහි උමතුවක් වැනි ය.

v. තෙරණුවෝ නැඟිට දොර විවර කොට කාලය බලන්නේ අලුයම යැයි දැන පාසිවුරු ගෙන ගමට පිවිසියහ.

03. සුදුසු අතීත කෘදන්ත පද යොදා හිස්තැන් පුරවන්න.

(ජාතං, හිනෙනා, ජාතො, නිබ්බුතො, නිබ්බුතා, ගතො, පතිතං, ගතො, බුභිතො (සැළුණේ), පතිතො)

i. භික්ඛුසංඝො .................................
ii. රාහුලො .................................
iii. බන්ධනං .................................
iv. සා නාරී .................................
v. සො පිතා .................................
vi. සො ගාමං .................................
vii. ඵලං රුක්ඛම්හා .................................
viii. දෙවදත්තො නිරයං .................................
ix. සමුද්දො .................................
x. රුක්ඛො වාතප්පහාරෙන .................................

04. මෙම පාඩමේ එන සියලු කිතක පද තෝරා පහත එන පරිදි වගු ගත කරන්න.

| ත්‍රෛකාලික කිතක | අතීත කිතක | වර්තමාන කිතක |
|---|---|---|
| දාතබ්බං | කතං | පෙක්ඛමානො |

05. පහත සඳහන් ධාතුන් උපයෝගී කර ගෙන දී ඇති ප්‍රත්‍යය යොදා කිතක පද සාදන්න.

| ධාතුව | තබ්බ | අනීය | මාන | අන්ත | ත |
|---|---|---|---|---|---|
| වන්ද | වන්දිතබ්බ | වන්දනීය | වන්දමාන | වන්දන්ත | වන්දිත |
| කර | | | | | |
| දා | | | | | |
| නමු | | | | | |
| පත | | | | | |
| හර | | | | | |

# සොළසමො පාඨො

# පාලි පාඨාවලී

## 01. මච්ඡරියබ්‍රාහ්මණො

සාවත්ථියං අදින්නපුබ්බකො නාම බ්‍රාහ්මණො අහොසි. තෙන කස්සචි කිඤ්චි න දින්නපුබ්බං. තස්ස එකො'ව පුත්තො අහොසි පියො මනාපො. බ්‍රාහ්මණො පුත්තස්ස පිළන්ධනං දාතුකාමො සචෙ සුවණ්ණකාරස්ස ආචික්ඛිස්සාමි වෙතනං දාතබ්බං භවිස්සතී'ති සයමෙව සුවණ්ණං කොට්ටෙත්වා මට්ඨානි කුණ්ඩලානි කත්වා අදාසි. තෙනස්ස පුත්තො මට්ඨකුණ්ඩලීති පඤ්ඤායි. තස්ස සොළසවස්සිකකාලෙ පණ්ඩුරොගො උදපාදි. බ්‍රාහ්මණො වෙජ්ජානං සන්තිකං ගන්ත්වා තුම්හෙ අසුකරොගස්ස කිං භෙසජ්ජං කරොථාති පුච්ඡි. තෙ අස්ස යං වා තං වා රුක්ඛතචාදිං ආචික්ඛිංසු. සො තං ආහරිත්වා භෙසජ්ජං කරි. තථා කරොන්තස්සෙව තස්ස රොගො බලවා අහොසි. බ්‍රාහ්මණො තස්ස දුබ්බලභාවං ඤත්වා එකං වෙජ්ජං පක්කොසි. සො තං ඔලොකෙත්වා අම්හාකං එකං කිච්චං අත්ථි, අඤ්ඤං වෙජ්ජං පක්කොසිත්වා තිකිච්ඡාපෙහීති වත්වා නික්ඛමි. බ්‍රාහ්මණො තස්ස මරණසමයං ඤත්වා ඉමස්ස දස්සනත්ථාය ආගතාගතා අන්තො ගෙහෙ සාපතෙය්‍යං පස්සිස්සන්ති. තස්මා නං බහිකරිස්සාමීති පුත්තං නීහරිත්වා බහි ආලින්දෙ නිපජ්ජාපෙසි. තස්මිං කාලකතෙ බ්‍රාහ්මණො තස්ස සරීරං ඣාපෙත්වා දෙවසිකං ආළාහනං ගන්ත්වා කහං එකපුත්තක කහං එකපුත්තකා'ති රොදි.

-----------------------------------

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. අදින්නපුබ්බක බමුණා පුතාට පළඳනාවක් සකස් කළේ කෙසේ ද ?
ii. එම බමුණාගේ පුතාට පටබැඳුණු නම කුමක්ද ? එසේ වූයේ ඇයි ?
iii. මරණාසන්න පුතා තැබුවේ කොහිද?
iv. ගෙදරට පැමිණි වෛද්‍යවරයා දුන් උපදේශය කුමක්ද ?
v. පුතාට පියා විසින් බෙහෙත් කළ අයුරු පැහැදිලි කරන්න.
vi. මෙම පාඩමෙන් දෙන උපදේශය ලියන්න.

## 2. අකාරුණිකො වෙජ්ජො

අතීතෙ එකො වෙජ්ජො ගාමනිගමෙසු චරිත්වා වෙජ්ජකම්මං කරොන්තො එකං චක්ඛුදුබ්බලං ඉත්ථිං දිස්වා පුච්ඡි. කිං තෙ අඵාසුකන්ති. අක්ඛීහි න පස්සාමීති. භෙසජ්ජං තෙ කරොමීති. කරොහි සාමීති. කිමෙම දස්සසීති. සචෙ මෙ අක්ඛීනි පාකතිකානි කාතුං සක්ඛිස්සසි අහං තෙ පුත්තධීතාහි සද්ධිං දාසි භවිස්සාමීති. සො භෙසජ්ජං සංවිදහි. එකභෙසජ්ජෙනෙව අක්ඛීනි පාකතිකානි අහෙසුං. සා චින්තෙසි, අහං එතස්ස පුත්තධීතාහි සද්ධිං දාසී භවිස්සාමීති පටිජානිං. 'වඤ්චෙස්සාමි නන්ති' සා වෙජ්ජෙන කීදිසං භද්දෙති පුට්ඨා, පුබ්බෙ මෙ අක්ඛීනි ථොකං රුජිංසු. ඉදානි අතිරෙකතරං රුජන්තී ති ආහ. වෙජ්ජො අයං මං වඤ්චෙත්වා කිඤ්චි අදාතුකාමා. න මෙ එතාය දින්නභතියා අත්ථො. ඉදානෙව නං අන්ධං කරිස්සාමීති චින්තෙත්වා ගෙහං ගන්ත්වා භරියාය ආචික්ඛි. සා තුණ්හී අහොසි. සො එකං භෙසජ්ජං යොජෙත්වා තස්සා සන්තිකං ගන්ත්වා භද්දෙ ඉමං භෙසජ්ජං අඤ්ජාහී'ති අඤ්ජාපෙසි. තස්සා ද්වෙ අක්ඛීනි දීපසිඛා විය විජ්ඣායිංසු.

---------------------------

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඇස් දුර්වල ස්ත්‍රියගෙන් වෛද්‍යවරයා ඇසුවේ කුමක්ද?
ii. දෑස් සුව වුවහොත් කුමක් කිරීමට අඳ ස්ත්‍රිය පොරොන්දු වූවාද ?
iii. දෙවැනිවරට ද ඇසට බෙහෙත් දුන්නේ ඇයි?
iv. පෙරට වඩා බෙහෙත් ගැල්වීමෙන් ඇස රිදෙන බව ස්ත්‍රිය පැවසූවේ කුමක් නිසාද ?
v. වෛද්‍යවරයාගේ බිරිඳ කීවේ කුමක්ද ?
vi. මෙම කථාවෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියා දක්වන්න.

## 3. බුද්ධුපට්ඨාකා ද්වෙ තිරච්ඡානා

එකස්මිං සමයෙ සත්ථා ගණම්පහාය එකකොව එකං වනං පාවිසි. පාරිලෙය්‍යකො නාම එකො හත්ථිරාජාපි හත්ථිගණං පහාය තං වනං පවිසිත්වා භගවන්තං එකස්ස රුක්ඛස්ස මූලෙ නිසින්නං දිස්වා, පාදෙන පහරන්තො රුක්ඛමූලං සොධෙත්වා සොණ්ඩාය සාඛං ගහෙත්වා සම්මජ්ජි. තතො පට්ඨාය දිවසෙ දිවසෙ සොණ්ඩාය ඝටං ගහෙත්වා පානීය පරිභොජනීය උදකං ආහරන්ති. උණ්හොදකෙන අත්ථෙ සති උණ්හොදකං පටියාදෙති. කථං ? කට්ඨානි ඝංසිත්වා අග්ගිං පාතෙති. තත්ථ දාරූනි පක්ඛිපන්තො ජාලෙත්වා තත්ථ තත්ථ පාසාණෙ පචිත්වා දාරුක්ඛණ්ඩකෙන පවට්ටෙත්වා ඛුද්දකසොණ්ඩියං ඛිපති, තතො හත්ථං ඔතාරෙත්වා උදකස්ස තත්තභාවං ජානිත්වා ගන්ත්වා සත්ථාරං වන්දති. සත්ථා තත්ථ ගන්ත්වා නහායති. අථ නානාවිධානි ඵලානි ආහරිත්වා දෙති. යදා පන සත්ථා ගාමං පිණ්ඩාය පවිසති, තදා සත්ථුපත්තචීවරමාදාය කුම්භෙ ඨපෙත්වා සත්ථාරා සද්ධිං යෙව ගච්ඡති. රත්තිං වාළමිග

නිවාරණත්ථං මහන්තං දණ්ඩං සොණ්ඩාය ගහෙත්වා යාව අරුණුග්ගමනා වනසණ්ඩෙ විචරති.

අථෙකො මක්කටො හත්ථිං දිවසෙ දිවසෙ තථාගතස්ස උපට්ඨානං කරොන්තං දිස්වා අහම්පි කිඤ්චිදෙව කරිස්සාමීති විචරන්තො එකදිවසං නිම්මක්ඛිකං දණ්ඩකමධුං දිස්වා දණ්ඩකං භඤ්ජිත්වා දණ්ඩකෙනෙව සද්ධිං මධුපටලං සත්ථුසන්තිකං ආහරිත්වා කදලිපත්තං ඡින්දිත්වා තත්ථ ඨපෙත්වා අදාසි. සත්ථා ගණ්හි. මක්කටො කරිස්සති නු ඛො පරිභොගං න කරිස්සතීති ඔලොකෙන්තො ගහෙත්වා නිසින්නං දිස්වා කින්නුඛොති චින්තෙත්වා දණ්ඩකොටියං ගහෙත්වා, පරිවත්තෙත්වා ඔලොකෙන්තො අණ්ඩකානි දිස්වා තානි සනිකං අපනෙත්වා අදාසි. සත්ථා පරිභොගමකාසි. සො තුට්ඨමානසො තං තං සාඛං ගහෙත්වා නච්චන්තො අට්ඨාසි. තස්ස ගහිත-සාඛාපි අක්කන්තසාඛාපි භිජ්ජි. සො එකස්මිං ඛාණුමත්ථකෙ පතිත්වා නිබ්බිද්ධගත්තො සත්ථරි පසන්නෙන චිත්තෙන කාලඞ්කත්වා තාවතිංස භවනෙ නිබ්බත්ති.

-----------------------------

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඇතා බුදුරදුන්ට වැඩ සිටීමට ස්ථානයක් සකස් කළේ කෙසේ ද?
ii. ඇතා විසින් උණුවතුර සම්පාදනය කළ ආකාරය පැහැදිලි කරන්න.
iii. වඳුරා මීවදය පිළිගැන් වූයේ කුමක තබාද ?
iv. බුදුරදුන් සමග ඇතා පසුගමන් ගියේ කුමන අවස්ථාවලදී ද ?
v. වඳුරා මළේ කෙසේ ද ?
vi. කථාවේ උපදේශය ලියා දක්වන්න.

## 4. උජුජාතිකො සුනඛො

අතීතෙ ජම්බුදීපෙ අජිතරට්ඨෙ එකො ගොපාලකො වසි. තස්ස ගෙහෙ එකො පච්චෙකබුද්ධො නිබද්ධං භුඤ්ජති. තස්මිං ගෙහෙ එකො කුක්කුරො ච අහොසි. පච්චෙක බුද්ධො භුඤ්ජන්තො තස්ස නිබද්ධං එකං භත්තපිණ්ඩං අදාසි. සො තෙන පච්චෙකබුද්ධෙ සිනෙහමකාසි. ගොපාලකො දිවසස්ස ද්වෙ වාරෙ පච්චෙකබුද්ධස්ස උපට්ඨානං ගච්ඡි. සුනඛොපි තෙන සද්ධිං ගච්ඡි. ගොපාලො එක දිවසං පච්චෙකබුද්ධං ආහ. භන්තෙ යදා මෙ ඔකාසෙ න භවිස්සති තදා ඉමං සුනඛං පෙසෙස්සාමි. තෙන සඤ්ඤාණෙන ආගච්ඡෙය්‍යාථාති. තතො පට්ඨාය අනොකාසදිවසෙ සුනඛං පෙසෙසි. සො එකවචනෙනෙව පක්ඛන්දිත්වා පච්චෙකබුද්ධස්ස වසනට්ඨානං ගන්ත්වා තික්ඛත්තුං භුස්සිත්වා අත්තනො ආගතභාවං ජානාපෙත්වා එකමන්තං නිපජ්ජි. පච්චෙකබුද්ධෙ වෙලං සල්ලක්ඛෙත්වා නික්ඛන්තෙ භුස්සන්තො පුරතො ගච්ඡි. පච්චෙකබුද්ධො තං වීමංසන්තො එකදිවසං අඤ්ඤං මග්ගං පටිපජ්ජි. අථ සුනඛො පුරතො තිරියං ඨත්වා භුස්සිත්වා ඉතරමග්ගමෙව නං ආරොපෙසි.

අථෙකදිවසං අඤ්ඤං මග්ගං පටිපජ්ජිත්වා සුනඛෙන තිරියං ඨත්වා වාරියමානොපි අනිවත්තිත්වා තං පාදෙන අපනෙත්වා පායාසි. සුනඛො තස්ස අනිවත්තිතභාවං ඤත්වා නිවාසනකණ්ණෙ ඩසිත්වා ආකඩ්ඪන්තො ගන්තබ්බමග්ගමෙව පාපෙසි. එවං සො සුනඛො තස්මිං පච්චෙකබුද්ධෙ බලවසිනෙහං උප්පාදෙසි.

අපරභාගෙ පච්චෙකබුද්ධස්ස චීවරං ජීරි. අථස්ස ගොපාලකො චීවරවත්ථානි අදාසි. පච්චෙකබුද්ධො ඵාසුකට්ඨානං ගන්ත්වා චීවරං කාරෙස්සාමීති ගොපාලකං ආහ. සො පි භන්තෙ මා චිරං බහි වසිත්ථාති අවදි. සුනඛොපි තෙසං කථං සුණන්තො අට්ඨාසි. පච්චෙක බුද්ධො වෙහාසං අබ්භුග්ගන්ත්වා ගච්ඡන්තෙ, භුඞ්කරිත්වා ඨිතස්ස සුනඛස්ස හදයං ඵලි. තිරච්ඡානා නාමෙතෙ උජුජාතිකා හොන්ති. අකුටිලා මනුස්සා පන අඤ්ඤං චින්තෙන්ති අඤ්ඤං වදන්ති.

------------------------

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පසේ බුදුරදුන් දන් වළඳා අවසන්හි දිනපතා කළේ කුමක් ද?
ii. ගොපල්ලා දිනකට කී වතාවක් බුදුරදුන් වෙත යන්නේ ද?
iii. බල්ලා බුදුරදුන් වැඩමවීමට පැමිණ කළේ කුමක් ද?
iv. වැරදි මගට පිළිපන් පසේ බුදුරදුන්ට බල්ලා මග කියා දුන් අවස්ථා කියද ? එම අවස්ථා ලියන්න.
v. අවසානයේ බල්ලාට සිදුවූයේ කුමක් ද?
vi. කථාවේ උපදේශය ලියා දක්වන්න.

## 5. කතඤ්ඤූ සිගාලො

සීහළදීපෙ කිර දණ්ඩගොණගාමෙ එකො සිගාලො තත්ථ තත්ථ ගොචරං පරියෙසමානො එකං සල්ලකං දිස්වා ගණ්හිතුං ධාවි. තස්මිං ඛණෙ සල්ලො සූචියො විජ්ඣි. තතො එකා සූචි සිගාලස්ස අක්ඛිං භින්දි. තෙන සො 'කාණසිගාලො'ති පඤ්ඤායි.
අපරභාගෙ ගොචරත්ථාය ඉතො චිතො විචරන්තං අජගරො භොගෙන බන්ධි. අථෙකො ගොපාලකො තං අජගරෙන නිප්පිලීයමානං දිස්වා තස්ස කාරුඤ්ඤෙන අජගරෙන සද්ධිං වායමිත්වා තං විස්සජ්ජාපෙසි. අජගරො සිගාලං විස්සජ්ජෙත්වා ගොපාලං ගණ්හි. සිගාලො තං දිස්වා මයා කතඤ්ඤුනා භවිතබ්බන්ති මඤ්ඤමානො අජගරස්ස භොගෙ තත්ථ තත්ථ ඩසන්තො සද්දං කරොන්තොපි තං විස්සජ්ජාපෙතුමසක්කොන්තො සමීප ඛෙත්තෙ කසන්තෙ මනුස්සෙ දිස්වා සීඝසීඝං තත්ථ ගන්ත්වා සද්දං කත්වා තත්ථ ඨපිතංඑකං වත්ථං ඩසිත්වා ධාවි. මනුස්සා සද්දායන්තාපි වත්ථං පාතෙතුං අසක්කොන්තා ලෙඩ්ඩුදණ්ඩාදි හත්ථා තං අනුබන්ධිංසු. සිගාලො අජගරස්ස සමීපෙ වත්ථං පාතෙත්වා පටික්කම්ම අට්ඨාසි. මනුස්සා අජගරං ච ගොපාලං ච දිස්වා අජගරං මාරෙත්වා ගොපාලං විස්සජ්ජාපෙසුං.


නොමිලේ බෙදා හැරීම පිණිසයි

එවං තිරච්ඡානගතායපි අත්තනො කතං උපකාරං සල්ලක්ඛෙත්වා පච්චුපකාරං කරොන්ති. කාරණාකාරණං ජානන්තෙහි පන මනුස්සෙහි අවස්සං පච්චුපකාරො කාතබ්බොව හොති. තථාපෙකච්චෙ නරාධමා අත්තානං උපකාරකානං හිතෙසීනං සප්පුරිසානං අනත්ථමෙව කරොන්ති. තෙ පනෙතෙ අසප්පුරිසා තිරච්ඡානගතෙහිපි ගුණහීනාති ඤාතබ්බා.

------------------------

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1 සිවලාට 'කාණ සිගාල' යන නම ලැබුණේ කෙසේ ද?
2 සිවලා පිඹුරාගෙන් බේරාගත්තේ කවුද ?
3 සිවලා ගොවියාගේ වස්ත්‍රය රැගෙන යාමට හේතුව කුමක් ද?
4 පිඹුරා මරා දැමුයේ කවුද ?
5 මෙම කථාවෙන් දෙන උපදේශය කුමක් ද?

## 6. කතවෙදී සුනඛො

ජම්බුදීපෙ චන්දභාගා නාම ගංගාතීරෙ හොමගාමනාම අත්ථි. තස්මිං එකො මරුතෙතා නාම බ්‍රාහ්මණො පටිවසති. තදා සො වොහාරත්ථාය තක්කසිලං ගන්ත්වා ගෙහං ආගච්ඡන්තො අන්තරා මග්ගෙ එකාය සාලාය කුට්ඨරොගාතුරං සුනඛං දිස්වා තස්මිං කාරුඤ්ඤෙන නීලවල්ලිං තක්කම්බිලෙන මද්දිත්වා පායෙසි. සුනඛො වූපසන්තරොගො පාකතිකො හුත්වා බ්‍රාහ්මණෙන අත්තනො කතූපකාරං සල්ලක්ඛෙන්තො තෙනෙව සද්ධිං අගමාසි. අපරභාගෙ බ්‍රාහ්මණස්ස භරියා ගබ්භං පටිලභි. පරිපුණ්ණගබ්භාය තාය විජායනකාලෙ දාරකො තිරියම්පතිත්වා අන්තො ගබ්භෙයෙව මතො. තදා තං සත්ථෙන ඛණ්ඩාඛණ්ඩිතං, ඡින්දිත්වා නීහරිංසු. අථ බ්‍රාහ්මණො තං දිස්වා නිබ්බින්නහදයො ඝරාවාසං පහාය ඉසිපබ්බජ්ජං පබ්බජිත්වා අරඤ්ඤෙ විහරති. අථස්ස භරියා අඤ්ඤෙන සද්ධිං සංවසන්තී අයං මං පහාය පබ්බජිතො'ති බ්‍රාහ්මණෙ පදුට්ඨචිත්තා හො, බ්‍රාහ්මණං මාරෙහී'ති සාමිකෙන සද්ධිං මන්තෙසි. තෙසං මන්තං සුනඛො සුත්වා බ්‍රාහ්මණෙනෙව සද්ධිං චරති. අථෙකදිවසං තස්සා සාමිකො තාපසං මාරෙස්සාමී'ති ධනුකලාපං ගහෙත්වා නික්ඛමි. තදා තාපසො ඵලාඵලත්ථාය අරඤ්ඤං ගතො. සුනඛො අස්සමෙයෙව ඔහීයි. පුරිසො තාපසස්සාගමනමග්ගං ඔලොකෙන්තො ගච්ඡන්තරෙ නිලීනො අච්ඡි. සුනඛො තස්ස පමාදං ඔලොකෙත්වා ධනුනො ගුණං ඛාදිත්වා ඡින්දි. සො පුන ගුණං පාකතිකං කත්වා ආරොපෙසි. එවං සො ආරොපිතං ආරොපිතං ඛාදතෙව. අථ සො පාපපුරිසො තාපසස්සාගමනං ඤත්වා, තං මාරෙස්සාමී'ති ධනුනා සද්ධිං අගමාසි. අථ'ස්ස සුනඛො පාදෙ ඩසිත්වා පාතෙත්වා තස්ස මුඛං ඛාදිත්වා දුබ්බලං කත්වා භුංකාරමකාසි. එවං හි සප්පුරිසා අත්තනො උපකාරකානං පච්චුපකාරං කරොන්ති. වුත්තං හි

උපකාරකං සරනෙතා සො - සුනඛො කතවෙදිකො,
සත්තුපඝාතකං කත්වා - ඉසිනො'දාසි ජීවිතං.

තිරච්ඡානා'පි ජානන්ති - ගුණමත්තනි කතං සදා,
ඉති ඤත්වාන මෙධාවී - කතඤ්ඤූ හොන්ති පාණිනො
-----------------

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. බමුණා අතරමග දී දුටුවේ කුමක් ද?
ii. බමුණා ගිහිගෙය ගැන කළකිරුණේ ඇයි ?
iii බිරිඳ තම පෙර සැමියා මැරීමට සිතුවේ කවර හෙයින් ද ?
iv. තාපසයා මැරීමට කළ කුමන්ත්‍රණය අසාර්ථක වීමට හේතුව දක්වන්න.
v. කතාවෙන් ඉගැන්වෙන සාරධර්ම තුනක් ලියන්න.

## 7. නකුලඋපාසකස්ස වත්ථු

ලඞ්කායං කාකවණ්ණතිස්සමහාරාජෙ රජ්ජං කාරෙන්තෙ රොහණජනපදෙ අඤ්ඤතරස්මිං ගාමෙ නකුලො නාම උපාසකො වසි. සො දුක්ඛිතො දුක්ඛෙන කසිරෙන පුත්තදාරෙ පොසෙසි සො අත්තනො ධීතරං මහාගාමෙ එකස්මිං කුලෙ ඨපෙත්වා ද්වාදසකහාපණමත්තං ඉණං ගණ්හි. අපරභාගෙ ධීතරං මොචෙතුකාමො යතන භතිං කත්වා දුක්ඛෙන ද්වාදසකහාපණෙ උප්පාදෙත්වා තමාදාය මහාගාමං ගච්ඡන්තො අන්තරාමග්ගෙ සකටභින්නඛණ්ඩං නාම ඨානං සම්පාපුණි.සො තස්මිං තිස්සමහාවිහාරවාසිං චූලපිණ්ඩපාතිකතිස්සත්ථෙරං අද්දස, දිස්වා පන "පුරෙභත්තකාලො'යං, ආසන්නෙ ගාමො'පි න සන්ති. සචෙ ථෙරො ජිඝච්ඡිතො භවෙය්‍ය නෙතං පතිරූපං, කින්නුඛො කාතබ්බන්ති" චින්තෙන්තො අට්ඨාසි. තස්මිං ඛණෙ එකො පුරිසො පුටභත්තං ගහෙත්වා ආගඤ්ඡි. ථෙරං උපසංකමිත්වා පත්තං ගහෙත්වා භත්තං ආකිරිත්වා අදාසි, ථෙරො භත්තස්ස ලඞ්කාරං සල්ලක්ඛෙත්වා එකං රුක්ඛමූලං උපසඞ්කම්ම පත්තං ඨපෙත්වා විපස්සනං වඩ්ඪෙත්වා අග්ගඵලං අරහත්තං පත්වා'ව පරිභුඤ්ජි. සො විහාරං ගන්ත්වා, තම්පවත්තිං භික්ඛූනං ආරොචෙසි. ආරොචෙත්වා'ව පන යදා'හං පරිනිබ්බායිස්සාමි තදා මෙ නිපන්නකූටාගාරං අඤ්ඤෙහි උට්ඨාපෙන්තෙ න උට්ඨහතු යදා සො උපාසකො ආගන්ත්වා උට්ඨපෙති, තදා උට්ඨහතූති අපරභාගෙ පරිනිබ්බායන්තො තථෙව අධිට්ඨාය පරිනිබ්බායි.

අථස්ස ආළාහනකිච්චං කරිස්සාමාති මනුස්සා මහන්තං පූජාවිධානං කත්වා කූටාගාරං සජ්ජෙත්වා ථෙරස්ස කලෙබරං තත්ථ නිපජ්ජාපෙත්වා උක්ඛිපන්තා ඨපිතට්ඨානෙන

චාලෙතුං නා'සක්ඛිංසු' සත-ද්විසත - තිසත-චතුසත පඤ්චසතා'පි මනුස්සා උස්සහන්තා තං උක්ඛිපිතුං නාසක්ඛිංස' අථ තෙ තං පවත්තිං කාකවණ්ණතිස්ස මහාරාජානං ආරොචෙසුං රාජා'පි සෙනංග පරිවාරෙත්වා ආගන්ත්වා වායමං කරොන්තො චාලෙතුං නාසක්ඛි' තතො රාජා භික්ඛුසංඝං උපසංකමිත්වා, කාරණං පුච්ඡි. භික්ඛු ත'මත්ථං ආරොචෙසුං. රාජා උපාසකං පක්කොසාපෙත්වා“කූටාගාරං ගණ්හාහී”ති ආහ. තෙන ගන්ත්වා කූටාගාරකණ්ණෙ හත්ථෙන ඵුට්ඨමත්තෙනයෙව ආකාසං උප්පතිත්වා ආළාහනට්ඨානං අගමාසි'. අථ රාජා ච මනුස්සා ච තං අච්ඡරියං දිස්වා තස්ස මහාසම්පත්තිං අදංසු.

-----------------

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. උපාසක තෙම දියණිය නිවසක රැඳවූයේ කහවණු කීයක් ලබාගෙන ද?
ii. නැවත එන අතරමග දී උපාසක තෙම කළ විශේෂ කටයුත්ත කුමක්ද?
iii. පිණ්ඩපාතය ලද තෙරණුවෝ කළේ කුමක් ද?
iv. තෙරුන් වහන්සේ පිරිනිවි මොහොතේ කුමක් අධිෂ්ඨාන කළ සේක් ද ?
v. මෙම කථා පුවතින් භික්ෂු ජීවිතයට ගතහැකි ආදර්ශ මොනවාද ?

## 8. අඤ්ඤෙසං කතො අනත්ථො අත්තනො උපරි පතිස්සති

අතීතෙ කිර එකො වෙජ්ජො වෙජ්ජකම්මත්ථාය ගාමං විචරිත්වා කිඤ්චි කම්මං අලභිත්වා ඡාතජ්ඣත්තො නික්ඛමිත්වා ගාමද්වාරෙ සම්බහුලෙ කුමාරකෙ කීළන්තෙ දිස්වා ඉමෙ සප්පෙන ඩසාපෙත්වා තිකිච්ඡිත්වා ආහාරං ලභිස්සාමීති' එකස්මිං රුක්ඛබිලෙ සීසං නීහරිත්වා නිපන්නසප්පං දස්සෙත්වා අම්භො කුමාරකා එසො සාලිකපොතකො ගණ්හථ නන්ති ආහ. අථෙ'කො කුමාරකො සප්පං ගීවාය දළ්හං ගහෙත්වා නීහරිත්වා තස්ස සප්පභාවං ඤත්වා විරවන්තො අවිදූරෙ ඨිතස්ස වෙජ්ජස්ස මත්ථකෙ ඛිපි. සප්පො වෙජ්ජස්ස ඛන්ධට්ඨිකං පරික්ඛිපිත්වා දළ්හං ඩසිත්වා තත්ථෙව ජීවිතක්ඛයං පාපෙසි. එසො පන වෙජ්ජො අපරභාගෙ කොකො නාම සුනඛලුද්දකො අහොසි. සො කිර එකදිවසං පුබ්බණ්හසමයෙ ධනුං ආදාය සුනඛපරිවුතො අරඤ්ඤං ගච්ඡන්තො අන්තරාමග්ගෙ එකං පිණ්ඩාය පවිසන්තං භික්ඛුං දිස්වා කුජ්ඣිත්වා කාලකණ්ණී මෙ දිට්ඨො. අජ්ජ කිංචි නලභිස්සාමීති චින්තෙන්තො පක්කාමි. ථෙරොපි ගාමෙ පිණ්ඩාය චරිත්වා, කතභත්තකිච්චො පුන විහාරං පාවිසි' ඉතරොපි අරඤ්ඤං චරිත්වා කිඤ්චි අලභිත්වා පච්චා ගච්ඡන්තො පුන ථෙරං දිස්වා අජ්ජාහං ඉමං කාලකණ්ණිං දිස්වා අරඤ්ඤං ගතො කිඤ්චි න ලභිං ඉදානි මෙ පුනපි අභිමුඛො ජාතො සුනඛෙහි තං ඛාදාපෙස්සාමීති, සඤ්ඤං දත්වා සුනඛෙ විස්සජ්ජෙසි' ථෙරොපි එවං මා කරි උපාසකොති යාචි අජ්ජාහං තව සම්මුඛීභූතත්තා කිංචි නාලත්ථං' පුනපි මෙ සම්මුඛීභාව මාගතොසි ඛාදාපෙස්සාමෙ'ව ත'න්ති වත්වා සුනඛෙ උය්‍යොජෙසි එව.

ථෙරො වෙගෙන එකං රුක්ඛං ආරුහිත්වා පුරිසප්පමාණෙ ඨානෙ නිසීදි සුනඛා රුක්ඛං පරිවාරිංස'කො ගන්ත්වා රුක්ඛං අභිරුහිත්වාපි තෙ මොක්ඛො නත්ථීති තං සරතුණ්ඩෙන පාදතලෙ විජ්ඣි. ථෙරො මා එවං කරොහීති යාචියෙව. ඉතරො තස්ස යාචනං අනාදියිත්වා පුනප්පුනං විජ්ඣියෙව. ථෙරො එකස්මිං පාදතලෙ විජ්ඣියමානෙ තං උක්ඛිප්පිත්වා දුතියං පාදං ඔලම්බෙති' තස්මිං විජ්ඣියමානෙ, තම්පි උක්ඛිපති එවමස්ස සො යාචනං අනාදියිත්වා ද්වෙපි පාදතලානි විජ්ඣියෙව ථෙරස්ස සරීරං උක්කාහි ආදිත්තං අහොසි සො පාරුතං චීවරං භස්සන්තම්පි න සල්ලක්ඛෙසි තං පතමානං කොකං සීසතො පට්ඨාය පරික්ඛිපන්තමෙව පති. සුනඛා ථෙරොපි පතිතොති සඤ්ඤාය චීවරන්තරං පවිසිත්වා අත්තනො සාමිකං ලුඤ්චිත්වා ඛාදන්තා අට්ඨිමත්තාවසෙසං කරිංසු' අථ තෙසං ථෙරො එකං සුක්ඛදණ්ඩකං භඤ්ජිත්වා ඛිපි සුනඛා ථෙරං දිස්වා. සාමිකොව අම්හෙහි ඛාදිතොති අරඤ්ඤං පවිසිංසු.

---------------------

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඇවිදගෙන ගිය වෛද්‍යවරයා ගම්දොරටුවෙහිදී දුටුවේ කුමක් ද ?
ii. කුමාරයා අතට ගත් සර්පයාට කළේ කුමක් ද?
iii. තෙරුන්වහන්සේ දුටු වැද්දාට සිතුනේ මොනවා ද?
iv. තමා වෙත එන සුනඛයන් දුටු තෙරණුවෝ කුමක් කළේ ද?
v. අවසානයේ වැද්දාට වුයේ කුමක්ද ?
vi. මෙම කථාවෙන් ඉගැන්වෙන ජීවිතාදර්ශ 2 ක් ලියන්න.

## 9. මුඛරභාවස්ස දොසො

අතීතෙ කිර බාරාණසියං සාලිත්තකසිප්පෙ නිප්ඵත්තිං පත්තො එකො පීඨසප්පි අහොසි. සො නගරද්වාරෙ එකස්ස වටරුක්ඛස්ස හෙට්ඨා නිසින්නො සක්ඛරං ඛිපිත්වා තස්ස පණ්ණානි ඡින්දන්තො “හත්ථිරූපකං නො දස්සෙහි, අස්සරූපකං නො දස්සෙහී”ති. ගාමදාරකෙහි වුච්චමානො ඉච්ඡිතිච්ඡිතානි රූපානි දස්සෙත්වා තෙසං සන්තිකා ඛාදනීයාදීනි ලභති.

අථෙකදිවසං රාජා උය්‍යානං ගච්ඡන්තො තං පදෙසං පාපුණි. බාලා පීඨසප්පිං පාරොහන්තරෙ කත්වා පලායිංසු. රඤ්ඤො ඨිතමජ්ඣන්හිකෙ රුක්ඛමූලං පවිට්ඨස්ස ඡිද්දච්ඡායං සරීරං ඵරි. සො කින්නුඛො එතන්ති උද්ධං ඔලොකෙන්තො රුක්ඛස්ස පණ්ණෙසු හත්ථිරූපානි දිස්වා කස්සෙතං කම්මන්ති පුච්ඡිත්වා විචාරා පීඨසප්පිනොති සුත්වා තං පක්කොසෙත්වා ආහ. මය්හං පුරොහිතො අති මුඛරො. අප්පමත්තකෙපි වුත්තෙ බහුං භණන්තො මං උපද්දවෙති. සක්ඛිස්සසි තස්ස මුඛෙ නාලිමත්තා අජලණ්ඩිකා ඛිපිතුන්ති ? සක්ඛිස්සාමි. දෙව අජලණ්ඩිකා ආහරාපෙත්වා පුරොහිතෙන සද්ධිං තුම්හෙ අන්තොසාණියං නිසීදථ. අහමෙත්ථ කත්තබ්බං ජානිස්සාමී ති.

අථ රාජා තථා කාරෙසි. ඉතරොපි කත්තරියෙන සාණියං ඡිද්දං කත්වා පුරොහිතස්ස රඤ්ඤා සද්ධිං කථෙන්තස්ස මුඛෙ විවටමත්තෙ එකෙකං අජලණ්ඩිකං ඛිපි. පුරොහිතො පි මුඛං පවිට්ඨං පවිට්ඨං ගිලි. පීඨසප්පි ඛීණාසු අජලණ්ඩිකාසු සාණිං චාලෙසි. රාජා තාය සඤ්ඤාය අජලණ්ඩිකානං ඛීණභාවං ඤත්වා ආහ. ආචරිය, අහං තුම්හෙහි සද්ධිං කථෙන්තො කථං නිත්ථරිතුං න සක්ඛිස්සාමි. තුම්හෙහි අතිමුඛරතාය නාළිමත්තා අජලණ්ඩිකා ගිලන්තාපි තුණ්හීභාවං නාපජ්ජථාති. බ්‍රාහ්මණො මඞ්කුභාවං ආපජ්ජිත්වා තතො පට්ඨාය මුඛං විවරිත්වා රඤ්ඤා සද්ධිං සල්ලපිතුං නාසක්ඛි.

රාජා පීඨසප්පි පක්කොසෙත්වා තං නිස්සාය මෙ සුඛං ලද්ධන්ති තුට්ඨෙත්ස්ස සබ්බට්ඨකං නාම ධනං දත්වා නගරස්ස චතුදිසාසු චත්තාරො වරගාමෙ අදාසි.

--------------

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. කොර මිනිසාට තිබූ විශේෂ හැකියාව කුමක් ද?
ii. එම මිනිසාට රජු පැවරූ කාර්යය කුමක් ද?
iii. පුරෝහිතයාගේ තිබූ දුර්වලතාවය කුමක් ද?
iv. කථාවෙන් හැඟවෙන සාහිත්‍ය රසය කුමක් ද?
v. මෙම කථාවේ ඇති ආදර්ශය කුමක්ද ?

## 10. පණ්ඩිතඅතිපණ්ඩිතවාණිජ

අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො බාරාණසියං වාණිජ කුලෙ නිබ්බත්ති. නාමගගහණදිවසෙචස්ස පණ්ඩිතොති නාමමකංසු. සො පණ්ඩිතො වයප්පත්තො අඤ්ඤෙන වාණිජෙන සද්ධිං එකතො හුත්වා වාණිජ්ජං කරොති. තස්ස අතිපණ්ඩිතොති නාමං අහොසි. තෙ බාරාණසිතො පඤ්චහිසකටසතෙහි භණ්ඩං ආදාය ජනපදං ගන්ත්වා වණිජ්ජං කත්වා ලද්ධලාභා පුන බාරාණසිං අගමිංසු. අථ තෙසං භණ්ඩභාජනකාලෙ අතිපණ්ඩිතො ආහ. මයා ද්වෙ කොට්ඨාසා ලද්ධබ්බාති කිං කාරණාති? ත්වං පණ්ඩිතො, අහං අතිපණ්ඩිතො එකං ලද්ධුං අරහති, අතිපණ්ඩිතො ද්වෙති. නනු අම්හාකං ද්වින්නං භණ්ඩමූලම්පි ගොණාදයොපි සමසමායෙව, කස්මා ත්වං ද්වෙ කොට්ඨාසෙ ලද්ධුං අරහසීති, අතිපණ්ඩිතභාවෙනාති, එවං තෙ කථං වඩ්ඪෙත්වා කලහං අකංසු.

තතො අතිපණ්ඩිතො අත්ථෙකො උපායොති චින්තෙත්වා අත්තනො පිතරං එකස්මිං සුසිරරුක්ඛෙ පවෙසිත්වා ත්වං අම්හෙසු ආගතෙසු අතිපණ්ඩිතො ද්වෙකොට්ඨාසෙ ලද්ධුං අරහතීති වදෙය්‍යාසීති, වත්වා බොධිසත්තං උපසංකමිත්වා සම්ම මය්හං කොට්ඨාසානං යුත්තභාවං වා අයුත්තභාවං වා එසා රුක්ඛදෙවතා ජානාති, එහි නං පුච්ඡිස්සාමාති තං තත්ථ නෙත්වා අය්‍යෙ රුක්ඛදෙවතෙ, අම්හාකං අට්ටං පච්ඡින්දාති ආහ. අථස්ස පිතා සරං

පරිවතෙතත්‍වා තෙනහි කථෙථාති ආහ. අයොය අයං පණ්ඩිතො, අහං අතිපණ්ඩිතො. අමෙහහි එකතො වොහාරො කතො. තත්‍ථ කෙන කිං ලදධබබනති. පණ්ඩිතෙන එකො කොටඨාසො අතිපණ්ඩිතෙන දෙව කොටඨාසා ලදධාති. බොධිසතෙතා එවං විනිචඡිතං අටටං සුත්‍වා ඉදානි දෙවතාභාවං වා අදෙවතාභාවං වා ජානිසසාමීති පලාලං ආහරිත්‍වා සුසිරං පූරෙත්‍වා අගගිං අදාසි. අතිපණ්ඩිතසස පිතා ජාලාය ඵුටඨකාලෙ අඩඪජඣො, මෙන සරීරෙන උපරි ආරුයහ. සාඛං ගහෙත්‍වා ඔලමබනෙතා භූමියං පතිත්‍වා ඉමං ගාථමාහ.

සාධුඛො පණ්ඩිතො නාම නත්‍වෙව අතිපණ්ඩිතො,

-----------------------

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මෙහි ඇති වෙළෙඳුන් දෙදෙනාගේ නම් මොනවා ද?
ii. වෙළෙඳුන් දෙදෙනා අතර කලහය ඇති වූයේ කුමක් සඳහා ද?
iii. ලද ලාභ බෙදාගැනීමේ තීන්දුව ලබා ගැනීමට කුට උපාය කුමක් ද?
iv. ගස්බෙනයේ සිටියේ කවුරුද ?
v. මෙම කථාවෙන් දෙන්නා වූ ආදර්ශ මොනවා ද?

## පාලි පාඨාවලිය

අර්ථ

### 01 මචඡරියබ්‍රාහමණො - මසුරු බමුණා

සැවැත් නුවර අදින්නපුබ්බක නම් බමුණෙක් විය. ඔහු විසින් කිසිවක් කිසිවෙකුට නොදුන්විරුය. ඔහුට, එකම පුතෙක් විය. ප්‍රියය මනාපය බමුණා පුතුට. පළඳනාවක් දෙනු කැමැත්තේ ඉදින් රන්කරුවෙකුට කියන්නෙමි නම්, වේතනයක් (වැටුපක්) දීමට වන්නේ යැයි තෙමේම රන් තළා ඔපදමන ලද කුණ්ඩලාභරණ කර දුන්නේය. එනිසා ඔහුගේ පුතු මට්ටකුණ්ඩලී යැ’ යි ප්‍රකට වූයේ ය. ඔහුට සොළොස් වස් කාලයෙහි පාණ්ඩු රෝගයක් උපන්නේ ය ‘බමුණා වෙදුන් සමීපයට ගොස් නුඹලා අසවල් රෝගයට කුමන බෙහෙතක් කරහු දැයි විචාළේය. ඔවුහු මොහුට යම් ඒ, ගස්පොතු ආදිය ප්‍රකාශ කළහ. ඔහු ඒවා ගෙනවිත් බෙහෙතක් කළේය. එසේ කරනු ලබද්දීම ඔහුගේ රෝගය බලවත් වූයේ ය. බමුණා ඔහුගේ දුබල බව දැන එක් වෙදෙකු කැඳවී ය. ඔහු එය බලා අපට එක් කටයුත්තක් ඇත. අන් වෙදෙකු කැඳවා ප්‍රතිකාර කරවයි කියා නික්මුණේ ය. බමුණා ඔහුගේ මරණාසන්න බව දැන මොහුගේ දැකීම පිණිස එන යන්නෝ ඇතුල් ගෙහි වස්තුව දකින්නාහ. එනිසා ඔහු බැහැර කරන්නෙමි’ යි පුතු බැහැර කොට පිට ආලින්දයෙහි හොවාපීය. ඔහු කළුරිය කළ කල්හි බමුණා ඔහුගේ ශරීරය දවා දිනකට දෙවරක් සොහොනට ගොස් මාගේ එකම පුතු කොහිද? එකම පුතු කොහිදැයි හැඬුවේ ය.

## 2. අකාරුණිකො වෙජ්ජො - අකාරුණික වෙදාණෝ

අතීතයෙහි (පෙර) එක් වෛද්‍යවරයෙක් ගම්නියම්ගම්හි හැසිර වෙදකම් කරනුයේ එක් ඇස් දුර්වල ස්ත්‍රියක දැක ඔබේ අපහසුව කුමක් දැයි විචාළේ ය. ඇසින් නොදකිම් යනුවෙනි නුඹට බෙහෙත් කරමියි (කීය) කරන්න ස්වාමීනි යි කීවාය. මට කුමක් දෙන්නෙහි දැයි (ඇසීය). ඉදින් මාගේ ඇස් ප්‍රකෘතිමත් කිරීමට හැකි වන්නේ නම්, මම නුඹට දූ දරුවන් සමග දාසි වෙමියි (කීවාය) ඔහු බෙහෙත් කළේ ය. එක් බෙහෙතින්ම ඇස් ප්‍රකෘතිමත් විය. ඇය සිතුවාය. මම මොහුට දූදරුවන් සමග දාසී වන්නෙමියි පොරොන්දු වීමි. ඔහු රවටන්නෙමි'යි ඇය සොඳුරිය කෙසේ දැයි විචාරණ ලද්දදී පෙර මාගේ ඇස් තරමක් රිදුනි' දැන් වැඩිමනත් රිදේ යැයි කීවා ය. වෛද්‍යවරයා මැය මා වඤ්චාකර කිසිත් නොදෙනු කැමැත්තීය. මැ විසින් දුන් වැටුපෙන් පලක් නැත. දැන්ම ඇය අඳ කරමියි සිතා ගෙදරට ගොස් බිරිඳට කීය. ඇය නිහඬ වූවාය ඔහු එක් බෙහෙතක් යොදා ඇය වෙතට ගොස් කල්‍යාණිය මේ බෙහෙත ගාන්නැයි ගෑවීය. ඇගේ දෑස පහන් සිලක් සේ ක්‍ෂය වී ගියේය.

---------------------------------------

## 3. බුද්ධුපට්ඨාකා දෙව තිරච්ඡානා - බුද්ධෝපස්ථායක තිරිසනුන් දෙදෙනා

එක් සමයෙක්හි ශාස්තෘන් වහන්සේ සමූහයා අතහැර තනිවම එක් වනයකට පිවිසියහ. පාරිලෙය්‍යක නම් එක් ඇත් රජෙක් ද ඇත් සමූහයා අතහැර ඒ වනයට පැමිණ භාග්‍යවතුන් වහන්සේ එක් ගස් මුලක හිඳිනු දැක පයෙන් පහර දෙමින් ගසමුල පිරිසිදු කර සොඬින් අත්තක් ගෙන ඇමදීය. එතැන් පටන් දිනපතා සොඬින් කළය ගෙන බොන-පරිභෝජනය කරන දිය ගෙනෙයි. උණුදියෙන් ප්‍රයෝජන ඇති කල්හි උණු දිය සකසා දෙයි. කෙසේද? දර එකට ගටා ගිනි උපදවයි එහි දර දමමින් දල්වා ඒ ඒ තන්හි ගල් රත්කර දරකඩකින් පෙරලා කුඩා ගල් පොකුණක දමයි. ඉන්පසු සොඬය දමා වතුර රත්වූ බව දැන ගොස් ශාස්තෘන්වහන්සේට වඳියි. ශාස්තෘන්වහන්සේ එහි ගොස් ස්නානය කරති. ඉන්පසු නොයෙක් ඵල ගෙනවිත් දෙයි. යම් දිනක ශාස්තෘන් වහන්සේ ගමට පිඬු පිණිස පිවිසෙත් ද එකල්හි ශාස්තෘන් වහන්සේගේ පා සිවුරු ගෙන කුම්භස්තලයෙහි තබාගෙන ශාස්තෘන් වහන්සේ සමග ම යයි. රාත්‍රියෙහි සිංහ ව්‍යාඝ්‍රාදීන් වළකනු පිණිස, මහත් දණ්ඩක් සොඬින් ගෙන එළිය වැටෙන තෙක් වන ලැහැබෙහි හැසිරෙයි.

ඉක්බිති එක් වඳුරෙක් දිනපතා ඇතා තථාගතයන් වහන්සේට උවටැන් කරනු දැක මම ද කිසියම් දෙයක් කරමියි හැසිරෙන්නේ එක් දිනෙක මැස්සන් නැති දඬුවැල් බෑ මීවදයක් දැක දණ්ඩක් බිඳ දණ්ඩ සමගම මීවදය ශාස්තෘන් සමීපයට ගෙනවුත් කෙසෙල් කොළයක් කඩා එහි තබා දුන්නේය. ශාස්තෘන් වහන්සේ ගත්හ. වඳුරා පරිභෝග කරන්නේ ද නොකරන්නේ දැයි බලන්නේ, ගෙන වැඩ හිඳිනු දැක කුමක් නිසාදැයි සිතා දණ්ඩ කෙළවරින් ගෙන කරකවා බලන්නේ බිජු දැක උන් වහාම ඉවත්කර දුන්නේය. ශාස්තෘන් වහන්සේ පරිභෝග කළහ. ඔහු සතුටු සිත් ඇත්තේ ඒ ඒ අතු ගෙන, නටමින්, සිටියේය. ඌ අල්ලාගත් අත්ත ද පය තැබූ අත්ත ද බිඳුනේය. ඔහු එක් කණුවක් මතට වැටී සිදුරු වූ සිරුර ඇත්තේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි ප්‍රසන්න වූ සිතින් කලුරිය කර තව්තිසා භවනයෙහි උපන්නේය.

-------------------

## 4. උජුජාතිකො සුනඛො - ඍජු ජාතික බල්ලා

පෙර දඹදිව අජිත රටෙහි එක්තරා ගොපල්ලෙක් විසීය. ඔහුගේ නිවසෙහි එක් පසේබුදුවරයෙක් නිතර වළඳති. එම ගෙහි එක් බල්ලෙක් ද විය. පසේබුදුරජු වළඳන්නේ ඌට නිබඳව ම එක් බත් පිඩක් දුන්නේය. ඔහු ඒ පසේ බුදුන් කෙරෙහි සෙනෙහෙ කළේය. ගොපල්ලා දවසට දෙවරක් පසේ බුදුන්ට උවටැන් පිණිස ගියේය. බල්ලා ද ඔහු සමග ගියේ ය. ගොපල්ලා එක් දිනෙක පසේ බුදුරදුන්ට කීය. ස්වාමිනි යම් දිනෙක මට ඉඩක් නොවන්නේද, එදින මෙම බල්ලා එවන්නෙමි. එම සංඥාවෙන් එනුමැනවි යනුවෙනි. එතැන් පටන්, ඉඩ නැති දිනයෙහි බල්ලා යැවීය. ඔහු එක වචනයෙන්ම පැන පසේ බුදුරදුන් වසන ස්ථානයට ගොස් තුන්වරක් බුරා තමන් පැමිණි බව දන්වා එකත්පසෙක හොත්තේය. පසේබුදුරදුන් වේලාව සලකා නික්මුණු කල්හි බුරමින් ඉදිරියෙන් ගියේය. පසේබුදුරජ ඌ විමසන්නේ එක් දවසක් අන් මගකට පිළිපන්නේය. ඉක්බිති බල්ලා ඉදිරියෙන් හරස්ව සිට බුරා නියමිත මගටම උන්වහන්සේ යොමු කළේය.

ඉක්බිති එක් දවසක් අන් මගකට පිවිස, සුනඛයා විසින් හරස්ව සිට වළක්වන්නේ නොනැවතී ඌ පයින් ඉවත් කොට ගියේය. බල්ලා උන්වහන්සේ නොනවතින බව දැන අඳනය සපා අදින්නේ යායුතු මගටම පැමිණවීය. මෙසේ ඒ සුනඛයා ඒ පසේබුදුරදුන් කෙරෙහි බලවත් ස්නේහයක් ඉපදවීය.

පසුකලෙක පසේ බුදුරදුන්ගේ සිවුර දිරුවේය. ඉක්බිති ගොපල්ලා මුන්වහන්සේට සිවුරු රෙදි දුන්නේය, පසේබුදුන් වහන්සේ පහසු තැනකට ගොස් සිවුරක් කරන්නෙමියි ගොපල්ලාට කීය. ඔහු ද ස්වාමීනි බොහෝ කලක් පිටත නොවසන්නැයි කීය. බල්ලා ද ඔවුන්ගේ කථාව අසමින් සිටියේය. පසේබුදුන් වහන්සේ අහසට නැගී යන්නේ (දැක) බුරමින් සිටි ඒ සුනඛයාගේ හද පැලුනේය. තිරිසන් ගතිකයෝ බඳු ඍජු ගති ඇත්තෝ වෙති. වංක නො වෙති. මිනිස්සු වනාහි අනෙකක් සිතති. අනෙකක් කියති.

-------------------

## 5. කතඤ්ඤු සිගාලො - කළගුණ දත් නරියා

සිංහල දීපයෙහි වනාහි දණ්ඩගෝණ ගමෙහි එක් නරියෙක් ඒ ඒ තැන ගොදුරු සොයන්නේ, එක් ඉත්තෑවෙකු දැක අල්ලා ගැනීමට දිව්වේය. ඒ මොහොතෙහි ඉත්තෑවා කුරු විද්දේය. එයින් එක් කුරක් හිවලාගේ ඇසක් තුවාළ කළේය, එයින් ඔහු කණ සිවලායයි ප්‍රකට වූයේය, පසු කලෙක ගොදුරු පිණිස එහි මෙහි හැසිරෙන්නේ පිඹුරෙකු වෙලා ගත්තේය. ඉක්බිති එක් ගෙපල්ලකු පිඹුරා විසින් පෙළනු ලබනු ඌ දැක ඌ කෙරෙහි කරුණාවෙන් පිඹුරා සමග වැයම් කර ඌ නිදහස් කළේය. පිඹුරා නරියා අතහැර ගොපල්ලා අල්ලා ගත්තේය. සිවලා එය දැක මා විසින් කළගුණ සැළකිය යුතු වන්නේයැයි සිතනුයේ පිඹුරාගේ ශරීරය ඒ ඒ තැන සපන්නේ ශබ්ද කරනුයේ ද ඌ මුදාලිය නොහැකි වන්නේ අසල කෙතෙහි සී සාන මිනිසුන් දැක වේගයෙන් එහි ගොස්, ශබ්ද නගා එහි තබන ලද එක් වස්ත්‍රයක් ඩැහැ ගෙන දිව්වේය. මනුෂ්‍යයෝ ශබ්ද නගන්නෝ වස්ත්‍රය හෙළා ගන්නට නොහැකිව ගල්කැට දඬු ආදී අතැතිව ඌ ලුහුබැන්දාහ. සිවලා පිඹුරා සමීපයෙහි වස්ත්‍රය තබා පසෙකට වී සිටියේය, මිනිස්සු පිඹුරා ද ගොපල්ලා ද දැක පිඹුරා මරා, ගොපල්ලා නිදහස් කරවූහ.

මෙසේ තිරිසන් ගතිකයෝ වුව ද තමාට කළ උපකාරය සලකා ප්‍රති උපකාර කරති. කාරණ කාරණා (හොඳ නරක) දන්නා වූ මිනිසුන් විසින් ඒකාන්තයෙන් පෙරළා උපකාර කළ යුතු ම වන්නේය. ඉදින් එසේ වුවත් ඇතැම් මිනිස් අධමයෝ තමන්ට උපකාර කළ හිතවත් සත්පුරුෂයන්ට අනර්ථයක්ම කරති. ඒ අසත්පුරුෂයෝ වනාහි තිරිසන් ගතිකයනට ද වඩා ගුණ හීනයෝ'යි දත යුතුය.

-------------------

**6. කතවෙදීසුනඛො - කෘතවේදී සුනඛයා**

දඹදිව චන්දභාග නම් ගංතෙර හෝම නම් ගමක් ඇත. එහි එක් මරුත නම් බමුණෙක් වාසය කරයි. එදින ඔහු වෙළඳාම පිණිස තක්සිලාවට ගොස් ගෙට එනුයේ අතරමග එක් ශාලාවක කුෂ්ඨරෝගී සුනඛයකු දැක උෟ කෙරෙහි කරුණාවෙන් තිල්වැලක් මෝරුවලින් දියකර පෙව්වේය. සුනඛයා සුවපත්වූ රෝග ඇත්තේ ප්‍රකෘතියෙන් යුත් අයෙකු වී බමුණා විසින් තමන්ට කළ උපකාරය සලකන්නේ ඔහු ම සමග ගියේය. පසුකලෙක බමුණාගේ බිරිඳ ගැබ් ගත්තීය. පිරිපුන් ගැබ් ඇත්තී ඇය වදන කාලයේ දරුවා හරස් වී ඇතුළු ගැබෙහිදීම මළේය. එකල්හි එය සැතකින් කැල්ලෙන් කැල්ල සිඳ එලියට ගත්හ. ඉක්බිති බමුණා එය දැක කලකිරුණු හදින් ගිහිගෙය අතහැර සෘෂි ප්‍රවෘජ්‍යාවෙන් පැවිදිව කැලයෙහි වාසය කරයි. ඉක්බිති මොහුගේ බිරිඳ අනෙකෙකු සමග සංවාසය කරන්නීය. මොහු මා අතහැර පැවිදි වූයේයැ'යි, බමුණා කෙරෙහි දූෂිත සිතැත්තී බොල බමුණා මරන්නැ'යි සැමියා සමග මන්ත්‍රණය කළේය. ඔවුන්ගේ මන්ත්‍රණය බල්ලා අසා බමුණා සමගම හැසිරෙයි. ඉක්බිති එක් දවසක් ඇගේ සැමියා තවුසා මරන්නෙමි'යි දුනු හියවුරු ගෙන නික්මුණේය. එකල්හි තාපසයා පලවැළ පිණිස කැලයට ගියේ ය. බල්ලා අසපුවෙහිම නැවතුනේය. පුරුෂයා තවුසාගේ එන ගමන්මග බලන්නේ ගස් අතර සැඟවී සිටියේය. බල්ලා ඔහුගේ ප්‍රමාදයක් බලා දුනුදිය කා සින්දේය. නැවත ඔහු දුනුදිය ප්‍රකෘතිමත් කොට නැංවීය. මෙසේ ඔහු නැගූ නැගූ දුනුදිය කාදමයි. ඉක්බිති ඒ පාපී පුරුෂයා තවුසා එනු දැන ඔහු මරන්නෙමැ'යි දුනු සමඟ ගියේය. ඉක්බිති බල්ලා ඔහුගේ පාදය සපා බිම දමා, ඔහුගේ මුහුණ සපා දුර්වල කර බිරුවාය ලදී. මෙසේ වනාහි සත්පුරුෂයෝ, තමන්ට උපකාර කළවුන්ට පෙරළා උපකාර කරති. මෙසේ ද කියන ලදී.

උපකාර සිහි කරන්නා වූ කෘතවේදී සුනඛයා' සතුරා ඝාතනය කොට සෘෂිවරයාට ජීවිතය දුන්නේය,

තමා කෙරෙහි කළ ගුණ තිරිසන්නු ද සැමදා දනිති. මෙසේය දැන නුවණැති සත්වයෝ කෘතඥ වෙති.

-------------------

## 7. නකුල උපාසකස්ස වත්ථු - නකුල උපාසකගේ කථාව

ලක්දිව කාවන්තිස්ස මහ රජු රාජ්‍යය කරවන කල්හි රුහුණු දනව්වෙහි එක් ගමෙක නකුල නමින් උපාසකයෙක් විසීය. ඔහු දුප්පත් වූයේ දුක් කරදරයෙන් අඹුදරුවන් පෝෂණය කළේය. ඔහු තම දියණිය මාගම එක් කැලයක තබා කහවනු දොළහක් පමණ ණයක් ගත්තේය'. පසු කලෙක දුව මුදවනු කැමැත්තේ උත්සාහ යෙන් දුකින් කහවණු දොළහක් උපයා එය රැගෙන මාගමට යන්නේ අතරමග සකටභින්න ඛණ්ඩ නම් ස්ථානයකට පැමිණියේය.

ඔහු එහි තිස්සමහවෙහෙර වැසි චුල්ලපිණ්ඩපාතික තෙරුන් දුටුවේය. දැක වනාහි මේ පෙරබත් කාලයයැ'යි, අසල ගම් ද නැත. ඉදින් තෙරුන් වහන්සේ සුන් බත් ඇත්තේ වන්නේ මෙය සුදුසු නොවන්නේය. කුමක් නම් කළයුතුදැයි. සිතමින් සිටියේ ය. ඒ මොහොතෙහි එක් පුරුෂයෙක්, බත්මුලක් ගෙන ආවේය. තෙරුන් වෙත පැමිණ පාත්‍රය ගෙන, බත් දමා දුන්නේය. තෙරණුවෝ බතෙහි සිත්කළු බව සලකා එක් ගසක් මුලට පැමිණ පාත්‍රය තබා, විදසුන් වඩා අග්‍ර ඵලය වූ අරහත් බවට පැමිණ ම අනුභව කළහ. ඔහු විහාරයට ගොස් ඒ පුවත, භික්ෂූන්ට දැන්වීය. දන්වාම යම් දිනෙක මා පිරිණිවෙන්නෙම් නම් එදින මා හොත්තා වූ මේ කුළුගෙය අන් අය විසින්, උඩට නොනගීවා. යම් දිනෙක ඒ උපාසක තෙමේ පැමිණ ඔසවයි ද එකල්හි උඩට එසවේවායි පසු සමයේ පිරිනිවෙන සේක් එසේම අදිටන් කොට පිරිනිවියේය.

ඉක්බිති උන්වහන්සේගේ ආදාහන කටයුතු කරන්නෙමුයි මිනිස්සු මහත් පූජා විධි කොට කූටාගාරය සරසා, තෙරුන් වහන්සේගේ මළ සිරුර එහිම හොවා, ඔසවන්නෝ තැබූ තැනින් සොලවන්නට නොහැකි වූහ, ඉක්බිති සියය-දෙසියය-තුන්සියය-හාරසියය-පන්සියය ක් ද, මිනිස්සු ඔසවන්නට නොහැකි වූහ. ඔවුහු ඒ පුවත කාවන්තිස්ස මහ රජුට දැන්වූහ. රජු ද සෙනග පිරිවරා පැමිණ, වෑයම් කරනුයේ සෙලවීමට ද නොහැකි විය, එනිසා රජු භික්ෂු සංඝයා වෙත පැමිණ, කරුණු විචාළේය. භික්ෂූහු එහි අරුත් කීහ. රජු උවැසියා කැඳවා කූටාගාරය ගන්නැයි කීය, ඔහු ගොස් කූටාගාරයේ කොනක් අතින් ස්පර්ශ කළ පමණින් ම අහසට නැඟී ආදාහනස්ථානයට ගියේය. ඉක්බිති රජු ද මිනිස්සු ද ඒ අසිරිය දැක ඔහුට මහා සම්පත් දුන්හ.

--------------------

## 8. අඤ්ඤස්සං කතො අනත්ථො අත්තනො උපරි පතිසසති - අනුන්ට කළ අනර්ථය තමා මතටම වැටෙන්නේය.

අතීතයේ වනාහි එක් වෛද්‍යවරයෙක් වෙදකම් පිණිස ගමෙහි හැසිරෙන්නේ කිසියම් කර්මයක් නොලැබ කුසගින්නේ නික්ම ගම් දොරෙහි බොහෝ කුමාරවරුන් ක්‍රීඩා කරනු දැක මොවුන් සර්පයකු ලවා දෂ්ට කරවා වෙදකම් කර, ආහාර ලබන්නෙමැයි එක් රුක බෙනයක හිස එළියට දමා ගෙන හුන් සර්පයෙකු පෙන්වා එම්බා කුමාරවරුනි මේ මයින පැටියෙකි. අල්ලාගන්න යැයි කීය. ඉක්බිති එක් කුමාරයෙක් සර්පයාගේ ගෙළෙන් දැඩිව අල්වාගෙන පිටතට ගෙන උඟ සර්පයෙකු බව දැන කෑගසන්නේ නුදුරෙහි සිටි වෙදා මතට විසිකළේය. සර්පයා වෙදාගේ ගෙළෙහි වෙලී දැඩිව දෂ්ට කර එහිම ජීවිතක්ෂයට පත් කළේය,

මේ වෛද්‍යවරයා වනාහි පසු කලෙක කෝක නම් සුනඛ වැද්දෙක් විය. ඔහු වනාහි එක් දවසක්, පෙරවරුවෙහි දුන්න ගෙන බල්ලන් පිරිවරනලද්දේ කැලයට යන්නේ අතරමග එක් පිඬුපිණිස පිවිසෙන, භික්ෂුවක් දැක, කිපී මා විසින් කාලකණ්ණියෙක් දක්න ලදී. අද කිසිත් නො ලබන්නෙමි සිතමින් පිටත් විය. තෙරණුවෝ ද ගමෙහි පිඬු පිණිස හැසිරී කරන ලද බත් කිස ඇත්තේ නැවත විහාරයට පිවිසියහ. අනෙකාද කැලයේ හැසිර කිසිවක් නොලැබ, ආපසු එන්නේ නැවත තෙරුන් දැක අද මම මේ කාලකණ්ණියා දැක කැලයට ගියෙමි. කිසිත් නො ලදිමි. දැන් නැවතත් මගේ ඉදිරියෙහි පෙනේ. සුනඛයින් ලවා කවමියි, සංඥා කර බල්ලන් මුදා හළේය. තෙරණුවෝ ද උපාසකය මෙසේ නොකරන්න යයි ඉල්ලුහ. මම අද නුඹ හමුවීම හේතුවෙන් කිසිත් නොලදිමි නැවත ද මා හමුවට ආවෙහිය කවවන්නෙමියි කියා බල්ලන් උසිගැන්වීය,

තෙරුන් වහන්සේ වේගයෙන් එක් ගසකට නැග මිනිසකුගේ පමණ උසින් සිටිසේක. බල්ලෝ ගස වට කළහ. කෝක ගොස් ගසට නැගී ද ඔබට මිදීමක් නැතැයි උන්වහන්සේට හී තුඩින් යටිපතුල් විද්දේය. තෙරණුවෝ එසේ නොකරව යි. ඉල්ලුහ. අනෙකා උන්වහන්සේගේ ඉල්ලීම නොසලකා නැවත නැවතත් විද්දේමය. තෙරුන් වහන්සේ එක් පාදයක විදින කල්හි එය ඔසවා දෙවැනි පය තබති. එය ද විදින කල්හි එය ද ඔසවයි. මෙසේ ඔහු උන්වහන්සේ නොසලකා යටපතුල් දෙකම විද්දෙමය. තෙරුන්ගේ ශරීරය, විලක්කුවලින් දල්වන ලද්දක් විය, පෙරවන ලද සිවුර වැටෙද්දීත් නොසලකීය වැටෙන ඒ සිවුරු කෝක හිස පටන් වටකරමින් වැටුණි. බල්ලෝ තෙරුන් ද වැටුණියැයි හැඟීමෙන් සිවුර තුළට පිවිස තමාගේ ස්වාමියා ඉරා කන්නේ ඇට පමණක් ඉතිරි කළහ. ඉක්බිති උන්ට තෙරුන් වහන්සේ එක් වියලුණු දණ්ඩක් බිඳ විසි කළේය. බල්ලෝ තෙරුන් දැක අප විසින් ස්වාමියා කන ලද්දෙයැයි කැලයට පිවිසියහ.

-------------------

## 9. මුඛරභාවස්ස දොසො - මුකර බවෙහි දොස්

අතීතයෙහි බරණැස ගල් විදීමේ ශිල්පයෙහි කෙළවරට පත් එක් කොරෙකු විසීය. ඔහු නගර දොරෙහි, එක් නුගගසක් යට සිටින්නේ, ගල් කැට විද එහි කොල සිඳිනුයේ අපට ඇත් රූප පෙන්වන්න අපට අශ්ව රූප පෙන්වන්න යැයි ගමෙහි දරුවන් විසින් කියනු ලබන්නේ කැමති කැමති රූප පෙන්නා ඔවුන් වෙතින් කෑම ආදිය ලබයි.

ඉක්බිති එක් දවසක් රජු උයනට යන්නේ ඒ ප්‍රදේශයට පැමිණියේය. ළමයි කොරා නුගමුල් අතරෙහි කොට පලා ගියහ. මධ්‍යාහ්නයේ ගස මුලට පැමිණි රජුගේ ශරීරය පුරා සිදුරු වලින් ආ සෙවණැලි පැතිරිණ. ඔහු මේ කුමක්දැයි උඩ බලනුයේ ගසෙහි කොළවල ඇත් රූ දැක මේ කවරෙකුගේ ක්‍රියාවක් දැයි විචාරා කොරා ගේ යැයි අසා ඔහු කැඳවා කීය. මගේ පුරොහිත මහත් දොඩමලුය. අල්ප මාත්‍රයක් වුව ද කී කල්හි බොහෝ දේ කියමින් මට හිරිහැර කරයි. ඔහුගේ මුවෙහි නැළියක් පමණ එළුබෙටි විදින්නට හැකි ද? දේවයන් වහන්ස හැකිවන්නෙමි එළු බෙටි ගෙන්වා පුරෝහිතයා සමග නුඹලා තිරයෙන් ඇතුළත හිඳිනු මම කළයුත්ත දනිමියි (කීය).

රජු එසේ කරවීය ඉක්බිති අනෙකා (සිටින පැත්තෙහි) කතුරින් තිරයෙහි සිදුරක් කර රජු සමඟ කථා කරන පුරෝහිතයාගේ කට විවර කරන විටම එක එක එළු බෙටි විද්දේය. පුරෝහිතයා ද මුවට පිවිසි පිවිසි එළුබෙටි ගිල්ලේය. කොරා එළුබෙටි අවසන් වූ කල්හි තිරය සෙලවීය. රජු එම සඤ්ඤාවෙන් එළුබෙටි අවසන් බව දැන කීය. ඇදුරාණනි මම නුඹ සමග කථා කරනුයේ කථාව සපුරන්නට නොහැක්කෙමි. නුඹ අතිශය දොඩමළු බැවින් නැළියක් පමණ එළුබෙටි ගිලින්නේ නමුත් නිහඬ බවට නොපැමිණියෙහි යනුවෙනි. බමුණා නිහඬ බවට පැමිණ එතැන් පටන් මුව විවර කර රජු සමග කථා කරන්නට නොහැකි විය.

රජු කොරා කැඳවා නුඹ මවිසින් සැප ලබන ලදැයි සතුටුව ඔහුට සබ්බට්ඨක නම් (සියල්ල අටබැගින් වූ) ධනය දී නගරයෙහි සිවු දෙස සතර ගම්වරයක් දුන්නේය.

## 10. පණ්ඩිත අතිපණ්ඩිත වාණිජා - පණ්ඩිත අතිපණ්ඩිත වෙළෙන්දෝ

අතීතයෙහි බරණැස බඹදත් රජු රජ කරවන කල්හි බොසතාණෝ බරණැස වෙළඳ කුලයේ උපන්හ. නම් තබන දිනයෙහි ඔහුට පණ්ඩිත යැයි නම් තැබූහ. ඒ පණ්ඩිත තෙමේ වැඩෙන්නේ අන් වෙළෙන්දෙකු සමග එකකු වී වෙළඳාම් කරයි. ඔහුට අති පණ්ඩිතයැයි නමක් විය. ඔවුහු බරණැසින් පන්සියයක් කරත්තවල භාණ්ඩ රැගෙන ජනපදයට ගොස් වෙළඳාම් කර ලද ලාබ ඇත්තේ නැවත බරණැසට ආහ. ඉක්බිති ඔවුන් බඩුබෙදන කල්හි අතිපණ්ඩිත මෙසේ කීය. මා විසින් කොටස් දෙකක් ලැබිය යුත්තේය. කුමන කරුණක් නිසා ද? නුඹ පණ්ඩිතය මම අතිපණ්ඩිතය. පණ්ඩිතට එකක් ලැබීමට වටිනේය. අතිපණ්ඩිතට දෙකකි. අප දෙදෙනාගේ භාණ්ඩ මුදල් ද ගොනුන් ආදිය ද සම සම නොවන්නේද. කුමක් නිසා නුඹ කොටස් දෙකක් ලැබීමට සුදුසු වන්නේද? අතිපණ්ඩිත බැවිනැයි මෙසේ ඔවුහු කථාව වර්ධනය වී කලහ කළහ.

ඉක්බිති අතිපණ්ඩිත තෙමේ ඉදින් එක් උපායකැයි සිතා තම පියා එක් ගස්බෙනයකට ඇතුල් කර නුඹ අප පැමිණි කල්හි අතිපණ්ඩිත කොටස් දෙකක් ලැබබීමට සුදුසු යැයි කියන්නෙහි යැයි කියා බෝසතුන් වෙත එළඹ යහලුව මාගේ දෙකොටසේ යුතු හෝ අයුතු බව මෙහි රුක් දේවතාවා දනී. එව අපි ඔහු විචාරනනෙමුයි ඔහු එතනට පමුණුවා උතුම් රුක්දෙවිඳුනි අපගේ කලහය විසදන්නැයි කීය. ඉක්බිති ඔහුගේ පියා හඬ වෙනස් කොට එසේ නම් කියවු යැයි කීය. උතුමාණනි, මේ තෙමේ පණ්ඩිතය මම අතිපණ්ඩිතය අප විසින් එකතුව වෙළඳාම කරන ලදී. එහිදී කවරෙකු විසින් කුමක් ලැබීය යුතු ද යනුවෙනි. පණ්ඩිතයා විසින් එක් කොටසකි. අතිපණ්ඩිතයා විසින් දෙකොටසකියි බෝසතුන් තෙමේ මෙසේ විසඳු ලද නඩුව අසා දැන් දෙවි බව හෝ නොදෙවි බව හෝ දැනගන්නෙමියි පිදුරු ගෙන බෙනය පුරවා ගිනි තැබීය. අතිපණ්ඩිතගේ පියා ගිනි දැල් වැදුණු කල අඩක් දැවුණු සිරුරෙන් උඩට නැගී අත්තක් අල්වාගෙන එල්ලෙමින් බිමට පැන මේ ගාථාව කීවේය .

පණ්ඩිතකම යහපත්ය. අතිපණ්ඩිත කම එසේ නො වේ.

# සත්තරසමො පාඨො

# මහාවංසය

## පාලි වංස කථා

'වංස' යනු උණ ගසට නමකි. පුරුකෙන් පුරුක සම්බන්ධවී ඇති නිසා එම නම භාවිත කරන බව දැක්වේ. පසුව කුලය, පරම්පරාව දැක්වීම සඳහා ද යොදා ඇත. ඉතිහාස කෘති වංසකථා ලෙස හඳුන්වනුයේ ජාතියක හෝ යම් වස්තුවක අඛණ්ඩ සම්බන්ධතාව දක්වන නිසා ය.

පාලි වංසකථාවන්හි ආරම්භක කෘතිය ලෙස සැලකෙනුයේ **බුද්ධවංසයයි.** එය ත්‍රිපිටකයේ ඛුද්දක නිකායට අයත් 14වන කෘතියයි. '**අනාගතවංස** ' නම් පාලි වංසකථාව පශ්චාත් පේටක කෘතියක් වශයෙන් සැලකේ. ගාථා 142කින් යුතු මෙහි මෛත්‍රී බුදුරදුන්ගේ පහළවීම පිළිබඳ තොරතුරු දක්වේ. **දීපවංසය** අටුවා යුගයට පෙර ලියනලද වංසකථාවකි. ලංකා රාජ්‍යය හා සාසනික ඉතිහාසය මෙහි ඇතුළත් ය. කර්තෘවරයා පිළිබඳ තොරතුරු සඳහන් නොවන දීපවංසයේ ගාථා 1350 කි. මහසෙන් රාජ්‍ය සමය දක්වා තොරතුරු ඇතුළත්ය. මහාප්‍රජාපතී ගෝතමියගේ සිට මහසෙන් රාජ්‍යය දක්වා භික්ෂුණී පරම්පරාව පිළිබඳව ද දීපවංසයේ තොරතුරු ඇතුළත් වෙයි. **දීපවංසයේ ද්විතීයභාගය** ගාථා 2805කින් යුක්ත කොට ක්‍රි.ව. 1839 දී **අහුන්ගල්ලේ විමලකිත්ති තිස්ස** නාහිමියන් විසින් සම්පාදනය කර ඇත.

පාලි වංසකථා අතර **බෝධිවංසය** නම් කෘතිය වැදගත් වන්නේ ගද්‍ය කාව්‍යයක ස්වරූපයෙන් ලියන ලද එකම පාලි ග්‍රන්ථය වන නිසා ය. පරිච්ඡේද 12කින් යුක්ත බෝධිවංසය **දාඨානාග** තෙරුන්ගේ ආරාධනයෙන් **උපතිස්ස** නම් තෙර කෙනෙකුන් විසින් විරචිත ය. ජය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාවේ ඉතිහාසය ඇතුළත් මෙහි බුද්ධත්වය, ලංකා ගමනය, සංගායනා ආදී තොරතුරු ද ඇතුළත් ය. සංස්කෘත ගද්‍ය කාව්‍යයන්හි ආභාසය ලැබ රචිත වූ කෘතියක් සේ පෙනෙයි.

පාලි **ථූපවංසය** නම් කෘතිය **මහින්දසේන** පිරිවෙන්වාසී තෙර කෙනෙකුන්ගේ ආරාධනයෙන් පොළොන්නරු යුගයේ විසූ **වාචිස්සර** පිළිබඳව මෙන්ම මහා ස්වාමීන් විසින් රචනා කරන ලදී. රුවන්වැලි සෑය පිළිබඳ ඉතිහාසය දැක්වීම අරමුණු කොට රචනා කරන ලද මෙහි බුද්ධ චරිතය, අශෝක රජුගේ 84000ක් වෙහෙර විහාර ද ථූපාරාමය ඉදිකිරීම, ගැමුණු කුමරු හා දසමහා යෝධයන් පිළිබඳ තොරතුරු ද ඇතුළත් වෙයි. ගද්‍ය පද්‍ය මිශ්‍ර කෘතියකි.

**දාඨාවංසය** බුදුරදුන්ගේ වම් දළදා වහන්සේ පිළිබඳ ඓතිහාසික වෘත්තාන්තය

අප වෙත ගෙන එන කෘතියයි. ලීලාවතී රැජිනගේ කාලයේ විසූ පරාක්‍රම සෙන්පතියාගේ ආරාධනයෙන් ශාරිපුත්‍ර සංඝරාජයන්ගේ ශිෂ්‍ය **රාජගුරු ධර්මකීර්ති** මාහිමියන් විසින් රචිත මෙහි ඇතුළත් සංඛ්‍යාව පහකි. ගාථා 415කි. බුද්ධචරිතය, පරිනිර්වාණය, ධාතු බෙදීම, දළදා වහන්සේට පැමිණි උපද්‍රව හා ප්‍රාතිහාර්ය ලක්දිවට දළදා වහන්සේ වැඩමවීම පිළිබඳ පුවත් පද්‍යයෙන් දක්වා ඇති උසස් කාව්‍ය ලක්ෂණ සහිත පාලි කෘතියකි.

**ඡකෙසධාතුවංසය** කර්තෘ අවිනිශ්චිත කුඩා පාලි ගද්‍ය කෘතියකි. අනුරුද්ධ සෝභිත ආදී තෙරවරු හයනමක් කේසධාතුන් හයනමක් ලබාගෙන අනුග්‍රාහකයින් හය දෙනෙකුගේ උත්සාහයෙන් ස්ථාන හයක චෛත්‍ය හයක් තැනූව පුවතක් මෙහි විස්තර වෙයි. දුටුගැමුණු රාජ සමයෙහි ලියන ලදැයි සැලකෙන **ලලාටධාතුවංසය** බුදුරදුන්ගේ ලලාට ධාතුව පිළිබඳ ඓතිහාසික පුවත ඇතුළත් කෘතියයි. රෝහණ ප්‍රදේශයේ ඓතිහාසික තොරතුරු රාශියක් මෙහි ඇතුළත් වෙයි.

අනෝමදර්ශි සංඝරාජයන්ගේ ආරාධනයෙන් කිසියම් තෙර කෙනෙකුන් විසින් රචිත **හත්ථවනගලලවිහාරවංස** නම් කෘතිය පාලි චම්පු කාව්‍යයකි. සිරිසංඝබෝධි රජුගේ චරිතය අන්තර්ගත මෙය සංස්කෘත සාහිත්‍යයෙහි ආභාසය ලැබ රචනා කරන ලද කාව්‍ය ග්‍රන්ථයකි. මෙම ඓතිහාසික වංසකථාවලට අමතරව පාලි වංසකථා සාහිත්‍යයේ නූතන තෙරවරුන් විසින් රචිත කෘති කීපයක් ද වෙයි. ඒ අතර වැලිතර අම්බරුක්ඛාරාමාධිපති **අරියවංසාලංකාර විමලතිස්ස** නාහිමියන්ගේ ගාථා 1660න් යුතු **සාසනවංසදීප** නම් කාව්‍යයත් **විදුරුපොල** පියතිස්ස නාහිමිගේ පරිච්ඡෙද 4කින් යුතු **අභිනවසාසනවංස** නම් කාව්‍යයත් වැදගත්වේ. පාලි ගද්‍ය පද්‍ය භාෂාවේ ස්වරූපය දැන ගැනීමටත් බොහෝ නිලීන ඓතිහාසික පුවත් දැන ගැනීමටත් වෙනත් ඓතිහාසික තොරතුරු තහවුරු කර ගැනීමටත් පාලි වංසකථා මහෝපකාරී වෙයි.

## මහාවංසය

### ග්‍රන්ථ නාමය

ගුණයෙන් මහත් වූ සම්බුද්ධ, පච්චේකබුද්ධ, ශ්‍රාවක සංඝයාගේ පරම්පරාව හෝ මහාසම්මතාදී රජදරුවන්ගේ පරම්පරාව මහාවංස නම් වේ. සිංහල ජාතියේ උදාරත්වය පෙන්වන ඉතිහාසය දක්වෙන ග්‍රන්ථය ද මහාවංශය නම් වේ.

### ග්‍රන්ථ කරණයේ අරමුණු

**පොරාණෙහි කතො පෙසො - අතිවිත්ථාරතො ක්වචි,**
**අතීව ක්වචි සංඛිත්තො - අනෙකපුනරුත්තතො,**

**වජ්ජිතං තෙහි දොසෙහි - සුඛග්ගහණධාරණං,**
**පසාදසංවෙගකරං - සුතිතොච උපාගතං,**

| | | |
|---|---|---|
| **පසාදජනකෙ ඨානෙ** | - | **තථා සංවෙගකාරකෙ,** |
| **ජනයන්තා පසාදඤ්ච** | - | **සංවෙගඤ්ච සුණාථ මෙ.** |

යන ආරම්භක ගාථාවලට අනුව මහාවංසය පැරණි ඉතිහාස ග්‍රන්ථ අතුරෙන් ඇතැම් ඒවා විස්තර වැඩි වූ බැවිනුත්, ඇතැම් ඒවා සංක්ෂිප්ත බැවිනුත්, පුනරුක්ත බහුල බැවිනුත් ඒවා මගහැරීම, සිංහලයාගේ අවිච්ඡින්න ඉතිහාසය දැක්වීම, ශ්‍රොතෘජන පහන් සංවේගය ඉපදවීම, ජනප්‍රවාදයන්හි පැවති ඉතිහාස ප්‍රවෘත්ති ලියා තැබීම සඳහා යනාදී අරමුණු ඇතිව රචනා කර ඇත.

### මූලාශ්‍රය

මහාවංසයට ප්‍රධාන වශයෙන් මූලාශ්‍රය වූයේ **සීහලට්ඨකථා මහාවංසය** හා **උත්තර විහාරට්ඨකථා මහාවංසයයි.** මීට අමතරව දීපවංසය මූලාශ්‍රය වූ බව ඕල්ඩන්බර්ග් මහතා පිළිගනී. ඉතිහාස පුවත් ඇතුළත් ලියවිලි හා ජනප්‍රවාද ද මූලාශ්‍රය වූ බව පෙනී යයි.

### කතුවරයා හා කාලය

මහාවංසය කොටස් කීපයකින් යුක්ත ය. ඒ ඒ කොටස්වල කතුවරු හා ඒ ඒ කතුවරුන් සම්පාදිත කොටස් පහත සඳහන් පරිදි වේ.

ආරම්භයේ සිට 37 පරිච්ඡේදයේ 52 ගාථාව දක්වා කොටස දික්සඳ සෙනවියා පිරිවෙන් වැසි **මහානාම** හිමියන් විසින් සම්පාදිතය.

37 පරිච්ඡේදයේ සිට 79 පරිච්ඡේදය දක්වා මහපරාක්‍රමබාහු රාජ්‍ය කාලයෙන් අවසන් වන කොටස පොළොන්නරු යුගයේ විසූ **ධර්මකීර්ති** මාහිමියන් විසින් සම්පාදිත ය.

80 පරිච්ඡේදයේ සිට iv පැරකුම්බා රජු දක්වා රාජ්‍ය ඉතිහාසය ඇතුළත් කොටස කිසියම් තෙරනමක විසින් සම්පාදිතය.

iv පැරකුම්බා සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රාජ්‍ය කාලය දක්වා මහනුවර යුගයේ වැඩ විසූ **තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත** හිමියන් විසින් සම්පාදිත ය.

ඉංග්‍රීසීන් සිංහල රජු අල්ලා මුළු දිවයිනම අත්කර ගැනීම දක්වා වූ සියවෙනි පරිච්ඡේදය **හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි** හා **බටුවන්තුඩාවේ** පඬිතුමන් විසින් සම්පාදිත ය.

### මහාවංසයේ අන්තර්ගතය (මුල් කොටසේ)

මහාවංසයේ මුල් කොටසේ අන්තර්ගත වන්නේ සම්බුද්ධාගමනයේ සිට මහසෙන් රාජ්‍ය අවසානය දක්වා ඓතිහාසික හා ආගමික තොරතුරුය. ඒ ඒ පරිච්ඡේද හඳුන්වා ඇති නාමයන්ගෙන් ඒ ඒ පරිච්ඡේදවල ඇතුළත් කරුණු හඳුනාගත හැකි ය.

1 පරිච්ඡේදය - මහියංගනාගමනං
2 පරිච්ඡේදය - මහාසමමතවංසං
3 පරිච්ඡේදය - පඨමධමමසංගීති
4 පරිච්ඡේදය - දුතියධමමසංගීති
5 පරිච්ඡේදය - තතියධමමසංගීති
6 පරිච්ඡේදය - විජයාගමනං
7 පරිච්ඡේදය - විජයාභිසෙකො
8 පරිච්ඡේදය - පණ්ඩුවාසදෙවාභිසෙකො
9 පරිච්ඡේදය - අභයාභිසෙකො
10 පරිච්ඡේදය - පණ්ඩුකාභයාභිසෙකො
11 පරිච්ඡේදය - දෙවානමපියතිස්සාභිසෙකො
12 පරිච්ඡේදය - නානාදෙසපසාදො
13 පරිච්ඡේදය - මහින්දාගමනො
14 පරිච්ඡේදය - නගරපපවෙසනො
15 පරිච්ඡේදය - මහාවිහාරපටිගගහකො
16 පරිච්ඡේදය - චෙතියපබ්බතවිහාරපටිගගහකො
17 පරිච්ඡේදය - ධාතුආගමනො
18 පරිච්ඡේදය - මහාබොධිගගහණො
19 පරිච්ඡේදය - බොධිආගමනො
20 පරිච්ඡේදය - ථෙරපරිනිබ්බානං
21 පරිච්ඡේදය - පඤ්චරාජකො
22 පරිච්ඡේදය - ගාමිණීකුමාරසුති
23 පරිච්ඡේදය - යොධලාභො
24 පරිච්ඡේදය - දෙවභාතිකයුද්ධං
25 පරිච්ඡේදය - දුටඨගාමිණීවිජයො
26 පරිච්ඡේදය - මරීචිවටටිවිහාරමහො
27 පරිච්ඡේදය - ලොහපාසාදමහො
28 පරිච්ඡේදය - මහාථූපසාධනලාභො
29 පරිච්ඡේදය - ථූපාරමෙභා
30 පරිච්ඡේදය - ධාතුගබ්භමහො
31 පරිච්ඡේදය - ධාතුනිධානං
32 පරිච්ඡේදය - තුසිතපුරගමනං
33 පරිච්ඡේදය - දසරාජකො
34 පරිච්ඡේදය - එකාදසරාජදීපකො
35 පරිච්ඡේදය - ද්වාදසරාජකො
36 පරිච්ඡේදය - තයොදසරාජකො
37 පරිච්ඡේදය - පඤ්චරාජකො

ඒ ඒ පරිච්ඡේදයන්හි ඒ ඒ රජවරුන්ගේ දේශපාලනික ආගමික හා ආර්ථික සංවර්ධනයෙහි ලා ක්‍රියාත්මක වූ තොරතුරු අන්තර්ගත වේ. විශේෂයෙන් ආගමික තොරතුරු බහුලව වාර්තා කෙරේ. කාව්‍ය නායකයෙක් සිටීම, ප්‍රතිමල්ලවයෙක් සිටීම, පරිච්ඡේද වෙන්කිරීම, පරිච්ඡේදාවසානයේ වීරිත වෙනස් කොට තිබීම, කාව්‍ය නායකයා උතකර්ෂයෙන් වර්ණනා කර තිබීම වැනි මහාකාව්‍ය ලක්ෂණ මහාවංශයේ අන්තර්ගත වීම නිසා මහාවංශය රඝුවංශය වැනි මහා කාව්‍යයකැයි සමහරු සිතති. එහෙත් මහාවංශය වාර්තා කරන ඉතිහාසය ප්‍රවෘත්ති බොහොමයක් සත්‍ය වශයෙන්ම සිදුවූ ඒවා බැවින් මහාවංසය ඉතිහාස ග්‍රන්ථයක්ම බව බොහෝ දෙනා විසින් පිළිගන්නා ලද කරුණකි. ශ්‍රී ලාංකිකයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමට, ඓතිහාසික පුවත්වල කාලවකවානු තීරණය කිරීමට, අභිලේඛනවල එන ප්‍රවෘත්ති තහවුරුකර ගැනීමට, ආගමික තොරතුරු අනාවරණය කර ගැනීමට හා පාලි පද්‍ය භාෂාවේ ස්වරූපය හඳුනා ගැනීමට මහාවංසය මහෝපකාරී වේ.

### මහාවංසයේ 6 පරිච්ඡේදයේ සාරාංශය

පෙර වංග රට වංග නුවර අග මෙහෙසියට දියණියක් උපන්නා ය 'ඇ උපන් දිනයෙහි නිමිත්ත පාඨකයෝ ඇය සිංහයෙකු සමග විවාහ වන බවට අනාවැකි පළ කළහ. අතිශයින් රූමත් ඇ කාමයන්හි ගිජුබව නිසා දෙමාපියන්ගේ පිළිකුලට පත් වුවා ය. දිනක් ඇ වෙස්වලාගෙන වෙළඳ කණ්ඩායමක් සමග යන්නී ලාටරට වනයේදී ඉදිරියට ආ සිංහයෙකු සමග ගුහාවකට ගොස් වාසය කළා ය. සිංහයා සමග විසීමෙන් ඇය **සිංහබාහු** කුමාරයාත්, **සිංහ සීවලී** කුමරියත් යන දරුවන් ලැබුවා ය. සොළොස් වියැති සිංහබාහු කුමාරයා මවගෙන් කරුණු විමසා තොරතුරු දැන සිංහයා අතහැර මිනිස් වාසයට යාමට තීරණය කළේය. දිනක් සිංහයා ගිය පසු මව සහ නැගණිය උරහිසින් ඔසවාගෙන පනස් යොදුන් දුර කතර ගෙවා ගමනට පිළිපන්නේය. ඔවුහු වංගරට පසල් ගමකට පිළිපන්හ. වගුරජුගේ සේනාපති එහි මිනිසුන් කර්මාන්තවල යොදවමින් සිටියේ ඔවුන්ගෙන් තොරතුරු විමසා වනවාසීන් යැයි කී විට වස්ත්‍ර ආදිය දෙවීය. කෑම දුන් කොළ ඔවුන්ගේ පිනින් රන්බඳුන් වූ නිසා විමතියට පත් සේනාපති තවදුරටත් කරුණු විමසා රජ දියණියකැයි දැන තමාගේ මාමාගේ දියණිය බව වටහාගෙන ඔවුන් වංග නගරයට කැඳවාගෙන ගොස් එහි වාසය කරවීය. සිංහයා අවුත් දරුවන් නොදැක දරුවන් සොයමින් ගම් දනවු විනාශ කරන්නට විය. මහජනයා රජුට මෙය දැන්වූ විට රජතුමා ඇතෙකු මත රන්මසු දහසක් තබා සිංහයා මරා එය ලබාගන්නා ලෙස දැන්වීය. කිසිවෙක් ඉදිරිපත් නොවූ නිසා මසු තුන්දහස දක්වා ඉහළ නැංවීය. සිංහබාහු කුමාරයා සිංහයා මැරීමට ඉදිරිපත් වුවත් පළමු හා දෙවන වර මව විසින් ඔහු වළක්වනු ලැබීය. තුන්වන වර මවට නොදන්වා ගොස් සිංහයා මරා රජුට ඉදිරිපත් කිරීමට ගියේ ය. රජතුමා ඒ වන විට මියගොස් දින හතක් ගෙවී තිබිණ. රජුට පුතුන් නොවූ බැවිනුත් මොහුගේ ක්‍රියාව නිසා ප්‍රකට වූ බැවිනුත් රජතුමාගේ මුණුබුරා නිසාත් සිංහබාහු කුමාරයාට රජකම පිරිනැමිණ. සිංහබාහු කුමාරයා එය පිළිගෙන මවගේ ස්වාමියාට රජකම දී සිංහසීවලිව රැගෙන ලාටරට වනයට ගොස් සිංහපුරය නම් නගරයක් සාදා එහි රජකම් කළේ ය.

සිංහබාහු සහ සිංහසීවලී යුවළ නිවුන් දරුවන් සොළොස් වාරයක් ලැබූහ. දරුවන් දෙතිස අතරින් විජය වැඩිමහලු කුමරා විය. යුවරජකම ලැබූ විජය නොපණත් කම් සිදු කළ නිසා අඩක් හිස මුඩුකොට සත්සියයක් පිරිවර සමග නැව් නංවා රටින් පිටුවහල් කළේ ය. මේ නැව සුප්පාරක පටුනට ගොඩ බැස්සත් එහි උපද්‍රව නිසා නැවත නැව් නැගී බුදුරදුන් පිරිනිවන් පාන දවසෙහි තම්බපණ්ණි දිවයිනට ගොඩබටහ.

**අභ්‍යාස**

1. සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

i. පාලි වංසකථා සාහිත්‍යයේ ආදිතම වංසකථාව ------------ යි.
ii. ---------------- අටුවා යුගයට පෙර ලියන ලද්දකි.
iii. ------------- මෛත්‍රී බුදුන්ගේ පහළවීම පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.
iv. දීපවංසයේ ප්‍රථමභාගයේ ගාථා ------------------ කි.
v. ------------------- රචනා කිරීමට ආරාධනා කළේ පරාක්‍රම සෙන්පතියාය.

2. මහාවංසය' යන්නෙහි අර්ථය ලියන්න.
3. කතුවරයා මහාවංසය රචනා කිරීමෙන් බලාපොරොත්තු වූ කරුණු මොනවාද?
4. මහාවංසයේ ප්‍රථමභාගයේ අන්තර්ගතය සැකෙවින් දක්වන්න.
5. බුදුරදුන්ගේ ශාරීරික ධාතු වස්තු විෂය කොට රචිත වංසකථා නම් කරන්න.
6. පාලිවංසකථා රචනා කිරීමේ අරමුණු කෙටියෙන් දක්වන්න.
7. මහාවංසයේ ඇතුළත් මහා කාව්‍ය ලක්ෂණ පහක් දක්වන්න.
8. මහාවංසය කාව්‍ය ග්‍රන්ථයකට වඩා ඉතිහාස කෘතියක් බව තහවුරු කෙරෙන හේතු සාධක දෙකක් ලියන්න.
9. මහාවංසයේ 6 පරිච්ඡේදයෙන් උකහා ගතහැකි සාරධර්ම කීපයක් ලියන්න.
10. සිංහබාහු කුමාරයා සිංහ රජුට හීය විදින අවස්ථාවේ සිංහ රජුට ඇතිවෙන්නට ඇතැයි සිතිය හැකි සිතුවිලි උපකල්පනය කොට ලියන්න.

# අට්ඨාරසමො පාඨො

# මහාවංසො

1. වංගෙසු වංගනගරෙ - වංගරාජා අහූ පුරෙ,
කාලිංගරඤ්ඤො ධීතාසි - මහෙසි තස්ස රාජිනො.

2. සො රාජා දෙවියා තස්සා - එකං අලභි ධීතරං,
නෙමිත්තා ව්‍යාකරුං තස්සා - සංවාසං මිගරාජිනා.

3. අතීව රූපිනී ආසී - අතීව කාමගිද්ධිනී,
දෙවෙන දෙවියා චාපි - ලජ්ජායාසි ජිගුච්ඡිතා.

4. එකාකිනී සා නික්ඛම්ම - සෙරිචාරසුඛත්ථිනී,
සත්ථේන සහ අඤ්ඤාතා - අගා මගධගාමිනා.

5. ලාළරට්ඨෙ අටවියා - සීහො සත්ථ'මභිද්දවි,
අඤ්ඤත්ථ සෙසා ධාවිංසු - සීහාගතදිසන්තු සා.

6. ගණ්හිත්වා ගොචරං සීහො - ගච්ඡං දිස්වා තමාරකා
රත්තො උපාග ලාළෙන්තො - ලංගුලං පන්නකණ්ණකො.

7. සා තං දිස්වා සරිත්වාන - නෙමිත්තවචනං සුතං,
අභීතා තස්ස අඞ්ගානි - රංජයන්තී පරාමසි.

8. තස්සා ඵස්සෙනා'තිරත්තො - පිට්ඨිං ආරොපියාසු තං,
සීහො සකං ගුහං නෙත්වා - තාය සංවාස'මාචරි.

9. තෙන සංවාසමන්වාය - කාලෙන යමකෙ දුවෙ,
පුත්තං ච ධීතරංචා'ති - රාජධීතා ජනෙසි සා.

10. පුත්තස්ස හත්ථපාදාසුං - සීහා'කාරා තතො අකා,
නාමෙන සීහබාහුං තං - ධීතරං සීහසීවලිං.

11. පුත්තො සොළසවස්සො සො - මාතරං පුච්ඡි සංසයං,
"තුවං පිතා ච නො අම්ම - කස්මා විසදිසා ඉති.

12. සා සබ්බ'මබ්‍රවී තස්ස- "කිං න යාමා"ති සො'බ්‍රවි,
"ගුහං ථකෙති තාතො තෙ- පාසාණෙනා"ති, සා බ්‍රවි.

13. මහාගුහාය ථකනං - ඛන්‍ධෙ නාදාය සො අකා,
එකාහෙනෙව පඤ්ඤාස - යොජනානි ගතාගතං.

14 ගොචරාය ගතෙ සීහෙ - දක්ඛිණංසම්හි මාතරං,
වාමෙ කනිට්ඨිං කත්වාන - තතො සීසං අපක්කමි.

15 නිවාසෙත්වාන සාඛං තෙ - පච්චන්තං ගාම'මාගමුං,
තත්‍රා'සි රාජධීතාය - මාතුලස්ස සුතො තදා.

16 සෙනාපති වංගරඤ්ඤො - ඨිතො පච්චන්තගාමකෙ
නිසින්නො වටමූලෙ සො - කම්මන්තං සංවිධාපයං

17 දිස්වා තෙ පුච්ඡි තෙ'වොචුං - "අටවීවාසිනො මයං".
ඉති සො දාපයී තෙසං - වත්ථානි ධජිනීපති.

18 තානාහෙසුං උළාරානි - භත්තං පණ්ණෙසු දාපයි,
සොවණ්ණභාජනානාසුං - තෙසං පුඤ්ඤෙන තානි ච.

19 තෙන සො විම්හිතො පුච්ඡි - "කෙ තුම්හෙ"ති, චමූපති,
තස්ස සා ජාති ගොත්තානි - රාජධීතා නිවෙදයි,

20 පිතුච්ඡාධීතරං තං සො - ආදාය ධජිනීපතී,
ගන්ත්වාන වංග නගරං - සංවාසං තාය කප්පයි.

21 සීහො සීසං ගුහං ගන්ත්වා - තෙ අදිස්වා තයො ජනෙ,
අට්ටිතො පුත්තසොකෙන - න ච ඛාදි න චාපිවි.

22 දාරකෙ තෙ ගවෙසෙන්තො - අගා පච්චන්තගාමකෙ,
උබ්බාසීයති සො සො'ව - යං යං ගාමමුපෙති සො.

23 පච්චන්තවාසිනො ගන්ත්වා - රඤ්ඤො තං පටිවෙදයුං,
"සීහො පීළෙති තෙ රට්ඨං - තං දෙව පටිසෙධය".

24 අලභං නිසෙධකං තස්ස - හත්ථික්ඛන්ධගතං පුරෙ,
ආදෙතු "සීහදායී"ති - සහස්සං සො පචාරයි.

25 තථෙව දෙව සහස්සානි - තීණි චා'පි නරිස්සරො,
ද්වීසු වාරෙසු වාරෙසි - මාතා සීහභුජං හි තං.

26 අග්ගහි තතියෙ වාරෙ - සීහබාහු අපුච්ඡිය,
මාතරං තිසහස්සං තං - ඝාතෙතුං පිතරං සකං.

27 රඤ්ඤොදා කුමාරං දස්සෙසුං - තං රාජා ඉද'මබ්‍රවී,
"ගහිතො යදි සීහො තෙ - දම්මි රට්ඨං තදෙව තෙ."

28 සො තං ගන්ත්වා ගුහාද්වාරං - සීහං දිස්වා'ව ආරකා,
එන්තං පුත්තසිනෙහෙන - විජ්ඣිතුං තං සරං ඛිපි.

29 සරො නලාට මාහච්ච - මෙත්තචිත්තෙන තස්ස තු,
කුමාරපාදමූලෙ'ව - නිවත්තො පති භූමියං.

30 තථා'සි යාව තතියං - තතො කුජ්ඣි මිගාධිපො,
තතො ඛිත්තො සරො තස්ස - කායං නිබ්භිජ්ජ නික්ඛමි.

31 සකෙසරං සීහසීසං - ආදාය ස පුරං අගා,
මතස්ස වංගරාජස්ස - සත්තාහානි තදා අහූ.

32 රඤ්ඤොදා අපුත්තකත්තා ච - පතීතා චස්ස කම්මුනා,
සුත්වා ච රඤ්ඤොදා නත්තුත්තං - සංජානිත්වා ච මාතරං.

33 අමච්චා සන්නිපතිතා - අඛිලා එකමානසා,
සීහබාහුකුමාරස්ස - "රාජා හොහී"ති අබ්‍රවුං.

34 සො රජ්ජං සම්පටිච්ඡිත්වා - දත්වා මාතුපතිස්ස තං,
සීහසීවලිමාදාය - ජාතභූමිං ගතො සයං.

35 නගරං තත්ථ මාපෙසි - අහූ සීහපුරන්ති තං,
අරඤ්ඤෙ යොජනසතෙ - ගාමෙ චාපි නිවෙසයි.

36 ලාළරට්ඨෙ පුරෙ තස්මිං - සීහබාහු නරාධිපො,
රජ්ජං කාරෙසි කත්වාන - මහෙසිං සීහසීවලිං.

37 මහෙසි සොළසක්ඛත්තුං - යමකෙ'ව දුවෙ දුවෙ,
පුත්තෙ ජනයි කාලෙ සා - විජයො නාම ජෙට්ඨකො.

38 සුමිත්තො නාම දුතියො - සබ්බෙ දවත්තිංස පුත්තකා,
කාලෙන විජයං රාජා - උපරජ්ජෙ'භිසෙචයි.

39 විජයො විසමාචාරො - ආසි තම්පරිසා'පි ච
සහසානි අනෙකානි දුස්සහානි කරිංසු තෙ

40 කුද්ධො මහාජනො රඤ්ඤො - තමත්ථං පටිවෙදයි,
රාජා තෙ සඤ්ඤපෙත්වාන - පුත්තං ඔවදි සාධුකං.

41 සබ්බං තථෙව දුතියං - අහොසි තතියම්පන,
කුද්ධො මහාජනො ආහ - "පුත්තං ඝාතෙහි තෙ" ඉති.

42 රාජා'ථ විජයං තං ච - පරිවාරං ච තස්ස තං,
සත්තසතානි පුරිසෙ - කාරෙත්වා අඩ්ඪමුණ්ඩකෙ.

43 නාවාය පක්ඛිපාපෙත්වා - විස්සජ්ජාපෙසි සාගරෙ,
තථා තෙසං හරියායො - තථෙ'ව ච කුමාරකෙ.

44 විසුං විසුං තෙ විස්සට්ඨා - පුරිසි'ත්ථි කුමාරකා,
විසුං විසුං දීපකස්මිං - ඔක්කමිංසු වසිංසු ච.

45 නග්ගදීපො'ති ඤායිත්ථ - කුමාරොක්කන්තදීපකො,
හරියොක්කන්තදීපො තු - මහිලාදීපකො ඉති.

46 සුප්පාරකෙ පට්ටනම්හි - විජයො පන ඔක්කමි
පරිසාසාහසෙනෙත්ථ - හීතො නාවං පුනාරුහි

47 ලංකායං විජයස'නාමකො කුමාරො
ඔතිණ්ණො ථිරමති තම්බපණ්ණිදීපෙ
සාලානං යමකගුණාන'මන්තරස්මිං
නිබ්බාණං සයිතදිනෙ තථාගතස්ස

සුජනප්පසාදසංවෙගත්ථාය කතෙ මහාවංසෙ විජයාගමනො නාම ඡට්ඨො පරිච්ඡෙදො

1. **පුරෙ** පෙර, **වංගෙසු** වංගරට, **වංගනගරෙ** වංගනුවර, **වංගරාජා** වංග නම් රජෙක්, **අහු** විය, **කාලිංගරඤ්ඤො** කාලිංගරජුගේ, **ධීතා** දියණිය, **තස්ස රාජිනො** ඒ රජුගේ, **මහෙසී ආසි** මෙහෙසිය වූවා ය.

2. **සො රාජා** ඒ රජු, **තස්සා දෙවියා** ඒ දේවියගෙන්, **එකං ධීතරං** එක් දියණියක, **අලභි** ලැබී ය, **තස්සා** ඇයගේ, **මිගරාජිනා** මෘගරාජයකු (සිංහයෙකු) සමග **සංවාසං** සංවාසය (විවාහය), **නෙමිත්තා** නිමිති දන්නෝ, **ව්‍යාකරුං** ප්‍රකාශ කළහ.

3. **අතීව රූපිනී** අතිශයින් රූමත් වූ ඇය, **අතීව** අතිශයින්, **කාමගිද්ධිනී** කාමයෙහි ගිජු වූවා ය, **දෙවෙන** රජු විසින් ද, **දෙවියා ච අපි** දේවිය විසින් ද, **ලජ්ජාය** ලජ්ජාවෙන්, **ජිගුච්ඡිතා ආසි** පිළිකුල් කරන ලද්දියක් වූවා ය.

4. **සෙරිචාරසුඛත්ථිනී** ස්වෛරීව හැසිරීමේ සුවය කැමති වූ, **සා** ඇය, **එකාකිනී** තනිවම, **නික්ඛම්ම** නික්ම, **අඤ්ඤාතා** අප්‍රකටව (වෙස්වලාගෙන), **මගධගාමිනා** මගධයට යන, **සත්ථෙන සහ** තවලමක් සමග (වෙළඳ කණ්ඩායමක්), **අගා** ගියාය.

5. **ලාලරට්ඨෙ** ලාල නම් රට, **අටවියා** වනයේ දී, **සීහො** සිංහයෙක්, **සත්ථං** තවලම, **අභිද්දවි** ඉදිරියට අවේ ය, **සෙසා** සෙසු පිරිස, **අඤ්ඤත්ථ** වෙනතක, **ධාවිංසු** දිවූහ, **සා** ඇය, **සීහාගත දිසං තු** සිංහයා පැමිණි දිශාවට (ගියාය).

6. **සීහො** සිංහයා, **ගොචරං ගණ්හිත්වා** ගොදුරු ගෙන, **ගච්ඡං** යන්නේ, **තං** ඈ, **ආරකා** දුරදීම, **දිස්වා** දැක, **රත්තො** (ඈ කෙරේ) ඇලුණේ, **පන්නකණ්ණකො** කන් නවාගෙන, **ලංගුලං ලාලෙන්තො** වලිගය වනමින් **උපාග** (ඈ) වෙත ආවේ ය.

7. **සා** ඇය, **තං දිස්වා** ඌ දැක, **සුතං** අසන ලද, **නෙමිත්තවචනං** නිමිති පාඨකයන්ගේ වචනය, **සරිත්වාන** සිහිකොට, **අභීතා** බිය නොවූවා, **තස්ස අංගානි** උගේ ශරීරය, **රංජයන්ත** සතුටු කරවමින්, **පරාමසි** පිරිමැද්දා ය.

8. **තස්සා** ඇයගේ, **ඵස්සෙන** පහසින්, **අතිරත්තො** අතිශයින් ඇලුණු, **සීහො** සිංහයා, **ආසු** වහා, **තං** ඇය, **පිට්ඨිං ආරොපිය** පිටට නංවාගෙන, **සකං ගුහං** සිය ගුහාවට, **නෙත්වා** පමුණුවා, **තාය** ඈ සමග, **සංවාසං ආචරි** සංවාසයේ යෙදුණේ ය.

9. **සා රාජධීතා** ඒ රාජදියණිය, **තෙන** ඒ සිංහයා සමග, **සංවාසමන්වාය** සංවාසය නිසා, **කාලෙන** කල්යෑමෙන්, **පුත්තං** ච පුතෙකු ද, **ධීතරං** ච දියණියක ද, **යමකෙ දුවෙ** නිවුන් දරු දෙපළක්, **ජනෙසි** බිහිකළා ය.

10. **පුත්තස්ස** පුතුගේ, **හත්ථපාද**, අත්පා, **සීහාකාරො** සිංහයාගේ මෙන්, **ආසුං** විය, **තතො** එනිසා, **තං** ඔහු, **නාමෙන** නමින්, **සිංහබාහුං** සීහබාහු ද, **ධීතරං** දියණිය, **සීහසීවලිං** සිංහසීවලී ද යැයි, **අකා** (නම්) කළේය.

11. **සොළසවස්සො** සොළොස් වියැති, **සො පුත්තො** ඒ පුතා, **මාතරං** මවගෙන්, **සංසයං** සැකයක්, **පුච්ඡි** විචළේ ය, **නො** අපගේ, **අම්ම** මෑණියනි, **ත්වං ච** ඔබ ද, **පිතා ච** පියා ද, **කස්මා** කුමක් නිසා, **විසදිසා** අසමාන වන්නේ ද, **ඉති** යනුවෙනි.

12. **සො** ඇ,**තස්ස** ඔහුට, **සබ්බං** සියල්ල, **අබ්‍රවි** කීවා ය, **සො** හෙතෙම, **කිං** කුමක් නිසා, **න යාම ඉති** නො යමු දැයි, **අබ්‍රවී** කීය, **තෙ තාතො** ඔබේ පියා, **පාසාණෙන** ගලකින්, **ගුහං** ගුහාව, **ථකෙති ඉති** වසයි යැයි, **සා** ඇ, **අබ්‍රවී** කීවා ය.

13. **සො** ඒ කුමාරයා, **මහාගුහාය** මහා ගුහාවෙහි, **ථකනං** වසන දොර, **ඛන්ධෙන ආදාය** උරහිසින් ගෙන, **එක අහෙන එව** එක්දවසකින් ම, **පඤ්චාසයොජනානි** යොදුන් පන්සියයක්, **ගතාගතං** යාම් ඒම්, **අකා** කළේ ය.

14. **සීහො ගොචරාය ගතෙ** සිංහයා ගොදුරු පිණිස ගිය කල්හි, **මාතරං** මව, **දක්ඛිණංසම්හි** දකුණු උරහිසෙහි ද, **කනිට්ඨිං** බාල නැගණිය, **වාමෙ** වම් උරහිස ද, **කත්වාන** කොට, **තතො** එතනින්, **සීඝං** වහා, **අපක්කමි** (නික්මුණේය) ඉවත්විය.

15. **තෙ** ඔවුහු, **සාඛං** අතු, **නිවාසෙත්වාන** හැඳ, **පච්චන්තං ගාමං** පසල් ගමකට, **ආගමුං** ගියහ. **තදා** එකල, **තත්ථ** එහි, **රාජධීතාය** රජදියණියගේ, **මාතුලස්ස සුතො** මාමාගේ පුතා, **ආසි** විය.

16. **වංගරඤ්ඤො සෙනාපති** වංගරජුගේ සෙන්පතියා, **පච්චන්තගාමකෙ** ප්‍රත්‍යන්ත ගමෙහි, **ඨිතො** සිටියේ ය. **සො** හෙතෙම, **කම්මන්තං සංවිධාපයං** කර්මාන්ත සංවිධානය කරමින්, **වටමූලෙ** නුගගසක් මුල, **නිසින්නො** හුන්නේය.

17. **තෙ දිස්වා** ඔවුන් දැක, **පුච්ඡි** විචාළේය, **මයං** අපි, **අටවිවාසිනො ඉති** වනවාසීහු යැයි, **තෙ** ඔවුහු, **අවොචුං** කීවාහු ය. **සො ධජිනීපති** ඒ සෙන්පතියා, **තෙසං** ඔවුන්ට, **වත්ථානි** වස්ත්‍ර, **දාපයී** දෙවීය.

18. **තානි** ඒ වස්ත්‍ර, **උළාරානි අහෙසුං** මහගු විය. **පණ්ණෙසු** කොළවල, **භත්තං** බත් **දාපයී** දෙවීය, **තෙසං පුඤ්ඤෙන** ඔවුන්ගේ පිනෙන්, **තානි** ඒවා, **සොවණ්ණභාජනානි** රන් බඳුන්, **අහෙසුං** වීය.

19. **තෙන** ඒ කරුණෙන්, **විම්හිතො** විස්මයට පත්, **සො චමූපති** ඒ සෙන්පතියා, **කෙ තුම්හෙ ඉති** නුඹලා කවරහු දැයි, **පුච්ඡි** විචාළේ ය. **සා රාජධීතා** ඒ රජදියණිය, **තස්ස** ඔහුට, **ජාතිගොත්තානි** ජාති ගෝත්‍රයන්, **නිවෙදයී** දැනුම් දුන්නා ය.

20. **සො ධජිනීපති** ඒ සේනාපති තෙම, **තං පිතුච්ඡාධීතරං** ඒ මාමාගේ දියණිය, **ආදාය** රැගෙන, **වංගනගරං** වංග නගරයට, **ගන්ත්වාන** ගොස්, **තාය** ඈ සමග, **සංවාසං කප්පයී** වාසය කළේ ය.

21. **සීහො** සිංහයා, **සීඝං** වේගයෙන්, **ගුහං ගන්ත්වා** ගුහාවට ගොස්, **තෙ තයො ජනෙ** ඒ තිදෙනා, **අදිස්වා** නොදැක, **පුත්තසොකෙන** දරු සෙනෙහසින්, **අට්ටිතො** පෙළුණේ, **න ච** ඛාදි නො කෑවේ ය. **න ච පිවි** නො බීවේ ය.

22. (ඒ සිංහයා) **තෙ දාරකෙ** ඒ දරුවන්, **ගවෙසන්තො** සොයමින්, **පච්චන්තගාමකෙ** පසල් ගම්වලට, **අගා** ගියේ ය. **සො** ඒ සිංහයා, **යං යං ගාමං** යම් ගමකට, **උපෙති** එළඹේ නම්, **සො සො එව** ඒ ඒ ගම් ම, **උබ්බාසීයති** බැහැර කෙරේ (පාළු කරනු ලැබේ)

23. **පච්චන්තගාමවාසිනො** පසල්ගම් වැසියෝ, **ගන්ත්වා** ගොස්, **රඤ්ඤො** රජුට, **තං** එය **පටිවෙදයුං** දැන්වූහ, **දෙව**, දේවයන් වහන්ස, **තෙ** ඔබගේ, **රට්ඨං** රට, **සීහො** සිංහයෙක්, **පීළෙති** පෙළයි, **තං** එය, **පටිසෙධය** වළක්වනු මැනවි.

24. **තස්ස නිසෙධකං** ඒ සිංහයාගේ ක්‍රියාව වළක්වන්නෙක්, **අලභං** නොලබන්නා වූ **සො**, ඒ රජතුමා '**සීහදායී**' **සහස්සං** සීහදායී (සිංහයා අල්වා දෙන්නාට දෙනු ලබන කහවණු) දහසක්, **හත්ථික්ඛන්ධගතං**, ඇතෙකු පිට තබා, **ආදෙතු ඉති** ගනීවා යැයි, **පුරෙ** නගරයෙහි, **පචාරයි** ප්‍රචාරය කළේය.

25. **නරිස්සරො** රජතුමා, **තථෙව** එසේම, **දෙව සහස්සානි** දෙදහසක්, **තීණි ච සහස්සානි** තුන්දහසක් ද යැයි (ප්‍රචාරය කරවීය), **මාතා හි** මව වනාහි, **තං සීහභුජං** සිංහබාහු, **ද්වීසු වාරෙසු** දෙවරක් **වාරෙසි** වැළැක්වූවා ය.

26. **සීහබාහු** සිංහබාහු, තෙම **තතියවාරෙ** තුන්වන වර, **මාතරං අපුච්ඡිය** මවගෙන් නොවිමසා, **සකං පිතරං** තමාගේ පියා, **ඝාතෙතුං** මරන්නට, **තං තිසහස්සං** ඒ තුන්දහස, **අග්ගහී** ගත්තේය.

27. **රඤ්ඤො** රජුට, **කුමාරං** කුමාරයා, **දස්සෙසුං** දැක්වූහ. **රාජා** රජතුමා, **තං** ඔහුට, **ඉදං අබ්‍රවිං** මෙය කීය, **යදි** යම්හෙයකින්, **තෙ** තා විසින්, **සීහො** සිංහයා, **ගහිතො** අල්ලා ගන්නා ලද්දේ නම්, **තං රට්ඨං** ඒ රට, **තෙ එව** ඔබට ම, **දම්මි** දෙමි.

28. **සො** ඒ සිංහබාහු, තෙමේ, **තං ගුහාද්වාරං ගන්ත්වා** ඒ ගුහාද්වාරයට ගොස්, **ආරකා** දුරදී ම, **දිස්වා** දැක, **පුත්තසිනෙහෙන** පුත්‍ර සෙනෙහයෙන්, **එන්තං** එන්නා වූ, **සීහං** සිංහ-යාට, **විජ්ඣිතුං** විදින්නට, **තං සරං** ඒ, ඊය **ඛිපි** යැවී ය.

29. **සරො** හීය, **නලාටං ආහච්ච** නළලෙහි වැදී, **තස්ස** ඔහුගේ, **මෙත්තචිත්තෙන තු** මෙත් සිත නිසා වනාහි, **කුමාරපාදමූලෙ එව** කුමාරයාගේ පා මුල ම, **නිවත්තො** නැවතුණේ, **භූමියං** බිම, **පති** වැටුණේ ය.

30. **යාව තතියං** තුන්වන වාරය දක්වා, **තථා ආසි** එසේ විය. **තතො** ඉක්බිති **මිගාධිපො** සිංහයා **කුජ්ඣි** කිපුණේ ය. **තතො** ඉන්පසු, **ඛිත්තො සරො** විදින ලද හීය, **තස්ස කායං** ඒ සිංහයාගේ ශරීරය, **නිබ්භිජ්ජ** සිදුරු කරගෙන, **නික්ඛමි** නික්මුණේ ය.

31. **සො** හෙතෙම **සකෙසරං** කෙසරු සහිත **සීහසීසං** සිංහ හිස **ආදාය** රැගෙන **පුරං** නගරයට **අගා** ගියේ ය. **තදා** එදින, **මතස්ස වංගරාජස්ස** මැරුණු වංග රජුගේ **සත්තහානි අහු** සත්වන දිනය (සතිය) විය.

32. **රඤ්ඤො** රජුට, **අපුත්තකත්තා ච** පුතුන් නැති බැවින් ද, **අස්ස** ඔහුගේ, **කම්මුනා** (මේ සිංහයා මැරීමේ) ක්‍රියාවෙන්, **පතීතා ච** ප්‍රකට බැවින් ද, **රඤ්ඤො** රජුගේ, **නත්තුත්තං ච** මුණුබුරු බව, **සුත්වා ච** අසා ද, **මාතරං** මව, **සංජානිත්වා ච** හැඳිනගෙන ද

33. **සන්නිපතිතා** රැස් වූ, **අඛිලා අමච්චා** සියලු ඇමතිවරු, **එකමානසා** එක සිතින්, **සීහබාහු කුමාරස්ස** සිංහබාහු කුමාරයාට, **රාජා හොහි ඉති** රජ වන්න යැයි, **අබ්‍රවුං** කීහ.

34. **සො** හෙතෙම **රජ්ජං** රාජ්‍යය, **සම්පටිච්ඡිත්වා** පිළිගෙන, **මාතු** මවගේ, **පතිස්ස** ස්වාමියාට, **තං** ඒ රාජ්‍යය, **දත්වා** දී **සීහසීවලිං ආදාය** සිංහසීවලිය ගෙන, **සයං** තෙමේ, **ජාතභූමිං** උපන් බිමට, **ගතො** ගියේ ය.

35. **තත්‍ථ** එහි, **නගරං** නුවරක්, **මාපෙසි** සැදීය. **තං** එය, **සීහපුරං ඉති** සිංහ පුරය යැයි, **අභූ** විය, **යොජනසතෙ අරඤ්ඤෙ** යොදුන් සියයක් වනයෙහි, **ගාමෙ ච අපි** ගම්වැසියන් ද **නිවෙසෙසි** වාසය කරවීය.

36. **තස්මිං ලාරට්ඨෙ** එම ලාටරටෙහි, **පුරෙ** නගරයෙහි, **සීහබාහු නරාධිපො** සිංහබාහු රජතුමා, **සීහසීවලිං** සිංහසීවලී, **මහෙසිං කත්වාන** මෙහෙසිය කොට, **රජ්ජං කාරෙසි** රාජ්‍යය කරවී ය.

37. **සා මහෙසී** ඒ මහේෂිකාව, **සොළසක්ඛත්තුං** සොළොස් වරක්, **දුවෙ දුවෙ යමකෙ** දෙදෙනා බැගින් වූ නිවුන් වූ, **පුත්තෙ** දරුවන්, **ජනයි** වැදුවා ය, **ජෙට්ඨකො** දෙටුපුතා, **විජයො නාම** විජය නම් වීය.

38. **දුතියො** දෙවැන්නා **සුමිත්තො නාම** සුමිත්ත නම් වේ, **සබ්බෙ ද්වත්තිංස පුත්තකා** සියලු පුත්තු තිස්දෙදෙනෙකි, **රාජා** රජතුමා, **කාලෙන** සුදුසු කාලයෙහි, **විජයං** විජය කුමරු, **උපරජ්ජෙ** යුවරජ තනතුරෙහි, **අභිසෙචයි** අභිෂේක කළේ ය.

39. **තෙ** ඔවුහු, **අනෙකානි** නොයෙක්, **දුස්සහානි** ඉවසිය නොහැකි දෑ, **සාහසානි,** සැහැසිදේ, **කරිංසු** කළහ. **විජයො විසමාචාරො** - විජය විෂමාචාර ඇත්තෙකි. **තං පරිසා අපි ච** (ඔහුගේ) ඒ පිරිස ද **ආසි** එසේම වූහ.

40. **කුද්ධො** කිපුණා වූ, **මහාජනො** මහජනයා, **තමත්‍ථං** ඒ කරුණ, **රඤ්ඤො** රජුට, **පටිවෙදයි** දැන්වීය, **රාජා** රජතුමා, **තෙ** ඔවුන්, **සඤ්ඤපෙත්වාන** දැනුවත් කොට, **සාධුකං** මනාකොට, **පුත්තං** පුතුට, **ඔවදි** අවවාද කළේ ය.

41. **දුතියං** දෙවනුව ද, **සබ්බං** සියල්ල, **තථා එව ආසි** එසේම සිදුවිය, **තතියං** පන තුන්වෙනුව වනාහි, **කුද්ධො මහාජනො** කිපියා වූ මහජනයා, **තෙ** ඔබගේ **පුත්තං** පුතා, **ඝාතෙහි ඉති** ඝාතනය කරවැ'යි. **ආහ.** කීය.

42. **අථ** ඉක්බිති, **රාජා** රජතුමා, **තං විජයං ච** ඒ විජය කුමරු ද, **තස්ස** ඔහුගේ, **තං පරිවාරං** ඒ පරිවර ද යන, **සත්තසතානි** සත්සියයක්, **පුරිසෙ** මිනිසුන්, **අඩ්ඪමුණ්ඩකෙ කාරෙත්වා** (හිස) අඩක් මුඩු කරවා.

43. **නාවාය** නැවක, **පක්ඛිපාපෙත්වා** දම්මවා **සාගරෙ** සයුරෙහි, **විස්සජ්ජාපෙසි** පාකර යැවී ය, **තථෙව** එසේම, **තෙසං** ඔවුන්ගේ, **භරියායො ච** භාර්යාවන් ද, **කුමාරකෙ ච** කුමාරවරුන් ද (මුහුදට යැවීය).

44. **විසුං විසුං** වෙන් වෙන්ව, **විස්සට්ඨා** යවන ලද, **තෙ පුරිස ඉත්ථී කුමාරකා** ඒ පුරුෂයෝ ස්ත්‍රීහු හා කුමාරවරු, **විසුං විසුං** වෙන් වෙන් වූ, **දීපකස්මිං** දිවයිනෙක්හි, **ඔක්කමිංසු** ගොඩ බැස්සහ, **වසිංසු ච** වාසය කළාහු ද වෙති.

45. **කුමාරොක්කන්තදීපකො** කුමාරවරුන් ගොඩ බැස්සා වූ දිවයින, **නග්ගදීපොති නග්ගදීප** යැයි, **ඤායිත්ථ** හැඳින්වීය, **භරියොක්කන්තදීපො තු** භාර්යාවන් ගොඩබැස්සා වූ දිවයින වනාහි, **මහිලාදීපකො ඉති** මහිලා දිවයින යැයි හැඳින්වීය.

46. **විජයො පන** විජය වනාහි, **සුප්පාරකෙ පට්ටනම්හි** සුප්පාරක පටුනෙහි, **ඔක්කමි** ගොඩබැස්සේ ය, **එත්ථ** මෙහිදී (ද) **පරිසාසාහසෙන** පිරිසගේ සැහැසි ක්‍රියාවලින්, **භීතො** බිය වූයේ, **නාවං** නැවට, **පුන** නැවත, **ආරුහි** නැංගේ ය

47. **තථාගතස්ස** තථාගතයන්ගේ, **යමකගුණ්ණානං සාලානං** යමක ලක්ෂණ ඇති සල් ගස්, **අන්තරානං** අතරෙහි, **නිබ්බාණං** නිවනට **සයිතදිනෙ.** සැතපුන දිනයේ. **ථිරමති** ස්ථිර නුවණ ඇති **විජයනාමකො** විජය නම් වූ **කුමාරො,** කුමාරයෙක් **තම්බපණ්ණිදීපෙ** තම්බපණ්ණි දිවයිනෙහි **ඔතිණ්ණො** බැස ගත්තේය.

# කච්චායන ධාතුමඤ්ජූසා

**(වණපොත් කිරීම සඳහා)**

01. භූ සත්තායං පච පාකෙ ගමු - සප්ප ගතිම්හි ච,
සිලොක ධාතු සඞ්ඝාතෙ සකි සඞ්කාය වත්තතෙ.

02. අථො කුක-වකා'දානෙ කෙ සද්දෙ අකි ලක්ඛණෙ,
කු සද්දෙ කුච්ජිතෙ ටකි බන්ධනෙ මකි මණ්ඩනෙ.

03 වකි කොටිල්ලයාත්‍රාසු සක්ක-ඨීක ද්වයං ගතෙ,
කකී ලොලත්තනෙ යාතෙ තකී ඉධ ගතාදිසු.

04. ඉක්ඛො තු දස්සනඞ්කෙසු ඛී ඛයෙ කඞ්ඛ කඞ්ඛනෙ,
චක්ඛ දස්සෙ චික්ඛ වාචෙ දික්ඛො'පනයමුද්ධිසු.

